2022 අගෝස්තු 04
2022 ஆகஸ்ட் 04
04 August 2022

NAOSL

# 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 14 වන වගන්තිය ප්‍රකාරව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලබන විගණකාධිපති ත්‍රෛවාර්ෂික වාර්තාව

## 2018 இன் 19 ஆம் இலக்க தேசிய கணக்காய்வு அதிகாரச்சட்டத்தின் 14 ஆவது பிரிவின் பிரகாரம் பாராளுமன்றத்திற்கு சமர்ப்பிக்கப்படுகின்ற கணக்காய்வாளர் தலைமை அதிபதியின் மூன்றாண்டு அறிக்கை

# Triennial Report of the Auditor General presented in parliament in terms of Section 14 of the National Audit Act, No. 19 of 2018

එකොළොස් වන කාණ්ඩය - 04
பதினோராவது தொகுதி - 04
Eleventh Volume - 04

## විදේශ මූල්‍යයන ව්‍යාපෘති
## வெளிநாட்டு நிதியளிக்கப்பட்ட செயற்திட்டங்கள்
## Foreign Funded Projects

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE



විදේශ මූල්‍යයන ව්‍යාපෘති පිළිබඳ ත්‍රෛවාර්ෂික වාර්තාව ........................................................................ 4

1. ශ්‍රී ලංකාවේ විදේශ අරමුදල් ව්‍යාපෘති වල පසුබිම ........................................................................ 4

2. ජල සම්පාදන හා සනීපාරක්ෂක අංශය ........................................................................ 6

2.1 මහ කොළඹ අපජල කළමනාකරණ ව්‍යාපෘතිය (කො.න.ස.) 2557/2558 ........................................ 6

2.2 මහ කොළඹ ජල හා අපජල කළමනාකරණය වැඩිදියුණු කිරීමේ ආයෝජන වැඩසටහන - 02 කොටස (3029/3030) ........................................................................ 8

2.2.1 කොළඹ මහ නගර සභාව විසින් ඉටුකරනු ලබන කටයුතු ........................................ 9

2.2.2 ජාතික ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලය විසින් සිදුකරනු ලබන ක්‍රියාකාරකම් ................ 10

2.3 මහ කොළඹ ජල හා අපජල කළමනාකරණය වැඩිදියුණු කිරීමේ ආයෝජන වැඩසටහන - 03 කොටස (3348/3349) ........................................................................ 15

2.3.1 කොළඹ මහ නගර සභාව විසින් සිදුකරනු ලබන ක්‍රියාකාරකම් ........................................ 16

2.3.2 ජාතික ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලය විසින් සිදුකරනු ලබන ක්‍රියාකාරකම් ................ 18

2.4 මහ කොළඹ ජල හා අපජල කළමනාකරණය වැඩිදියුණු කිරීමේ ආයෝජන වැඩසටහන – ව්‍යාපෘති 01 (2947/2948) ........................................................................ 20

2.5 මහ කොළඹ ජල හා අපජල කලමනාකරණ වැඩිදියුණු කිරීමේ ආයෝජන වැඩසටහන – ව්‍යාපෘති 02 (අඹතලේ ජල සම්පාදන පද්ධතිය වැඩිදියුණු කිරීම හා බලශක්ති ඉතුරුම් ව්‍යාපෘතිය) ................. 23

2.6 අනුරාධපුර උතුර ජල සම්පාදන ව්‍යාපෘතිය - අදියර 1 ........................................ 28

2.7 අනුරාධපුර උතුර ජල සම්පාදන ව්‍යාපෘතිය -අදියර 2 ........................................ 33

2.8 යාපනය සහ කිළිනොච්චි ජල සම්පාදන හා සනීපාරක්ෂක ව්‍යාපෘතිය ........................................ 35

2.9 නිමැවුම් පදනම් වූ ආධාර ව්‍යාපෘතිය පිළිබඳ ගෝලීය හවුල්කාරිත්වය ........................................ 37

2.10 මහනුවර නගරයේ අපජල කළමනාකරණ ව්‍යාපෘතිය ........................................ 38

2.11 ජල සම්පාදන හා සනීපාරක්ෂක කටයුතු වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය ........................................ 40

2.12 නගර සඳහා සනීපාරක්ෂක හා ස්වස්ථතා ආරම්භක ව්‍යාපෘතිය ........................................ 44

3. මාර්ග ඉදිකිරීම් සහ ප්‍රවාහන අංශය ........................................................................ 46

3.1 ජාතික මාර්ග ජාලයේ ප්‍රධාන පාලම් ඉදිකිරීමේ ව්‍යාපෘතියේ (ප්‍රධාන පාලම් 37 ක් ඉදිකිරීමේ ........ 46

3.2 නව කැළණි පාලම සිට අතුරුගිරිය දක්වා කණු මතින් ඉදිවන අධිවේගී මාර්ග ........................ 50

3.3 ඔපෙක් අරමුදලින් මුල්‍යයනය කරන බස්නාහිර පළාත් මාර්ග සංවර්ධන ව්‍යාපෘතිය .................... 52

3.4 ඔපෙක් අරමුදලින් කොළඹ ජාතික මහා මාර්ග පුනරුත්ථාපනය කිරීම හා වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතියේ 53

3.5 කොන්ක්‍රීට් කණුමත දිවෙන වරාය ප්‍රවේශ මාර්ග ව්‍යාපෘතිය ........................................ 54

3.6 රුවන්පුර අධිවේගී මාර්ග ව්‍යාපෘතිය ........................................ 56

3.7 දක්ෂිණ මාර්ග සම්බන්ධ කෙරෙන ව්‍යාපෘතිය ........................................ 58

3.8 ප්‍රවාහන සම්බන්ධතා සහ වත්කම් කළමණාකරණ ව්‍යාපෘතිය ........................................ 62

3.9 ප්‍රවාහන සම්බන්ධතා සහ වත්කම් කළමණාකරණ ව්‍යාපෘතිය (පළාත් මාර්ග සංවර්ධන සංරචකය)65

3.10 ප්‍රවාහන ව්‍යාපෘති පහසුකම් සැකසීමේ ව්‍යාපෘතිය ........................................ 66

3.10.1 මාර්ග සංවර්ධන අධිකාරිය මගින් සිදුකරනු ලබන කටයුතු ........................................ 66

3.10.2 ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව මගින් සිදුකරනු ලබන කටයුතු ............................................ 68

3.10.3 ශ්‍රී ලංකා වරාය අධිකාරිය මගින් සිදුකරනු ලබන කටයුතු.......................................................... 71

3.11 සැහැල්ලු දුම්රිය සංක්‍රමණ ව්‍යාපෘතිය ........................................................................................ 73

3.12 කොළඹ තදාසන්න දුම්රිය කාර්යක්ෂමතාව වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය ................................... 79

3.13 උතුරු මාර්ග සම්බන්ධ කෙරෙන ව්‍යාපෘතිය (මාර්ග සංවර්ධන අධිකාරි) සංරචකය...................... 82

3.14 උතුරු මාර්ග සම්බන්ධ කෙරෙන ව්‍යාපෘතිය (අතිරේක මූල්‍යනය) පළාත් සංරචකය .................... 83

3.15 ඒකාබද්ධ මාර්ග ආයෝජන වැඩසටහන (අයි-මාර්ග) .............................................................. 84

3.16 දෙවන ඒකාබද්ධ මාර්ග ආයෝජන වැඩසටහනේ (අයි-මාර්ග-II)-............................................ 95

4. විදුලිබල සහ බලශක්ති අංශය ................................................................................................ 108

4.1 හරිත බලශක්ති සංවර්ධන සහ බලශක්ති කාර්යක්ෂමතාවය වැඩිදියුණු කිරීමේ ආයෝජන වැඩසටහනේ (අදියර I)................................................................................................................ 108

4.2 හරිත බලශක්ති සංවර්ධන සහ බලශක්ති කාර්යක්ෂමතාවය වැඩිදියුණු කිරීමේ ආයෝජන වැඩසටහනේ (අදියර II) ............................................................................................................... 113

4.3 විදුලි සැපයුම් ස්ථායීතා ප්‍රවර්ධන සහය ව්‍යාපෘතිය.................................................................. 118

4.4 ලංකා විදුලි (පුද්ගලික) සමාගම මගින් සිදුකරනු ලබන කටයුතු .............................................. 122

4.5 ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය මගින් සිදුකරනු ලබන කටයුතු........................ 126

4.6 මන්නාරම් සුළං බලශක්ති උත්පාදන ව්‍යාපෘතිය ..................................................................... 128

4.7 පියැසි මත සූර්ය බලශක්ති උත්පාදන ණයමාලා ව්‍යාපෘතිය .................................................... 131

5. අධ්‍යාපන හා වෘත්තීය සංවර්ධන අංශය ................................................................................... 132

5.1 නිපුණතා අංශ සංවර්ධන වැඩසටහන....................................................................................... 132

5.2 ශ්‍රී ලංකාවේ වෘත්තීය අධ්‍යාපන හා තාක්ෂණ අංශය සඳහා පෞද්ගලික අංශයේ හා කාන්තා සවිබල ගැන්වීමේ නව්‍ය ප්‍රවේශය.................................................................................................. 143

5.3 පොදු අධ්‍යාපන නවීකරණ ව්‍යාපෘතිය ..................................................................................... 147

5.4 කඩිනම් උසස් අධ්‍යාපන ව්‍යාප්ති හා සංවර්ධන මෙහෙයුම් ව්‍යාපෘතිය (ව්‍යාපෘති සංරචකය)......... 150

5.5 විද්‍යා හා තාක්ෂණ මානව සම්පත් සංවර්ධන ව්‍යාපෘතිය ........................................................ 152

6. කෘෂිකාර්මික අංශය................................................................................................................ 154

6.1 කුඩා කෘෂි ව්‍යාපාර හිමියන්ගේ හවුල් ව්‍යාපාර වැඩසටහන...................................................... 154

6.2 දේශගුණික සුහුරු වාරි කෘෂිකාර්මික ව්‍යාපෘතිය .................................................................... 162

6.3 කුඩා තේ සහ රබර් වතු හිමියන් පුනර්ජීවන ව්‍යාපෘතිය.......................................................... 165

6.5 කෘෂිකාර්මික අංශ නවීකරණ ව්‍යාපෘතිය- 02 කොටස ........ 172

7. සෞඛ්‍ය අංශය ........ 174

7.1 හදිසි ප්‍රතිචාර සහ සෞඛ්‍ය පද්ධති සූදානම වැඩසටහන ........ 174

7.2 ප්‍රාථමික සෞඛ්‍ය සේවා පද්ධතිය ශක්තිමත් කිරීමේ ව්‍යාපෘතිය (සංරචක I සහ II) ........ 176

7.3 සෞඛ්‍ය පද්ධතිය වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය ........ 178

8. නාගරික සංවර්ධන අංශය ........ 181

8.1 පළාත් පාලනය වැඩිදියුණු කිරීමේ ආංශික ව්‍යාපෘතිය ........ 181

8.2 නැගී එන කලාපවල ග්‍රාමීය යටිතල පහසුකම් සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය ........ 186

8.3 ප්‍රදේශිය සංවර්ධන සහය ව්‍යාපෘතිය ........ 187

8.4 යෝජිත නාගරික සංවර්ධන ව්‍යාපෘතියේ පහසුකම් සැපයීමේ ව්‍යපෘතිය ........ 189

8.4.1 පළාත් සභා සහ පළාත් පාලන කටයුතු පිළිබඳ රාජ්‍ය අමාත්‍යාංශය මගින් සිදුකරනු ලබන කටයුතු 190

8.4.2 නාගරික සංවර්ධන, ජල සම්පාදන සහ නිවාස අමාත්‍යාංශය මගින් සිදුකරනු ලබන කටයුතු ........ 192

8.5 උපාය මාර්ගික නගර සංවර්ධන ව්‍යාපෘතිය ........ 194

8.6 අනුරාධපුර ඒකාබද්ධ නාගරික සංවර්ධන ව්‍යාපෘතිය ........ 202

8.7 කොළඹ අගනගර ආශ්‍රිත නාගරික සංවර්ධන ව්‍යාපෘතිය ........ 205

9. වෙනත් අංශ ........ 211

9.1 ව්‍යාපෘති සකස් කිරීමේ පහසුකම වැඩසටහන ........ 211

9.2 නායයෑම් අවදානම අවම කිරිමේ ව්‍යාපෘතිය ........ 212

9.3 සමාජ ආරක්ෂණ ජාල ව්‍යාපෘතිය ........ 214

9.4 මූල්‍ය අංශය නවීකරණ ව්‍යාපෘතිය ........ 216

9.5 පරිසර පද්ධති සංරක්ෂණ හා කළමනාකරණ ව්‍යාපෘතිය ........ 218

9.6 දේශගුණයට ඔරොත්තු හැකියාව වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය ........ 221

9.7 දේශගුණයට ඔරොත්තු දීම වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය (අතිරේක මූල්‍යකරණය) ........ 224

9.8 මහවැලි ජල සුරක්ෂිතතා ආයෝජන වැඩසටහන - අධියර 01 ........ 225

9.9 මහවැලි ජල සුරක්ෂිතතා ආයෝජන වැඩසටහන - අධියර 02 ........ 229

# විදේශ මූල්‍යයන ව්‍යාපෘති පිළිබඳ ත්‍රෛවාර්ෂික වාර්තාව

## 1. ශ්‍රී ලංකාවේ විදේශ අරමුදල් ව්‍යාපෘති වල පසුබිම

1.1 ශ්‍රී ලංකාව තුළ ශක්තිමත් අපනයන ආදායමක් නොමැති අතර දේශීය වෙළඳපල තුළ හා දේශීය කර්මාන්ත වලින් නිපදවන භාණ්ඩ සඳහා අවශ්‍ය ඛනිජ සම්පත් හා ගුණාත්මක නිෂ්පාදන නොමැතිවීම හේතුවෙන් ලෝක වෙළඳපල තුළ ශ්‍රී ලාංකික අපනයන සඳහා අනම්‍ය ඉල්ලුමක් ද නොමැත . තවද, ශ්‍රී ලංකාව සුඛෝපබෝගී ජීවන රටාවකට හුරුවී ඇත. එනිසා, රට තුළ දෛනික අවශ්‍යතා ඉටු කරගැනීම සඳහා භාණ්ඩ හා සේවා රැසක් ආනයනය කිරීමට සිදුවේ.

1.2 ශ්‍රී ලංකාවේ ප්‍රධාන අපනයන ආදායම වන්නේ, තේ, ඇගළුම්, කුළුබඩු වැනි නිෂ්පාදන හා විවිධ සේවා සැපයීම්ය. කෙසේවෙතත්, වර්ෂ ගණනාවක සිට මෙම ආදායම පාරිභෝගික භාණ්ඩ හා සේවා මෙරටට ආනයනය කිරීම සඳහා ප්‍රමාණවත් නොවේ. එබැවින් වර්ෂ ගණනාවක සිට ශ්‍රී ලංකාවේ වෙළඳ ගිණුම්වල හිඟයක් පවතී. එනිසා, පාරිභෝගික භාණ්ඩ හා සේවා ආනයනය කිරීමට පවා රටේ අපනයන ආදායම ප්‍රමාණවත් නොවීය.

1.3 කෙසේ වෙතත්, ප්‍රාග්ධන වියදම රටක යටිතල පහසුකම් සංවර්ධනය සඳහා අත්‍යවශ්‍ය අංගයක් වන්නේ රටේ ජනතාවගේ ජීවන තත්ත්වය ඉහළ නැංවීම සඳහා රටේ යටිතල පහසුකම් වන විදුලිය, ජලය, මහාමාර්ග, සෞඛ්‍යය, අධ්‍යාපනය යන අංශවල සංවර්ධනය වැදගත් වන බැවිනි. එසේම, රට තුළ ආයෝජකයන්ගේ නිෂ්පාදිත සඳහා අවශ්‍ය යටිතල පහසුකම් සංවර්ධනය කළයුතු අතර ඒ සඳහා අවශ්‍ය අනෙකුත් පහසුකම් ලබාදී රටේ දළ දේශීය නිෂ්පාදිතයට ඔවුන්ගේ දායකත්වය ලබාගත යුතුය. එනිසා, රජයට අවශ්‍ය ප්‍රාග්ධනය විදේශ ණය ලෙස ලබාගෙන රටේ යටිතල පහසුකම් සංවර්ධනය සඳහා ප්‍රදානය කළ යුතුය. මෙම විදේශ මූල්‍යයන ව්‍යාපෘති ආදළ අමාත්‍යාංශය හා ඊට ආසන්නතම ක්‍රියාත්මක කරන ආයතන නමින් ක්‍රියාත්මක වේ. මෙම ව්‍යපෘති මඟින් රටේ ප්‍රාග්ධන වියදම් සඳහා ලබාගන්නා විදේශ ණය සහ ප්‍රදාන අදාළ ව්‍යපෘති තුළින් අපේක්ෂිත ප්‍රතිඵල ලබාගැනීම සඳහා නිසි ලෙස සැලසුම් කර ක්‍රියාත්මක කළ යුතුය.

1.4 නමුත්, මෙම ව්‍යාපෘති තුළින් අපේක්ෂිත අරමුණු ඉටුකර නොගෙන රටේ විදේශ ණය ශීඝ්‍රයෙන් ඉහළ යන බවට නිරන්තරයෙන් කතාබහට ලක්වන අතර මීට හේතුව වන්නේ අදාළ අමාත්‍යාංශවල හා එහි ක්‍රියාත්මක ආයතනවල මෙන්ම මෙම ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා පිහිටුවා ඇති ව්‍යාපෘති අධීක්ෂණ ඒකකවල දුර්වලතාවයයි.

1.5 මේ සඳහා ප්‍රධාන වශයෙන්ම ඉහත ආයතන විසින් අදාළ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේදී ඇතිවන පහත සඳහන් හේතු බලපා ඇත.

i. ව්‍යාපෘතිය සඳහා නිසි සැලසුම් නොමැති වීම.

ii. ණය හෝ ප්‍රදාන ලබාගැනීමට පෙර ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය මූලික කටයුතු සම්පූර්ණ කිරීමට කටයුතු නොකිරීම.

iii. ව්‍යාපෘති කටයුතු සඳහා හෝ ව්‍යාපෘති ස්ථාපනය කිරීම සම්බන්ධ රාජ්‍ය ආයතන අතර සම්බන්ධීකරණයක් නොමැති වීම.

iv. ඉඩම් අත්පත්කරගැනීම් ආදිය ප්‍රමාදවීම නිසා කොන්ත්‍රාත්කරුවන්ට ඉදිකිරීම් ලබාදීම ප්‍රමාද වීම.

v. ව්‍යාපෘති සඳහා සුදුසුකම් ලත් නිලධාරීන් පත් නොකිරීම.

vi. දේශගුණය හා දේශගුණික තත්ත්වයන් පිළිබඳ වැරදි අනාවැකි හේතුවෙන් ව්‍යාපෘති ක්‍රියාකාරකම් සිදුකිරීම අපහසු වීම.

vii. ව්‍යාපෘති සඳහා රාජ්‍ය දායකත්වය නිසි අවස්ථාවේදී නොලැබීම හේතුවෙන් විදේශ අරමුදල් නැවත ලබාගැනීම ප්‍රමාද වීම.

1.6 ඉහත හේතු නිසා විදේශ ආයෝජන ව්‍යාපෘති අපේක්ෂිත දිනවලදී නිම කිරීමට නොහැකි වන අතර එම හේතුව නිසා විදේශ මූල්‍යායන ව්‍යාපෘතිවල අරමුදල් යෙදවීම ඵල රහිත වේ. ඒ අනුව,

i. අපේක්ෂිත පරිදි විදේශ අරමුදල් ලබා නොදීම හේතුවෙන් අමතර පොළී සහ විය පැහැදම් ගාස්තු ගෙවීමට සිදුවීම.

ii. අපේක්ෂිත දිනවලදී නිම කිරීමට නෙහැකි වීම හේතුවෙන් ඉදිකිරීම් නිම කිරීමට භාවිතා කරන යෙදවුම්වල පිරිවැය ඉහළ යාම නිසා ව්‍යාපෘති පිරිවැය වැඩිවීම.

iii. ව්‍යාපෘතියේ අපේක්ෂිත අරමුණු නියමිත වේලාවට සාක්ෂාත් කරගැනීමට නොහැකිවීම හා ව්‍යාපෘති තුළින් ප්‍රතිලාභ අපේක්ෂා කරන ජනතාවගේ අවශ්‍යතා ඉටු නොවීම.

iv. අදාළ ව්‍යාපෘති තුළින් රජය බලාපොරොත්තු වූ අරමුණු ඉටුකරගැනීමට නෙහැකිවීම.

v. අදාළ ව්‍යාපෘති නියමිත වේලාවට නිම නොකිරීම හේතුවෙන් නිෂ්පාදන හෝ සැපයුම් හෝ සේවා අඩාල වීම.

vi. ව්‍යාපෘති ප්‍රමාදය හේතුවෙන් පරිසරයට සිදුවන බලපෑම වැඩිවීම.

vii. ව්‍යාපෘති ප්‍රමාදය හේතුවෙන් ව්‍යාපෘති අධීක්ෂණ ඒකක පවත්වාගෙන යාමට අමතර මුදලක් ගෙවීමට සිදුවීම.

viii. කොන්ත්‍රාත්කරුවන් සඳහා අමතර මුදලක් ගෙවීමට සිදුවීම.

ix. විදේශ විනිමය අනුපාත වෙනස්වීම නිසා ව්‍යාපෘති පරිවැය විශාල ලෙස වැඩිවීම.

x. රට පිළිබඳ විශ්වාසය නෙමැතිවීම නිසා විදේශ ණය දෙනු ලබන ආයතන රට තුළ ආයෝජනයෙන් ඉවත්වීම.

1.7 විදේශ අරමුදල් සපයනු ලබන ආයතන විසින් 2018,2019 හා 2020 යන වර්ෂ වලදී පිළිවෙලින් රු. මිලියන 209,889ක්, රු. මිලියන 152,704ක් හා රු. මිලියන 507,388ක් විදේශ ණය වශයෙන් ලබාදී ඇත. මෙම විදේශ අරමුදල් ශ්‍රී ලංකාවේ ස්ථාපිත ව්‍යාපෘති සඳහා පහත පරිදි වෙන් කරන ලදී. (අංක 01 වගුව)

1.8 ඉහත ව්‍යාපෘති දිවයිනේ ප්‍රධාන අංශ 8ක් යටතේ ක්‍රියාත්මක වන අතර අරමුදල් සපයන ආයතනයේ නම, ලබාදී ඇති විදේශ අරමුදල් ප්‍රමාණය, ව්‍යාපෘතිවල ප්‍රධාන අරමුණු හා එම අංශ යටතේ පසුගිය වසර 03 තුළ නොවිසඳුණු විගණන නිරීක්ෂණ පහත පරිදි වේ.

## 2. ජල සම්පාදන හා සනීපාරක්ෂක අංශය

### 2.1 මහ කොළඹ අපජල කළමනාකරණ ව්‍යාපෘතිය (කො.න.ස.) 2557/2558

(i) සාගර හා අභ්‍යන්තර ජලයේ ගුණාත්මකභාවය වැඩිදියුණු කිරීම හා සනීපාරක්ෂක තත්ත්වය වැඩිදියුණු කිරීම තුළින් මහ කොළඹ ප්‍රදේශයේ මිලියන 1.5ක් වූ නාගරික හා උප නාගරික පදිංචිකරුවන්ගේ නාගරික පරිසරය හා මහජන සෞඛ්‍ය තත්ත්වය වැඩිදියුණු කිරීම සඳහා මහ කොළඹ අපජල කළමනාකරණ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කෙරේ.

(ii) ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත පිරිවැය රු. මිලියන 12,597.11ක් හෙවත් ඇ.එ.ජ. ඩොලර් මිලියන 110.24ක් වන අතර ඉන් රු. මිලියන 10,783.65 ක් හෙවත් ඇ.එ.ජ. ඩොලර් මිලියන 94.37 ක් ආසියානු සංවර්ධන බැංකුව මඟින් මූල්‍යයනය කිරීමට එකඟ වී ඇත.

(iii) මෙම ව්‍යාපෘතිය 2010 අප්‍රේල් 09 වන දින ආරම්භ කර ඇති අතර 2014 දෙසැම්බර් 31 දින වනවිට අවසන් කිරීමට නියමිතව තිබුණි. නමුත්, ව්‍යාපෘතියේ ක්‍රියාකාරකම්වල මන්දගාමී ප්‍රගතිය හේතුවෙන් ව්‍යාපෘති කාලය 2021 දෙසැම්බර් 31 දක්වා දීර්ඝ කර තිබුණි.

(iv) එහි ප්‍රතිඵලයක් ලෙස ප්‍රදේශයේ වෙසෙන ජනතාවගේ සනීපාරක්ෂාව හා සනීපාරක්ෂක කටයුතු වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතියේ අරමුණු ඉටුකරගැනීමට නොහැකි විය.

(v) ව්‍යාපෘතිය සම්බන්ධයෙන් 2018,2019 හා 2020 වර්ෂ සඳහා ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන සඳහා විගණකාධිපති විසින් තත්ත්වාගණනය නොකළ මතයක් දක්වා තිබුණි. කෙසේවෙතත්, ව්‍යාපෘතියේ කාර්යසාධනය සම්බන්ධයෙන් මෙතෙක් විසඳී නොමැති ගැටළු කිහිපයක් පහත දැක්වේ.

| | විගණන නිරීක්ෂණය | විගණකාධිපති නිර්දේශ | ව්‍යාපෘතිය විසින් ගනු ලැබූ වැළැක්වීමේ ක්‍රියාමාර්ග | වර්තමාන තත්ත්වය |
|---|---|---|---|---|
| (අ) | 2010 අප්‍රේල් 09 වන දින ව්‍යාපෘතිය ආරම්භ කිරීමට නියමිතව තිබූ අතර 2015 ජුනි 30 දින අවසන් කිරීමට නියමිතව තිබුණි. කෙසේ වෙතත්, ව්‍යාපෘතිය අවසන් කළයුතු දිනය 2021 දෙසැම්බර් 31 දක්වා අවස්ථා 04ක දී දීර්ඝ කර තිබුණි. මෙම තත්ත්වය අනුව ව්‍යාපෘතියේ පොම්පාගාර 08 ක් ඉදිකිරීම, වනාතමුල්ල හා විස්ට්වෙකෙ හි ප්‍රධාන ක්‍රියාකාරකම් හා වනාතමුල්ල භූගත මලාපවාහන ජාලය වැඩිදියුණු කිරීම යනාදියෙහි මන්දගාමී භෞතික කාර්යසාධනයක් වාර්තා කර තිබුණි. | ව්‍යාපෘතියේ කාලසීමාව අවසන් වීමට පෙර ව්‍යාපෘතියේ කටයුතු කඩිනමින් අවසන් කිරීමට කටයුතු කළ යුතුය. | කාර්යසාධන දත්ත සමඟ එකඟ වේ. 2021 වර්ෂයට පෙර නිම කිරීම සඳහා සැලසුම් කර ඇත. | පොම්පාගාර 03ක් (බම්බලපිටිය, කොම්පඤ්ඤවීදිය, සීඑස්3) කොළඹ මහනගර සභාවට භාරදී ක්‍රියාත්මක කරමින් පැවතුණි.<br>• ඉතිරි නල මාර්ග සඳහා මෙතෙක් අවසර ලැබී නොමැත.<br>• දැනට ඉතිරිව පවතින මීටර් 240 ක භූගත මලාපාවහන පද්ධතියෙහි වැඩ කොන්ත්‍රාත්කරු වෙත පවරා ඇති අතර මීටර් 197කට ආසන්න නල එළීම් කටයුතු 2021 දෙසැම්බර් 31 දින වනවිට අවසන් කර ඇත. |

| | | | | |
|---|---|---|---|---|
| (ආ) | ප්‍රතිපත්ති ආධාරක කණ්ඩායමේ නිලධාරීන් හත් දෙනෙකුට 2020 වර්ෂය තුළ රු. මිලියන 5.01ක් ගෙවා ඇති අතර අවස්ථා දෙකකදී පමණක් රැස්වීම් දෙකක් පවත්වා තිබුණි. 2020 දෙසැම්බර් 31 දින වනවිට ව්‍යාපෘතිය අවසන් කර මාස 66ක් ගතවී තිබුණද, ව්‍යාපෘතිය ආරම්භයේ සිට 2020 දෙසැම්බර් 31 දින දක්වා ප්‍රතිපත්ති ආධාරක කණ්ඩායම් වෙත රු. මිලියන 38.73ක මුදලක් ගෙවා තිබූ අතර ව්‍යාපෘතිය සඳහා ප්‍රතිපත්ති ආධාරක කණ්ඩායමේ දායකත්වය ඇගයීමට ලක් කර නොතිබුණි. | ව්‍යාපෘතියේ අරමුණු ඉටුකරගැනීම සඳහා සහ කාර්යසාධනය ඇගයීම සඳහා දායක විය යුතුය. | කාර්යසාධනය ඇගයීමේ ක්‍රම අනුගමනය කිරීමේ හැකියාවක් නොමැත. | ප්‍රතිපත්ති ආධාරක කණ්ඩායමේ නිලධාරීන් හත් දෙනෙකුට 2021 වර්ෂයේදී රු. මිලයන 2.5 ක් ගෙවා තිබූ අතර එක් රැස්වීමක් පවත්වා තිබුණි. |
| (ඇ) | 2020 දෙසැම්බර් 31 දින වනවිට උපදේශන සේවා සඳහා රු. මිලියන 1,066.14ක් ගෙවා තිබුණි. කෙසේවෙතත්, ණය ගිවිසුමට අනුව උපදේශන සේවා සඳහා වෙන් කර ඇති මුදල රු. මිලියන 935.87කි. | ව්‍යාපෘති කාලසීමාව අවසන් වීමට පෙර ව්‍යාපෘතියේ කටයුතු අවසන් කිරීමට අවශ්‍ය කඩිනම් ක්‍රියාමාර්ග ගත යුතුය. | උපදේශන සඳහා සැලකිය යුතු පිරිවැයක් දරා ඇති බව පිළිගන්නා ලදී. | උපදේශන සේවා සඳහා 2021 දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු මුදල රු. මිලියන 1,108 කි. |

### 2.2 මහ කොළඹ ජල හා අපජල කළමනාකරණය වැඩිදියුණු කිරීමේ ආයෝජන වැඩසටහන - 02 කොටස (3029/3030)

(i) මහ කොළඹ ප්‍රදේශයේ ජල සම්පාදන හා අපජල සේවාවල කාර්යක්ෂමතාවය හා මූල්‍ය තිරසරභාවය වැඩිදියුණු කිරීම සඳහා මහ කොළඹ ජල හා අපජල කළමනාකරණය වැඩිදියුණු කිරීමේ ආයෝජන වැඩසටහන - 02 කොටස ක්‍රියාත්මක කෙරේ.

(ii) ණය ගිවිසුමට අනුව ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු. මිලියන 15,340ක් හෙවත් ඇ.එ.ජ. ඩොලර් මිලියන 118ක් විය. ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැයෙන් ඇ.එ.ජ.

ඩොලර් මිලියන 107.05ක් හෙවත් රු. මිලියන 13,917ක් ජාතික ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලය විසින් ඉටු කිරීමට අපේක්ෂිත කාර්යයන් සඳහා වෙන්කර ඇති අතර ඇ.එ.ජ. ඩොලර් මිලියන 9.44ක් හෙවත් රු. මිලියන 1,230.60ක් කොළඹ මහ නගර සභාව විසින් ඉටුකිරීමට අපේක්ෂිත කාර්යයන් සඳහා වෙන් කර තිබුණි.

### *2.2.1 කොළඹ මහ නගර සභාව විසින් ඉටුකරනු ලබන කටයුතු*

(i) ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත පිරිවැය ඇ.එ.ජ. ඩොලර් මිලියන 9.44ක් හෙවත් රු. මිලියන 1,230.66 ක් වේ. ඉන් ඇ.එ.ජ. ඩොලර් මිලියන 8.00ක් හෙවත් රු. මිලියන 1,042.88ක මුදලක් ආසියානු සංවර්ධන බැංකුව විසින් මූල්‍යායනය කිරීමට එකඟ වී ඇත.

(ii) 2014 සැප්තැම්බර් 23 දින ව්‍යාපෘතියේ කටයුතු ආරම්භ කර 2019 ජුනි 30 දින වනවිට අවසන් කිරීමට නියමිතව තිබුණි. කෙසේවෙතත්, 2022 දෙසැම්බර් 31 දින දක්වා ව්‍යාපෘති කාලය දීර්ඝ කර තිබුණි.

(iii) ව්‍යාපෘතිය සම්බන්ධයෙන් 2018,2019 හා 2020 වර්ෂ සඳහා ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන සඳහා විගණකාධිපති විසින් තත්ත්වාගණනය නොකළ මතයක් දක්වා තිබුණි. කෙසේවෙතත්, ව්‍යාපෘතියේ ක්‍රියාකාරිත්වය සම්බන්ධයෙන් මෙතෙක් නොවිසඳී පැවතුණු ගැටලු කීපයක් පහත දැක්වේ.

| | විගණන නිරීක්ෂණය | විගණකාධිපති නිර්දේශ | ව්‍යාපෘතිය විසින් ගනු ලැබූ වැළැක්වීමේ ක්‍රියාමාර්ග | වර්තමාන තත්ත්වය |
|---|---|---|---|---|
| (අ) | සැලසුම් අධීක්ෂණ ආයතනික සංවර්ධන උපදේශන කොන්ත්‍රාත්තුව වසර 04ක් ඇතුළත නිම කිරීම සඳහා 2016 අප්‍රේල් 25 දින රු. මිලියන 482.43ක පිරිවැයකට ප්‍රදානය කර තිබුණි. කෙසේ වෙතත්, | දීර්ඝ කරන ලද ව්‍යාපෘති කාලය අවසන්වීමට පෙර ව්‍යාපෘතියේ ක්‍රියාකාරකම් කඩිනමින් අවසන් කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. | දීර්ඝ කරන ලද කොන්ත්‍රාත් කාලයට පෙර නිම කිරීමට සැලසුම් කර ඇත. | 2020 අප්‍රේල් 25 සිට 2022 ඔක්තෝබර් 24 දින දක්වා දීර්ඝ කිරීම 2021 අප්‍රේල් 05 දින අත්සන් කර ඇත. |

| | | | | |
|---|---|---|---|---|
| | කොන්ත්‍රාත්තුවේ ප්‍රගතිය 2020 දෙසැම්බර් 31 දින වනවිට සියයට 100ක ප්‍රගතියට සාපේක්ෂව සියයට 55ක් විය. | | | |
| (ආ) | කි.මී 97.2ක් වූ මලාපවාහන පද්ධතිය සම්බන්ධ සීසීටීවී කොන්ත්‍රාත්තුවේ කොන්දේසි සහිත තක්සේරු ලංසු තැබීමේ ක්‍රියාවලිය 2016 වර්ෂයේදී ආරම්භ කර තිබුණි. කෙසේවෙතත්, 2020 දෙසැම්බර් 31 දක්වා එය ප්‍රදානය කර නොතිබුණි. | කොන්ත්‍රාත්තුව ලබාදීම සඳහා කඩිනම් පියවර ගත යුතුය. | 3 වන ලංසු තැබීමේ ප්‍රසම්පාදන ක්‍රියාවලිය අවසන් කර ඇති අතර කොන්ත්‍රාත්තුව ප්‍රදානය කිරීම සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය අපේක්ෂා කෙරේ. | 2021 දෙසැම්බර් 31 දින දක්වා කොන්ත්‍රාත්තුව ප්‍රදානය කර නොතිබුණි. |

### *2.2.2 ජාතික ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලය විසින් සිදුකරනු ලබන ක්‍රියාකාරකම්*

(i) ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත පිරිවැය ඇ.එ.ජ ඩොලර් මිලියන 107.05ක් හෙවත් රු. මිලියන 13,917ක් වන අතර ඉන් ඇ.එ.ජ. ඩොලර් මිලියන 79.95ක් හෙවත් රු. මිලියන 10,394ක් ආසියානු සංවර්ධන බැංකුව මගින් ලබාදීමට එකඟ වී තිබුණි.

(ii) ව්‍යාපෘතිය 2014 සැප්තැම්බර් 03 දින ආරම්භ කර 2019 ජුනි 30 දින වනවිට අවසන් කිරීමට නියමිතව තිබුණි. කෙසේවෙතත්, ව්‍යාපෘති කාලය 2022 ඔක්තෝබර් 15 දින දක්වා දීර්ඝ කර ඇත.

(iii) ව්‍යාපෘතිය සම්බන්ධයෙන් 2018,2019 හා 2020 වර්ෂ සඳහා ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන සඳහා විගණකාධිපති විසින් තත්ත්වාගණනය කළ මතයක් ඉදිරිපත් කර තිබුණි. කෙසේ වෙතත්, ව්‍යාපෘතියේ කාර්යසාධනය සම්බන්ධයෙන් මෙතෙක් නොවිසඳී ඇති ගැටළු කිහිපයක් පහත දැක්වේ.

| | විගණන නිරීක්ෂණය | විගණකාධිපති නිර්දේශ | ව්‍යාපෘතිය විසින් ගනු ලැබූ වැළැක්වීමේ ක්‍රියාමාර්ග | වර්තමාන තත්ත්වය |
|---|---|---|---|---|
| (අ) | ව්‍යාපෘතිය ආරම්භ කර වසර 6ක් ගතවී ඇතත් ව්‍යාපෘති කාර්යයන් වූ නල එළීමේ කටයුතු මීටර් 318,722න් සියයට 66.74ක් හා සැලසුම් කරන ලද නිවාස සම්බන්ධතා මාරුකිරීම් 41,484කින් සියයට 16.65ක් පමණක් 2020 දෙසැම්බර් 31 දිනවනවිට අවසන් කර තිබුණි. | කාර්යයන් කඩිනම් කිරීමට හා කොන්ත්‍රාත්කරුගේ ප්‍රගතිය සමීප සුපරීක්ෂණය සඳහා උපදෙස් දිය යුතුය. | පොලීසිය, කොළඹ නගර සභාව, ශ්‍රී ලංකා ටෙලිකොම් යනාදී වෙනත් ආයතනවල අනුමැතිය ලබාගැනීම කඩිනම් කිරීම සඳහා කලින් කලට දැනුවත් කිරීමේ වැඩසටහන් හා රැස්වීම් පවත්වන ලදී. කාර්යයන් කඩිනම් කිරීමට හා කොන්ත්‍රාත්කරුගේ ප්‍රගතිය සමීපව නිරීක්ෂණය කිරීමට උපදෙස් දිය යුතුය. | ව්‍යාපෘතිය අවසන් කර නොතිබූ අතර ව්‍යාපෘතියේ අපේක්ෂිත ප්‍රතිලාභ ජනතාව වෙත ප්‍රමාණවත් පරිදි ලැබී නොතිබුණි. |
| (ආ) | 2020 දෙසැම්බර් 31 දින වනවිට ව්‍යාපෘතිය ආරම්භ කළ දින සිට වසර 06ක් ගතවී ඇතත්, ඉදිකිරීම සඳහා ඉඩම් නොමැතිවීම හේතුවෙන් පාමංකඩ ප්‍රාදේශීය ඉංජිනේරු කාර්යාලය විසින් ඉදිකිරීම් කටයුතු ආරම්භ කර නොතිබුණි. | ඉඩම් අත්පත් කරගැනීමේ කටයුතු කඩිනම් කර ප්‍රමාදයකින් තොරව ඉදිකිරීම් ආරම්භ කිරීමට කටයුතු කළ යුතුය. | මිල්කෝ සමාගමෙන් නව ඉඩමක් ලබාගැනීමේ ක්‍රියාවලිය සිදුවෙමින් පවතී. සැලසුම් කටයුතු අවසන් කර ඇත. ලේඛන ඇගයීම් සිදුකර ඇත. | ව්‍යාපාර සම්පත් දෙපාර්තමේන්තු වේ අනුමැතිය අපේක්ෂා කෙරේ. |

| | | | | |
|---|---|---|---|---|
| (ඇ) | 2019 මාර්තු 15 දිනැති කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 01/2019 2.3.2 වගන්තිය අනුව ඵලදායී ව්‍යාපෘති කළමනාකරණය සහතික කිරීම සඳහා ව්‍යාපෘති අධ්‍යක්ෂවරයා ව්‍යාපෘති ක්‍රියාකාරකම්වල නිරත වී නොතිබුණි. | ව්‍යාපෘති කටයුතු කඩිනම් කිරීම සඳහා ව්‍යාපෘති අධ්‍යක්ෂවරයාගේ පූර්ණ කාලීන සේවය ලබාගැනීමට කටයුතු කළ යුතුය. | කළමනාකරණය විසින් අවශ්‍ය පියවර ගනු ඇත. | ව්‍යාපෘතිය අවසන් කර ඇති බැවින් කාර්යය සියයට 82ක් අවසන් කර ඇත. |
| (ඇ) | ජාතික ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලය සහ කොළඹ මහ නගර සභාව විසින් ක්‍රියාත්මක කරන ලද අංක 3030 දරන ණය සඳහා, ණය ලබාදීමේ නියෝජිතායතනය විසින් අය කරන ලද ඇ.එ.ජ. ඩොලර් 513,119ක් හෙවත් රු. මිලියන 79.64ක පොලී ගාස්තු 2020 දෙසැම්බර් 31 දක්වා ක්‍රියාත්මක කරනු ලබන ආයතන දෙක අතර බෙදා වෙන්කර නොතිබුණි. එහි ප්‍රතිඵලයක් වශයෙන් වෙන් නොකළ ප්‍රමාණයෙන් ණය මුදල් අඩුවෙන් දක්වා තිබුණි. | ණයදීමේ නියෝජිතායතනය විසින් ඍජුවම අයකරන ලද අදාළ පිරිවැය වසර අවසානයේදී භාවිතා කළ ණය ප්‍රමාණය දැක්වෙන පරිදි ගිණුම් වෙත ගෙන ආ යුතුය. | කොළඹ මහ නගර සභාව හා ජාතික ජල සම්පාදන හා ජලපවාහන මණ්ඩලය සමඟ එක්ව පොලී සහ විය පැහැදම් ගාස්තු වෙන් කිරීම සඳහා නිසි යාන්ත්‍රණයක් සකස් කරනු ලබන අතර 2021 වර්ෂයේ සිට ගිණුම් පොත්වල ගිණුම්ගත කරනු ලැබේ. | මෙතෙක් විසඳී නොමැත. |
| (ඉ) | පද්ධති ප්‍රතිස්ථාපනය යටතේ මාර්ග අවසරයට අදාළව ආපසු ගෙවිය හැකි ආරක්ෂණ තැන්පතු මුදල් රු. මිලියන | ආපසු ගෙවිය හැකි තැන්පතු කටයුතු ණය ක්‍රියාවලිය යටතේ සිදු නොකළ | ව්‍යාපෘති ණය අරමුදල් හා ශ්‍රී ලංකා රාජ්‍ය ආදායම හැර ලද අරමුදල් රැස්කර | මෙතෙක් විසඳී නොමැත. |

| | | | | |
|---|---|---|---|---|
| | 60.53ක් කොළඹ මහ නගර සභාවට ගෙවා ඇති අතර 2020 දෙසැම්බර් 31 දක්වා කොළඹ නගර බටහිර කොන්ත්‍රාත්තුවේ (අයිසීබී 03) ආදායම් නොලබන ජලයේ අගය අඩු කිරීමට එයින් රු. මිලියන 3.78ක් සමාලෝචිත වර්ෂය තුළ ලැබී ඇති අතර එය මහා භාණ්ඩාගාරයට පැවරීම වෙනුවට ජාතික ජල සම්පදන හා ජලාපවාහන මණ්ඩලය වෙත භාරදී ඇත. | යුතුය. ව්‍යාපෘතිය අවසානයේ එවැනි තැන්පතු පවතී නම් ඉතිරිය භාවිතා නොකළ ණය මුදල් ලෙස භාණ්ඩාගාරයට පැවරිය යුතුය. | තබාගැනීමට හෝ භාවිතා කිරීමට නොහැකි බැවින් ආපසු ගෙවීම් ජාතික ජල සම්පාදන හා ජලපවාහන මණ්ඩලය වෙත යවනු ලැබේ. ව්‍යාපෘතිය තුළින් විගණකවරුන් අවධාරණය කරන කරුණු කළමනාකාරිත්වයට දැනුම් දෙන අතර ඒ සම්බන්ධයෙන් විගණකවරුන්ව දැනුවත් කරනු ඇත. | |
| (ඊ) | 2017 පෙබරවාරි 22 දින අයිසීබී 04 කොන්ත්‍රාත්තුවට දේශීය සංරචකය යටතේ රු. මිලියන 577.67 ක් සහ විදේශීය සංරචකය යටතේ ඇ.එ.ජ. ඩොලර් මිලියන 4.15ක් ලෙස අරම්භක අත්තිකාරම් ගෙවා තිබුණද, කොන්ත්‍රාත්කරුගේ දුර්වල භෞතික හා මූල්‍ය ප්‍රගතිය හේතුවෙන් මාස 48ක ව්‍යාපෘති කාලයෙන් මාස 42ක් ගතවූ පසුවද කිසිදු මුදලක් අයකරගෙන නොතිබුණි. | නව ආවරණ සැලැස්ම ක්‍රියාත්මක කිරීමට කඩිනම් පියවර ගත යුතුය. | අත්තිකාරම් ගෙවීම් ආපසු අයකරගැනීම සඳහා නව ක්‍රමක්ෂය අනුපාතයක් සහිත ව ආවරණ සැලැස්මක් ලැබුණි. | කොන්ත්‍රාත්තුවේ කොන්දේසිවලට අනුව ඉතිරිකිරීම් උපයෝජනය ඇතුළු කාර්යයන් වලින් නව ක්‍රමක්ෂය අනුපාතයක් සහිතව අත්තිකාරම් ගෙවීමට හා අය කරගැනීමට දෙපාර්ශවයම එකඟ වී ඇත. |

| | | | | |
|---|---|---|---|---|
| (උ) | ණය ගිවිසුමට අනුව 2019 ජුනි 30 දින ව්‍යාපෘතිය අවසන් කිරීමට නියමිතව තිබුණි. ව්‍යාපෘතියේ දුර්වල ක්‍රියාකාරිත්වයේ ප්‍රතිඵලයක් ලෙස ණය දෙනු ලබන නියෝජිතායතනය විසින් ලබාදුන් ඇ.එ.ජ ඩොලර් 79.95ක මුළු ප්‍රතිපාදනයෙන් ඇ. ඩොලර් මිලියන 44.38ක් හෙවත් රු. මිලියන 7,413.25ක් එනම්, සියයට 55.5ක් පමණක් 2021 දෙසැම්බර් 31 දින වනවිට උපයෝජනය කර තිබුණි. | දීර්ඝ කරන ලද කාලය තුළ ව්‍යාපෘතිය අවසන් කිරීමටත් කොන්ත්‍රාත්කරුවන් ගේ ප්‍රගතිය සමීප සුපරීක්ෂණයටත් කටයුතු කළ යුතුය. | මිලිමීටර් 1200 “ජුබිලි රේඛාව” සඳහා පැකේජ 4හි ඉතුරුම් භාවිතා කිරීමට අනුමැතිය ලැබී ඇති අතර දැනටමත් එය ක්‍රියාත්මක කර ඇත. | දීර්ඝ කරන ලද කාලසීමාව තුළ ව්‍යාපෘතිය නිම කිරීමට සියලු කටයුතු සූදානම් කර ඇත. |
| (ඌ) | අයිසීබී- 03 කොන්ත්‍රාත්තුව යටතේ මාර්ග 15ක කාපට් කිරීම් කටයුතු 2021 දෙසැම්බර් 31 දින වනවිට මාස 01 සිට මාස 18ක් දක්වා කාලසීමාවක් තුළ අවසන් කර කොළඹ මහ නගර සභාව වෙත භාරදී තිබුණි. කෙසේවෙතත්, 2021 මාර්තු 31 දින දක්වා කොළඹ මහ නගර සභාවෙන් රු. මිලියන 5.42 ක් වූ තැන්පතුව ආපසු ලබාගැනීමට ඉල්ලීම් කර නොතිබුණි. | තැන්පතු මුදල් ආපසු ලබාගැනීමට කඩිනම් පියවර ගත යුතුය. | ආපසු ගෙවීම් පියවීමේදී කොළඹ මහ නගර සභාව තුළ සැලකිය යුතු ප්‍රමාදයක් පවතී. ආපසු ගෙවීම් ක්‍රියාවලිය කඩිනම් කිරීම සඳහා කොළඹ මහ නගර සභාව සමඟ අඛණ්ඩ සම්බන්ධීකරණයක් පවත්වා ගනී. | තවදුරටත් ප්‍රමාදයන් පවතී. |
| (එ) | අයිසීබී-04 කොන්ත්‍රාත්තුව යටතේ මාර්ග 32ක් කාපට් කිරීමේ කටයුතු 2020 | ආපසු ගෙවීම් ක්‍රියාවලිය කඩිනම් කිරීම සඳහා පියවර | තැන්පතු ලබාගැනීම සඳහා සෑම | මේ සම්බන්ධයෙන් දැනුවත් කිරීමේ |

| | | | |
|---|---|---|---|
| අගෝස්තු 30 දින අවසන් කර කොළඹ මහ නගර සභාව වෙත භාරදී ඇති අතර, 2021 මාර්තු 31 දින දක්වා තැන්පතු මුදල් ලබාගැනීමට කටයුතු කර නොතිබූ බව නිරීක්ෂණය විය. | ගත යුතුය. | ක්‍රියාමාර්ගයක්ම ගෙන තිබුණි. | ලිපියක් ජාතික ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලයේ සභාපතිවරයා විසින් නගරාධිපතිතුමිය වෙත යොමු කිරීමට කටයුතු කරනු ඇත. |

## 2.3 මහ කොළඹ ජල හා අපජල කළමනාකරණය වැඩිදියුණු කිරීමේ ආයෝජන වැඩසටහන - 03 කොටස (3348/3349)

(i) ව්‍යාපෘති 03 වැඩසටහනේ අරමුණ වන්නේ, මහ කොළඹ ප්‍රදේශයේ ජල සම්පාදන හා අපජල සේවාවල පද්ධති කාර්යක්ෂමතාවය හා මූල්‍ය තිරසරභාවය වැඩිදියුණු කිරීමයි.

(ii) ව්‍යාපෘති සංවර්ධන සහාය උපදේශන කොන්ත්‍රාත්තුව, ව්‍යාපෘති -01 සඳහා අතිරේක මූල්‍යයන කටයුතු හා ව්‍යාපෘති -02 සඳහා අතිරේක මූල්‍යයන කටයුතු වශයෙන් මෙම ව්‍යාපෘතිය යටතේ සංරචක 03ක් ක්‍රියාත්මක වේ.

(iii) ණය ගිවිසුම්වලට අනුව, ව්‍යාපෘති 03 වැඩසටහනේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය ඇ.එ.ජ. ඩොලර් මිලියන 228.02 ක් හෙවත් රු. මිලියන 29,642.60 ක අගයක් වූ අතර එම මුදලින් ඇ.එ.ජ. ඩොලර් මිලියන 123ක් හෙවත් රු. මිලියන 15,990ක් ආසියනු සංවර්ධන බැංකුවේ සාමාන්‍ය ප්‍රාග්ධන සම්පත් මගින් මූල්‍යයනය කිරීමට එකඟ වී ඇති අතර, ඇ.එ.ජ. ඩොලර් මිලියන 5ක් හෙවත් රු. මිලියන 650ක් ආසියානු සංවර්ධන අරමුදලේ විශේෂ අරමුදල් සම්පත් මගින් මූල්‍යයනය කිරීමට එකඟ වී ඇත. ඊට අමතරව, ඇ.එ.ජ. ඩොලර් මිලියන 59.56ක් හෙවත් රු. මිලියන 7,742.80 ක් යුරෝපීය ආයෝජන බැංකුව විසින් මූල්‍යයනය කිරීමට එකඟ වී ඇත. ඉතිරි මුදල වූ ඇ.එ.ජ. ඩොලර් මිලියන 40.46ක් හෙවත් රු. මිලියන 5,259.80 ක අගයක් සඳහා ශ්‍රී ලංකා රජය මගින් දායකත්වය ලබාදෙනු ඇතැයි අපේක්ෂා කරන ලදී.

(iv) ව්‍යාපෘති 03 වැඩසටහනේ ඇස්තමේන්තුගත මුළු පිරිවැයෙන් ඇ.එ.ජ. ඩොලර් මිලියන 55.63 ක මුදලක් හෙවත් රු. මිලියන 7,231.90ක් ජාතික ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලය මඟින් ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත කාර්යයන් සඳහා වෙන් කර තිබුණි.

### *2.3.1 කොළඹ මහ නගර සභාව විසින් සිදුකරනු ලබන ක්‍රියාකාරකම්*

(i) ප්‍රතිස්ථාපන කටයුතු සඳහා මහ කොළඹ ජල හා අපජල කළමනාකරණ වැඩිදියුණු කිරීමේ ආයෝජන වැඩසටන -03 කොටස ක්‍රියාත්මක කෙරෙන අතර කි.මී. 29.4 ක මලාපවාහන ජාලයක් සහ පොම්පාගාර තුනක් ඉදිකිරීම ඇතුළුව දකුණු පෝෂක ප්‍රදේශයේ අපජල පවිත්‍රාගාරය පුළුල් කිරීම හා සේවා සපයන්නන්ගේ ආයතනික ව්‍යුහය හා ධාරිතාවය ගොඩනැගීම සිදුකෙරේ.

(ii) ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත පිරිවැය ඇ.එ.ජ. ඩොලර් මිලියන 112.83 ක් හෙවත් රු. මිලියන 16,401.76 ක් වේ. එයින් ඇ.එ.ජ. ඩොලර් මිලියන 92.67 ක් හෙවත් රු. මිලියන 13,471.16ක් ආසියානු සංවර්ධන බැංකුව මගින් මූල්‍යායනය කිරීමට එකඟ වී ඇත.

(iii) 2016 නොවැම්බර් 03 දින ව්‍යාපෘති කටයුතු ආරම්භ කර 2022 ඔක්තෝබර් 24 දින අවසන් කිරීමට නියමිතව තිබුණි.

(iv) ව්‍යාපෘතිය සම්බන්ධයෙන් 2018,2019 හා 2020 වර්ෂ සඳහා ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන සඳහා විගණකාධිපති විසින් තත්ත්වාගණනය නොකළ මතයක් ඉදිරිපත් කර තිබුණි. කෙසේ වෙතත්, ව්‍යාපෘතියේ කාර්යසාධනය සම්බන්ධයෙන් මෙතෙක් නොවිසඳී ඇති ගැටලු කීපයක් පහත දැක්වේ.

| විගණන නිරීක්ෂණය | විගණකාධිපති නිර්දේශ | ව්‍යාපෘතිය විසින් ගනු ලැබූ වැළැක්වීමේ ක්‍රියාමාර්ග | වර්තමාන තත්ත්වය |
|---|---|---|---|
| (අ) කිරුලපන ජල පෝෂක ප්‍රදේශය සඳහා වන නව භූගත මලාපවාහන, ප්‍රධාන පෝෂක හා පොම්පාගාර ඉදිකිරීම් | ව්‍යාපෘති කාලසීමාව අවසන් වීමට පෙර ව්‍යාපෘති කටයුතු අවසන් කිරීමට | මේ පිළිබඳව කොන්ත්‍රාත්කරු සමාගමේ ඉහළ කළමනාකාරිත්වයට | 2021 දෙසැම්බර් 31 දිනට කොන්ත්‍රාත්තුව අවසන් කර |

| | | | | |
|---|---|---|---|---|
| | කටයුතු 2020 මැයි 04 දින අවසන් කිරීමට නියමිතව තිබුණද, එය 2020 දෙසැම්බර් 31 දින වනවිට අවසන් කර නොතිබුණි. අපේක්ෂිත භෞතික කාර්යසාධනය සියයට 100ක් වූ අතර 2021 දෙසැම්බර් 31 දින වනවිට ලබාගත් කාර්යසාධනය සියයට 54ක් විය. | කඩිනම් පියවර ගත යුතුය. | කිහිප වතාවක්ම දන්වා ඇතත්, කාර්යය ප්‍රගතියක් නිරීක්ෂණය නොවුණි. | නොතිබුණි. |
| (ආ) | ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ සංයුක්ත සැලැස්මට අනුව වැල්ලවත්ත අපජල පවිත්‍රාගාරය ඉදිකිරීමේ කොන්ත්‍රාත්තුව 2017 වර්ෂයේ 02 වන කාර්තුව තුළ ප්‍රදානය කිරිමට නියමිතව තිබුණි. කෙසේවෙතත්, එය වසර තුනක ප්‍රමාදයකින් පසුව ප්‍රදානය කර තිබුණි. | ව්‍යාපෘති කාලසීමාව අවසන් වීමට පෙර ව්‍යාපෘති කටයුතු අවසන් කිරීමට කඩිනම් පියවර ගත යුතුය. | 2021 පෙබරවාරි 22 දින වැඩ ආරම්භ කර ඇත. | 2021 අප්‍රේල් 27 දින සැලසුම්කිරීමේ රැස්වීම් දෙකක් පවත්වා ඇති අතර මූලික සැලැස්ම සඳහා අනුමැතිය ලබා දී තිබුණි. |
| (ඇ) | ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ සංයුක්ත සැලැස්මට අනුව කිරුළ- නාරාහේන්පිට ප්‍රදේශයේ මලාපවාහන පහසුකම් ඉදිකිරීම් කටයුතු 2018 වර්ෂයේදී අවසන් කළ යුතුව තිබුණි. කෙසේවෙතත්, 2020 නොවැම්බර් 18 දින ලැබුණු ලංසු ලේඛන සඳහා යුරෝපීය ආයෝජන බැංකුවේ එකඟතාවය හිමිව | ව්‍යාපෘති කාලසීමාව අවසන් වීමට පෙර ව්‍යාපෘති කටයුතු අවසන් කිරීමට කඩිනම් පියවර ගත යුතුය. | සැලසුම් වෙනස්කිරීම හා ඉඩම් නොමැතිවීම හේතුවෙන් සමස්ත ප්‍රසම්පාදන ක්‍රියාවලිය ප්‍රමාද වී තිබුණි. | 2021 වර්ෂය අවසන් වනවිට තාක්ෂණික ලංසු ඇගයීම අවසන් කර තිබුණි. |

තිබුණි.

### *2.3.2 ජාතික ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලය විසින් සිදුකරනු ලබන ක්‍රියාකාරකම්*

(i) මහ කොළඹ ජල හා අපජල කළමනාකරණ වැඩිදියුණු කිරීමේ ආයෝජන වැඩසටහන - 03 ව්‍යාපෘතිය මහ කොළඹ ප්‍රදේශයේ ජල සම්පාදන හා අපජල සේවා පද්ධතිවල කාර්යක්ෂමතාවය හා මූල්‍ය තිරසරභාවය වැඩිදියුණු කිරීම සඳහා ක්‍රියාත්මක වේ.

(ii) ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත පිරිවැය ඇ.එ.ජ. ඩොලර් මිලියන 55.63 ක් හෙවත් රු. මිලියන 7,231.90 ක් වේ. ඉන් ඇ.එ.ජ. ඩොලර් මිලියන 38 ක් හෙවත් රු. මිලියන 4,940ක අගයක් ආසියානු සංවර්ධන බැංකුව මගින් මූල්‍යයනය කිරීමට එකඟ වී ඇත.

(iii) 2016 නොවැම්බර් 03 දින ව්‍යාපෘති කටයුතු ආරම්භ කර 2020 ජුනි 30 දින අවසන් කිරීමට නියමිතව තිබුණි. කෙසේ වෙතත්, ව්‍යාපෘති කාලය 2022 ඔක්තෝබර් 24 දින දක්වා දීර්ඝ කර තිබුණි

(iv) ව්‍යාපෘතිය සම්බන්ධයෙන් 2018,2019 හා 2020 වර්ෂ සඳහා ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන සඳහා විගණකාධිපති විසින් තත්ත්වාගණනය නොකළ මතයක් ඉදිරිපත් කර තිබුණි. කෙසේ වෙතත්, ව්‍යාපෘතියේ කාර්යසාධනය සම්බන්ධයෙන් මෙතෙක් නොවිසඳී ඇති ගැටලු කීපයක් පහත දැක්වේ.

| | **විගණන නිරීක්ෂණය** | **විගණකාධිපති නිර්දේශ** | **ව්‍යාපෘතිය විසින් ගනු ලැබූ වැළැක්වීමේ ක්‍රියාමාර්ග** | **වර්තමාන තත්ත්වය** |
|---|---|---|---|---|
| (අ) | ණය ගිවිසුමට අනුව, සමස්ත ප්‍රතිපාදන ඇ.එ.ජ. ඩොලර් මිලියන 38ක් හෙවත් රු. මිලියන 4,550කින් ඇ.එ.ජ. ඩොලර් මිලියන 35ක් තථ්‍ය අතිරේක මූල්‍යයන අවශ්‍යතා | ව්‍යාපෘතියේ තථ්‍ය අනාගත අවශ්‍යතාවයන් සමාලෝචනය කිරීමෙන් අනතුරුව අතිරේක මුදල් ඉල්ලුම් | එක්සත් ජනපද ඩොලරයට සාපේක්ෂව ශ්‍රී ලංකා රුපියල අවප්‍රමාණය වීම හේතුවෙන් වාරික | මෙම ගැටලුව මෙතෙක් විසඳා නොමැත. |

| | | | | |
|---|---|---|---|---|
| | හඳුනාගැනීමකින් තොරව 2016 වර්ෂයේ ව්‍යාපෘති 01 සහ ව්‍යාපෘති 02 ට අනුරූපී ව්‍යාපෘතිවල අතිරේක මූල්‍යායනය සඳහා වෙන්කර තිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස ව්‍යාපෘතිය ආරම්භ කර වර්ෂ 04 ක් හා මාස 04ක් ගතවී ඇතත් 2020 දෙසැම්බර් 31 දින වනවිට කිසිදු මුදලක් භාවිතා කර නොතිබුණි. කෙසේ වෙතත්, 2021 මැයි මාසයේදී රු.මිලියන 116.6ක ණය මුදලක් ආපසු ගෙවා තිබුණි. | කළ යුතුය. | 1 හා 2 යටතේ සැලකිය යුතු ඉතිරියක් වී ඇත. | |
| (ආ) | ජාතික ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලය සහ කොළඹ මහ නගර සභාව මඟින් ක්‍රියාත්මක කරනු ලබන වැඩසටහන් ව්‍යාපෘති 03 යටතේ ක්‍රියාත්මක කරනු ලබන ව්‍යාපෘති දෙකට අදාළව ඇ.එ.ජ. ඩොලර් මිලියන 1.42 ක් හෙවත් රු. මිලියන 249.67ක් ණය ලබාදීමේ නියෝජිතායතනය විසින් මෙම ණය ක්‍රමවේදය යටතේ ණය පොළී සහ බැඳීම් සඳහා ගාස්තු වශයෙන් අයකර තිබුණි. කෙසේ වෙතත්, එය ක්‍රියාත්මක කරනු ලබන ආයතන දෙක අතර වෙන් වශයෙන් බෙදා නොතිබූ අතර | ණය ලබාදීමේ නියෝජිතායතනය විසින් සෘජුවම අයකර ගන්නා ලද අදාළ පිරිවැය හා වර්ෂ අවසානයේ භාවිතා කළ ණය ප්‍රමාණය දැක්වෙන පරිදි ව්‍යාපෘති අතර වෙන් වශයෙන් ගිණුම් පවත්වා ගත යුතුය. | කොළඹ මහ නගර සභාව, ජාතික ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලය සමඟ එක්ව ආසියානු සංවර්ධන බැංකුව විසින් පොළී සහ බැඳීම් සඳහා ගාස්තු වෙන්කර දැක්වීමට ක්‍රමවේදයක් සකස් කර ඇති අතර ඒ අනුව 2021 වර්ෂයේ සිට ගිණුම්ගත කිරීමට කටයුතු කරනු | මෙතෙක් විසඳී නොමැත. |

| | | | | |
|---|---|---|---|---|
| | 2020 දෙසැම්බර් 31 දින දක්වා මූල්‍ය ප්‍රකාශන තුළ ඇතුළත් කර තිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස එම ප්‍රමාණයෙන් ණය අඩුවෙන් දක්වා තිබුණි. | | ලැබේ. | |
| (ආ) | 2019 මාර්තු 15 දිනැති කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 01/2019 හි 2.3.2 වගන්තියට අනුව ඵලදායී ව්‍යාපෘති කළමනාකරණය සහතික කිරීම සඳහා ව්‍යාපෘති අධ්‍යක්ෂක විසින් පූර්ණ කාලීනව අවශ්‍ය කටයුතු සිදුකර නොතිබුණි. | පූර්ණ කාලීන සේවා පදනමක් යටතේ ව්‍යාපෘති අධ්‍යක්ෂක පත් කිරීමට කටයුතු කළ යුතුය. | කළමනාකරණය විසින් අවශ්‍ය පියවර ගනු ඇත. | මෙතෙක් විසඳී නොමැත. |

**2.4 මහ කොළඹ ජල හා අපජල කළමනාකරණය වැඩිදියුණු කිරීමේ ආයෝජන වැඩසටහන – ව්‍යාපෘති 01 (2947/2948)**

(i) මහ කොළඹ ජල හා අපජල කළමනාකරණය වැඩිදියුණු කිරීමේ ආයෝජන වැඩසටහන – ව්‍යාපෘති 01 මහ කොළඹ ප්‍රදේශයේ පදිංචිකරුවන්ගේ නාගරික පරිසරය හා ජීවන තත්ත්වය වැඩිදියුණු කිරීම සඳහා ක්‍රියාත්මක කෙරේ. ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත පිරිවැය ඇ.එ.ජ. ඩොලර් මිලියන 112ක් හෙවත් රු. මිලියන 14,784ක් වන අතර එයින් ඇ.එ.ජ. ඩොලර් මිලියන 84 ක් හෙවත් රු. මිලියන 11,088ක් ආසියානු සංවර්ධන බැංකුව විසින් මූල්‍යයනය කිරීමට එකඟ වී ඇත.

(ii) 2013 සැප්තැම්බර් 25 දින ව්‍යාපෘතියේ කටයුතු ආරම්භ කර ඇති අතර 2016 දෙසැම්බර් 31 දින වනවිට අවසන් කිරීමට නියමිතව තිබුණි. කෙසේ වෙතත්, යෝජිත නල ක්‍රමය වෙනුවට විවෘත අගල් ක්‍රමය වෙනස් කිරීම, මාර්ගවල වැඩ කටයුතු සඳහා කොළඹ මහ නගර සභාවෙන් හා මාර්ග සංවර්ධන අධිකාරියෙන් අනුමැතිය ලැබීම ප්‍රමාද වීම, යන්ත්‍රෝපකරණ වෙනුවට කම්කරු ශ්‍රමය යෙදවීම, අනපේක්ෂිත භූමි භාවිතය, ක්‍රියා විරහිතවීම් හා කොන්ත්‍රාත්කරුවන්ගේ දුර්වල ප්‍රගතිය ආදී හේතූන් නිසා 2022 ඔක්තෝබර් 24 දින දක්වා ව්‍යාපෘති කාලය සිව් වතාවක් දීර්ඝ කරන ලදී.

මේ නිසා, ව්‍යාපෘතියේ මූලික අරමුණ වූ මහ කොළඹ ප්‍රදේශවාසීන්ගේ නාගරික පරිසරය හා ජීවන තත්ත්වය වැඩිදියුණු කිරීම ප්‍රමාද විය.

(v) ව්‍යාපෘතිය සම්බන්ධයෙන් 2018,2019 හා 2020 වර්ෂ සඳහා ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන සඳහා විගණකාධිපති විසින් තත්ත්වාගණනය කළ මතයක් ඉදිරිපත් කර තිබුණි. කෙසේ වෙතත්, ව්‍යාපෘතියේ කාර්යසාධනය සම්බන්ධයෙන් මෙතෙක් නොවිසඳී ඇති ගැටලු කීපයක් පහත දැක්වේ.

| | විගණන නිරීක්ෂණය | විගණකාධිපති නිර්දේශ | ව්‍යාපෘතිය විසින් ගනු ලැබූ වැළැක්වීමේ ක්‍රියාමාර්ග | වර්තමාන තත්ත්වය |
|---|---|---|---|---|
| (අ) | ව්‍යාපෘතිය තුළින් මීටර් 450,508.26ක නල එළීමේ කටයුතු සැලසුම් කර තිබූ අතර, ඉන් දිස්ත්‍රික් මැනුම් ප්‍රදේශ 36ක නිවාස 60,463ක් සඳහා සම්බන්ධතා ලබාදීම, නල එළීමේ කටයුතු මීටර් 426,482ක් සහ නිවාස සම්බන්ධතා 37,786ක කටයුතු 2020 දෙසැම්බර් 31 දින වන විට අවසන් කර තිබුණි. කෙසේ වෙතත්, නල එළීමේ කටයුතු මීටර් 89,566ක් හෙවත් දිස්ත්‍රික් මිනුම් ප්‍රෙද්ශ 10කට පමණක් නිවාස සම්බන්ධතා මාරු කිරීම් 15,732ක් සම්පූර්ණයෙන්ම අවසන් කර ජතික ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලය වෙත භාර දී ඇත. | සංශෝධනය කරන ලද කාලපරිච්ඡේදය තුළ සමීප සුපරීක්ෂණයක් යටතේ කාර්යයන් නිම කළ යුතුය. | කාර්යසාධනය වැඩිකිරීම සඳහා කොන්ත්‍රාත්කරු සමඟ රැස්වීම් කිහිපයක් සංවිධානය කර පවත්වා ඇත. | කොළඹ නගරයේ නැගෙනහිර කොටසේ හා කොළඹ නගරයේ උතුරු කොටසේ ආදායම් නොලබන ජලයේ අගය අඩුකිරීම සඳහා වූ පද්ධති ප්‍රතිස්ථාපන කටයුතු පිළිවෙලින් සියයට 93.4ක හා 99.7ක භෞතික ප්‍රගතියක් ලබා ඇත. |

| | | | | |
|---|---|---|---|---|
| (ආ) | 2020 දෙසැම්බර් 31 දක්වා ආපසු ගෙවිය යුතු තැන්පතු මුදල් රු. මිලියන 75.28ක මුදලක් ණය මුදල් මගින් ගෙවා ඇත. ඉන් රු. 544,275 ක් මුදලක් අයකරගෙන එය ආපසු මහා භාණ්ඩාගාරයට ගෙවීම වෙනුවට ජාතික ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලය වෙත ගෙවා තිබුණි. එබැවින්, ව්‍යාපෘතිය අවසානයේ ආපසු ගෙවිය හැකි ණය මුදල් ප්‍රමාණය මහා භාණ්ඩාගාරයට ආපසු ගෙවීම වෙනුවට ප්‍රයෝජනයට නොගත් ණය මුදල් ලෙස ජාතික ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලයට ගෙවා තිබුණි. | ආපසු ගෙවිය හැකි තැන්පතු සඳහා ප්‍රමාණ ගෙවීම් බිල්පත ගෙවීම් අයිතමයක් ලෙස ඇතුළත් නොකළ යුතු අතර එවැනි ගෙවීම් සඳහා ණය මුදල් භාවිතා නොකළ යුතුය. | ආසියානු සංවර්ධන බැංකුව සමඟ සාකච්ඡා කර ඇති අතර ණය ගෙවීම් අවසන්වීමට පෙර ආසියානු සංවර්ධන බැංකුවේ කොටස ප්‍රතිපූර්ණය කිරීමේ යාන්ත්‍රණය ඇගයීමට ලක් කර ඇත. | මෙතෙක් විසඳී නොමැත. |
| (ඇ) | ප්‍රමාණ ගෙවීම් බිල්පත් අගය අනුව මිල වැඩි කිරීම රු. මිලියන 600ක් වූ අතර කාලය දීර්ඝ කිරීම හේතුවෙන් අයිසීබී 01 හා අයිසීබී 02 කොන්ත්‍රාත්තු සඳහා රු. 1,060.75ක් ගෙවා තිබුණි. කෙසේ වෙතත්, දීර්ඝ කරන ලද කොන්ත්‍රාත් කාලය වෙනුවට ව්‍යාපෘතිය ආරම්භ වූ දින සිට ගෙවන ලද සියලුම අතුරු ගෙවීම් සඳහා වැඩි මුදලක් ගෙවා තිබුණි. තවද, ඉන් එකතුව රු. මිලියන 360.81ක් 2021 මැයි 30 දක්වා අනුමැතියකින් තොරව ගෙවා තිබුණි. එමෙන්ම ව්‍යාපෘති කාලය දීර්ඝ කිරීම හේතුවෙන් ව්‍යාපෘති කළමනාකරණ ඒකක කාර්යාල | කොන්ත්‍රාත් කාලය තුළ කාර්යය නිම කිරීම සඳහා නිරන්තර සුපරීක්ෂණය කළ යුතුය. | කොන්ත්‍රාත් ලේඛන වෙළුම I-IV 8 පරිච්ඡේදය අනුව, කොන්ත්‍රාත්තුවේ විශේෂ කොන්දේසි - අ කොටස (කොන්ත්‍රාත් දත්ත) අයිතම අංක 13.8 හා ආ කොටස (විශේෂිත විධිවිධාන ) යටතේ පිරිවැය වෙනස් කිරීම් සඳහා ගැලපීමේදී මාසික අතුරු ගෙවීම් අයදුම්පත් | විචලාය නියෝග අංක 235 සහ 238 (අයිසීබී 01 වැඩිකිරීම සඳහා අමතර කාර්යය නියෝගය) අනුමැතිය ලබාදී ඇති අතර විචලාය නියෝග අංක 175 සඳහා විචලතා නියෝග කමිටුවේ අනුමැතියෙන් පසුව (මගහැරීම් නියෝගය - ඕඑම් අයි -8) අයිසීබී 02 සඳහා විචලාය නියෝග අංක 176 |

| | | | | |
|---|---|---|---|---|
| | වියදම් හා එහි කාර්ය මණ්ඩල නඩත්තු වියදම් ඇතුළු සාමාන්‍ය වියදම් සඳහා ව්‍යාපෘතිය යටතේ රු. මිලියන 146 ක මුදලක් දරා තිබුණි. | | ගෙවීමේදී නිරන්තරයෙන් මිල උච්ඡාවචනයන්ට හිමිකම් පෑමට සිදුවේ. | (මිල වැඩිවීම සඳහා අමතර කාර්යය නියෝගය) සමඟ සක්‍රීය කිරීමට කටයුතු කර ඇත. |
| (ඇ) | නල එළීම් කටයුතු සඳහා ආපසු ගෙවනු ලබන තැන්පතුව වශයෙන් රු. මිලියන 75.28ක් 2020 දෙසැම්බර් 31 දින දක්වා කොළඹ මහ නගර සභාව වෙත ගෙවා තිබූ අතර 2020 දෙසැම්බර් 31 දින වනවිට ව්‍යාපෘතියේ නල එළීම් කටයුතුවලින් සියයට 90ක් හා ස්ථිර මාර්ග ප්‍රතිසංස්කරණ කටයුතුවලින් සියයට 75ක් අවසන් කර තිබුණි. කෙසේ වෙතත්, 2020 දෙසැම්බර් 31 දින දක්වා රු. 544,275ක් පමණක් තැන්පතුවෙන් අයකරගෙන තිබුණි. | මාර්ග භාරදීමටත්, තැන්පතු මුදල් ප්‍රමාදයකින් තොරව ආපසු ගෙවීමටත් දෙපාර්ශවය විසින්ම කාර්යක්ෂම යාන්ත්‍රණයක් ස්ථාපිත කළ යුතුය. | දැනටමත් භාරදී ඇති මාර්ග සඳහා මුදල් ආපසු ලබාගැනීම් වෙනුවෙන් කොළඹ මහ නගර සභාව වෙත ඉල්ලීම් ඉදිරිපත් කර ඇත. කෙසේ වෙතත්, ව්‍යාපෘතිය තුළ සඳහන් පරිදි කොළඹ මහ නගර සභාව විසින් ආපසු ගෙවීම් කටයුතුවල සැලකිය යුතු ප්‍රමාදයක් පවතී. | මෙතෙක් විසඳී නොමැත. |

## 2.5 මහ කොළඹ ජල හා අපජල කලමනාකරණ වැඩිදියුණු කිරීමේ ආයෝජන වැඩසටහන – ව්‍යාපෘති 02 (අඹතලේ ජල සම්පාදන පද්ධතිය වැඩිදියුණු කිරීම හා බලශක්ති ඉතුරුම් ව්‍යාපෘතිය)

(i) මහ කොළඹ ජල හා අපජල කලමනාකරණ වැඩිදියුණු කිරීමේ ආයෝජන වැඩසටහන – ව්‍යාපෘති 02 (අඹතලේ ජල සම්පාදන පද්ධතිය වැඩිදියුණු කිරීම හා බලශක්ති ඉතුරුම් ව්‍යාපෘතිය) මහ කොළඹ ජල සැපයුම් ප්‍රවේශය පුළුල් කිරීම හා ජල පද්ධතියේ තිරසරභාවය පෝෂණය කිරීම සඳහා ක්‍රියාත්මක කෙරේ.

(ii) ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත පිරිවැය ඇ.එ.ජ. ඩොලර් මිලියන 100ක් හෙවත් රු. මිලියන 13,000 ක් වේ. ඉන් ඇ.එ.ජ. ඩොලර් 70ක් හෙවත් රු. මිලියන 9,100ක මුදලක් ෆ්‍රැන්චයිස් ඩී ඩිවලොප්මන්ට් ආයතනය විසින් මූල්‍යයනය කිරීමට එකඟ වී ඇත. මෙම ව්‍යාපෘතිය 2014 සැප්තැම්බර් 29 දින ආරම්භ කර 2019 දෙසැම්බර් 31 දින අවසන් කිරීමට නියමිතව තිබුණි. කෙසේ වෙතත් එය 2022 මැයි 31 දින දක්වා දීර්ඝ කර තිබුණි. එහි ප්‍රතිඵලයක් වශයෙන් මහ කොළඹ ජල සැපයුම සඳහා ප්‍රවේශය පුළුල් කිරීම හා ජල පද්ධතියේ තිරසරභාවය පෝෂණය කිරීමේ ක්‍රියාවලිය ප්‍රමාද වී තිබුණි.

(iii) ව්‍යාපෘතිය සම්බන්ධයෙන් 2018,2019 හා 2020 වර්ෂ සඳහා ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන සඳහා විගණකාධිපති විසින් තත්ත්වාගණනය කළ මතයක් ඉදිරිපත් කර තිබුණි. කෙසේ වෙතත්, ව්‍යාපෘතියේ කාර්යසාධනය සම්බන්ධයෙන් මෙතෙක් නොවිසඳී ඇති ගැටලු කීපයක් පහත දැක්වේ.

| | විගණන නිරීක්ෂණය | විගණකාධිපති නිර්දේශ | ව්‍යාපෘතිය විසින් ගනු ලැබූ වැළැක්වීමේ ක්‍රියාමාර්ග | වර්තමාන තත්ත්වය |
|---|---|---|---|---|
| (අ) | 2019 දෙසැම්බර් 31 දින වනවිට මෙම ව්‍යාපෘතිය යටතේ අඹතලේ ජල පවිත්‍රාගාරයේ අධික බලශක්ති පිරිවැය අවම කිරීම ඝර්ෂණ හානි අවම කිරීම, අවම කාර්යක්ෂමතාවයකින් යුතු පොම්ප අලුත්වැඩියා කර ප්‍රතිස්ථාපනය කිරීම හා විශාල විෂ්කම්භයකින් යුතු සම්ප්‍රේෂණ ජාලයක් සඳහා ජාතික ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලය විසින් සැලසුම් කර තිබුණි. එසේ වුවද, 2020 දෙසැම්බර් 31 දින දක්වා | සංශෝධිත කාල රමුවක් තුළ ව්‍යාපෘතිය නිම කිරීම සඳහා උපරිම උත්සහ කළ යුතුය. | කාර්යසාධනය සමීප සුපරීක්ෂණය සඳහා නිරන්තරයෙන් රැස්වීම් පවත්වන අතර එහි ප්‍රගතිය නිරීක්ෂණය කරනු ලැබේ. | මුළු පොම්ප 17න් කොන්ත්‍රාත්කරු විසින් පොම්ප 10ක් ලබාදී ඇති අතර මාලිගාකන්ද පොම්ප අංක 03ක පරීක්ෂණ කටයුතු අවසන් කර ඇත. |

| | | | | |
|---|---|---|---|---|
| | වයාපෘතිය යටතේ වූ කිසිදු කොන්ත්‍රාත්තුවක් අවසන් කර නොතිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස අඹතලේ ජල පවිත්‍රාගාරයේ මාසික සාමාන්‍ය විදුලි ගාස්තුව රු. මිලියන 67.52ක් වූ අතර 2020 වර්ෂය අවසන් වනවිට සැලසුම් කල පරිදි ඉහත සඳහන් විදුලි ගාස්තු අඩු කිරීමට නොහැකි වී තිබුණි. | | | |
| (ආ) | ඇ.එ.ජ. ඩොලර් මිලියන 70ක් හෙවත් රු. මිලියන 9,100ක මුදලක් ණය දෙනු ලබන නියෝජිතායතනය විසින් මූල්‍යයනය කිරීමට එකඟ වුවද, වයාපෘති ක්‍රියාකාරකම් ආරම්භ වී වර්ෂ 6 ක් සහ මාස 3කට පසුව 2020 දෙසැම්බර් 31 දින වනවිට අරමුදලින් සියයට 24ක් නියෝජනය වන ලෙස එකතුව ඇ.එ.ජ. ඩොලර් මිලියන 16.68ක් හෙවත් රු. මිලියන 2,792 ක මුදලක් පමණක් භාවිතා කර තිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස, 2020 දෙසැම්බර් 31 දින දක්වා නොගෙවූ ශේෂය වෙනුවෙන් රජය විසින් ඇ.එ.ජ. ඩොලර් 1.93ක් හෙවත් රු. මිලියන 308.27ක මුදලක් බැඳීම් ගාස්තු වශයෙන් ගෙවා තිබුණි. | සංශෝධිත කාල රමුවක් තුළ වයාපෘතිය නිම කිරීම සඳහා උපරිම උත්සහ කළ යුතුය. | කොන්ත්‍රත් වැඩවල සියලුම භෞතික ක්‍රියාකාරකම් 2022 වර්ෂයේ දෙසැම්බර් මාසය අවසන් වනවිට නිම කිරීමට සැලසුම් කර ඇත. | වයාපෘති ණය මුදලේ කාලය 2023 වර්ෂයේ ජුනි 30 දක්වා දීර්ඝ කර ඇත. වයාපෘතියේ තථ්‍ය මූල්‍ය ප්‍රගතිය සියයට 78.25 ඉලක්කයට සාපේක්ෂව සියයට 43.89කි. |

| | | | | |
|---|---|---|---|---|
| (ඇ) | සැපයුම් හා නල එළීම් සමඟ භූගත ජලාශය හා බූස්ටර් පොම්පාගාරය ඉදිකිරීමේ නව කොන්ත්‍රාත්තුව 2020 ඔක්තෝබර් 07 දින වනවිට ආරම්භ කර 2022 ජුනි 06 දින වනවිට අවසන් කිරීමට නියමිතව තිබුණි. කොන්ත්‍රාත්තුවේ ප්‍රගති වාර්තාවට අනුව, 2020 දෙසැම්බර් 31 දිනට සමස්ත භෞතික ප්‍රගතිය සියයට 8ක ඉලක්කගත ප්‍රගතියට සාපේක්ෂව සියයට 3ක් පෙන්නුම් කර ඇති අතර එය 2021 ජුනි 30 දින වනවිට සියයට 16.58ක් ලෙස පැවතුණි. | ව්‍යාපෘති කාර්යයන් කඩිනම් කිරීමට අවශ්‍ය පියවර ගතයුතු අතර කොන්ත්‍රත්කරුගේ වැඩ නිරන්තරයෙන් සුපරීක්ෂණය කළ යුතුය. | 2021 සැප්තැම්බර් 30 දින වනවිටත් කොන්ත්‍රාත්කරු විසින් ණයවර ලිපි විවෘත කර ඇති අතර 2022 පෙබරවාරි වනවිට අවශ්‍ය පයිප්ප බට ලබා දී ඇත. ප්‍රගතිය සමීප සුපරීක්ෂණය සඳහා නිරන්තරයෙන් වැඩබිම් රැස්වීම් පවත්වන අතර එය එහි වැඩිදියුණු කිරීම් සිදුකෙරේ. | අයිසීබී 03 කොන්ත්‍රාත්තුවේ අවසන් දිනය 2022 සැප්තැම්බර් 20 ලෙස කොන්ත්‍රාත් ගිවිසුම දීර්ඝ කිරීම අනුමත කර ඇත. 2022 ජනවාරි 31 දිනට අයිසීබී 03 කොන්ත්‍රාත්තුවේ සමස්ත ප්‍රගතිය සියයට 30.50ක් වන අතර එහි භෞතික ඉලක්කය සියයට 37.33කි. |
| (ඈ) | කාර්යක්ෂම පොම්පකරණය තුළින් බලශක්තිය ඉතිරිකිරීම සඳහා අඹතලේ නිෂ්පාදන පහසුකම්වල විශ්වසනීයත්වය වැඩිදියුණු කිරීමේ කොන්ත්‍රාත්තුවේ ප්‍රගති වාර්තාවට අනුව, එහි භෞතික ප්‍රගතිය 2020 දෙසැම්බර් 31 දින වනවිට සියයට 100 ක අපේක්ෂිත භෞතික ප්‍රගතියට සාපේක්ෂව සියයට 33.22ක මන්දගාමී තත්ත්වයක් පෙන්නුම් කර තිබුණි. | ව්‍යාපෘති කාර්යයන් කඩිනම් කිරීමට අවශ්‍ය පියවර ගතයුතු අතර කොන්ත්‍රත්කරුගේ වැඩ නිරන්තරයෙන් සුපරීක්ෂණය කළ යුතුය. | 2021 ඔක්තෝබර් මාසයේදී නව ව්‍යාපෘති කළමනාකරුගේ පැමිණීමත් සමඟ කොන්ත්‍රාත්කරුගේ ක්‍රියාකාරිත්වයේ සුළු වර්ධනයක් දක්නට ලැබේ. | අයිසීබී 05 කොන්ත්‍රාත්කරු විසින් 2022 දෙසැම්බර් මස අවසානය දක්වා කොන්ත්‍රාත් ගිවිසුම දීර්ඝ කිරීමක් ඉල්ලුම් කර ඇති අතර එය ඇගයීමට භාජනය කරමින් පවතී.<br><br>2022 ජනවාරි 31 දින වනවිට |

| | | | | |
|---|---|---|---|---|
| | | | | අයිසීබී 05 කොන්ත්‍රාත් පැකේජයේ භෞතික ප්‍රගතිය සියයට 47.09කි. |
| (ඉ) | අඹතලේ සිට එළි හවුස් දක්වා (අයිසීබී-04) කොන්ත්‍රාත්තුවට අනුව කිලෝමීටර් 9ක ඩීඅයි පයිප්ප (මි.මී 1200) සැපයීම හා පිහිටුවීම සියයට 88.98ක් වූ ඉලක්කගත ප්‍රතිශතයට සාපේක්ෂව කොන්ත්‍රාත්තුව ආරම්භක දින සිට වර්ෂ 4ක් හා මාස 5කට පසුව සියයට 53.20ක මන්දගාමී ප්‍රගතියක් පෙන්නුම් කර තිබුණි. තවද, කොන්ත්‍රාත්තුව යටතේ නල එලන ලද ප්‍රදේශයෙන් මීටර් 2,450ක මාර්ග කොටස නල එළීමේ කටයුතු අවසන් කිරීමෙන් අනතුරුව මාර්ග සංවර්ධන අධිකාරිය වෙත පවරා තිබුණි. එසේ වුවද, නල වංගු අලුත්වැඩියා කිරීමේ කටයුතු හා පීඩන පරීක්ෂණ කටයුතු ප්‍රමාද වීම හේතුවෙන් 2018 වර්ෂයේ එළන ලද නල මීටර් 360ක් 2021 ජුනි 30 දින වනවිටත් වැඩ අවසන් කර නොතිබුණි. | ව්‍යාපෘති කාර්යයන් කඩිනම් කිරීමට අවශ්‍ය පියවර ගතයුතු අතර කොන්ත්‍රත්කරුගේ වැඩ නිරන්තරයෙන් සුපරීක්ෂණය කළ යුතුය. | සේදවත්ත මාර්ගය දිවා කාලයේදී වසා තැබිය නොහැකි අතර රාත්‍රී 9.00 සිට අලුයම 400 දක්වා පමණක් මාර්ගය වසා තැබීමට පොලිස් දෙපාර්තමේන්තුව විසින් අවසර ලබා දී ඇත. එබැවින්, දිනකට වැඩ කරන පැය ගණන වැඩි කිරීමට පොලීසිය හා මාර්ග සංවර්ධන අධිකාරිය සමඟ සම්බන්ධීකරණ වැඩසටහනක් සැලසුම් කර ඇත. එසේම වැඩ කරනු ලබන පැය ගණන උපරිම කරගැනීම සඳහා බහාලුම් අංගන හිමියන් සමඟ සාකච්ඡා පවත්වනු ලැබේ. | 2022 ජනවාරි 31 දින වනවිට අයිසීබී 04 කොන්ත්‍රාත්තුවේ සමස්ත භෞතික ප්‍රගතිය සියයට 84.50ක් වන අතර භෞතික ඉලක්කය සියයට 85.86කි. 2022 ජනවාරි 31 දිනට නල එළීමෙන් පසුව(මීටර් 7,682) මාර්ග කොටසේ සමස්ත දිග මීටර් 4,723ක ප්‍රමාණයක් මාර්ග සංවර්ධන අධිකාරිය වෙත භාරදී ඇත. |
| (ඊ) | 2021 ජුලි 27 වන දින අයිසීබී-05 කොන්ත්‍රාත්තුවේ කාර්ය මණ්ඩල නවාතැන් ගොඩනැගිල්ල හා | ශ්‍රම බලකාය වැඩිකිරීමට හා ව්‍යාපෘති කාර්යයන් | කාර්ය මණ්ඩල නවාතැන් ගොඩනැගිල්ල හා | අයිසීබී 05 කොන්ත්‍රාත් පැකේජයේ |

| | | | |
|---|---|---|---|
| මධ්‍යම පාලන ගොඩනැගිලි සම්බන්ධයෙන් ඉදිකිරීම් කටයුතු වලදී සිදුකරන ලද භෞතික විගණන පරීක්ෂණයට අනුව, කර්ය මණ්ඩල නවාතැන් ගොඩනැගිල්ලේ ඉදිකිරීම් වැඩ හා රැහැන් වැඩ, මධ්‍යම පාලන ගොඩනැගිල්ලට අයත් පද්ධතියේ උපකරණ ස්ථාපනය, පරීක්ෂා කිරිම හා සම්බන්ධීකරණ කටයුතු 2021 ජුලි 27 දින වනවිටත් අවසන් කර නොතිබුණි. ඊට අමතරව, ක්ෂේත්‍ර පරීක්ෂා කරන ලද දිනය දක්වා භූගත ජලාශයේ ගල් කැබලි කිරීමේ කාර්යයන් පවා අවසන් කර නොතිබුණි. කෙසේ වෙතත්, මෙම ස්ථාන සඳහා අවම ශ්‍රම බලකායක් යොදවා ඇති බව නිරීක්ෂණය විය. | කඩිනම් කිරීමට අවශ්‍ය පියවර ගතයුතු අතර කොන්ත්‍රාත්කරුගේ වැඩ නිරන්තරයෙන් සුපරීක්ෂණය කළ යුතුය. | පාලන ගොඩනැගිල්ලේ ඉතිරි කටයුතු ලැයිස්තුගත කර ඇති අතර එම කටයුතු සඳහා කාල ඉලක්ක ලබාදී සමීප සුපරීක්ෂණයක් සිදුකර ඇත. | 2022 ජනවාරි 31 දින වනවිට සමස්ත භෞතික ප්‍රගතිය සියයට 47.09කි. |

## 2.6 අනුරාධපුර උතුර ජල සම්පාදන ව්‍යාපෘතිය - අදියර 1

(i) අනුරාධපුර උතුර ප්‍රදේශයේ ජල සම්පාදන පද්ධතියක් ඉදිකර සුරක්ෂිත පානීය ජලය සැපයීම හා ජල සම්පාදන ආවරණය වැඩි කිරීම සඳහා අනුරාධපුර උතුර ජල සම්පාදන ව්‍යාපෘතිය - අදියර 1 ක්‍රියාත්මක වන අතර එමගින් ප්‍රදේශයේ සනීපාරක්ෂක තත්ත්වය හා සෞඛ්‍ය තත්ත්වය වැඩිදියුණු කිරීමට දායකවීම අපේක්ෂා කෙරේ.

(ii) ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත පිරිවැය ජපන් යෙන් මිලියන 6,817ක් හෙවත් රු. මිලියන 11,515ක් වන අතර ඉන් ජපන් යෙන් මිලියන 5,166ක් හෙවත් රු. මිලියන 8,726ක් ජපාන ජාත්‍යන්තර සහයෝගිතා නියෝජිතායතනය විසින් මූල්‍යයනය කිරීමට එකඟ වී ඇත.

(iii) 2013 පෙබරවාරි මාසයේදී ව්‍යාපෘති කටයුතු ආරම්භ කර ඇති අතර 2018 පෙබරවාරි 18 දින අවසන් කිරීමට නියමිතව තිබුණි. කෙසේ වෙතත්, ව්‍යාපෘති කාලය 2022 ජුලි 05 දින දක්වා දෙවතාවක් දීර්ඝ කර තිබුණි.

(iv) ව්‍යාපෘතිය සම්බන්ධයෙන් 2018,2019 හා 2020 වර්ෂ සඳහා ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන සඳහා විගණකාධිපති විසින් තත්ත්වාගණනය කළ මතයක් ඉදිරිපත් කර තිබුණි. කෙසේ වෙතත්, ව්‍යාපෘතියේ කාර්යසාධනය සම්බන්ධයෙන් මෙතෙක් නොවිසඳී ඇති ගැටලු කීපයක් පහත දැක්වේ.

| | විගණන නිරීක්ෂණය | විගණකාධිපති නිර්දේශ | ව්‍යාපෘතිය විසින් ගනු ලැබූ වැළැක්වීමේ ක්‍රියාමාර්ග | වර්තමාන තත්ත්වය |
|---|---|---|---|---|
| (අ) | සමස්ත ව්‍යාපෘතියෙන් සියයට 35.13ක් වූ ව්‍යාපෘතියේ ප්‍රධාන බෙදාහැරීම්, ප්‍රධාන සම්ප්‍රේෂණ හා උප ප්‍රධාන නල එළීමේ කොන්ත්‍රාත්තුව 2019 දෙසැම්බර් 11 වන දින අවසන් කිරීමට නියමිතව තිබුණි. කෙසේ වෙතත්, කොන්ත්‍රාත් කාලය 2022 ජනවාරි 31 දින දක්වා හය වතාවක් දීර්ඝ කර තිබුණි. 2021 නොවැම්බර් 10 දින සිදුකරන ලද භෞතික විගණන පරීක්ෂණයට අනුව, ඉතිරි මීටර් 5,080.28ක නල එළීමේ කටයුතු, මීටර් 72,048.15ක පීඩන පරීක්ෂණ කටයුතු, බෝක්කු හරස් මාර්ග 50ක් සහ කපාට කුටි 103ක් සවිකිරීම අවශ්‍ය වේ. | කැබලි අක්ෂර බී කොන්ත්‍රාත්තුව අවසන් කිරීමට කඩිනම් ක්‍රියාමාර්ග ගත යුතුය. | බිලපත් නොගෙවීම, අයහපත් කාලගුණය යනාදී සාධාරණ හේතු මත කොන්ත්‍රාත්කරුට කාලය දීර්ඝ කිරීමක් ලබාදෙන ලදී.<br>දැනට ජාතික ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලය විසින් සාධාරණ හේතු මත 2022 මාර්තු 31 දින දක්වා කාලය දීර්ඝ කිරීමක් ලබාදී ඇත. | සැලසුම් කළ ප්‍රගතිය සියයට 98.70ක් වූ අතර 2022 ජනවාරි 31 දින වනවිට සමස්ත කාර්යයෙන් සියයට 96.31ක් අවසන් කර ඇත.<br>කොන්ත්‍රාත්කරුගේ ඉතිරි වැඩසටහන් පවතින සම්පත් මත කලින් කලට සමීප සුපරීක්ෂණයකට ලක්කරනු ලැබේ. |

| | | | | |
|---|---|---|---|---|
| | කෙසේවෙතත්, එම ඉතිරි කාර්යයන් 2022 ජනවාරි 31 දින වනවිට මාස තුනක් ඇතුළත අවසන් කළ හැකිද යන්න තීරණය කළ නොහැක. | | | |
| (ආ) | ඉසින්බැස්සගල කලාපයේ කි.මී. 115ක යූපීවීසී, ඩීඅයි හා ජීඅයි පයිප්ප බට එළීම (කැබලි අක්ෂර සී 1 කොන්ත්‍රාත්තුව) සහ නැගෙනහිර රඹෑව සහ ඇතාකන්ද කලාපයේ (කැබලි අක්ෂර සී- 3 කොන්ත්‍රාත්තුව) කි.මී . 119.6ක් දිගකින් යුත් ඩීඅයි හා ජීඅයි පයිප්ප බට එළීමේ කොන්ත්‍රාත්තු පිළිවෙලින් 2020 පෙබරවාරි 29 දින හා 2019 ජුලි 15 දින අවසන් කර තිබුණි. මෙම කොන්ත්‍රාත්තු යටතේ නල එළීමේ කටයුතු අවසන් වුවද, කැබලි අක්ෂර බී කොන්ත්‍රාත්තුව යටතේ ප්‍රධාන බෙදාහැරීමේ හා ප්‍රධාන සම්ප්‍රේෂණ කොටස අවසන් වන තෙක් නල මාර්ග සේදීම සහ විෂබීජනාශක කටයුතු කොන්ත්‍රාත්කරුවන් විසින් අත්හිටුවා තිබුණි. එසේ වුවද, 2021 මාර්තු 12 වන දින සේදීමේ (Flush) හා විෂබීජනාශක කටයුතු සිදුකිරීමට යටත්ව ව්‍යාපෘතිය | බී කැබලි අක්ෂරයේ ඉතිරි කටයුතු සම්පූර්ණ කිරීමේ කලාප සැලැස්මට අනුව, මෙම ජාලවල සේදීම් හා විෂබීජහරණය කිරීමෙන් පසුව බී කැබලි අක්ෂරය යටතේ සේදීම් හා විෂබීජහරණය සිදුකළ හැක.<br><br>සේදීම හා විෂබීජහරණය අවසන් වූ පසු සී1/සී3 කැබලි අක්ෂරයේ අවසන් බිල්පත කොන්ත්‍රාත්කරු විසින් ඉදිරිපත් කළ යුතුය. | කලාපයෙන් කලාපය සම්පූර්ණ කිරීම සඳහා කඩිනමින් ක්‍රියා කරන අතර ඉතිරි වැඩ සමීප අධීක්ෂණය යටතේ සිදුකෙරේ. | කැබලි අක්ෂර ඒ යටතේ වන ජල සම්පාදන ව්‍යාපෘතිය දැනට උපකරණ පරීක්ෂා කිරීමේ ක්‍රියාවලියේ පවතින අතර කැබලි අක්ෂර බී මගින් නල ජලය සේදීම ආරම්භ කර ඇත.<br><br>දැනටමත් පළමු සම්ප්‍රේෂණ කලාපය සෝදා ඇත. අනෙකුත් ප්‍රදේශ සේදීමට සැලසුම් කර ඇති අතර ව්‍යාපෘති කළමනාකරණ ඒකකය විසින් කොන්ත්‍රාත්කරු ගේ වැඩසටහන අනුගමනය කරයි. |

| | | | | |
|---|---|---|---|---|
| | මගින් මෙම කොන්ත්‍රාත්කරුවන්ට කොන්ත්‍රාත්තුව සම්පූර්ණ කිරීමේ සහතික නිකුත් කර තිබුණි. | | | |
| (ඇ) | 2020 දෙසැම්බර් 31 දින වනවිට ණය භාවිතා කිරීම සඳහා එකඟ වූ ණය මුදලෙන් ජපන් යෙන් මිලියන 3,214.81ක් හෙවත් රු. මිලියන 62.23ක් වුවද, , ව්‍යාපෘතිය අවසන් වීමට පෙර 2020 මාර්තු මස සිට 2021 සැප්තැම්බර් 17 දින දක්වා ණය දෙනු ලබන නියෝජිතායතනයට ජපන් යෙන් මිලියන 558.51ක් හෙවත් රු. මිලියන 994.38ක ණය ආපසු ගෙවීම් කර තිබුණි. | ව්‍යාපෘතිය අවසන් කිරීමට කඩිනම් ක්‍රියාමාර්ග ගතයුතු අතර ණය ආපසු ගෙවීමේ කොන්දේසි වෙනස් කරන ලෙස ජයිකා ආයතනයෙන් ඉල්ලීම් කළ යුතුය. | ජයිකා ආයතනය හා මුදල් අමාත්‍යාංශය අතර ණය ගිවිසුම අත්සන් කර ඇත. මුල් ගිවිසුමට අනුව ණය ආපසු ගෙවීම සිදුවේ. | මුල් ගිවිසුමට අනුව මුදල් අමාත්‍යාංශය මඟින් ණය ආපසු ගෙවීම් ක්‍රියාත්මක කෙරේ. මුදල් අමාත්‍යාංශය ද ව්‍යාපෘතියේ ප්‍රගතිය අඛණ්ඩව අධීක්ෂණය කරනු ලබයි. |
| (ඈ) | බිල්පත් ගෙවීම සඳහා විදේශ අරමුදල් ප්‍රමාණවත් නොවීම හේතුවෙන් කැබලි අක්ෂර ඒ කොන්ත්‍රාත්තුවට අදාළව රු. මිලියන 868.74ක් හෙවත් ඇ.එ.ජ. ඩොලර් 927, 547ක් වූ කොන්ත්‍රාත් බිල්පත්වල වටිනාකම සහ කැබලි අක්ෂර බී කොන්ත්‍රාත්තුවට අදාළව රු. මිලියන 595.62ක් හෙවත් ජපන් යෙන් 892.522ක් වූ බිල්පත්වල වටිනාකම ගෙවීම | ණය ක්‍රියාවලිය තුළින් අදාළ ගෙවීම් කටයුතු සිදුකිරීමට පියවර ගත යුතුය. | ප්‍රධාන කළමනාකරු විසින් අනුමත කරන ලද විචලා නියෝගයක් හරහා ප්‍රමාද ගාස්තු ගෙවන ලදී.<br>සියයට 98ක බිල්පත් හා වවුචර් ගෙවීම් ණය ක්‍රමය තුළින් ගෙවනු ලැබේ. මෙම වවුචර ද එම ක්‍රමය | මේ කරුණ/කාර්යය සම්බන්ධයෙන් ඉදිරියේදී ගෙවීම් කමිටුව තුළ අවධාරණය කිරීමට සහතික විය. |

| | | | | |
|---|---|---|---|---|
| | 2018 ජනවාරි මස සිට 2020 ජුලි මස දක්වා ප්‍රමාද වී තිබුණි. මෙම හිඟ බිල්පත් ගෙවීම් 2020 වර්ෂය තුළදී පියවා තිබුණද, කොන්ත්‍රාත්කරු විසින් කොන්ත්‍රාත්තුවේ කොන්දේසි වලට අනුව මූල්‍ය ගාස්තු පිළිවෙලින් රු. මිලියන 21.39ක්, ඇ.එ.ජ. ඩොලර් 10,429 ක් හා ජපන් යෙන් මිලියන 1.32ක් අය කරගෙන තිබුණි. එසේ වුවද, ණය ගිවිසුමට පටහැණිව මූල්‍ය ගාස්තුවලින් සියයට 98ක් 2021 වර්ෂයේදී රජයේ ආදායම යටතේ ගෙවීම වෙනුවට ණය ක්‍රමය හරහා වැරදි ලෙස ගෙවා ඇති බව නිරීක්ෂණය විය. | | යටතේ ගෙවා ඇත. | |
| (ඉ) | අදියර -01 ව්‍යාපෘති සංදේශයට අනුව, වයාපෘතියේ සැලසුම්ගත නිමකිරීමේ දිනය 2018 පෙබරවාරි මස විය. පසුව, කොටස් අක්ෂර ඒ හා බී කොන්ත්‍රාත් පදානය කිරීම හා දරුවල ක්‍රියාකාරිත්වය හේතුවෙන් එය 2022 ජුලි මාසය දක්වා දීර්ඝ කර තිබුණි. ඒ හේතුවෙන්, ව්‍යාපෘති කළමනාකරණ ඒකකය හා එහි උප කාර්යාල නඩත්තු කිරීම සඳහා අමතර පොදු | ව්‍යාපෘතිය ප්‍රමාදයකින්ත තොරව නිම කිරීම සඳහා කඩිනම් පියවර ගත යුතුය. | පුසම්පාදන අදියරේදී වර්ෂ 2කට අධික ප්‍රමාදයක් හා අනෙක්තු සාධාරණ හේතු මත සිදුවන ප්‍රමාදයන් පිළිබඳ ප්‍රධාන වශයෙන් සලකා බලා 2022 ජුලි මස දක්වා ජයිකා ආයතනය විසින් එහි කාලය දීර්ඝ කරන ලදී. කෙසේ වෙතත්, ව්‍යාපෘතිය සඳහා දීර්ඝ කළ එක් | කොන්ත්‍රාත් පැකේජ 7න් 5ක් නිම කර ඇති අතර අනෙකුත් පැකේජ දෙකෙහි ආසන්න වශයෙන් සියයට 95ක ප්‍රගතියක් දක්නට ලැබේ. |

| | | | |
|---|---|---|---|
| කාර්ය පිරිවැය වශයෙන් රු. මිලියන 132.7ක් දරා තිබුණි. | | කාලසීමාවක් තුළදී ව්‍යාපෘතිය අවසසන් කිරීමට අවශ්‍ය සියලු ක්‍රියාමාර්ග ගෙන ඇත. | |

## 2.7 අනුරාධපුර උතුර ජල සම්පාදන ව්‍යාපෘතිය -අදියර 2

(i) අනුරාධපුර දිස්ත්‍රික්කයේ ජල සම්පාදන පද්ධතියක් ඉදිකර සුරක්ෂිත පානීය ජලය සැපයීම හා ජල සම්පාදන ආවරණය වැඩි කිරීම සඳහා අනුරාධපුර උතුර ජල සම්පාදන ව්‍යාපෘතිය - අදියර 2 ක්‍රියාත්මක වන අතර එමගින් ප්‍රදේශයේ ජනතාවගේ සෞඛ්‍ය තත්ත්වය හා ජීවන පරිසරය වැඩිදියුණු කිරීමට දායක වේ.

(ii) ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත පිරිවැය ජපන් යෙන් මිලියන 27,301ක් හෙවත් රු. මිලියන 31,598ක් වන අතර එයින් ජපන් යෙන් මිලියන 23,137ක් හෙවත් රු. මිලියන 26,779ක් ජපාන අන්තර්ජාතික සහයෝගිතා නියෝජිතායතනය විසින් මූල්‍යයනය කිරීමට එකඟ වී ඇත.

(iii) 2017 ජූනි මාසයේදී ව්‍යාපෘතියේ කටයුතු ආරම්භ කර ඇති අතර 2024 ජූනි මාසය අවසන් වනවිට නිම කිරීමට සැලසුම් කර ඇත.

(iv) ව්‍යාපෘතිය සම්බන්ධයෙන් 2018,2019 හා 2020 වර්ෂ සඳහා ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන සඳහා විගණකාධිපති විසින් තත්ත්වාගණනය නොකළ මතයක් ඉදිරිපත් කර තිබුණි. කෙසේ වෙතත්, ව්‍යාපෘතියේ කාර්යසාධනය සම්බන්ධයෙන් මෙතෙක් නොවිසඳී ඇති ගැටලු කීපයක් පහත දැක්වේ.

| විගණන නිරීක්ෂණය | විගණකාධිපති නිර්දේශ | ව්‍යාපෘතිය විසින් ගනු ලැබූ වැළැක්වීමේ ක්‍රියාමාර්ග | වර්තමාන තත්ත්වය |
|---|---|---|---|
| (අ) ව්‍යාපෘතියේ සංයුක්ත සැලසුම් හා ප්‍රසම්පාදන | සංශෝධිත කොන්ත්‍රාත් කාලය | තාක්ෂණික ඇගයීම් කමිටුව, SCAPC, | ව්‍යාපෘතියේ ප්‍රධාන පැකේජ |

| | | | | |
|---|---|---|---|---|
| | සහාය සඳහා වූ උපදේශන කොන්ත්‍රාත්තුවේ කාලය 2021 අගෝස්තු 31 දිනෙන් අවසන් වුවද, 2021 අගෝස්තු 31 දින වනතුරුත් කොන්ත්‍රාත්තු 12න් 10ක් සඳහා ප්‍රදානයන් සිදුකර නොතිබුණි. | තුළ උපදේශන කටයුතු කඩිනම් කිරීමට අවශ්‍ය උපදෙස් ලබාදිය යුතුය. | CPCC වෙතින් ලංසු ලේඛන සඳහා අනුමැතිය ලබාගැනීමට අවශ්‍ය සෑම ක්‍රියාමාර්ගයක්ම ගන්නා ලද අතර කොවිඩ්-19 තත්ත්වය හේතුවෙන් සංචරණ සීමා පැවති කාලය තුළද නිරන්තර කටයුතු පවත්වාගෙන යාම සඳහා විදේශ සම්පත් දෙපාර්තමේන්තුව සමඟ ජයිකා ආයතනය විසින් අවසන් එකඟතාවය ලබාදී ඇත. | හයෙන් පහක් ලංසු ඇගයීමේ අදියරේ පවතින අතර 2022 වර්ෂයේ 2වන කාර්තුව තුළ අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබාගැනීමට අපේක්ෂා කෙරේ. |
| (ආ) | මෙහෙයුම් උපදේශන කොන්ත්‍රාත්තුව යටතේ මහජනතාව දැනුවත් කිරීම සඳහා රු. මිලියන 4ක් වෙන්කර තිබූ අතර මහජනතාව දැනුවත් කිරීම සඳහා කිසිදු වැඩසටහනක් හෝ සම්මන්ත්‍රණයක් පවත්වා නොතිබුණි. | කොන්ත්‍රාත් පිරිනමා අරම්භ කිරීමට පෙර ජනතාව දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීමට කටයුතු කළ යුතුය. | 2022 ජනවාරි 10 සහ 25 යන දිනවලදී ජ්‍යෙෂ්ඨ මහජන සම්බන්ධතා නිලධාරි සහ සහකාර මහජන සම්බන්ධතා නිලධාරී යන තනතුරුවලට පත් කිරීම් සිදුකරන ලදී.<br>මහජන දැනුවත්කිරීම් සඳහා ජනවාරි 27 දින ජ්‍යෙෂ්ඨ මහජන සම්බන්ධතා නිලධාරී විසින් ව්‍යාපෘති කළමනාකරණ ඒකකය සමඟ රැස්වීමක් පවත්වන ලදී. | ජනතාව දැනුවත් කිරීමේ වැඩසටහන් ක්‍රියාකාරකම් 2022 ජනවාරි 10 වන දින ආරම්භ කර ඇති අතර අනෙකුත් දැනුවත්කිරීම් වැඩසටහන් ඇතුළුව ප්‍රධාන දැනුවත් කිරීම් වැඩමුළු 05ක් පැවැත්වීමට සැලසුම් කර ඇත. |

| | | | | |
|---|---|---|---|---|
| (ඇ) | ව්‍යාපෘති අදියර II මගින් කැබතිගොල්ලෑව, පදවිය, හොරොව්පතාන හා කහටගස්දිගිලිය යන ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශ ආවරණය වන අතර එම ප්‍රදේශ අනාරක්ෂිත දූෂිත භූගත ජලයෙන් යැපෙන හා නිදන්ගත වකුගඩු රෝග පැතිර යන ප්‍රදේශ වේ. එබැවින් මෙම ජල සම්පාදන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට රජය ප්‍රමුඛත්වය ලබාදී තිබුණි. කෙසේවෙතත්, ව්‍යාපෘති කොන්ත්‍රාත්තුවේ ප්‍රසම්පාදන ක්‍රියාවලිය ප්‍රසම්පාදන සැලැස්මට අනුකූල නොවුණි. එහි ප්‍රතිඵලයක් වශයෙන් සංශෝධිත ව්‍යාපෘති කාලසීමාව තුළ ව්‍යාපෘතිය නිම කිරීම අවිනිශ්චිත විය. | නියමිත කාලසීමාව තුළ ව්‍යාපෘතිය නිම කිරීමට සහ සමීප සුපරීක්ෂණය සඳහා විශේෂ අවධානය යොමු කළ යුතුය. | ගොවීන්ගේ හා මහජන විරෝධය හේතුවෙන් වාහල්කඩ ජල මූලාශ්‍රය යාන් ඔයට වෙනස් කර නව ජල මූලාශ්‍රයක් ලෙස යාන් ඔය සඳහා අනුමැතිය ලබා ගන්නා ලදී. . | පැකේජ හයෙන් පහක් ලංසු ඇගයීමේ අදියරේ පවතින අතර 2022 වර්ෂයේ 2වන කාර්තුව තුළ අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබාගැනීමට අපේක්ෂා කෙරේ. |

## 2.8 යාපනය සහ කිළිනොච්චි ජල සම්පාදන හා සනීපාරක්ෂක ව්‍යාපෘතිය

(i) ව්‍යාපෘතිය යටතට අයත් ප්‍රදේශවල ජීවත්වන පදිංචිකරුවන් සඳහා ජල සැපයුම හා සනීපාරක්ෂක යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම සහ යාපනය අර්ධද්වීපයේ ජල මූලාශ්‍ර ආරක්ෂා කිරීම හා කළමනාකරණය කිරීම සඳහා යාපනය සහ කිළිනොච්චි ජල සම්පාදන හා සනීපාරක්ෂක ව්‍යාපෘතිය ක්‍රියාත්මක කෙරේ.

(ii) ව්‍යාපතියේ ඇස්තමේන්තුගත පිරිවැය ඇ.එ.ජ. ඩොලර් මිලියන 147.45ක් හෙවත් රු. මිලියන 16,474.59 ක් වන අතර ඉන් ඇ.එ.ජ. ඩොලර් මිලියන 76.45ක් හෙවත් රු. මිලියන 8,541.76ක් ආසියානු සංවර්ධන බැංකුව මගින් මූල්‍යායනය කිරීමට එකඟ වී ඇති අතර, ඇ.එ.ජ. ඩොලර් මිලියන 48ක් හෙවත් රු. මිලියන 5,363.04ක් ෆ්‍රාන්ක්ස් ඩි ඩිවලෝප්මන්ට්

විසින් මූල්‍යායනය කිරීමට එකඟ වී ඇත. කෙසේ වෙතත්, 2015 ඔක්තෝබර් 06 දින ඒජන්සි ෆ්‍රැන්ක්ස් ඩි ඩිවලෝප්මන්ට් වෙතින් ණය අවලංගු කරන ලද අතර ව්‍යාපෘතියේ ඇතැම් ක්‍රියාකාරකම් නිසා ඉරණමඩු වැවේ සිට ලවනීකරණ කම්හලක් දක්වා ජල මූලාශ්‍රයක් ලෙස ව්‍යාපෘති විෂය පථය ප්‍රතිව්‍යුහගත කිරීම හේතුවෙන් අත්හිටුවා තිබුණි. එබැවින්, ශ්‍රී ලංකා රජය විසින් 2017 දෙසැම්බර් 15 වන දින ආසියානු සංවර්ධන බැංකුව සමඟ අතිරේක ණය ගිවිසුමක් අත්සන් කර තිබුණි.

(iii) අතිරේක ණය ගිවිසුම්වලට අනුව, ව්‍යාපෘතියේ ක්‍රියාකාරකම් සඳහා ඇස්තමේන්තුගත මුළු පිරිවැය ඇ.එ.ජ. ඩොලර් මිලියන 153ක් හෙවත් රු. මිලියන 23,256ක් විය. ඉන් ඇ.එ.ජ. ඩොලර් මිලියන 120ක් හෙවත් රු. මිලියන 18,240ක් ආසියානු සංවර්ධන බැංකුව විසින් ලබාදීමට එකඟ වී ඇත.

(iv) 2011 පෙබරවාරි 11 දින එහි කටයුතු ආරම්භ කර ඇති අතර 2017 අගෝස්තු 14 වන දින අවසන් කිරීමට නියමිතව තිබුණි. කෙසේවෙතත්, ජල මූලාශ්‍රවල වෙනස්වීම් හේතුවෙන් ව්‍යාපෘති කාලය 2026 ජුනි 30 දින දක්වා දීර්ඝ කර ඇත. එහි ප්‍රතිඵලයක් වශයෙන් යාපනය අර්ධද්වීපය වෙත පානීය ජලය ලබාදීම ප්‍රමාද විය.

(v) ව්‍යාපෘතිය සම්බන්ධයෙන් 2018,2019 හා 2020 වර්ෂ සඳහා ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන සඳහා විගණකාධිපති විසින් තත්ත්වාගණනය කළ මතයක් ඉදිරිපත් කර තිබුණි. කෙසේ වෙතත්, ව්‍යාපෘතියේ කාර්යසාධනය සම්බන්ධයෙන් මෙතෙක් නොවිසඳී ඇති ගැටලු කීපයක් පහත දැක්වේ.

| **විගණන නිරීක්ෂණය** | **විගණකාධිපති නිර්දේශ** | **ව්‍යාපෘතිය විසින් ගනු ලැබූ වැළැක්වීමේ ක්‍රියාමාර්ග** | **වර්තමාන තත්ත්වය** |
|---|---|---|---|
| සංශෝධිත විෂය පථයට අනුව යාපනය කිළිනොච්චි ප්‍රදේශයට ජල සම්පාදන පහසුකම් සැලසීම සඳහා මුහුදු ජලය ආශ්‍රිත යාන්ත්‍රණයක් ස්ථාපිත කිරීමට නියමිතව තිබූ අතර එය 2023 වර්ෂය වනවිට අවසන් කිරීමට අපේක්ෂා කර තිබුණි. රු. | සැලසුම් කළ පරිදි ව්‍යාපෘතියේ අපේක්ෂිත ප්‍රතිඵලය අදාළ පාර්ශවයන් වෙත ලබාදිය යුතුය. | මුහුදු ජල අවශෝෂණ බලාගාරය ඉදිකිරීමේ කොන්ත්‍රාත්තුව ප්‍රදානය කර ඇති අතර සැලැසුම් කර ඇති ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට | සැලසුම් කළ පරිදි ජල සම්පාදන යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කිරීම සඳහා මුහුදු ජලය නිස්සාරණය කිරීමේ |

| | | |
|---|---|---|
| මිලියන 1,140ක් වූ ඇස්තමේන්තුගත වියදමින් ජල කුළුණු 15ක් ඉදිකිරීම සහ රු. මිලියන 5,536ක ඇස්තමේන්තුගත මුදලින් පිරිපහදු කළ ජල සම්ප්‍රේෂණ නල එළීමේ කොන්ත්‍රාත්තුව යටතේ වූ කාර්යයන් 2018 දෙසැම්බර් 31 දින වනවිට අවසන් කර තිබුණද, ව්‍යාපෘතිය යටතේ නිම කරන ලද මෙම සියලුම ඉදිකිරීම් කටයුතු සඳහා සුදුසු ජල මූලාශ්‍රයක් නොමැතිකම හේතුවෙන් වර්ෂ තුනක සිටම අක්‍රියව පැවතුණි. | බලාපොරොත්තු වේ. | කර්මාන්ත ශාලාවක් ඉදිකිරීම සඳහා කොන්ත්‍රාත්තු සකස් කරමින් පවතී. |

## 2.9 නිමැවුම් පදනම් වූ ආධාර ව්‍යාපෘතිය පිළිබඳ ගෝලීය හවුල්කාරිත්වය

(i) දැනට පවතින හා නව මලාපවාහන ජාල සඳහා මලාපවාහන නිවාස සම්බන්ධතා සංඛ්‍යාව වැඩිකිරීම හා ගෘහස්ථ සනීපාරක්ෂක සේවා වැඩිදියුණු කිරීම තුළින් මහ කොළඹ අඩු ආදායම්ලාභී නිවාස සඳහා සනීපාරක්ෂක සේවා වැඩිදියුණු කිරීම සඳහා නිමැවුම් පදනම් වූ ආධාර පිළිබඳ ගෝලීය හවුල්කාරිත්වය ක්‍රියාත්මක කෙරේ.

(ii) ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත පිරිවැය ඇ.එ.ජ. ඩොලර් මිලියන 13.10ක් හෙවත් රු. මිලියන 1,559ක් වන අතර එයින් ඇ.එ.ජ. ඩොලර් මිලියන 5.08ක් හෙවත් රු. මිලියන 583.66ක් ප්‍රතිසංස්කරණය හා සංවර්ධනය සඳහා වූ ජාත්‍යාන්තර බැංකුව හා ජාත්‍යාන්තර සංවර්ධන සංගමය විසින් මූල්‍යයනය කිරීමට එකඟ වී ඇත.

(iii) 2011 දෙසැම්බර් මාසයේදී එහි කටයුතු ආරම්භ කර ඇති අතර 2015 දෙසැම්බර් 31 දින වනවිට අවසන් කිරීමට නියමිතව තිබුණි. කෙසේවෙතත්, ව්‍යාපෘති කාලය 2019 මාර්තු 31 දින දක්වා තෙවරක් දීර්ඝ කර තිබුණි. ව්‍යාපෘතියේ කටයුතු 2019 මාර්තු මාසයේදී අවසන් කර තිබුණි

(iv) ව්‍යාපෘතිය සම්බන්ධයෙන් 2018,2019 හා 2020 වර්ෂ සඳහා ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන සඳහා විගණකාධිපති විසින් තත්ත්වාගණනය කළ මතයක් ඉදිරිපත් කර තිබුණි. කෙසේ වෙතත්, ව්යාපෘතියේ කාර්යසාධනය සම්බන්ධයෙන් මෙතෙක් නොවිසඳී ඇති ගැටලු කීපයක් පහත දැක්වේ.

| විගණන නිරීක්ෂණය | විගණකාධිපති නිර්දේශ | ව්‍යාපෘතිය විසින් ගනු ලැබූ වැළැක්වීමේ ක්‍රියාමාර්ග | වර්තමාන තත්ත්වය |
|---|---|---|---|
| 2015 දෙසැම්බර් 31 දින වනවිට සනීපාරක්ෂක සේවා යටතේ මලාපවාහන සම්බන්ධතා 13,107ක් සහ මලාපවාහන පිරිපහදු ඒකක 2,300ක් ස්ථාපනය කිරීමට ව්‍යාපෘතිය යතේ මූලිකව සැලසුම් කර තිබුණි. පසුව, ව්‍යාපෘති පිරිවැය වැඩිවීම හේතුවෙන් එය මලාපවාහන සම්බන්ධතා 5,015ක් හා මලාපවාහන පිරිපහදු ඒකක 3,785ක් දක්වා සංශෝධනය කර තිබුණි. 2019 මාර්තු මාසයේදී ව්‍යාපෘතිය අවසන් කර මලාපවාහන සම්බන්ධතා 4,793ක් හා මලාපවාහන පිරිපහදු ඒකක 3,554ක ඉලක්කය සපුරාගෙන තිබුණද, 2020 ජූනි 30 දින වනවිටත් ඇවර කිරීමේ ගිණුම් සකස් කිරීමට කටයුතු කර නොතිබුණි. | වත්කම් ප්‍රාග්ධනිත කිරීමට හා ප්‍රමාදයකින් තොරව ඇවර කිරීමේ ගිණුම් සකස් කිරීමට කඩිනමින් පියවර ගත යුතුය. | 2020 මූල්‍ය වර්ෂයේදී ව්‍යාපෘතිය පූර්ණ වශයෙන් ප්‍රාග්ධනිත කරන ලදී. | මෙම වත්කම් ප්‍රාග්ධනිත කර නොමැත. |

## 2.10 මහනුවර නගරයේ අපජල කළමනාකරණ ව්‍යාපෘතිය

(i) සනීපාරක්ෂක පහසුකම් ප්‍රතිසංස්කරණය කිරීම ඇතුළුව මහනුවර නගරයේ අපජලය එකතු කිරීම, පිරිපහදු කිරීම හා බැහැර කිරීම සඳහා නිසි ක්‍රමවේදයක් සකස් කරමින් වඩා ඉහළ සනීපාරක්ෂක පහසුකම් තුළින් මහවැලි ගඟ ආශ්‍රිත ජීවන පරිසරය හා ජල තත්ත්වය වැඩිදියුණු කිරීම සඳහා මහනුවර නගරයේ අපජල කළමනාකරණ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කෙරේ.

ජනාකීර්ණ ප්‍රදේශවල හා එම ප්‍රදේශයේ ජනතාවගේ ජීවන තත්ත්වය, සෞඛ්‍යය හා යහපැවැත්ම වැඩිදියුණු කිරීම මෙමඟින් අපේක්ෂා කෙරේ.

(ii) ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත පිරිවැය ජපන් යෙන් මිලියන 17,278ක් හෙවත් රු. මිලියන 21,982ක් වන අතර එයින් ජපන් යෙන් මිලියන 14,087ක් හෙවත් රු. මිලියන 17,922ක් ජපාන ජාත්‍යන්තර සහයෝගිතා නියෝජිතායතනය විසින් මූල්‍යායනය කිරීමට එකඟ වී ඇත.

(iii) 2010 පෙබරවාරි 03 දින ව්‍යාපෘතියේ කටයුතු අරම්භ කර ඇති අතර 2017 සැප්තැම්බර් මාසය වනවිට එහි කටයුතු අවසන් කිරීමට නියමිතව තිබුණි. කෙසේවෙතත්, කොන්ත්‍රාත්කරුවන් විසින් එම කටයුතු අවසන් නොකිරීම හේතුවෙන් 2022 දෙසැම්බර් 31 දින දක්වා මෙහි කාලය දීර්ඝ කර ඇත. මේ හේතුවෙන් මහනුවර නගරයේ අපජලය නිසි ලෙස බැහැර කිරීමේ කටයුතු ප්‍රමාද වී තිබුණි.

(iv) ව්‍යාපෘතිය සම්බන්ධයෙන් 2018,2019 හා 2020 වර්ෂ සඳහා ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන සඳහා විගණකාධිපති විසින් තත්ත්වාගණනය නොකළ මතයක් ඉදිරිපත් කර තිබුණි. කෙසේ වෙතත්, ව්‍යාපෘතියේ කාර්යසාධනය සම්බන්ධයෙන් මෙතෙක් නොවිසඳී ඇති ගැටලු කීපයක් පහත දැක්වේ.

| විගණන නිරීක්ෂණය | විගණකාධිපති නිර්දේශ | ව්‍යාපෘතිය විසින් ගනු ලැබූ වැළැක්වීමේ ක්‍රියාමාර්ග | වර්තමාන තත්ත්වය |
|---|---|---|---|
| 2022 දෙසැම්බර් 31 දින වනවිට ව්‍යාපෘතියේ කටයුතු අවසන් කිරීමට නියමිතව තිබුණද, මහාමායා ප්‍රාථමික විද්‍යාලයට ආසන්න මනුබිල් පොම්පාගාරය පිහිටි ආලෝකා රෝහල් පරිශ්‍රයේ ඇති අමතර ඉඩමේ අයිතිය හා දෙයියන්වෙල මනුබිල් පොම්පාගාරය පිහිටි ඉඩම | අමතර වියදම් වැඩිවීම වළක්වා ගැනීම සඳහා ව්‍යාපෘතිය නිසි කලට අවසන් කල යුතුය. | සඳහන් කර නොමැත | |

සම්බන්ධ කටයුතු අවසන් කර
නොතිබුණි.

## 2.11 ජල සම්පාදන හා සනීපාරක්ෂක කටයුතු වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය

(i) තෝරාගත් දිස්ත්‍රික්කවල නල ජල ප්‍රවේශය වැඩි කිරීම සහ සනීපාරක්ෂාව වැඩිදියුණු කිරීම සහ ඒ ආශ්‍රිත ආයතනවල ධාරිතාවය ශක්තිමත් කිරීම සඳහා ජල සම්පාදන හා සනීපාරක්ෂක කටයුතු වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කෙරේ.

(ii) ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත පිරිවැය ඇ.එ.ජ. ඩොලර් මිලියන 183.90 ක් හෙවත් රු. මිලියන 27,590ක් වන අතර එයින් ඇ.එ.ජ. ඩොලර් මිලියන 165ක් හෙවත් රු. මිලියන 24,750ක් ජාත්‍යන්තර සංවර්ධන සංගමය මගින් මූල්‍යයනය කිරීමට එකඟ වී ඇත.

(iii) 2015 දෙසැම්බර් 07 දින ව්‍යාපෘතියේ කටයුතු ආරම්භ කර ඇති අතර 2020 දෙසැම්බර් 31 දින වනවිට අවසන් කිරීමට නියමිතව තිබුණි. කෙසේවෙතත්, ව්‍යාපෘති කාලය 2022 මාර්තු 31 දින දක්වා දීර්ඝ කර තිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස තෝරාගත් දිස්ත්‍රික්කවල නල ජල සේවා සඳහා ප්‍රවේශය වැඩිකිරීම සහ සනීපාරක්ෂක කටයුතු වැඩිදියුණු කිරීම මෙන්ම ඒ ආශ්‍රිත ආයතනවල ධාරිතාවය ශක්තිමත් කිරීමේ කටයුතු සාක්ෂාත් කරගැනීමට නොහැකි වී තිබුණි.

(iv) ව්‍යාපෘතිය සම්බන්ධයෙන් 2018,2019 හා 2020 වර්ෂ සඳහා ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන සඳහා විගණකාධිපති විසින් තත්ත්වාගණනය කළ මතයක් ඉදිරිපත් කර තිබුණි. කෙසේ වෙතත්, ව්‍යාපෘතියේ කාර්යසාධනය සම්බන්ධයෙන් මෙතෙක් නොවිසඳී ඇති ගැටලු කීපයක් පහත දැක්වේ.

| විගණන නිරීක්ෂණය | විගණකාධිපති නිර්දේශ | ව්‍යාපෘතිය විසින් ගනු ලැබූ වැළැක්වීමේ ක්‍රියාමාර්ග | වර්තමාන තත්ත්වය |
|---|---|---|---|
| (අ) ව්‍යාපෘති ඇගයුම් ලේඛනයේ නිම කරන ලද ව්‍යාපෘතිවල ප්‍රජා දායකත්වය 38 වන වගන්තිය අනුව, ග්‍රාමීය ව්‍යාපෘති සඳහා ප්‍රජා හඳුනාගෙන 2021 මූල්‍ය ප්‍රකාශන තුළ සහ වතු ජල සම්පාදන දායකත්වය හඳුනාගත ඇතුළත් කර ඇත. | | | |

| | | | |
|---|---|---|---|
| | යෝජනා ක්‍රම සඳහා රු. මිලියන 189.87ක ප්‍රජා දායකත්වයක් සහ නිම කරන ලද ව්‍යාපෘති කටයුතු වෙනුවෙන් ග්‍රාමීය ජල සම්පාදන පුනරුත්ථාපන යෝජනා ක්‍රම සඳහා රු. මිලියන 250.6ක ප්‍රජා දායකත්වයක් හඳුනාගෙන මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් කර නොතිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස ප්‍රජා දායකත්වයේ ශේෂය මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ රු. මිලියන 440.47කින් අඩුවෙන් දක්වා තිබුණි. | යුතුය. | |
| (ආ) | විදේශ සම්පත් දෙපාර්තමේන්තුව විසින් පවත්වාගෙන යනු ලබන වාර්තාවලට අනුව 2020 දෙසැම්බර් 31 දිනට ණය දෙන නියෝජිතායතනය විසින් ඇ.එ.ජ. ඩොලර් මිලියන 116ක් හෙවත් රු. මිලියන 21,623ක් ලබාදී තිබුණි. එහෙත්, ඊට අදාළ මුදල් රු. මිලියන 19,179ක් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස ණය ක්‍රියාවලිය මූල්‍ය ප්‍රකශනවල අඩුවෙන් දක්වා තිබුණි. | ඉතිරි ණය ප්‍රමාණය නිවැරදිව සටහන් කළ යුතුය. | 2021 මූල්‍ය ප්‍රකාශනවල එය දක්වා ඇත. |

| | | | | |
|---|---|---|---|---|
| (ඇ) | සමාලෝචිත වර්ෂය තුළ කොන්ත්‍රාත්කරුවන් සිව් දෙනෙකුගෙන් අඩු කරන ලද රු. මිලියන 16.78ක ද්‍රවශීලතා හානි සම්බන්ධයෙන් 2021 අප්‍රේල් 30 දින වනවිටත් ඒකාබද්ධ අරමුදලට බැර කර නොතිබුණි. | මුදල් රෙගුලාසි විධිවිධාන අනුව කටයුතු කළ යුතුය. | එය වර්ෂය තුළදී අමාත්‍යාංශය වෙත යොමුකර ඇත. | |
| (ඈ) | එම ව්‍යාපෘතිය සඳහාම අවස්ථා දෙකක සිට පහක් දක්වා ජල සම්පාදන ව්‍යාපෘති එකොළහක නිරත වන කොන්ත්‍රාත්කරුවන්ගේ මුල් කොන්ත්‍රාත් කාලය ඉක්මවන ලෙස රු. මිලියන 512.12ක ආරම්භක අත්තිකාරම් මුදල ළඟ තබාගැනීමේ කාලය දීර්ඝ කර ඇති බවත් නිරීක්ෂණය වූ අතර කොන්ත්‍රාත්කරුවන් වසරකට වැඩි කාලයක් ව්‍යාපෘතියේ කටයුතු සඳහා යොදාගෙන නොතිබුණි. | නියමිත කාලසීමාව තුළ අවසන් කිරීම සඳහා දිස්ත්‍රික් කළමනාකරු විසින් ව්‍යාපෘති ප්‍රගතිය නිරීක්ෂණය කළ යුතුය. | වරින් වර ව්‍යාපෘතියේ කටයුතු සමාලෝචනය කිරීමට කටයුතු කර ඇත. | |
| (ඉ) | බදුල්ල දිස්ත්‍රික්කයේ උඩුබද්දන ජල යෝජනා ක්‍රමය සඳහා රු. මිලියන 98.6ක වියදමින් ලබාදී ඇති කොන්ත්‍රාත්තුව 2019 පෙබරවාරි 13 දින වනවිට අවසන් කිරීමට නියමිතව තිබුණි. පසුව, කෙන්ත්‍රාත්කරුගේ දුර්වල ක්‍රියාකාරිත්වය හේතුවෙන් | කාර්යසාධන බැඳුම්කර සහ අත්තිකාරම් ඇපකර කොන්ත්‍රාත් ගිවිසුමේ නියමයන්ට අනුව කඩිනමින් මුදල් බවට පත් කළ යුතුය. | ජල මූලාශ්‍ර ගැටලු හේතුවෙන් එය මනා ලෙස අවසන් කර නව කොන්ත්‍රාත්තුවක් නැවත ප්‍රදානය කර තිබුණි. | අධිකරණ ක්‍රියාමාර්ග ඔස්සේ පසුකාලීනව නීත්‍යානුකූලව විසඳාගෙන ඇත. |

| | | | | |
|---|---|---|---|---|
| | කාර්යය සියයට 52ක් අවසන් කිරීමෙන් පසු කොන්ත්‍රාත්තුව අවසන් කර තිබුණි. කෙසේ වෙතත්, ඉතිරි වැඩ අවසන් කිරීම සඳහා 2021 අප්‍රේල් 30 දින වනවිටත් කොන්ත්‍රාත්තුවක් ප්‍රදානය කර නොතිබුණි. | | | |
| (ඊ) | කිළිනොච්චි දිස්ත්‍රික්කයේ පොන්නගර් පතිපුරම්හි ජල සම්පාදන ව්‍යාපෘතිය සඳහා රු. මිලියන 216.93ක පිරිවැය යටතේ ලබාදුන් ඉදිකිරීම් වැඩ කොන්ත්‍රාත්තුව 2018 ඔක්තෝබර් 20 දින අවසන් කිරීමට නියමිතව තිබුණි. පසුව, දුර්වල කාර්යසාධනය හේතුවෙන් කොන්ත්‍රාත්තුව අවසන් කර තිබුණි. කෙසේ වෙතත්, 2021 අප්‍රේල් 30 දින වනවිට ව්‍යාපෘතියේ කටයුතු අවසන් කිරීමට කොන්ත්‍රාත්කරු අපොහොසත් වී තිබුණි. | -එම- | -එම- | -එම- |
| (උ) | මන්නාවත්ත භූගත ජලාශ භූමියේ ජනන යන්ත්‍ර නිවාසයක් ඉදිකිරීම හේතුවෙන් පඹගින්න නාගරික ජල සම්පාදන ව්‍යාපෘතිය සඳහා | කාර්යක්ෂම හා ඵලදායී ලෙස උපයෝජනය කිරීමට කටයුතු කළ යුතුය. | ජනන යන්ත්‍ර කුලියට ගැනීම අවසන් කර ඇති අතර එම කාමරය උත්පාදක කාමරයට සම්බන්ධ කර ඇත. | |

| | | | |
|---|---|---|---|
| | රු. මිලියන 7ක පිරිවැයක් යටතේ ආනයනය කරන ලද විදුලිජනන යන්ත්‍ර අක්‍රීය තත්ත්වයේ පැවතුණි. | | |
| (ඖ) | සමලෝචිත වර්ෂය තුළදී රථ වාහන හතක් ජාතික ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලය, වැවිලි මානව සංවර්ධන භාරය හා ජාතික ප්‍රජා හා ජල සම්පාදන දෙපාර්තමේන්තුව වෙත මුදා හැර ඇති අතර ඒ සඳහා රු. මිලියන 1.22 ක් වැයකර තිබුණි. | එම ආයතන විසින් වාහන ලබාගැනීම සම්බන්ධයෙන් පසු විපරම් කළ යුතුය. | එබැවින් කොටස් හිමියන්ගේ ආයතනවල ධාරිතාවය වර්ධනය කිරීම සඳහා සංරචක දෙක යටතේ සම්පත් වෙන්කර ඇත. |
| (එ) | 2019 වර්ෂය තුළදී රු. 27,238,510ක පිරිවැයක් යටතේ ව්‍යාපෘතිය මගින් ප්‍රසම්පාදනය කරන ලද ජංගම විද්‍යාගාරයක් රථයේ හිමිකම පැවරීමකින් තොරව 2019 අප්‍රේල් 10 වන දින ජාතික ප්‍රජා හා ජල සම්පාදන දෙපාර්තමේන්තුව වෙත භාර දී තිබුණි. කෙසේ වෙතත්, එය නියැදි එකතු කිරීම සඳහා සමාලෝචිත වර්ෂය අවසානයේදී දින 24ක් සඳහා පමණක් භාවිතා කර තිබුණි. | ව්‍යාපෘති අරමුදල් ඵලදායී ලෙස උපයෝජනය සහතික කිරීම සඳහා නිසි අධීක්ෂණ යාන්ත්‍රණයක් ක්‍රියාත්මක කළ යුතුය. | මේ වනවිට හිමිකම පවරා ඇති අතර දැනට ජංගම විද්‍යාගාරය නියැදි එකතු කිරීම හා පරීක්ෂණ පැවැත්වීම සඳහා භාවිතා කරනු ලැබේ. |

## 2.12 නගර සඳහා සනීපාරක්ෂක හා ස්වස්ථතා ආරම්භක ව්‍යාපෘතිය

(i) (අ) මීගමුව මහ නගර සභා බල ප්‍රදේශයේ පුද්ගලයන් 73,000ක් සඳහා අපජලය එකතු කිරීමේ හා පිරිපහදු කිරීමේ පද්ධති පුළුල් කිරීම හා සනීපාරක්ෂක සේවා වැඩිදියුණු කිරීම (ආ) ජල හා සනීපාරක්ෂක අංශයේ රාමුව පැහැදිලි කිරීම හා වැඩිදියුණු කිරීම (ඇ)

දරිද්‍රතාවයට එරෙහිව සටන් කිරීමට හා වෙරළබඩ හා සාගර පරිසර පද්ධති ආරක්ෂා කිරීමට සහ ජෛව විවිධත්වය පවත්වාගැනීමට සැලසුම් කිරීම, දූප්පතුන්ට හිතකර ප්‍රතිපත්ති සංවර්ධනය තුළින් දිළිදු කුටුම්බ සඳහා සේවා ප්‍රවේශයන් පහසු කිරීම සඳහා නගර සඳහා සනීපාරක්ෂක හා ස්වස්ථතා ආරම්භක ව්‍යාපෘතිය ක්‍රියාත්මක කෙරේ.

(ii) ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත පිරිවැය යුරෝ මිලියන 107.70ක් හෙවත් රු. මිලියන 18,793.81ක් වේ. එයින් යුරෝ මිලියන 76ක් හෙවත් රු. මිලියන 13,224ක් ණය වශයෙන් ඒජන්සි ෆ්‍රැන්කේස් ඩී ඩිවලොප්මන්ට් විසින් මූල්‍යායනය කිරීමට එකඟ වී ඇති අතර යුරෝ මිලියන 5.70ක් හෙවත් රු. මිලියන 991.81ක් ප්‍රදානයක් ලෙස හිමිවේ.

(iii) 2016 ජුනි 01 දින ව්‍යාපෘති කටයුතු ආරම්භ කර ඇති අතර 2022 ජුනි 30 දින වනවිට අවසන් කිරීමට නියමිතව තිබුණි.

(iv) ව්‍යාපෘතිය සම්බන්ධයෙන් 2018, 2019 හා 2020 වර්ෂ සඳහා ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන සඳහා විගණකාධිපති විසින් තත්ත්වාගණනය නොකළ මතයක් ඉදිරිපත් කර තිබුණි. කෙසේ වෙතත්, ව්‍යාපෘතියේ කාර්යසාධනය සම්බන්ධයෙන් මෙතෙක් නොවිසඳී ඇති ගැටලු කීපයක් පහත දැක්වේ.

| විගණන නිරීක්ෂණය | විගණකාධිපති නිර්දේශ | ව්‍යාපෘතිය විසින් ගනු ලැබූ වැළැක්වීමේ ක්‍රියාමාර්ග | වර්තමාන තත්ත්වය |
|---|---|---|---|
| ජාතික ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලය විසින් ගාල්ල දිස්ත්‍රික්කයේ අපජල පවිත්‍රාගාරයක් ඉදිකිරීමට නියමිතව තිබූ අතර ව්‍යාපෘතිය මගින් පවිත්‍රාගාරයේ කොටසක් සැලසුම් කිරීම අවසන් කර තිබුණි. තවද, ජාතික ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලය විසින් ඒ සඳහා ඉඩමක් තෝරාගෙන 2014 වර්ෂය අවසන් වනවිට අත්පත් කරගැනීමේ ක්‍රියාවලිය ආරම්භ කර | ඉඩම් අත්පත් කරගැනීම ඵලදායී, ආර්ථිකමය හා කාර්යක්ෂම අයුරින් සිදුකළ යුතුය. | හිමිකාරිත්වය සම්බන්ධ විමර්ශනය කඩිනම් කිරීමට ව්‍යාපෘතිය වෙනුවෙන් පියවර ගෙන තිබුණි. | ඉහත ඉඩම් රජයට පවරා ඇති අතර එම ඉඩම්වල අයිතිය හිමිකරුවන් විසින් පවරා තිබුණි. |

2019 ජුනි 17 දින වනවිට අවසන් කර තිබුණි. කෙසේ වෙතත්, මිලදී ගැනීම සඳහා මේ වනවිටත් ගෙවන ලද අත්තිකාරම් ආපසු අයකර ගැනීමට ජාතික ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලය විසින් ගොනු කර ඇති නඩුවේ තීන්දුව ප්‍රමාද වීම හේතුවෙන් 2021 ජුනි මස 30 දින දක්වා ජාතික ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලයට ඉඩමේ නීත්‍යානුකූල අයිතිය පවරා නොතිබුණි.

## 3. මාර්ග ඉදිකිරීම් සහ ප්‍රවාහන අංශය

### 3.1 ජාතික මාර්ග ජාලයේ ප්‍රධාන පාලම් ඉදිකිරීමේ ව්‍යාපෘතියේ (ප්‍රධාන පාලම් 37 ක් ඉදිකිරීමේ ව්‍යාපෘතිය)

(i) ජාතික මාර්ග ජාලයේ ප්‍රධාන පාලම් ඉදිකිරීමේ ව්‍යාපෘතියේ (ප්‍රධාන පාලම් 37 ක් ඉදිකිරීමේ ව්‍යාපෘතිය) ජාතික මාර්ගවල ප්‍රධාන පාලම් ඉදිකිරීම මඟින් ජාතික මාර්ග ජාලය වැඩි දියුණු කිරීම හා එමඟින් ආර්ථික සංවර්ධනයට දායකවීමේ අරමුණින් ක්‍රියාත්මක වේ.

(ii) ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත පිරිවැය රු.මිලියන 27,250කට සමාන ජපන් යෙන් මිලියන 16,132ක් වන අතර ඉන් රු.මිලියන 20,914කට සමාන ජපන් යෙන් මිලියන 12,381 ක් සැපයීමට ජපන් ජාත්‍යන්තර සහයෝගීතා නියෝජිතායතනය එකඟ වී තිබුණි.

(iii) ව්‍යාපෘතිය එහි කටයුතු 2013 මාර්තු 14 දින ආරම්භ කළ අතර 2019 වර්ෂයේදී අවසන් කිරීමට නියමිත විය. ණය උපයෝජනයේ කල්ඉකුත්වීම 2021 ජුනි 05 දින අවසන් කිරීමට නියමිත විය.

(iv) විගණකාධිපති 2018 සහ 2019 වර්ෂ සඳහා ව්‍යාපෘතිය විසින් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන මත තත්ත්වාගණනය කළ මතයක් සහ 2019 වර්ෂය සඳහා තත්ත්වාගණනය නොකළ මතයක් ප්‍රකාශ කර තිබුණි. කෙසේවෙතත්, මේ වනතෙක් නිරවුල් නොකරන ලද ව්‍යාපෘතියේ කාර්යසාධනය සම්බන්ධ ගැටළු කිහිපයක් පහත දැක්වේ.

| | විගණන නිරීක්ෂණ | විගණකාධිපතිගේ නිර්දේශ | ව්‍යාපෘතිය විසින් ගන්නා ලද වළක්වාලීමේ පියවර | වර්තමාන තත්ත්වය |
|---|---|---|---|---|
| (අ) | 2016 මාර්තු 24 දිනැති අංක 01/2016 සහ 2019 මාර්තු 15 දිනැති අංක 01/2019 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛයේ 3.2.2 වගන්තියට පටහැනිව ව්‍යාපෘතිය විසින් වැරදි වැටුප් පියවර ලබාදීම හේතුවෙන් රු. මිලියන 1.41ක මුදලක් නිලධාරීන් දෙදෙනෙකුට වැඩිපුර ගෙවා තිබුණි. | කළමනාකරණ සේවා චක්‍රලේඛය පදනම් කර ගනිමින් ව්‍යාපෘතියේ කාර්ය මණ්ඩලයේ වැටුප් ගෙවිය යුතුය. | 2020 විගණකාධිපතිගේ ත්‍රෛයිවාර්ෂික වාර්තාවෙන් යෝජනා වූ පරිදි 2022.02.01 සිට බලපැවැත්වෙන පරිදි එම නිලධාරීන්ගේ වැටුප් නිවැරදි කිරීමට පියවර ගනු ලැබේ. | කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ පැහැදිලි කිරීම් බලාපොරොත්තුවෙන් සිටී. |
| (ආ) | කළමනාකරණ සේවා චක්‍රලේඛය සහ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය චක්‍රලේඛයට පටහැනිව, ව්‍යාපෘතිය 2021 ජූලි 31 දිනට සියයට 50 දීමනා | වගුව 01හි සඳහන් නොවන ව්‍යාපෘති කාර්ය මණ්ඩලයේ තනතුරු සඳහා වැටුප්, රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ සමාන තනතුරුවල | 2020 විගණකාධිපතිගේ ත්‍රෛයිවාර්ෂික වාර්තාවෙන් යෝජනා වූ පරිදි 2022.02.01 සිට බලපැවැත්වෙන පරිදි එම නිලධාරීන්ගේ වැටුප් නිවැරදි | කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ පැහැදිලි කිරීම් බලාපොරොත්තුවෙන් සිටී. |

| | | | | |
|---|---|---|---|---|
| | සේවා අර්ථසාධක අරමුදල සහ සේවා භාරකාර අරමුදල ඇතුළුව SPMUහි ව්‍යාපෘති කාර්ය මණ්ඩලයේ තිදෙනෙකුට රු. මිලියන 1.9ක් වැඩිපුර ගෙවා තිබුණි. | බඳවා ගැනීමේදී ආරම්භක වැටුප් පරිමාණය මත පදනම් විය යුතුය. | කිරීමට පියවර ගනු ලැබේ. | |
| (ඇ) | 2013 ජුනි 05 දින සිට ණය ගිවිසුම බලාත්මක වුවද, පාලම් ඉදිකිරීමේ කටයුතුවල ප්‍රමාදයන් හේතුවෙන්, 2020 දෙසැම්බර් 31 දිනට ජපන් යෙන් මිලියන 12,381ක මුළු ණය මුදලින් සියයට 37 නියෝජනය වන ජපන් යෙන් මිලියන 4,586ක් පමණක් උපයෝජනය කර තිබුණි. තවද, ඉහත හේතූන් නිසා 2018 සහ 2019 වර්ෂ අවසාන වන විට ණය ප්‍රතිපාදනවලින් පිළිවෙලින් සියයට | ණය කාලසීමාව තුළ වැඩ විෂය පථය නිම කිරීමේ අරමුණින් පාලම් ඉදිකිරීමේ කටයුතු නිසි පරිදි සැලසුම් කිරීම අවශ්‍ය වේ. | අනාගතයේදී ව්‍යාපෘති ආරම්භ කිරීමට පෙර ඉඩම් අත්පත් කර ගැනීම සහ සේවා මාරු කිරීම් නිම කිරීමට යෝජනා කරන ලදී. | ඉඩම් අත්පත් කර ගැනීම් සහ සේවා මාරු කිරීම් නිම කිරීමට පියවර ග්නා ලදී. |

| | | | | |
|---|---|---|---|---|
| | 43 සහ සියයට 37 නියෝජනය වන යෙන් මිලියන 5,378 යෙන් මිලියන 4,587ක් උපයෝජනය කිරීමට නොහැකි වී තිබුණු බව නිරීක්ෂණය විය. | | | |
| (ඇ) | 2013 වර්ෂයේදී පාලම් නිර්මාණය සහ අධීක්ෂණය සඳහා උපදේශන සේවාව ආරම්භ වූ අතර 2015 වන විට පාලම් 37 ක නිර්මාණ කටයුතු උපදේශක විසින් නිම කර තිබුණි. කෙසේවෙතත්, ව්‍යාපෘතිය මුළු නිර්මාණවලින්, ණය කාලසීමාව අවසාන වන විට කොන්ත්‍රාත් පැකේජ 2 යටතේ නව පාලම් 18 ක් ඉදිකිරීම සඳහා පාලම් 18ක නිර්මාණ පමණක් යොදාගෙන තිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස, | අලාභය අවම කර ගැනීමට අනාගත පාලම් ඉදිකිරීම්වලදී ඉතිරි පාලම් නිර්මාණ යොදා ගැනීමට පියවර ගැනීම අවශ්‍ය වේ. | වෙනත් අරමුදල් මූලාශ්‍ර භාවිතයෙන් කරනු ලබන පාලම් ඉදිකිරීම් සඳහා ඉතිරි නිර්මාණ යොදා ගැනීමට තීරණය කරන ලදි. | ප්‍රධාන පාලම් ඉදිකිරීම් ව්‍යාපෘතියේ උපදේශක විසින් කරන ලද නිර්මාණ යොදා ගනිමින් පාලම් 3ක ඉදිකිරීමේ කටයුතු සිදු කරමින් පවතී. |

පාලම් 19ක් නිර්මාණය සඳහා ව්‍යාපෘතිය විසින් ආසන්න වශයෙන් දරන ලද රු.මිලියන 275ක පිරිවැය නිශ්කාර්ය වියදමක් බවට පත් වී තිබුණි.

## 3.2 නව කැළණි පාලම සිට අතුරුගිරිය දක්වා කණු මතින් ඉදිවන අධිවේගී මාර්ග

(i) රටේ මුල්‍ය හා පරිපාලන නගරවල අධික රථවාහන තදබදය අඩුකිරීම සහ සපයන සේවාව වැඩිදියුණු කිරීමේ අරමුණින් වරාය නගරය, කොළඹ වරාය, මාලබේ අධ්‍යාපන කේන්ද්‍රය සහ බත්තරමුල්ල පරිපාලන කේන්ද්‍රය ඇතුළුව කොළඹ සිට පවතින අධිවේගී මාර්ග ජාලය සම්බන්ධ කිරීම මගින් අධිවේගී මාර්ග ජාලයේ සම්බන්ධතාවය වැඩිදියුණු කිරීම සඳහා නව කැළණි පාලම සිට අතුරුගිරිය දක්වා කණු මතින් ඉදිවන අධිවේගී මාර්ග ව්‍යාපෘතිය ක්‍රියාත්මක වේ.

(ii) ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත පිරිවැය රු. බිලියන 193ක් වේ. යෝජිත ව්‍යාපෘතිය රාජ්‍ය පෞද්ගලික හවුල්කාරිත්ව පදනම මත නිර්මාණය-ගොඩනැගීම-මුල්‍යයනය-නඩත්තුව මත ක්‍රියාත්මක කිරීමට නියමිත වේ.

(iii) ව්‍යාපෘතියේ ආරම්භක කටයුතු 2016 ආරම්භ කරන ලද අතර 2025 වන විට වර්ෂ 3ක් ඇතුලත නිම කිරීමට නියමිතය.

(v) විගණකාධිපති 2018 ,2019 සහ 2020 වර්ෂ සඳහා ව්‍යාපෘතිය සම්බන්ධයෙන් ඉදිරිපත් කරන ලද මුල්‍ය ප්‍රකාශන මත තත්ත්වාගණනය නොකළ මතයක් ප්‍රකාශ කර තිබුණි. කෙසේවෙතත්, මේ වනතෙක් නිරවුල් නොකරන ලද ව්‍යාපෘතියේ කාර්යසාධනය සම්බන්ධ ගැටළු කිහිපයක් පහත දැක්වේ.

| | විගණන නිරීක්ෂණ | විගණකාධිපතිගේ නිර්දේශ | ව්‍යාපෘතිය විසින් ගන්නා ලද වළක්වාලීමේ පියවර | වර්තමාන තත්ත්වය |
|---|---|---|---|---|
| (අ) | ව්‍යාපෘතිය එහි කටයුතු 2016 දී ආරම්භ කර තිබුණද, ව්‍යාපෘතිය සඳහා ආයෝජකයකු තෝරා ගැනීමේ ප්‍රමාදය හේතුවෙන්, ව්‍යාපෘතියේ සිවිල් ඉදිකිරීම් කටයුතු ආරම්භ කිරීමට නොහැකිවී තිබුණි. තවද, මහා මාර්ගයේ මංතීරු පාරිසරික ආරක්ෂිත ප්‍රදේශ හරහා ඉදිවෙන බැවින් 2021 සැප්තැම්බර් 30 දින වන විටත් මධ්‍යම පරිසර අධිකාරිය විසින් අදියර II ( රාජගිරිය සිට අතුරුගිරිය දක්වා කි.මී 10) සඳහා පාරිසරික බලපෑම් ඇගයීමේ වාර්තාව අනුමත කර නොතිබුණි. | ඉලක්කගත දිනට කටයුතු නිම කිරීමට ප්‍රමාදයකින් තොරව ආයෝජකයකු තෝරා ගැනීමට පියවර ගත යුතුය. | කැබිනට් මණ්ඩලයට නිර්දේශ ඉදිරිපත් කිරීමට කැබිනට් මණ්ඩලයට පත්කළ ඇගයීම කමිටුව සහ ව්‍යාපෘති කමිටුව යෝජනාව ඇගයීම සහ සකස් කිරීමට කටයුතු කරනු ලැබේ. | |
| (ආ) | රාජගිරියේ සිට | ඉලක්කගත | ඉඩම් අත්පත් කරගැනීම් | |

| | | |
|---|---|---|
| අතුරුගිරිය දක්වා කොටසේ අත්කර ගතයුතු ඉඩම් කොටස් 821න් ව්‍යාපෘතිය 2020 අවසාන වන විට සියයට 03 භෞතික ප්‍රගතියක් පමණක් අත්කරගෙන තිබුණි. | දිනයන්ට ඉඩම් අත්පත් කර ගැනීමේ කටයුතු නිම කිරීමට දිස්ත්‍රික් ලේකම් කාර්යාල, මිනින්දෝරු දෙපාර්තමේන්තුව සහ තක්සේරු දෙපාර්තමේන්තුව සමඟ නිසි සම්බන්ධතාවක් පවත්වා ගැනීමට පියවර ගත යුතුය. | කඩිනම් කිරීමට පියවර ගෙන ඇත. |

### 3.3 ඔපෙක් අරමුදලින් මුල්‍යායනය කරන බස්නාහිර පළාත් මාර්ග සංවර්ධන ව්‍යාපෘතිය

(i) ශ්‍රී ලංකාවේ බස්නාහිර පළාතේ පෙර තෝරාගත් ජාතික මාර්ගවල කිලෝමීටර් 27 ක් වැඩිදියුණු කිරීම, සංවර්ධනය කිරීම හා පුළුල් කිරීම සඳහා ඔපෙක් අරමුදලින් මුල්‍යායනය කරන බස්නාහිර පළාත් මාර්ග සංවර්ධන ව්‍යාපෘතිය ක්‍රියාත්මක වේ.

(ii) ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත පිරිවැය රු.මිලියන 3,232.5කට සමාන එ.ජ.ඩො. මිලියන 24.87ක් වන අතර ඉන් රු.මිලියන 2,209.84කට සමාන එ.ජ.ඩො. මිලියන 17ක් සැපයීමට ජාත්‍යන්තර සංවර්ධනය සඳහා වූ ඔපෙක් අරමුදල විසින් ලබාදීමට එකඟවී තිබුණි.

(iii) ව්‍යාපෘතිය එහි කටයුතු 2017 ඔක්තෝබර් 05 දින ආරම්භ කරන ලද අතර 2019 ජූනි 28 දින වන විට නිමකිරීමට සැලසුම් කර තිබුණි. කෙසේවෙතත්, ඉඩම් අත්පත් කර ගැනීමේ ප්‍රමාදය සහ කොන්ත්‍රාත්කරුගේ දුර්වල කාර්යසාධනය හේතුවෙන් ව්‍යාපෘතියේ කාලය 2021 සැප්තැම්බර් 30 දක්වා දීර්ඝ කර තිබුණි. එහි ප්‍රතිපලයක් ලෙස, ශ්‍රී ලංකාවේ බස්නාහිර පළාතේ පෙර තෝරාගත් ජාතික මාර්ගවල කිලෝමීටර් 27 ක් වැඩිදියුණු කිරීම, සංවර්ධනය කිරීම හා පුළුල් කිරීමේ කටයුතු ප්‍රමාද වී තිබුණි.

(iv) විගණකාධිපති 2018 ,2019 සහ 2020 වර්ෂ සඳහා ව්‍යාපෘතිය සම්බන්ධයෙන් ඉදිරිපත් කරන ලද මුල්‍ය ප්‍රකාශන මත තත්ත්වාගණනය කළ මතයක් ප්‍රකාශ කර තිබුණි. කෙසේවෙතත්, මේ වනතෙක් නිරවුල් නොකරන ලද ව්‍යාපෘතියේ කාර්යසාධනය සම්බන්ධ ගැටළු කිහිපයක් පහත දැක්වේ.

| | විගණන නිරීක්ෂණ | විගණකාධිපතිගේ නිර්දේශ | ව්‍යාපෘතිය විසින් ගන්නා ලද වළක්වාලීමේ පියවර | වර්තමාන තත්ත්වය |
|---|---|---|---|---|
| (අ) | 2020 දෙසැම්බර් 31 දිනට ඉඩම් කොටස් 1,716ක් සඳහා වන්දි ගෙවීම් නිරවුල් කිරීමේ ප්‍රමාදයන් නිසා රු. මිලියන 286ක පොළිය ඇතුලුව රු. මිලියන 1,600ක වන්දි මුදලක් ගෙවා තිබුණි. කෙසේවෙතත්, ඉඩම් අත්පත් කර ගැනීමේ පනතේ 44 වන වගන්තිය යටතේ ඉඩම් කොටස් 22 ක් පමණක් ලියාපදිංචි කර තිබුණි. | ඉඩම් අත්පත් කර ගැනීමේ කටයුතු හා ඉඩම් අත්පත් කර ගැනීමේ පනතේ 44 වගන්තිය යටතේ ලියාපදිංචි කිරීමේ කටයුතු කඩිනම් කිරීමට පියවර ගත යුතුය. | ඉඩම් 44 වගන්තිය යටතේ ලියාපදිංචි කිරීමට පියවර ගනිමින් පවතී. | |

## 3.4 ඔපෙක් අරමුදලින් කොළඹ ජාතික මහා මාර්ග පුනරුත්ථාපනය කිරීම හා වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතියේ

(i) කොළඹ තදාසන්න ප්‍රදේශවල ප්‍රධාන ජාතික මාර්ග 13ක කිලෝමීටර් 65.45ක් වැඩිදියුණුකිරීම හා නාරාහේන්පිට- නුගේගොඩ පාලම ප්‍රතිසංස්කරණය කිරීම සඳහා ඔපෙක් අරමුදලින් කොළඹ ජාතික මහා මාර්ග පුනරුත්ථාපනය කිරීම හා වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක වේ.

(ii) ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත පිරිවැය රු. මිලියන 12,347.37කට සමාන එ.ජ.ඩො. මිලියන 94.99ක් වන අතර ඉන් රු. මිලියන 6,499.57කට සමාන එ.ජ.ඩො.මිලියන 50ක් සැපයීමට ජාත්‍යන්තර සංවර්ධනය සඳහා වූ ඔපෙක් අරමුදල එකඟ වී තිබුණි.

(iii) ව්‍යාපෘතිය එහි කටයුතු 2013 දෙසැම්බර් 11 දින ආරම්භ කරන ලද අතර 2017 දෙසැම්බර් 31 වන විට නිම කිරීමට නියමිත විය. කෙසේවෙතත්, ඉඩම් අත්පත් කර ගැනීමේ ප්‍රමාදය සහ කොන්ත්‍රාත්කරුගේ දුර්වල කාර්යසාධනය හේතුවෙන් ව්‍යාපෘතියේ කාලය 2022 දෙසැම්බර් 31 දක්වා දීර්ඝ කර තිබුණි. එහි ප්‍රතිපලයක් ලෙස, මාර්ග වැඩිදියුණු කිරීම හා

පුනරුත්ථාපන කටයුතු ප්‍රමාද වී තිබුණු අතර මාර්ග භාවිතා කරන්නන් වෙත මාර්ග වැඩිදියුණු කිරීමේ ප්‍රතිලාභය ලබාගැනීමට ප්‍රමාද වේ

(iv) විගණකාධිපති විසින් 2018 වර්ෂ සඳහා ව්‍යාපෘතිය සම්බන්ධයෙන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන මත තත්ත්වාගණනය නොකළ මතයක් සහ 2019 සහ 2020 වර්ෂ සඳහා තත්ත්වාගණනය කළ මතයක් ප්‍රකාශ කර තිබුණි. කෙසේවෙතත්, මේ වනතෙක් නිරවුල් නොකරන ලද ව්‍යාපෘතියේ කාර්යසාධනය සම්බන්ධ ගැටළු කිහිපයක් පහත දැක්වේ.

| විගණන නිරීක්ෂණ | විගණකාධිපතිගේ නිර්දේශ | ව්‍යාපෘතිය විසින් ගන්නා ලද වළක්වාලීමේ පියවර | වර්තමාන තත්ත්වය |
|---|---|---|---|
| රජයේ ඉඩම් කොටස් 911 ඇතුලුව ඉඩම් කොටස් 5,493න් 2020 දෙසැම්බර් 31 දිනට ඉඩම් අත්පත් කර ගැනීමේ පනතේ 44 වැනි වගන්තිය යටතේ ඉඩම් කොටස් 5ක් පමණක් ලියාපදිංචි කර තිබුණි. තවද වන්දි නිරවුල් කිරීමේ ප්‍රමාදය හේතුවෙන් රු.මිලියන 1,175ක පොළී මුදලක් දරා තිබුණි. | ඉඩම් අත්පත් කර ගැනීමේ කටයුතු කඩිනම් කිරීමට පියවර ගත යුතු අතර ඉඩම් අත්පත් කර ගැනීමේ පනතේ 44 වැනි වගන්තිය යටතේ ඉඩම් ලියාපදිංචි කිරීමට පියවර ගත යුතුවේ. | ඉඩම් 44 වගන්තිය යටතේ ලියාපදිංචි කිරීමට පියවර ගනිමින් පවතී. | |

## 3.5 කොන්ක්‍රීට් කණුමත දිවෙන වරාය ප්‍රවේශ මාර්ග ව්‍යාපෘතිය

(i) නව කැළණි පාලමේ සිට ගාලු මුව දොර දක්වා වූ වරාය හා යෝජිත බහු මාදිලි ප්‍රවාහන කේන්ද්‍රස්ථානය කි. මී. 5.3 ක් දිගැති මංතීරු 4ක් ඉදිකිරීම සඳහා කොන්ක්‍රීට් කණුමත දිවෙන වරාය ප්‍රවේශ මාර්ග ව්‍යාපෘතිය ක්‍රියාත්මක වේ.

(ii) ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත පිරිවැය රු. මිලියන 56,815.2කට සමාන එජඩො මිලියන 360ක් වන අතර ඉන් රු. මිලියන 47,346 කට සමාන එජඩො මිලියන 300 ක් සැපයීමට ආසියානු සංවර්ධන බැංකුව විසින් එකග වී තිබුණි.

(iii) ව්‍යාපෘතිය එහි කටයුතු 2016 පෙබරවාරි මස ආරම්භ කරන ලද අතර ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය 2016 මාර්තු මාසයේදී ලැබී තිබුණු අතර ව්‍යාපෘතිය 2025 ජුනි 30 දින නිම කිරීමට නියමිතය.

(iv) විගණකාධිපති විසින් 2018 වර්ෂ සඳහා ව්‍යාපෘතිය සම්බන්ධයෙන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන මත තත්ත්වාගණනය කළ මතය සහ 2019 වර්ෂ සඳහා තත්ත්වාගණනය නොකළ මතයක් සහ 2020 වර්ෂ සඳහා තත්ත්වාගණනය කළ මතයක් ප්‍රකාශ කර තිබුණි. කෙසේවෙතත්, මේ වනතෙක් නිරවුල් නොකරන ලද ව්‍යාපෘතියේ කාර්යසාධනය සම්බන්ධ ගැටළු කිහිපයක් පහත දැක්වේ.

| | විගණන නිරීක්ෂණ | විගණකාධිපතිගේ නිර්දේශ | ව්‍යාපෘතිය විසින් ගන්නා ලද වළක්වාලීමේ පියවර | වර්තමාන තත්ත්වය |
|---|---|---|---|---|
| (අ) | කොන්ක්‍රීට් කණුමත දිවෙන වරාය ප්‍රවේශ මාර්ග ව්‍යාපෘතිය ඉදිකිරීම්වල භෞතික කාර්යසාධනය සහ 2020 වර්ෂය සඳහා ව්‍යාපෘතියේ ප්‍රම්පාදන සැලැස්මට ඇතුළත් කර තිබුණු රු. 10,382ක් වටිනා ක්‍රියාකාරකම් 08ක් ඉලක්කවලට පිටුපසින් පැවතුණි. | ඉලක්කගත දිනයන්ට නිමකිරීමට ඉදිකිරීම් කටයුතු කඩිනම් කිරීමට පියවර ගතයුතුය. | එකගවේ. දැනටමත් නිවැරදි කිරීමේ පියවර ගෙන ඇත. | ඉදිකිරීම්වල වර්තමාන භෞතික ප්‍රගතිය සියයට 29.4ක් වේ. |
| (ආ) | 2020 වර්ෂයේ ව්‍යාපෘතියේ සංයුක්ත සැලැස්ම, ක්‍රියාකාරී සැලැස්ම, ප්‍රසම්පාදන සැලැස්ම සහ ප්‍රගති වාර්තා සැසදීමේදී එකිනෙකට නොගැළපීම සහ ව්‍යාපෘතියේ අරමුණු සමඟ පෙළ ගැසී | ව්‍යාපෘතියේ ක්‍රියාකාරී සැලැස්ම, ප්‍රසම්පාදන සැලැස්ම සහ ප්‍රගති වාර්තා නිසි ආකාරයෙන් සකස් කළ යුතුය | එකගවේ. විගණකාධිපතිගේ නිර්දේශ ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පියවර ගෙන ඇත. | 2022 වර්ෂය සඳහා ක්‍රියාකාරී සැලැස්ම සහ අනෙකුත් වාර්තා පිළියෙල කිරීමේදී සියලුම ඒකක සම්බන්ධ වේ. |

| | | | | |
|---|---|---|---|---|
| | නොතිබීම. | අතර ව්‍යාපෘතියෙහි අරමුණු සාක්ෂාත් කර ගැනීමට භාවිතා කළ යුතුය. | | |
| (ඇ) | විදේශ ණය යටතේ 2019 සහ 2020 වර්ෂ සඳහා මහා භාණ්ඩාගාරය විසින් රු. මිලියන 6,508 සහ රු.මිලියන 5,858ක ප්‍රතිපාදන මුදලක් වෙන්කර තිබුණි. කෙසේවෙතත්, කොන්ත්‍රාත් ප්‍රදානය කිරීමේ ප්‍රමාදයන් සහ කොන්ත්‍රාත්කරුගේ කටයුතුවල මන්දගාමී ප්‍රගතිය හේතුවෙන් මුළු ප්‍රතිපාදන මුදලින් සියයට 33 සහ සියයට 73නියෝජනය කරන රු. මිලියන 2,182 සහ රු. මිලියන 4,302ක මුදලක් 2019 සහ 2020 සඳහා ව්‍යාපෘති විසින් උපයෝජනය කර නොතිබුණි. | ණය පහසුකම් කල්පිරීමට පෙර මුළු ණය පහසුකම උපයෝජනයට මූල්‍ය සැලසුමක් තුළ වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝජනයට පියවර ගත යුතුය. | පිළිගනු ලැබේ. | - |

## 3.6 රුවන්පුර අධිවේගී මාර්ග ව්‍යාපෘතිය

(i) දක්ෂිණ අධිවේගී මාර්ගය සහ මධ්‍යම අධිවේගී මාර්ගය සම්බන්ධ කරමින් නව අධිවේගී මාර්ගයක් ඉදිකිරීම තුළින් රටේ උපායමාර්ගික හා සමාජ ආර්ථික තත්ත්වය වැඩිදියුණු කිරීම සඳහා රුවන්පුර අධිවේගී මාර්ග ව්‍යාපෘතිය ක්‍රියාත්මක වේ.

(ii) ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත පිරිවැය රු.මිලියන 286,000ක් වන අතර භාණ්ඩාගාර ලේකම්ගේ අධීක්ෂණය යටතේ දේශීය බැංකු පද්ධතියෙන් මූල්‍යායනය කිරීමට තීරණය කර තිබුණි. ව්‍යාපෘතිය කටයුතු කහතුඩුවේ සිට ඉංගිරිය දක්වා කොටසේ කිලෝමීටර 24.3ක අදියර 1 යටතේ කටයුතු 2021 මැයි 03 ආරම්භ කර තිබුණු අතර වර්ෂ 2 ½ තුළදී නිමකිරීමට අපේක්ෂිත විය. කෙසේවෙතත්, කහතුඩුව අන්තර් හුවමාරුවේ කිලෝමීටර 02 සහ ඉංගිරිය සිට පැල්මඩුල්ල කොටසේ කිලෝමීටර 47.6ක මාර්ගයේ ඉදිකිරීම් කටයුතු ආරම්භ කර නොතිබුණි.

(iii) විගණකාධිපති විසින් 2018, 2019 සහ 2020 වර්ෂ සඳහා ව්‍යාපෘතිය සම්බන්ධයෙන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන මත තත්ත්වාගණනය නොකළ මතයක් මතයක් ප්‍රකාශ කර තිබුණි. කෙසේවෙතත්, මේ වනතෙක් නිරවුල් නොකරන ලද ව්‍යාපෘතියේ කාර්යසාධනය සම්බන්ධ ගැටළු කිහිපයක් පහත දැක්වේ.

| විගණන නිරීක්ෂණ | විගණකාධිපතිගේ නිර්දේශ | ව්‍යාපෘතිය විසින් ගන්නා ලද වළක්වාලීමේ පියවර | වර්තමාන තත්ත්වය |
|---|---|---|---|
| ව්‍යාපෘතියේ කටයුතු 2016 ආරම්භ කර තිබුණද කිලෝමීටර 76.40කින් ඉදිකිරීම සඳහා කිලෝමීටර 24.3ක් පමණක් පිරිනමා තිබුණි. ඒ අනුව ව්‍යාපෘතිය ආරම්භ කර වර්ෂ 6ක් ගත වී තිබුණද කහතුඩුව අන්තර් හුවමාරුවේ කිලෝමීටර 02 සහ ඉංගිරිය සිට පැල්මඩුල්ල කොටසේ කිලෝමීටර 47.6ක මාර්ගයේ ඉදිකිරීම් කටයුතු 2021 දෙසැම්බර් 31 දින වනවිටත් ආරම්භ කිරීමට නොහැකි වී තිබුණි. තවද, අදියර II සඳහා ( ඉංගිරිය | ඉඩම් අත්පත් කර ගැනීමේ කටයුතු ආරම්භ කිරීමට පෙර ඉංගිරිය සිට පැල්මඩුල්ල දක්වා කිලෝමීටර 47.6ක ඉතිරි මාර්ග කොටස සඳහා පාරිසරික බලපෑම් ඇගයීමේ වාර්තාව ලබා ගැනීමට පියවර ගැනීම අවශ්‍ය වේ. | පිළිගනී. | |

සිට පැල්මඩුල්ල දක්වා කිලෝමීටර 47.6ක) පාරිසරික බලපෑම් ඇගයීම් වාර්තාව (EIA) මධ්‍යම පරිසර අධිකාරිය විසින් 2021 දෙසැම්බර් 30 දින වන විටත් ලබා දී නොතිබුණි.

### 3.7 දක්ෂිණ මාර්ග සම්බන්ධ කෙරෙන ව්‍යාපෘතිය

(i) දක්ෂිණ අධිවේගී මාර්ගයට සම්බන්ධ කිලෝ මීටර් 33ක් වැඩි දියුණු කිරීම හා ප්‍රතිසංස්කරණය කිරීම තුළින් ජාතික ප්‍රවාහනයේ කාර්යක්ෂමතාව ඉහළ නැංවීම සඳහා දක්ෂිණ මාර්ග සම්බන්ධ කෙරෙන ව්‍යාපෘතිය ක්‍රියාත්මක වේ.

(ii) ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත පිරිවැය රු.මිලියන 12,248කට සමාන එජඩො මිලියන 95ක් වන අතර ඉන් රු.මිලියන 9,025කට සමාන එජඩො මිලියන 70ක් සැපයීමට ආසියානු සංවර්ධන බැංකුව එකඟ වී තිබුණි.

(iii) ව්‍යාපෘතිය එහි කටයුතු 2014 මැයි 27 දින ආරම්භ කරන ලද අතර 2018 දෙසැම්බර් 30 දින වන විට නිම කිරීමට නියමිත විය. කෙසේවෙතත්, ඉඩම් අත්පත් කර ගැනීමේ, උපයෝගිතා මාරුකිරීමේ ප්‍රමාදය සහ විෂය පථය වෙනස් කිරීම හේතුවෙන් ව්‍යාපෘතියේ කාලය 2021 දෙසැම්බර් 31 තෙක් දීර්ඝ කර තිබුණි.

(iv) විගණකාධිපති විසින් 2018 වර්ෂ සඳහා ව්‍යාපෘතිය සම්බන්ධයෙන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන මත තත්ත්වාගණනය කළ මතය සහ 2019 වර්ෂ සඳහා තත්ත්වාගණනය නොකළ මතයක් සහ 2020 වර්ෂ සඳහා තත්ත්වාගණනය කළ මතයක් ප්‍රකාශ කර තිබුණි. කෙසේවෙතත්, මේ වනතෙක් නිරවුල් නොකරන ලද ව්‍යාපෘතියේ කාර්යසාධනය සම්බන්ධ ගැටළු කිහිපයක් පහත දැක්වේ.

| | විගණන නිරීක්ෂණ | විගණකාධිපතිගේ නිර්දේශ | ව්‍යාපෘතිය විසින් ගන්නා ලද වළක්වාලීමේ පියවර | වර්තමාන තත්ත්වය |
|---|---|---|---|---|
| (අ) | අදාළ කොන්ත්‍රාත්තුවේ මුළු පිරිවැය ඇස්තමේන්තුවේ නිවැරදි ආකාරයෙන් | ප්‍රමාණ බිල්පත් පිළියෙළ කිරීමට ප්‍රථම සවිස්තරාත්මක ඉංජිනේරු අධ්‍යයනයක් | එකගවේ. ඉදිරි කොන්ත්‍රාත්වලදී අනුගමනය කිරීමට සටහන් | සීපී 01, සීපී 02 සහ සීපී 03 කොන්ත්‍රාත් පැකේජ |

| | | | | |
|---|---|---|---|---|
| | පිළියෙල කර කොන්ත්‍රාත්කරුට පැවරිය යුතුය. කෙසේවුවද, කොන්ත්‍රාත්කරු විසින් 2018-2020 වර්ෂ තුළදී නිමකළ කොන්ත්‍රාත් පැකේජ 3ක ප්‍රමාණ පත්‍ර ඇතුළත් රු.මිලියන 1,100 වටිනා වැඩ අයිතම 626ක් සඳහා සම්පූර්ණයෙන්ම සම්බන්ධ වී නොතිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස, සිදු නොකරන ලද වැඩ සඳහා රු. මිලියන 191ක වැඩ ආරම්භ කිරීම අත්තිකාරම් වැඩියෙන් ගෙවා තිබුණි. | සිදු කළ යුතු අතර නිවැරදි විෂය පථයක් හඳුනා ගත යුතුය. | කර ගන්නා ලදි. | සාර්ථකව සම්පූර්ණයෙන්ම නිමකර ඇත. |
| (ආ) | 2020 වර්ෂය සඳහා අඹතලේ සිනෙක් මංසන්දියේ සහ කිරුළපන - ගොඩගම දක්වා තෝරාගත් මාර්ග කොටස් ඉදිකිරීම අපේක්ෂිත භෞතික කාර්යසාධනය කොන්ත්‍රාත්කරු විසින් අත්කර ගෙන නොතිබුණි. | ඉලක්කගත දිනයන්හිදී නිම කිරීම කටයුතු කඩිනම් කිරීමට ක්‍රියාමාර්ග ගත යුතුය. | කොවිඩ් වසංගත තත්ත්වය නොසලකා කටයුතු කඩිනම් කිරීමට පියවර ගෙන ඇත. | සීපී -04 සාර්ථකව නිමකර ඇත. |
| (ඇ) | කොන්ත්‍රාත්තුවේ | අතිරේක හිමිකම්පෑම් | එම්පීසී මගින් | එස්ආර්සීපී |

| | | | | |
|---|---|---|---|---|
| | අතිරේක පිරිවැය සඳහා ණය දෙන ආයතනයේ අනුමැතිය ප්‍රමාද වීම හේතුවෙන්, ව්‍යාපෘතිය කොන්ත්‍රාත්කරුගේ අවසාන ගෙවීම් සහතික වන රු මිලියන 248.6 මුදල නිරවුල් කර නොතිබුණු අතර 2020 දෙසැම්බර් 31 දින වන විටත් වසර 1 ½ ක කාලයක් තිස්සේ ගෙවිය යුතුව වගකීම් ලෙස පවතී. කොන්ත්‍රාත්කරුවන්ගේ ගෙවීම් පියවීමේ ප්‍රමාදය ව්‍යාපෘති පිරිවැය ඉහළ යාමට බලපා ඇත. | අවම කර ගැනීම සඳහා කොන්ත්‍රාත් ගිවිසුම අනුව ප්‍රමාදයකින් තොරව කොන්ත්‍රාත්කරුවන්ගේ වගකීම් පියවා ගැනීමට ක්‍රියාමාර්ග ගත යුතුය. | අනුමත කරනු ලැබු සංශෝධිත කොන්ත්‍රාත් මුදල තුළ හිඟ මුදල නිරවුල් කිරීමට පියවර ගනු ලැබේ. | ණයවල ඉතිරියෙන් නිරවුල් කිරීමට ADB සමග සාකච්ඡා පවත්වමින් යනු ලැබේ. |
| (ඇ) | ලැබී ඇති තොරතුරු අනුව, රජයට අයත් ඉඩම් කැබලි 548 ක් ඇතුලුව ඉඩම් කැබලි 3,558 ක් අත්පත් කර ගැනීමට සැලසුම් කර තිබුණි. 2020 දෙසැම්බර් 31 දින වන විට ව්‍යාපෘතිය විසින් ඉඩම් අත්පත් කර ගැනීමේ පිරිවැය ලෙස රු. මිලියන 9,500 ක් වැය කර තිබුණු ඉන් ඉඩම් අත්පත් කර ගැනීමේ හා නැවත | ඉඩම් අත්පත් කර ගැනීමේ කටයුතු කඩිනම් කිරීමට සහ ඉඩම්වල අයිතිය මාර්ග සංවර්ධන අධිකාරිය වෙත මාරුකිරීමට පියවර යුතු වේ. | සියලු වන්දි සහ පොළී නිරවුල් කරන ලද කොටස් 44 වගන්තිය යටතේ ලියාපදිංචි කිරීමට පියවර ගෙන ඇති අතර ඒ අනුව අදාළ ප්‍රාදේශීය ලේකම් කාර්යාල වෙත උපදෙස් ලබා දී ඇත. | 44 වගන්තිය නිකුත් කිරීමේ ප්‍රගතියක් දැකිය හැකිවේ. |

| | | | | |
|---|---|---|---|---|
| | පදිංචි කිරීමේ කමිටු වල තීරණ යටතේ රු. මිලියන 5,243 ක ගෙවීම් සිදු කර තිබුණි. මීට අමතරව, 2020 දෙසැම්බර් 31 දක්වා වන්දි ගෙවීම ප්‍රමාද වීම මත පොළී වශයෙන් රු. මිලියන 289 ක් ගෙවා තිබුණි. කෙසේවෙතත්, ඉඩම් අත්පත් කර ගැනීමේ පනතේ 44 වන වගන්තිය යටතේ කිසිදු ඉඩමක් ලියාපදිංචි කර නොතිබුණි. | | | |
| (ඉ) | කොන්ත්‍රාත් පැකේජ 2ක් මුළු පිරිවැය රු. මිලියන 3,064ක් වන අතර ඉන් සියයට 20ක් නියෝජනය කරන රු. මිලියන 510ක මුදලක් පසුව කරන වෙනස්කම් සඳහා අවිනිශ්චිත වෙන් කිරීම් ලෙස වෙන්කර තිබුණි. කෙසේවෙතත්, 2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශයේ 8.13.4 වගන්තියේ අවශ්‍ය පරිදි අනුමැතිය ලබා ගැනීමකින් තොරව කරන ලද විෂය පථය වෙනස් කිරීම හේතුවෙන් ව්‍යාපෘතිය | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අනුගමනය කළ යුතු අතර ගෙවීම් නිදහස් කිරීමට පෙර අදාළ ආයතනවලින් අවශ්‍ය අනුමැතීන් ලබා ගත යුතුය. | අවශ්‍ය අනුමැතීන් ලබාගෙන ඇත. | ව්‍යාපෘතිය සාර්ථකව නිමකර ඇත. |

කොන්ත්‍රාත්තුවේ මුළු පිරිවැයෙන් සියයට 51ක් නියෝජනය වන එකතුව රු. මිලියන 1,573ක විචලනතා සිදුකර තිබුණි.

### 3.8 ප්‍රවාහන සම්බන්ධතා සහ වත්කම් කළමණාකරණ ව්‍යාපෘතිය

(i) වත්කම් කළමනාකරණය පිළිබඳ මාර්ග සංවර්ධන අධිකාරියේ ධාරිතාව ශක්තිමත් කිරීම සහ නිර්මානකරණය-ඉදිකිරීම- නඩත්තුව හා ක්‍රියාත්මකකිරීම යන කරුණු නිසි ක්‍රම වේදයකින් යුතුව භාවිතා කර නිමැවුම් සහ කාර්ය සාධනය පදනම්කරගත් කොන්ත්‍රාත් ක්‍රම භාවිතයෙන් සකසන ලද ආකෘතියක් (OPBRC) යටතේ පැලියගොඩ - පුත්තලම මාර්ගයේ ජා-ඇල සිට හලාවත දක්වා කි.මී. 58 කින් යුත් (කොටසක්) නියමුකරණය කිරීම සඳහා ප්‍රවාහන සම්බන්ධතා සහ වත්කම් කළමණාකරණ ව්‍යාපෘතිය ක්‍රියාත්මක වේ.

(ii) ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත පිරිවැය රු.මිලියන 18,125 කට සමාන එ.ජ.ඩො මිලියන 125ක් වන අතර සම්පූර්ණ වටිනාකම මූල්‍යයනය කිරීමට ජාත්‍යන්තර සංවර්ධන සංගමය එකඟවී තිබුණි. කෙසේවෙතත්, 2018 අගෝස්තු 15 දිනැති අංක 18/1682/805/051 දරන අමාත්‍ය මණ්ඩල තීරණයට අනුව, පැලියගොඩ - පුත්තලම මාර්ගයේ ජා-ඇල සිට හලාවත නගරය දක්වා මාර්ග ඉදිකිරීමේ කටයුතු ව්‍යාපෘතියේ වැඩ විෂය පථයෙන් ඉවත් කර තිබුණු අතර ව්‍යාපෘතිය සඳහා වෙන්කරන ලද මුළු ණය ප්‍රමාණය රු. මිලියන 1,305 කට සමාන එ.ජ.ඩො මිලියන 9කට අඩු කර තිබුණි.

(iii) ව්‍යාපෘතිය එහි කටයුතු 2016 ජුනි 30 දින ආරම්භ කර 2018 අගෝස්තු 15 දින ප්‍රතිව්‍යුහගත කර තිබුණු අතර 2023 ජුනි 30 වන විට නිමකිරීමට සැලසුම් කර තිබුණි.

(iv) විගණකාධිපති විසින් ව්‍යාපෘතිය සම්බන්ධයෙන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන මත 2018 වර්ෂ සඳහා තත්ත්වාගණනය කළ මතයක් සහ 2019 වර්ෂ සඳහා තත්ත්වාගණනය නොකළ මතයක් සහ 2020 වර්ෂ සඳහා තත්ත්වාගණනය කළ මතයක් ප්‍රකාශ කර තිබුණි. කෙසේවෙතත්, මේ වනතෙක් නිරවුල් නොකරන ලද ව්‍යාපෘතියේ කාර්යසාධනය සම්බන්ධ ගැටළු කිහිපයක් පහත දැක්වේ.

| | විගණන නිරීක්ෂණ | විගණකාධිපතිගේ නිර්දේශ | ව්‍යාපෘතිය විසින් ගන්නා ලද වළක්වාලීමේ පියවර | වර්තමාන තත්ත්වය |
|---|---|---|---|---|
| (අ) | 2020 දෙසැම්බර් 31 දිනට මුළු කෙරීගෙන යන වැඩ රු.මිලියන 233.35 න්, පැලියගොඩ පුත්තලම මාර්ගයේ හලාවත සිට ජාඇල දක්වා කොටසේ ආරම්භක ව්‍යාපෘති කටයුතු වෙනුවෙන් එකතුව රු.මිලියන 90.57ක් වැය කර තිබුණි. 2018 මාර්තු රජය ගනු ලබන තීරණයකට අනුව, ඉහත කොටසේ කටයුතු ක්‍රියාත්මක කිරීමේ සැලසුමින් ඉවත් කර තිබුණු අතර එමනිසා එම වියදම නිෂ්කාර්ය වියදමක් බවට පත්විය. | පාඩු අවම කර ගැනීමට පියවර ගත යුතුය. | පෙන්වා දෙන ලද පාඩු සැලසුම්, නිර්මාණකරණය සහ ලංසු ලියවිලි සකස් කිරීමෙන් පසු මුල් ව්‍යාපෘතියට කරන ලද ප්‍රධාන විෂය පථය වෙනස්කිරීමේ ප්‍රතිඵලයක් වේ. එමනිසා ප්‍රතිව්‍යුහගත කරන ලද ව්‍යාපෘතියේ එවැනි විශාල විෂය පථය වෙනස් කිරීම් වැළක්වීමට පියවර ගනු ලැබේ. | TCAMP ව්‍යාපෘතිය මගින් OPBRC කොන්ත්‍රාත් අකෘතිය සඳහා පිළියෙල කරන ලද ලංසු ලියවිලි I – ROAD ව්‍යාපෘතියේ මාර්ග කළමනාකරණ කොන්ත්‍රාත් සඳහා යොදාගනු ලැබේ. |
| (ආ) | ව්‍යාපෘතියේ වත්කම් කළමනාකරණ සහාය සහ ඒකකවලට අදාල ධාරිතා වර්ධනය ක්‍රියාත්මක කිරීම සහ ධාරිතා වර්ධනය, පුහුණුව සහ උපදේශනය, මාර්ග | ව්‍යාපෘතියේ කටයුතු කඩිනම් කිරීමට පියවර ගත යුතුය. | 2021 වර්ෂයේදී මුළු පිරිවැය ආසන්න වශයෙන් රු. මිලියන 450කට ප්‍රධාන කොන්ත්‍රාත් 05ක් | ලෝක බැංකු ණයෙහි අවසන් දිනට පෙර ව්‍යාපෘතියේ විෂය පථය සහ ඉලක්ක අත්පත් කර ගැනීමට හැකිවේ. |

| | | | | |
|---|---|---|---|---|
| | ආරක්ෂාව පිළිබද කටයුතු සහ උපකරණ යන සංරචකවල 2020 දෙසැම්බර් 31 දිනට භෞතික ප්‍රගතිය පිළිවෙලින් සියයට 8.22, සියයට 3.2 සහ සියයට 1.7 ලෙස ඉලක්ක වන සියයට 13.05, සියයට 7.76 සහ සියයට 3.23කින් පිටුපසින් වේ. | | පිරිනමා ඇත. | |
| (ඇ) | 2018 වර්ෂයේ විශේෂ (ඩොලර්) ගිණුමට රු.මිලියන 236.12 කට සමාන එජඩො මිලියන 1.5ක් ලැබී තිබුණද ව්‍යාපෘතිය විසින් සියයට 82.63ක් නියෝජනය වන රු.මිලියන 195ක් සහ සියයට 58.19ක් නියෝජනය වන රු.මිලියන 137.4ක් උපයෝජනය කර නොතිබුණු අතර පිළිවෙලින් 2019 සහ 2020 දෙසැම්බර් 31 දිනට විශේෂ (ඩොලර්) ගිණුමේ වියදම් නොකර පැවතුණි. | ව්‍යාපෘතියයේ කටයුතු නිසි පරිදි සැලසුම් කළ යුතු අතර ණය ගිවිසුම අවසන් වීමට පෙර ඒවා නිම කිරීමට කටයුතු කඩිනම් කළ යුතුය. | 2021 තුන්වන කාර්තුව අවසාන වන විට ඉතිරි මුදල වන රු. මිලියන 98.7(විනිමය ලාභය හැර) සම්පූර්ණයෙන්ම වියදම් කර ඇති අතර නැවත විශේෂ (ඩොලර්) ගිණුමට අත්තිකාරම් ලබා දී ඇත. කටයුතු කඩිනම් කිරීමට පියවර ගනු ලැබේ. | ව්යාපෘතිය අවසාන වන විට පහත ක්ෂේත්‍ර මත විදේශ අරමුදල් වියපැහදම් කිරීමට සැලසුම් කර ඇත.<br>- උපකරණ මිළදී ගැනීම<br>- උපදේශනය සහ දේශීය සහ විදේශීය සමග සේවා ගිවිසුම් මත. |

### 3.9 ප්‍රවාහන සම්බන්ධතා සහ වත්කම් කළමණාකරණ ව්‍යාපෘතිය (පළාත් මාර්ග සංවර්ධන සංරචකය)

(i) වත්කම් කළමණාකරණ පිළිබඳ මාර්ග සංවර්ධන අධිකාරියේ ධාරිතාව ශක්තිමත් කිරීම හා පළාත් මාර්ග සඳහා ප්‍රවේශ හා කළමණාකරණ රාමුව වැඩිදියුණු කිරීම සඳහා ප්‍රවාහන සම්බන්ධතා සහ වත්කම් කළමණාකරණ ව්‍යාපෘතිය (පළාත් මාර්ග සංවර්ධන සංරචකය) ක්‍රියාත්මක වේ.

(ii) ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත පිරිවැය රු.මිලියන 21,875කට සමාන එජඩො මිලියන 125ක් වේ. ව්‍යාපෘතියේ සංශෝධිත මූල්‍ය ගිවිසුමට අනුව, සංශෝධිත සංරචක 02 හි ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු.මිලියන 19,075කට සමාන එජඩො මිලියන 109ක් වන අතර මුළු මුදලම ජාත්‍යන්තර සංවර්ධන සංගමය ලබාදීමට එකග වී තිබුණි.

(iii) ව්‍යාපෘතිය එහි කටයුතු 2019 මැයි 02 දින ආරම්භ කර තිබුණු අතර 2023 මාර්තු 31 දින වන විට නිම කිරීමට සැලසුම්කර තිබුණි.

(iv) විගණකාධිපති විසින් ව්‍යාපෘතිය සම්බන්ධයෙන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන මත 2019 සහ 2020 වර්ෂ සඳහා තත්ත්වාගණනය කළ මතයක් ප්‍රකාශ කර තිබුණි. කෙසේවෙතත්, මේ වනතෙක් නිරවුල් නොකරන ලද ව්‍යාපෘතියේ කාර්යසාධනය සම්බන්ධ ගැටළු කිහිපයක් පහත දැක්වේ.

| | විගණන නිරීක්ෂණ | විගණකාධිපතිගේ නිර්දේශ | ව්‍යාපෘතිය විසින් ගන්නා ලද වළක්වාලීමේ පියවර | වර්තමාන තත්ත්වය |
|---|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂය තුළදී රු.මිලියන 7,769.86ක පිරිවැයකි කොන්ත්‍රාත් ප්‍රදානය කිරීමේ අරමුණින් සංවර්ධනය කළ යුතු මාර්ග හඳුනා ගෙන විස්තරාත්මක ව්‍යාපෘති වාර්තාවක් සකස් කිරීම අවශ්‍ය වේ. කෙසේවෙතත්, සමාලෝචිත වර්ෂයේ කිසිදු ප්‍රගතියක් නිරීක්ෂණය නොවුණි. | ප්‍රමාණවත් කාර්යසාධනයක් අත්කර ගැනීමට කටයුතු කළ යුතුය. | පිළිතුරු ලබාදී නොමැත. | ගැටලුව විසඳා නොමැත. |

| | | | | |
|---|---|---|---|---|
| (ආ) | ව්‍යාපෘතිය සඳහා විනිවිදභාවයක් නොමැති ප්‍රසම්පාදන ක්‍රියාවලියක් මගින් කාල පදනම මත තනි පුද්ගල උපදේශකවරු පහළොස් දෙනෙකු බඳවාගෙන ඇති අතර ඔවුන්ගෙන් ප්‍රමාණවත් සේවාවක් ලබා ගැනීමට විධිමත් අභ්‍යන්තර පාලන පද්ධතියක් ස්ථාපනය කර නොතිබුණි. | උපදේශකවරු බඳවා ගැනීමේදී ප්‍රසම්පාදන මාර්ගෝපදේශය අනුගමනය කළ යුතුය. | මෙම ව්‍යාපෘතිය මාර්ග සංවර්ධන අමාත්‍යාංශයෙන් මෙම අමාතයාංහය වෙත ලැබුණු අතර අනෙකුත් ව්‍යාපෘති මෙන් උපදේශන ආයතනයක් හෝ පෙර සැලසුම් කරන ලද ව්‍යාපෘති රාමුවක් නොමැත. | ගැටලුව විසඳා නොමැත. |

## 3.10 ප්‍රවාහන ව්‍යාපෘති පහසුකම් සැකසීමේ ව්‍යාපෘතිය

ශක්‍යතා අධ්‍යයනය, විස්තරාත්මක සැලසුම් සහ ප්‍රසම්පාදන ලේඛන පිළියෙල කිරීම සහ ව්‍යාපෘතිය ආරම්භක අදියර තුළදී ක්‍රියාත්මක කිරීමේ සහාය ලබා දීම මඟින් මාර්ග, දුම්රිය හා වරාය යන උප අංශවල ප්‍රමුඛතා ප්‍රවාහන ව්‍යාපෘතිවල ආරම්භක කාර්යක්ෂමතාව වැඩි දියුණු කිරීම සඳහා ප්‍රවාහන ව්‍යාපෘති සැකසීමේ පහසුකම් ව්‍යාපෘතිය ක්‍රියාත්මක වේ.

### *3.10.1 මාර්ග සංවර්ධන අධිකාරිය මගින් සිදුකරනු ලබන කටයුතු*

(i) මාර්ග සංවර්ධන අධිකාරියේ සංරචකයේ ඇස්තමේන්තුගත පිරිවැය රු. මිලියන 1,697.48කට සමාන එ.ජ.ඩො මිලියන 11.34ක් වන අතර ඉන් රු.මිලියන 1,496.90කට සමාන එ.ජ.ඩො. මිලියන 10ක් සැපයීමට ආසියානු සංවර්ධන බැංකුව එකඟ වී තිබුණි.

(ii) ව්‍යාපෘතිය එහි කටයුතු 2017 ජනවාරි 28 දින ආරම්භ කරන ලද අතර 2022 දෙසැම්බර් 31 දින වන විට නිමකිරීමට අපේක්ෂා කර තිබුණි.

(iii) විගණකාධිපති විසින් ව්‍යාපෘතිය සම්බන්ධයෙන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන මත 2018,2019 සහ 2020 වර්ෂ සඳහා තත්ත්වාගණනය කළ මතයක් ප්‍රකාශ කර තිබුණි. කෙසේවෙතත්, මේ වනතෙක් නිරවුල් නොකරන ලද ව්‍යාපෘතියේ කාර්යසාධනය සම්බන්ධ ගැටළු කිහිපයක් පහත දැක්වේ.

| | විගණන නිරීක්ෂණ | විගණකාධිපතිගේ නිර්දේශ | ව්‍යාපෘතිය විසින් ගන්නා ලද වළක්වාලීමේ පියවර | වර්තමාන තත්ත්වය |
|---|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 04 අනුව, ව්‍යාපෘතිය විසින් දරන මුළු පොළිය හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුය. කෙසේවෙතත් පොළිය රු. මිලියන 06කට සමාන එ.ජ.ඩො. 40,434ක් පමණක් කෙරීගෙන යන වැඩ යටතේ ගිණුම්ගත කර තිබුණි. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 04 (ණය ගැනුම් පිරිවැය) අනුව ව්‍යාපෘතිය සම්බන්ධයෙන් ඉදිකිරීම් කාල පරිච්ඡේදය තුළදී උපදවන පොළිය ප්‍රාග්ධනිත කළ යුතුය. | පිළිගතහැකි විසඳුමක් ලබාගැනීමට ගැටලුව ආ.සං.බැ වෙත යොමුකර ඇත. | නිරීක්ෂණයේ කරුණු එලෙසම පවතී. |
| (ආ) | ව්‍යාපෘති පරිපාලන අත්පොතට අනුව, මාර්ග සංරචකයේ ඇස්තමේන්තුගත පිරිවැය එ.ජ.ඩො. මිලියන 11.34ක් වන අතර ඉන් එ.ජ.ඩො. 10ක් ආ.සා.බැ විසින් සපයනු ලැබේ. ඉහත සපයන ලද තොරතුරු අනුව, 2020 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතිය විසින් එ.ජ.ඩො. මිලියන 7.41ක් උපයෝජනය කළ යුතුව තිබුණි. කෙසේවෙතත්, එදින එ.ජ.ඩො. මිලියන | ව්‍යාපෘතිය අරමුදල් අපේක්ෂිත අරමුණ මත භාවිත කළ යුතු අතර ව්‍යාපෘතියෙන් නියමිත කාලයට අපේක්ෂිත ප්‍රතිලාභ ලබා ගැනීමට ව්‍යාපෘතිය නිසි පරිදි සැලසුම් කළ යුතුය. | පිළිතුරු ලබාදී නොමැත. | නිරීක්ෂණයේ කරුණු එලෙසම පවතී. |

| | | | | |
|---|---|---|---|---|
| | 2.58ක් පමණ උපයෝජනය කර තිබුණි. | | | |
| (ආ) | මේ දක්වා ව්‍යාපෘතිය විසින් නිම කිරීමට හඳුනාගත් වැඩ අයිතම්වලින් ඇස්තමේන්තුගත පිරිවැය රු. මිලියන 338ක් වන උපදේශනය (තනි පුද්ගල)- අන්තර් ජාතික රාජ්‍ය හා පෞද්ගලික හවුල්කාර ප්‍රසම්පාදන උපදේශක සහ අධිවේගී මාර්ග සංවර්ධන ව්‍යාපෘතිය යන අයිතම දෙක 2020 දෙසැම්බර් 31 වන විට නිම කර නොතිබුණි. | අපේක්ෂිත කටයුතු ව්‍යාපෘති කලපරිච්ඡේදය තුළදී නිමකිරීමට අවශ්‍ය වේ. | අමාත්‍ය මණ්ඩලය පත්කරන ලද සාකච්ඡා කමිටුව PPP කොන්ත්‍රාත්තුව පිළිබද අවසන් නිගමනයකට පැමිණීමට අඛණ්ඩව සාකච්ඡා පවත්වනු ලැබේ. | මෙම වාර්තාවේ දින වන විට නිරීක්ෂණයේ කරුණු එලෙසම පවතී. |

### *3.10.2 ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව මගින් සිදුකරනු ලබන කටයුතු*

(i) ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවේ සංරචකයේ ඇස්තමේන්තුගත පිරිවැය රු. මිලියන 1,654කට සමාන එ.ජ.ඩො මිලියන 11.36ක් වන අතර ඉන් රු.මිලියන 1,456.90කට සමාන එ.ජ.ඩො. මිලියන 10ක් සැපයීමට ආසියානු සංවර්ධන බැංකුව එකඟ වී තිබුණි.

(ii) ව්‍යාපෘතිය එහි කටයුතු 2016 ජනවාරි 28 දින ආරම්භ කරන ලද අතර 2022 දෙසැම්බර් 31 දින වන විට නිමකිරීමට අපේක්ෂා කර තිබුණි.

(iv) විගණකාධිපති විසින් ව්‍යාපෘතිය සම්බන්ධයෙන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන මත 2018,2019 වර්ෂ සඳහා තත්ත්වාගණනය කළ මතයක් හා 2020 වර්ෂය සඳහා තත්ත්වාගණනය නොකළ මතයක් ප්‍රකාශ කර තිබුණි. කෙසේවෙතත්, මේ වනතෙක් නිරවුල් නොකරන ලද ව්‍යාපෘතියේ කාර්යසාධනය සම්බන්ධ ගැටළු කිහිපයක් පහත දැක්වේ

| | විගණන නිරීක්ෂණ | විගණකාධිපතිගේ නිර්දේශ | ව්‍යාපෘතිය විසින් ගන්නා ලද වළක්වාලීමේ පියවර | වර්තමාන තත්ත්වය |
|---|---|---|---|---|
| (අ) | ව්‍යාපෘතියේ විදේශ මූලාශ්‍රවලින් ආරම්භක ආයෝජනය එ.ජ.ඩො. මිලියන 15ට වඩා අඩු නිසා ව්‍යාපෘතියේ කාර්යයමණ්ඩලයේ වැටුප් පරිමාණ කළමණාකරණ සේවා දෙපාර්තමේන්තුවේ 2016 මාර්තු 24 දිනැති චක්‍රලේඛ අංක 01/2016 (2019 මාර්තු දින සංශෝධිත) පළමු කාණ්ඩය යටතේ තීරණය කිරීම අවශ්‍ය වේ. විදේශ අරමුදල් එ.ජ.ඩො. මිලියන 100 වඩා දියත් කිරීමට සැලැස්මක් නොමැති වුවද ඉහත චක්‍රලේඛයට පටහැනිව 2018 සහ 2019 වර්ෂවලදී ව්‍යාපෘති කාර්යමණ්ඩලයේ 38 දෙනෙකුට රු. මිලියන 12.89ක වැඩිපුර ගෙවීමක් සිදුකර තිබුණි. | චක්‍රලේඛ උපදෙස් අනුගමනය කිරීම අවශ්‍ය වේ. | කළමණාකරණ සේවා චක්‍රලේඛය අනුව වැටුප් ස්ථාපනය අදාළ වැටුප් පියවරෙහි සිදුකර තිබුණි. | වැඩිපුර කරන ලද ගෙවීම අයකර ගැනීමට පියවර ගෙන නොමැත. |
| (ආ) | කොළඹ තදාසන්න දුම්රිය ව්‍යාපෘතියේ ව්‍යාපෘති කළමනාකරණ | ව්‍යාපෘති පරිපාලන අත්පොතෙහි දක්වා ඇති | එය REIP ව්‍යාපෘතිය අයවැය යටතේ පසුගාමී | මේ වන විටත් පියවර ගෙන නොමැත. |

| | | | | |
|---|---|---|---|---|
| | ඒකකයේ වසර 5 ක කාලය සඳහා ඇස්තමේන්තුගත මුදල එ.ජ.ඩො මිලියන 0.50 කි. කෙසේවෙතත්, ව්‍යාපෘති කළමනාකරණ ඒකකය විසින් එ.ජ.ඩො 665,351ක් වැය කර ඇති අතර එය එම කාලය සඳහා ඇස්තමේන්තුගත මුදල දෙක තුළ එ.ජ.ඩො 165,351 සමාන රු.30,822,782 කින් ඉක්මවා ගොස් ඇත. | ප්‍රතිපාදනවලට අනුකූලව වියදම් කළ යුතුය. | මූල්‍ය පහසුකම අනුමත කර ඇත, එබැවින් PMU පිරිවැය පුරෝකථනය කළ ඩොලර් 0.5 ඉක්මවන බව අප හඳුනාගත් විට එය ඉක්මවන PMU පිරිවැය වහාම නතර කරන ලදී. | |
| (ඇ) | නැවත පදිංචි කිරීමේ ක්‍රියාකාරකම් සහ ආසන වෙන්කිරීමේ පද්ධතිය ව්‍යාපෘති අරමුණුයටතට නොගැනුණද, මෙම අරමුණ සඳහා උපදේශක සේවා සැපයීමට පුද්ගල උපදේශක වෙත එකතුව රු.මිලියන 4.83ක මුදලක් ගෙවා තිබුණි. තවද, නැවත පදිංචි කිරීමේ සැලැස්මක් සකස් කිරීමට සහ ඒ පිළිබඳ සමාජ සමීක්ෂණයක් සිදුකිරීම සඳහා රු.මිලියන 77.14 ක් මුදලක් UN-Habitat වෙත ගෙවා තිබුණි. | ව්‍යාපෘතියේ ක්‍රියාකාරකම්වල විෂයපථය සමාලෝචනය කර ඒ අනුව චක්‍රලේඛ උපදෙස් අදාළ කර ගැනීම අවශ්‍ය වේ. | REIP යටතේ ක්‍රියාත්මක කිරීමට නියමිත දුම්රිය ස්මාර්ට් ටිකට්පත් සහ ආසන වෙන් කිරීමේ පද්ධතිය සඳහා සැලසුම් සහ ලංසු ලේඛන සකස් කිරීම සඳහා උපදේශන සේවා ලබා ගැනීම සඳහා රු.මිලියන 4.92ක් වැය කර ඇත. | ගිණුමෙන් ව්‍යාපෘතියට අදාළ නොවන වියදම් මාරුකිරීමට පියවර ගෙන නොමැත. |

| | | | | |
|---|---|---|---|---|
| (ඇ) | අමාත්‍ය මණ්ඩල තීරණයට අනුව, කැලණිවැලි දුම්රිය මාර්ගය දෙපස අනවසර පදිංචිකරුවන් 2,036 දෙනෙකු වසර තුනක කාලයක් තුළ නැවත පදිංචි කිරීම සඳහා 2018-2020 කාලය තුළ වාර්ෂික අයවැය මඟින් රුපියල් මිලියන 9,600 ක ප්‍රතිපාදන වෙන් කර ඇත. කෙසේ වෙතත්, 2020 දෙසැම්බර් 31 වන විට ඔවුන් සඳහා නිවාස ඒකක ගණන 386 ක් පමණක් භාරදී ඇත. ඒ අනුව අපේක්ෂිත ඉලක්ක සපුරා ගැනීම සඳහා ඉදිකිරීම් ක්‍රියාත්මක කර නොතිබුණි. | අමාත්‍ය මණ්ඩල තීරණයට අනුව ඉදිකිරීම් කඩිනම් කළ යුතුයි. | ඉහත සඳහන් පරිදි අවශ්‍යතාවය අනුව, කැලණිවැලි මාර්ගය දිගේ දුම්රිය මාර්ගය දෙපස ජීවත්වන පවුල් නැවත පදිංචි කිරීම සඳහා අමාත්‍ය මණ්ඩල තීරණ මඟින් රු. මිලියන 9,600ක් වෙන්කර තිබුණි. | එදිනට කැලණිවැලි මාර්ගය දිගේ ජීවත්වන පවුල් වෙත නිවාස ඒකක 534 පමණක් ලබා දී ඇත. |

### *3.10.3 ශ්‍රී ලංකා වරාය අධිකාරිය මඟින් සිදුකරනු ලබන කටයුතු*

(i) ශ්‍රී ලංකා වරාය අධිකාරිය සංරචකයේ ඇස්තමේන්තුගත පිරිවැය රු. මිලියන 729.65කට සමාන එ.ජ.ඩො මිලියන 5ක් වන අතර ඉන් රු.මිලියන 645.01කට සමාන එ.ජ.ඩො. මිලියන 4.42ක් සැපයීමට ආසියානු සංවර්ධන බැංකුව එකඟ වී තිබුණි.

(ii) ව්‍යාපෘතිය එහි කටයුතු 2018 දින ආරම්භ කරන ලද අතර 2022 දෙසැම්බර් 3 දින වන විට නිමකිරීමට අපේක්ෂා කර තිබුණි.

(iii) විගණකාධිපති විසින් ව්‍යාපෘතිය සම්බන්ධයෙන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන මත 2020 වර්ෂය සඳහා තත්ත්වාගණනය නොකළ මතයක් ප්‍රකාශ කර තිබුණි. කෙසේවෙතත්,

මේ වනතෙක් නිරවුල් නොකරන ලද ව්‍යාපෘතියේ කාර්යසාධනය සම්බන්ධ ගැටළු කිහිපයක් පහත දැක්වේ.

| | විගණන නිරීක්ෂණ | විගණකාධිපතිගේ නිර්දේශ | ව්‍යාපෘතිය විසින් ගන්නා ලද වළක්වාලීමේ පියවර | වර්තමාන තත්ත්වය |
|---|---|---|---|---|
| (අ) | 2016 ඔක්තෝබර් ණය ගිවිසුම අත්සන් කර ඇති අතර ව්‍යාපෘතියේ කටයුතු 2018දී ආරම්භ කර ඇත. ඒ අනුව ව්‍යාපෘතියේ ශක්‍යතා අධ්‍යනය සඳහා උපදේශක සේවාව 2020 දෙවන කාර්තුව වන විට නිමකිරීමට සැලසුම් කර තිබුණි. කෙසේවෙතත්, උපදේශන සේවාව සඳහා කොන්ත්‍රාත්තුව 2020 පෙබරවාරි 24 දින පිරිනමා තිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස ව්‍යාපෘතියේ කටයුතුවල ආරම්භ කිරීමේ ප්‍රමාදයක් විය. | ව්‍යාපෘති කළමනාකරණ ඒකකය මගින් වගකීම් ඇතුළත් කර ව්‍යාපෘතියේ කටයුතු නිමකිරීමට විස්තරාත්මක සැලැස්ම සකස් කළ යුතුය. | කොළඹ උතුරු වරාය සංවර්ධන ව්‍යාපෘතියේ ශක්‍යතා අධ්‍යයනය සඳහා උපදේශන සේවාව හඳුනාගෙන සංකීර්ණ ADB සහ ජාත්‍යන්තර ලංසු ක්‍රියාවලිය අනුගමනය කිරීමෙන් පසු එය AECOM වෙත පිරිනමා ඇත. | ව්‍යාපෘති කළමනාකරණ ඒකකයේ අදහස් දැක්වීමට අනුව විස්තරාත්මක සැලැස්මක් පිළියෙල කර වැඩසටහන සමග කටයුතු අධීක්ෂණය කරනු ලැබේ. කෙසේවෙතත්, විස්තරාත්මක සැලැස්ම විගණනය වෙත ඉදිරිපත් කර නොතිබුණි. |
| (ආ) | සමාලෝචිත වර්ෂය සඳහා වරාය හා නාවික කටයුතු අමාත්‍යාංශයේ වාර්ෂික අයවැය ඇස්තමේන්තුව යටතේ ව්‍යාපෘතියේ කටයුතු සිදු | වර්ෂය තුළ ඇත්ත වශයෙන්ම ඉටු කළ හැකි ක්‍රියාකාරකම් පිළිබඳව සලකා බලා වාර්ෂික ඇස්තමේන්තුව සකස් | ව්‍යාපෘතිය 2020 ජුනි සිට 2020 නොවැම්බර් දක්වා නවතා තිබුණු අතර උපලේඛනයට | 2021 දෙසැම්බර් 31 වන විට මුළු වියපැහැදම එ.ජ.ඩො මිලියන 1.3 වේ. |

| | |
|---|---|
| කිරීම සඳහා රුපියල් මිලියන 180ක ප්‍රතිපාදන වෙන් කර තිබුණි. කෙසේවෙතත්, 2020 වර්ෂය තුළ රු. මිලියන 21.9ක් පමණක් භාවිත කර තිබුණි. | කළ යුතුය. අනුව අපේක්ෂිත ගෙවීම් ලබා දී නොතිබුණි. |

## 3.11 සැහැල්ලු දුම්රිය සංක්‍රමණ ව්‍යාපෘතිය

(i) සැහැල්ලු දුම්රිය සංක්‍රමණ රථ වාහන ඉල්ලුම සීඝ්‍රයෙන් ඉහළයාම හේතුවෙන් මාර්ග තදබදය පවතින කොළඹ නාගරික ප්‍රදේශයට සැහැල්ලු දුම්රිය සංක්‍රමණය හඳුන්වා දීමෙන් කාර්යක්ෂම ප්‍රවාහන ධාරිතාව ඉහළ නැංවීම සහ පොදු ප්‍රවාහන සේවය වැඩිදියුණු කිරීම වන අතර එමගින් මාර්ග තදබදය අවම කිරීම හරහා නාගරික පරිසරය වැඩිදියුණු කිරීමට දායකවීම සඳහා ක්‍රියාත්මක වේ.

(ii) ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත පිරිවැය ජපන් යෙන් මිලියන 246,641 ක් වන අතර 2019 – 2024 කාලය සඳහා සැලසුම් කර තිබුණු අදියර හයක් (06) යටතේ ඉන් රු.මිලියන 286,839 කට සමාන ජපන් යෙන් මිලියන 200,215 ක් සැපයීමට ජපාන සහයෝගීතා නියෝජිත ආයතනය එකඟ වී තිබුණි.

(iii) ව්‍යාපෘතිය එහි කටයුතු 2019 මාර්තු 25 දින ආරම්භ කරන ලද අතර 2024 දෙසැම්බර් 31 දින වන විට නිම කිරීමට නියමිතය.

(v) විගණකාධිපති විසින් ව්‍යාපෘතිය සම්බන්ධයෙන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන මත 2019 සහ 2020 වර්ෂය සඳහා තත්ත්වාගණනය කළ මතයක් ප්‍රකාශ කර තිබුණි. කෙසේවෙතත්, මේ වනතෙක් නිරවුල් නොකරන ලද ව්‍යාපෘතියේ කාර්යසාධනය සම්බන්ධ ගැටළු කිහිපයක් පහත දැක්වේ.

| | විගණන නිරීක්ෂණ | විගණකාධිපතිගේ නිර්දේශ | ව්‍යාපෘතිය විසින් ගන්නා ලද වළක්වාලීමේ පියවර | වර්තමාන තත්ත්වය |
|---|---|---|---|---|
| (අ) | කොළඹ නගරයේ පවතින දැඩි රථවාහන තදබදයට දිගුකාලීන පිළියමක් ලෙස ජපානයේ මූල්‍ය ආධාර යටතේ සැහැල්ලු දුම්රිය සංක්‍රමණ පද්ධති ව්‍යාපෘතිය 2017 මැයි 01 දින ආරම්භ කරන ලදි. ඒ අනුව JICA ආයතනය මඟින් ලබාදෙන ලද රු.මිලියන 4,622.45 ක් හා රු.මිලියන 923.18 ක් වූ භාණ්ඩාගාර ප්‍රතිපාදනද සමඟ රු.මිලියන 5,545.63 ක් 2020 වර්ෂය අවසානය වන විට ව්‍යාපෘතිය සඳහා දරා තිබුණි. අංක : 20/1450/312/002 හා 2020 ඔක්තෝබර් 06 දිනැති අමාත්‍ය මණ්ඩල පත්‍රිකාවට අනුව ව්‍යාපෘතිය වසා දමා ව්‍යාපෘතියේ සියලුම වත්කම් ප්‍රවාහන අමාත්‍යාංශය සහ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශය | ව්‍යාපෘති ආරම්භ කිරීමට පෙර විධිමත් ශක්‍යතා අධ්‍යයනයක් සිදුකළ යුතුය. | අවශ්‍ය පියවර ගෙන තිබුණි. | |

| | | | |
|---|---|---|---|
| | වෙත තිබුණි. එමනිසා ව්‍යාපෘතිය වෙනුවෙන් දරා තිබුණු පිරිවැය ඵලරහිත වියදමක් බවට පත්ව තිබුණි. | | |
| (ආ) | 2020 වර්ෂය තුළදී ව්‍යාපෘතියේ වැඩ කටයුතු නවතා දැමීම නිසා උපදේශන ආයතනය විසින් ඔවුන්ට ලැබිය යුතු එ.ජ.ඩො මිලියන 23.65ක මුදලද ඇතුලත්ව එ.ජ.ඩො මිලියන 31.36 ක් ඉල්ලුම් කර තිබුණි. මේ සම්බන්ධව සාකච්ඡා කිරීම සඳහා අමාත්‍ය මණ්ඩලය විසින් 2021 පෙබරවාරි 23 දින කමිටුවක් පත්කර තිබුණි. | පත්කළ කමිටුව විසින් නොපමාව ගැටලුව සාකච්ඡා කළ යුතුය. | අවශ්‍ය පියවර ගෙන තිබුණි. |
| (ඇ) | 2020 වර්ෂය තුළදී ව්‍යාපෘතියේ කටයුතු අත්හිටුවීමට තීරණය කිරීම නිසා, 2019 මැයි 23 දින අත්සන් කරන ලද ව්‍යාපෘතියෙහි ණය ගිවිසුමට අනුව ගෙවීමට සිදුවී තිබුණු රු.මිලියන 102.73 කට සමාන ජපන් යෙන් මිලියන 60.08 ක මුදල එනම් මුළු ණය මුදලින් සියයට 0.2 ක් වූ ඉදිරි ගාස්තු මුදල නිෂ්කාර්ය | අනවශ්‍ය වියදම් දැරීම් වැළැක්වීම සඳහා කටයුතු කළ යුතුය. | අවශ්‍ය පියවර ගෙන තිබුණි. |

| | | | |
|---|---|---|---|
| | වියදමක් බවට පත් වී තිබුණි. එසේම, ණය ලබාදුන් ආයතනය වූ JICA ආයතනයට නැවත ගෙවිය යුතු ණය මුදල වූ රු.මිලියන 4,622.45 කට සමාන ජපන් යෙන් මිලියන 2,703.18 මුදල ගෙවීම සඳහා ගිවිසුමකට එළඹී නොතිබුණි. | | |
| (ඇ) | ටෙන්ඩර් ලියවිලි සකස් කර 2020 ජුනි 30 දිනට පෙර ඉදිරිපත් කිරීම සඳහා ව්‍යාපෘතිය මඟින් රු.මිලියන 26.13 ක් 2020 වර්ෂය අවසානයේදී උපදේශන සමාගමට ගෙවා තිබුණි. කෙසේවෙතත්, 2020 වර්ෂය අවසානය වන තෙක් ටෙන්ඩර් ලියවිලි සකස් කර නොතිබුණි. | සැලසුම් කල කාල පරිච්ඡේදය තුළ අදාළ කාර්යයන් නිම කිරීමට හැකිවන පරිදි ශක්තිමත් හා ඵලදායි ව්‍යාපෘති කළමනාකරණ ක්‍රමවේදයක් ක්‍රියාත්මක කළ යුතුය. | අවශ්‍ය පියවර ගෙන තිබුණි. |
| (ඉ) | 2020 වර්ෂය අවසානයට ව්‍යාපෘතිය අත්හිටුවා තිබුණද, මාලඹේ සිට බත්තරමුල්ල දක්වා උපයෝගී රැහැන් ඇදීමට අවශය අමුද්‍රව්‍ය පෙරසැරි කිරීමේ කටයුතු ආරම්භ කිරීම පිණිස හා කොළඹ නගරයෙහි පොලොව යටින් දිවෙන විදුලි | අත්තිකාරම් නැවත අයකර ගැනීම සඳහා අවශ්‍ය නිවැරදි ක්‍රියාමාර්ග කඩිනමින් ගත යුතුය. | අවශ්‍ය පියවර ගෙන තිබුණි. |

| | | | |
|---|---|---|---|
| | රැහැන් සම්බන්ධ කිරීම සඳහා රු.මිලියන 36 ක වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරමක් ලංකා විදුලිබල මණ්ඩලයට ගෙවා තිබුණි. මෙයින් රු.මිලියන 8 ක් 2021 ජුලි මාසය අවසානය දක්වාම නැවත පියවාගෙන නොතිබුණි. | | |
| (ඊ) | උපදේශන ආයතනය විසින් ලබාදී තිබුණු වාර්තාවන් පදනම් කරගෙන මෙම ව්‍යාපෘතිය රාජ්‍ය පෞද්ගලික සහභාගීත්ව (PPP) ව්‍යාපෘතියක් ලෙස දිගටම කරගෙන යාමට යෝජනා කර තිබුණි. එසේ වුවත්, 2021 දෙසැම්බර් මාසය අවසානය වන විට වර්ෂයකුත් මාස 6 ක් ගත වී තිබුණද නව ව්‍යාපෘතිය ආරම්භ කර නොතිබුණි. | ව්‍යාපෘතියේ අරමුණු ඉටුකර ගැනීම සඳහා ශක්තිමත් ඵලදායි ව්‍යාපෘති කළමනාකරණ පද්ධතියක් ක්‍රියාත්මක කළ යුතුය. | ව්‍යාපෘතිය කාර්යක්ෂමව කළමනාකරණය කිරීමට පියවර ගෙන නොතිබුණි. |
| (උ) | උපදේශන කොන්ත්‍රාත්කරුවන් 4 දෙනෙකුට රු.මිලියන 21.43 ක් ගෙවා තිබුණද, ඔවුන් විසින් ඉදිරිපත් කළ වාර්තා සහ එම වාර්තා සමාලෝචනය | සියලුම තොරතුරු විගණනයට ලබාදිය යුතුය. | තොරතුරු ඉදිරිපත් කර නොතිබුණි. |

| | | | |
|---|---|---|---|
| | කිරීමේ වාර්තා විගණනයට ඉදිරිපත් නොකෙරුණි. | | |
| (ඍ) | වටිනාකම රු.මිලියන 3,419.52 ක් වූ ජර්නල් සටහන් 114කට අදාළ ජර්නල් වවුචර් හා උපයෝගී ලියවිලි විගණනයට ඉදිරිපත් නොකෙරුණි. | සියලුම තොරතුරු විගණනයට ලබාදිය යුතුය. | තොරතුරු ඉදිරිපත් කර නොතිබුණි. |
| (එ) | 2020 වර්ෂය අවසානයේ භාරදීමට නියමිතව තිබුණු උපදේශන වාර්තා 16 කින් වාර්තා 11 ක් පමණක් භාරදී තිබුණු අතර භාරදුන් වාර්තාවලින්ද වාර්තා 7 ක් පමණක් ව්‍යාපෘතිය විසින් සමාලෝචනය කර තිබුණි. එසේ වුවත් උපදේශන සේවා ගිවිසුමට අනුව ප්‍රමාද වූ උපදේශන සේවා 5 වෙනුවෙන් ප්‍රමාද ගාස්තු අයකර ගැනීමට කටයුතු කර නොතිබුණු අතර, අලාභ අයකර ගැනීමට අවශ්‍ය ප්‍රතිපාදන ගිවිසුම්වලට ඇතුළත් කර නොතිබුණි. | ඉතිරි උපදේශන වැඩ ඉටුකරවා ගැනීම සඳහා නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග ගැනීමට කඩිනම්ව කටයුතු කළ යුතුය අතර අලාභ අයකර ගැනීමට හැකිවනු පිණිස උපදේශන ගිවිසුම්වලට ප්‍රතිපාදන ඇතුළත් කළ යුතුය. | අලාභ අයකර ගැනීමට පියවර ගෙන නොතිබුණි. |

### 3.12 කොළඹ තදාසන්න දුම්රිය කාර්යක්ෂමතාව වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය

(i) කොළඹ තදාසන්න දුම්රිය කාර්යක්ෂමතාව වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය ඉදිරි වර්ෂ 20 සඳහා ජාතික ප්‍රවාහන පද්ධතියට එහි දායකත්වය තහවුරු කිරීමට කොළඹ තදාසන්න ප්‍රදේශයේ දුම්රිය ජාලය සංවර්ධනය කිරීම සඳහා ක්‍රියාත්මක වේ.

(ii) ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත පිරිවැය රු.මිලියන 33,878 කට සමාන එ.ජ.ඩො මිලියන 192ක් ඉන් රු.මිලියන 28,232 කට සමාන එ.ජ.ඩො මිලියන 160ක් ලබාදීමට ආසියානු සංවර්ධන බැංකුව එකඟ වී තිබුණි.

(iii) ව්‍යාපෘතිය එහි කටයුතු 2019 සැප්තැම්බර් 06 දින ආරම්භ කරන ලද අතර 2024 දෙසැම්බර් 31 දින වන විට නිම කිරීමට නියමිතය.

(iv) විගණකාධිපති විසින් ව්‍යාපෘතිය සම්බන්ධයෙන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන මත 2019 වර්ෂය සඳහා තත්ත්වාගණනය කළ මතයක් සහ 2020 වර්ෂය සඳහා තත්ත්වාගණනය නොකළ මතයක් ප්‍රකාශ කර තිබුණි. කෙසේවෙතත්, මේ වනතෙක් නිරවුල් නොකරන ලද ව්‍යාපෘතියේ කාර්යසාධනය සම්බන්ධ ගැටළු කිහිපයක් පහත දැක්වේ.

| | විගණන නිරීක්ෂණ | විගණකාධිපතිගේ නිර්දේශ | ව්‍යාපෘතිය විසින් ගන්නා ලද වළක්වාලීමේ පියවර | වර්තමාන තත්ත්වය |
|---|---|---|---|---|
| (අ) | ව්‍යාපෘතිය එම කාලය සඳහා වෙන් කරන ලද අරමුදල් ඌන උපයෝජනය සඳහා රු.මිලියන 34ක බැදීම් ගාස්තුවක් දැරීමට සිදු විය. | පරිපාලන පාලනයන් ශක්තිමත් කළ යුතුය. | වෘත්තීය සමිති මගින් මතු වූ විරෝධතා, අමාත්‍ය ධූර වෙනස් කිරීම, අපේක්ෂිත ප්‍රසම්පාදන ඉලක්කගත සාක්ෂාත් කර ගැනීම ප්‍රමාදවීම හේතුවෙන් බැදීම් ගාස්තු දැරීමට සිදු | 2021 වර්ෂයේත් රු.මිලියන 46ක් ගෙවා තිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| | | | විය. | |
| (ආ) | විදේශ උපදේශන ආයතනයක් සමග මහනුවර තදාසන්න දුම්රිය මාර්ගයේ සවිස්තර සැලැස්මක් සකස් කිරීම සහ ශක්‍යතා අධ්‍යනය කිරීම සඳහා වන කොන්ත්‍රාත්තුව යුරෝ 1,385,208, එ.ජ.ඩො 2,642,014 සහ රු. මිලියන 194 අත්සන් කර තිබුණු අතර රු.මිලියන 49ක සවලීකරණ අත්තිකාරම් ලබා දී තිබුණි. කෙසේවෙතත්, 2020 දෙසැම්බර් 31 දිනට මෙම ව්‍යාපෘති සංරචකය අත්හිටුවන ලදි. | සම්පූර්ණ යෝජනා ක්‍රියාත්මක කිරීමේදී කැබිනට් තීරණ සලකා බැලිය යුතුය. | 2018.05.09 දිනැති කැබිනට් තීරණයට අනුව මෙම සංරචකය සඳහා උපදේශක ප්‍රසම්පාදනය කරන ලද අතර 2019.12.10 දින ගිවිසුම අත්සන් කරන ලදි. කැබිනට් තීරණයට අනුව සවලීකරණ අත්තිකාරම් ගෙවන ලද අතර ව්‍යාපෘතිය අත්හිටුවන ලදි. ERD විසින් ව්‍යාපෘති කටයුතු නැවත ඇගයීමෙන් පසු 2021.04.30 දින සිට ආරම්භ කරන ලදී. | දැනටමත් ව්‍යාපෘති සංරචකයේ ප්‍රගතිය මන්දගාමී වේ. |
| (ඇ) | 2018 මැයි 16 දිනැති අමාත්‍ය මණ්ඩල සංදේශයේ යෝජනා 04 ක් සඳහා අමාත්‍ය මණ්ඩලය අනුමැතිය ලබාදී තිබුණි. කෙසේවෙතත්, ප්‍රවාහන අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ ඉහත අනුමැතියට පටහැනිව එ.ජ.ඩො මිලියන 62.79 ක් වෙන්කරමින් | වැඩ යෝජනා සඳහා මුදල් වෙන් කිරීමේදී කැබිනට් තීරණය සලකා බැලිය යුතුය. | REIP හි ඇතුළත් කළ යුතු සංවර්ධන මැදිහත්වීම් ලැයිස්තුව SLR, MOT, ERD යනාදිය සමඟ ආසියානු සංවර්ධන බැංකු මෙහෙවර රැස්වීමේදී තවදුරටත් සාකච්ඡා කර ඇත. ඊට අමතරව REIP | 2021 දී තවත් යෝජනා 3ක් එකතු කර ඇත. |

| | | | | |
|---|---|---|---|---|
| | තවත් උප යෝජනා 13 ක් සඳහා ආසියානු සංවර්ධන බැංකුව සමඟ ගිවිසුමක් අත්සන් කර තිබුණි. | | යටතේ අයිතම ලැයිස්තුවක් ආසියානු සංවර්ධන බැංකු සහ ශ්‍රී ලංකා රජය අතර අත්සන් කරන ලද ගිවිසුමට ඇතුළත් වේ. | |
| (ඇ) | ව්‍යාපෘති පරිපාලන අත්පොතෙහි සී කොටසේ වගුව 4 අනුව වෙනම කළමනාකරණ ඒකකයක් ස්ථාපිත කළ යුතු අතර කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබා ගත යුතුය. කෙසේවෙතත්, කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අදාළ අනුමැතිය ලබා ගැනීමකින් තොරව කොළඹ තදාසන්න දුම්රිය ව්‍යාපෘතිය යන ADB ණය අංක 3425න් වෙනත් ව්‍යාපෘති කළමනාකරණ ඒකකයක් සම්බන්ධ කාර්ය මණ්ඩලය වෙත වැටුප් ලෙස එකතුව රු.මිලියන 25.4ක් ගෙවා තිබුණි. | වෙනම කළමනාකරණ ඒකකයක් ස්ථාපිත කළ යුතු අතර කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබා ගත යුතුය. | ව්‍යාපෘතියේ සියලුම කාර්ය මණ්ඩලය බඳවා ගෙන ඇති අතර කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය අනුව ගෙවා තිබුණි. | 2019දී කොළඹ තදාසන්න දුම්රිය ව්‍යාපෘතියේ කළමනාකරණ ඒකකය CSRIEP නව ව්‍යාපෘතියට අනුයුක්ත කර ඇත. |

**3.13 උතුරු මාර්ග සම්බන්ධ කෙරෙන ව්‍යාපෘතිය (මාර්ග සංවර්ධන අධිකාරි) සංරචකය**

(i) උතුරු සහ උතුරු මැද පළාත්වල ජාතික මාර්ගයවල කිලෝමීටර් 170ක් පුනරුත්ථාපනය කිරීම හා වැඩිදියුණු කිරීම සඳහා උතුරු මාර්ග සම්බන්ධ කෙරෙන ව්‍යාපෘතිය ක්‍රියාත්මක වේ.

(ii) ණය ගිවිසුමට අනුව, ව්‍යාපෘතියේ මුල් ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු.මිලියන 16,790 කට සමාන එජඩො මිලියන 146ක් වූ අතර ඉන් රු.මිලියන 14,950කට සමාන එජඩො මිලියන 130ක් සැපයීම සඳහා ආසියානු සංවර්ධන බැංකුව එකඟ වී තිබුණි.

(iii) තවද, 2012 නොවැම්බර් 12 දිනැති 2890 එස්ආර්අයි (එස්එෆ්) දරන අතිරේක ණය ගිවිසුම යටතේ රු.මිලියන 8,840කට සමාන එජඩො මිලියන 68ක් ලබාදීමට ආසියානු සංවර්ධන බැංකුව එකඟ වී තිබුණු අතර ඉන් රු.මිලියන 4,420කට සමාන එජඩො මිලියන 34ක් උතුරු සහ උතුරු මැද පළාත්වල පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය වෙත වෙන්කර තිබුණි. ඊට අමතරව 2012 නොවැම්බර් 12 දිනැති 2891 එස්ආර්අයි දරන ණය ගිවිසුම යටතේ උතුරු සහ උතුරු මැද පළාත්වල ජාතික මාර්ගය සඳහා රු.මිලියන 3,900කට සමාන එජඩො මිලියන 30ක් ආසියානු සංවර්ධන බැංකුව විසින් වෙන්කර තිබුණි.

(v) ව්‍යාපෘතිය එහි කටයුතු මුල් ණය ගිවිසුම යටතේ 2010 ඔක්තෝම්බර් 22 දින ආරම්භ කරන ලද අතර 2016 දෙසැම්බර් 31 දින වන විට නිමකර තිබුණි. අතිරේක මූල්‍ය පහසුකම් යටතේ ව්‍යාපෘතියේ කටයුතු 2013 මැයි 13 දින ආරම්භ කර තිබුණු අතර 2018 දෙසැම්බර් 31 දින වනවිට නිම කිරීමට සැලසුම් කර තිබුණු අතර එය 2020 දෙසැම්බර් 31 දක්වා දීර්ඝ කර තිබුණි.

(vi) විගණකාධිපති විසින් ව්‍යාපෘතිය සම්බන්ධයෙන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන මත 2018,2019 සහ 2020 වර්ෂය සඳහා තත්ත්වාගණනය කළ මතයක් ප්‍රකාශ කර තිබුණි.

ලැබී තිබුණු තොරතුරු අනුව, පුනරුත්ථාපනය කළ ජාතික මාර්ග 3ක වර්ෂ 3ක කාර්යසාධනය මත නඩත්තු කටයුතු ඇතුළුව උතුරු සහ උතුරු මැද පළාත්වල කොන්ත්‍රාත් පැකේජ 10ක් යටතේ පිරිනමන ලද ජාතික මාර්ග 6ක කිලෝමීටර 170ක කොටස් පුනරුත්ථාපන කටයුතු 2015 දෙසැම්බර් 31 දිනට අවසන් කර තිබුණි. තවද, ආරම්භක ක්‍රියාත්මක කිරීමේ සැලැස්ම යටතේ මාර්ග පුනරුත්ථාපනය මත ඉතුරුම් භාවිතයෙන් අනෙකුත් ජාතික මාර්ග 2හි පුනරුත්ථාපනය සඳහා කොන්ත්‍රාත්තුව 2015 පිරිනමා තිබුණු අතර 2016 වර්ෂයේදී නිම කර තිබුණි. ඊට අමතරව 2016 දෙසැම්බර් 31 දිනට අතිරේක මූල්‍ය පහසුකම් යටතේ උතුරු සහ උතුරු මැද පළාත්වල ජාතික මාර්ග 7ක කිලෝමීටර 122ක වෙනත් කොටස් පුනරුත්ථාපන කටයුතු අවසන් කර තිබුණි. ණය මුදලෙහි ඉතුරුම් වලින් මහනුවර යාපනය මාර්ගයේ (ඒ 009) රබෑව සිට මැදවච්චිය දක්වා කොටසේ කිලෝමීටර 9.64ක් පුනරුත්ථාපනය සඳහා 2017 අප්‍රේල් 28 දින නව කොන්ත්‍රාත්තුවක් පිරිනමා තිබුණු අතර 2018 ඔක්තෝබර් 31 දිනට නිමකර තිබුණි. තවද, ව්‍යාපෘතිය මැදවච්චිය හොරොව්පතාන මාර්ගයේ කොටසක් (බී 238) පුනරුත්ථාපනය සඳහා ආසියානු සංවර්ධන බැංකුවෙන් සහ අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලබා ගෙන තිබුණු අතර ඒ සඳහා කොන්ත්‍රාත්

2ක් පිරිනමා තිබුණි. කෙසේවෙතත්, පුනරුත්ථාපනය කටයුතු 2020 වර්ෂයේදී නිමකර තිබුණි.

## 3.14 උතුරු මාර්ග සම්බන්ධ කෙරෙන ව්‍යාපෘතිය (අතිරේක මුල්‍යනය) පළාත් සංරචකය

(i) උතුරු පළාත තුළ සහ උතුරු පළාත සහ දකුණු පළාත අතර මාර්ග සම්බන්ධතාවයන් වැඩිදියුණු කිරීම සඳහා උතුරු මාර්ග සම්බන්ධ කෙරෙන ව්‍යාපෘතිය (අතිරේක මුල්‍යනය) පළාත් සංරචකය ක්‍රියාත්මක වේ

(ii) ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත පිරිවැය රු.මිලියන 4,600කට සමාන එජඩො මිලියන 34ක් වන අතර ඉන් රු.මිලියන 4,058කට සමාන එජඩො මිලියන 30ක් මුල්‍යයනය කිරීමට ආසියානු සංවර්ධන බැංකුව එකඟවී තිබුණි.

(iii) ව්‍යාපෘතිය එහි කටයුතු 2013 මැයි 31 දින ආරම්භ කර තිබුණු අතර 2017 දෙසැම්බර් 30 දින නිමකිරීමට සැලසුම් කර තිබුණි. ජාතික සංරචකය (මා.සං.අ) දීර්ඝ කිරීම හේතුවෙන් ව්‍යාපෘති කාලපරිච්ඡේදය 2020 ජුනි 30 දක්වා දීර්ඝ කර තිබුණි.

(iv) විගණකාධිපති විසින් ව්‍යාපෘතිය සම්බන්ධයෙන් ඉදිරිපත් කරන ලද මුල්‍ය ප්‍රකාශන මත 2018,2019 සහ 2020 වර්ෂය සඳහා තත්ත්වාගණනය කළ මතයක් ප්‍රකාශ කර තිබුණි. කෙසේවෙතත්, මේ වනතෙක් නිරවුල් නොකරන ලද ව්‍යාපෘතියේ කාර්යසාධනය සම්බන්ධ ගැටළු කිහිපයක් පහත දැක්වේ.

| | විගණන නිරීක්ෂණ | විගණකාධිපතිගේ නිර්දේශ | ව්‍යාපෘතිය විසින් ගන්නා ලද වළක්වාලීමේ පියවර | වර්තමාන තත්ත්වය |
|---|---|---|---|---|
| (අ) | ව්‍යාපෘතිය පළාත් මාර්ගවල සංවර්ධන කටයුතු නිමකර තිබුණ ද, ව්‍යාපෘතිය විසින් සංවර්ධනය කර අදාළ සභාවලට භාරදී ඇති සෑම මාර්ගයක් සඳහා දරන ලද පිරිවැය වෙන් කිරීමට පියවර ගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය. | සෑම මාර්ගයක් සඳහා මුළු පිරිවැය වෙන් කිරීමට සහ අදාළ සභාවලට භාරදීමට පියවර ගත යුතුය. | 2020 මුල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණන වාර්තාව සමාලෝචනය කිරීමෙන් පසුව භාරදීමට පියවර ගනු ලැබේ. | මේවන විට ගැටලුව විසඳා නොමැත. |

## 3.15 ඒකාබද්ධ මාර්ග ආයෝජන වැඩසටහන (අයි-මාර්ග)

(i) ඒකාබද්ධ මාර්ග ආයෝජන වැඩසටහන (අයි-මාර්ග)ග්‍රාමීය ප්‍රජාව සහ සමාජ ආර්ථික මධ්‍යස්ථාන අතර මාර්ග ප්‍රවේශතාවය වැඩිදියුණු කිරීම සඳහා ක්‍රියාත්මක වේ.මෙහි දිගුකාලීන බලපෑම වන්නේ ජාතික හා පළාත් මාර්ගවල කාර්යක්ෂමතාවය වැඩිදියුණු කිරීම වේ.

(ii) වැඩසටහනේ ඇස්තමේන්තුගත පිරිවැය රු.මිලියන 117,780 කට සමාන එ.ජ.ඩො.මිලියන 906 ක් වන අතර ඉන් රු.මිලියන 104,000 කට සමාන එ.ජ.ඩො. මිලියන 800 ක් මූල්‍යනය කිරීමට ආසියානු සංවර්ධන බැංකුව එකඟවී තිබුණි.

(iii) වැඩසටහන එහි කටයුතු 2014 ජුනි 01 දින ආරම්භ කරන ලද අතර 2024 සැප්තැම්බර් 30 දින වන විට නිමකිරීමට නියමිතය.

(iv) විගණකාධිපති විසින් ව්‍යාපෘතිය සම්බන්ධයෙන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන මත 2018,2019 සහ 2020 වර්ෂය සඳහා තත්ත්වාගණනය කළ මතයක් ප්‍රකාශ කර තිබුණි. කෙසේවෙතත්, මේ වනතෙක් නිරවුල් නොකරන ලද ව්‍යාපෘතියේ කාර්යසාධනය සම්බන්ධ ගැටළු කිහිපයක් පහත දැක්වේ.

| | විගණන නිරීක්ෂණ | විගණකාධිපතිගේ නිර්දේශ | ව්‍යාපෘතිය විසින් ගන්නා ලද වළක්වාලීමේ පියවර | වර්තමාන තත්ත්වය |
|---|---|---|---|---|
| (අ) | කොන්ත්‍රාත්තුවේ සාමාන්‍ය කොන්දේසිවල 4.2 උප වගන්තිය අනුව කොන්ත්‍රාත්කරුවන් විසින් කාර්ය සාධන සුරැකුම්පත් ඔවුන්ගේ වියදමින් ලබා දිය යුතු වුවද, කොන්ත්‍රාත්කරුවන්ට හිමිකම්පෑමට හැකි වන පරිදි ප්‍රමාණ පත්‍රවල මූලික හා පොදු අයිතමයන් යටතේ | ලංසු ලියකියවිලි නිකුත් කිරීමට පෙර ප්‍රසම්පාදන විශේෂඥ සහ තාක්ෂණික ඇගයීම් කමිටුව විසින් ප්‍රමාණ පත්‍ර සමාලෝචනය කිරීමට කටයුතු කළ යුතුය. | ප්‍රමාණ පත්‍රවල ගෙවීම් අයිතම ඉවත් කර ඇත. | කොන්ත්‍රාත්කරුවන් කාර්ය සාධන සුරැකුම්පත් ඔවුන්ගේ වියදමින් ලබා දී ඇත. |

| | | | | |
|---|---|---|---|---|
| | වෙනම ගෙවීම් අයිතමයක් දක්වා ඇති බව නිරීක්ෂණය විය. ඒ අනුව, කොන්ත්‍රාත්කරුවන් විසින් ලබාගත් කාර්ය සාධන බැඳුම්කරවල පිරිවැය ප්‍රතිපූරණය කිරීම සඳහා රු. මිලියන 564.45 ක අතිරේක මුදලක් කොන්ත්‍රාත්කරුවන්ට ගෙවා තිබුණි. | | | |
| (ආ) | මූලික සැලැස්මට අනුව වැඩසටහනේ කාල සීමාව තුළ ජාතික මාර්ග කි.මී. 218.19 ක් සහ ග්‍රාමීය මාර්ග කි.මී. 3,106.10 ක් පුනරුත්ථාපනය කිරීමට අපේක්ෂා කළද, 2020 දෙසැම්බර් 31 දින වන විට ජාතික මාර්ග වලින් කි.මී 104.13 ක් පමණක් ප්‍රදානය කර තිබුණි. | වැඩසටහනේ මූලික සැලැස්මට අනුකූලවීමට සහ කාල සීමාව තුළ ඉලක්කය සපුරා ගැනීමට අවශ්‍ය පියවර ගත යුතුය. | ඒකාබද්ධ මාර්ග වැඩසටහනේ කාලපරිච්ඡේදය 2014 සිට 2024 දක්වා වේ.ජාතික මාර්ගවලට සාපේක්ෂව ඔවුන්ගේ කොන්දේසි දුර්වල වීම නිසා ආරම්භක කාලපරිච්ඡේදය තුළදී වැඩිම ප්‍රමුඛතාවයක් ග්‍රාමීය මාර්ග සඳහා ලබා දී ඇත.<br>) 2022 පෙබරවාරි 10 දින පිරිනමන ලද ඉතිරි කිලෝමීටර් 10,413 ඇතුළුව ජාතික මාර්ග කිලෝමීටර් 350ක් පුනරුත්ථාපනය | 2022 පෙබරවාරි 10 දින පිරිනමන ලද ඉතිරි කිලෝමීටර් 104.13 ඇතුළුව ජාතික මාර්ග කිලෝමීටර් 350ක් පුනරුත්ථාපනය කිරීමට සැළසුම වෙනස්කර තිබුණි. කිලෝමීටර් 38ක් ලංසු ක්‍රියාවලිය යටතේ අමතර කිලෝමීටර් 112ක් සඳහා ලංසු කැඳවීමට නියමිතය. |

| | | | | |
|---|---|---|---|---|
| | | | කිරීමට සැළසුම වෙනස්කර තිබුණි. කිලෝමීටර් 38ක් ලංසු ක්‍රියාවලිය යටතේ අමතර කිලෝමීටර් 112ක් සඳහා ලංසු කැඳවීමට නියමිතය. | |
| (ඇ) | ග්‍රාමීය මාර්ග කි.මී 2,203.87 ක ප්‍රතිසංස්කරණ කටයුතු අවසන් කර 2020 දෙසැම්බර් 31 දින වන විට මාර්ග සංවර්ධන අධිකාරියට භාර දී තිබුණි. තවද, කොන්ත්‍රාත් පැකේජ 12 කට අදාළ ග්‍රාමීය මාර්ග කි.මී. 1,000.43 ක් 2020 දෙසැම්බර් 31 දින වන විට අත්හැර දමා තිබුණි. | වැඩසටහනේ අපේක්ෂිත ඉලක්ක සපුරා ගැනීම සඳහා සෑම උත්සාහයක්ම ගත යුතුය. | ADB කොන්ත්‍රාත්වලඅ ඇගයීම් තුළදී දුර්වල කාර්යසාධනයක් සහිත කොන්ත්‍රාත්කරුවන් ඉවත් කිරීමට ලංසු ලියවිලිවලට නව වගන්තියක් ඇතුළත් කර ඇත. නැවත ලංසු කැඳවීමට උසාවි නියෝගයක් නොමැති නවත්වන ලද කොන්ත්‍රාත්වල ඉතිරි වැඩ නිම කිරීමට කොන්ත්‍රාත් පිරිනමා ඇත. නැවත ලංසු කැඳවීමට උසාවි නියෝගයක් ලබා දී ඇති සමහර කොන්ත්‍රාත්වල මාර්ග කොන්ත්‍රාත් සමඟ නිරවුල් කිරීමේ ගිවිසුම අත්සන් කිරීමෙන් පසු දේශිය | කිලෝමීටර් 520 මාර්ග දැනටමත් පිරිනමා ඇති අතර ඒකාබද්ධ මාර්ග වැඩසටහන මඟින් ඉදිකරමින් පවතී. කිලෝමීටර් 391 මාර්ග ඒකාබද්ධ මාර්ග වැඩසටහනින් ඉවත්කර ඇති අතර ඉන් කිලෝමීටර 326ක් දේශීය බැංකු මූල්‍යනය කරන වැඩසටහනක් වෙත භාරදී ඇත. ඉන් කිලෝමීටර් 154ක් සඳහා නැවත ලංසු කැඳවීම වළක්වාලමින් උසාවි නියෝගයක් ඇති මාර්ග සඳහා පියවරක් ගත යුතු වේ. |

| | | | | |
|---|---|---|---|---|
| | | | බැංකු මඟින් මූල්‍යනය කරන වැඩසටහන්වලට භාර දෙනු ලැබේ. | |
| (ඇ) | අතහැර දමා ඇති කොන්ත්‍රාත් පැකේජ 12 න් 2019 වර්ෂයේදී කොන්ත්‍රාත් පැකේජ 03 ක් අවසන් කර ඇතත්, 2020 දෙසැම්බර් 31 වන විටත් ඉතිරි කටයුතු කරගෙන යාමට කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. | වැඩසටහනේ අපේක්ෂිත ඉලක්ක සපුරා ගැනීම සඳහා සෑම උත්සාහයක්ම ගත යුතුය. | උසාවි නියෝගයක් නොමැති කොන්ත්‍රාත් 06ක් ඉතිරි වැඩ නිම කිරීම සඳහා ප්‍රදානය කර ඇත. කොන්ත්‍රාත් 04ක් දේශීය බැංකු මූල්‍යයනය කරන වැඩසටහනට භාරදී ඇත. නැවත ලංසු කැඳවීමට නියෝග ලබාදී ඇති කොන්ත්‍රාත් 02ක් සඳහා කටයුතු කළ යුතු වේ. | මෙම ගැටළුව විසඳීමට සාකච්ඡා පවත්වමින් ඇත. |
| (ඉ) | අතහැර දමා තිබුණු කොන්ත්‍රාත් පැකේජ 12 න්, සමාලෝචිත වර්ෂය තුළදී මෙම ව්‍යාපෘතිය මගින් සිදු කිරීම සඳහා කොන්ත්‍රාත් පැකේජ 05 ක ඉතිරි වැඩ නැවත පිරිනමා තිබුණු අතර නැවත ප්‍රදානය කරන ලද කොන්ත්‍රාත් වල වටිනාකම මුල් කොන්ත්‍රාත් මිලට සාපේක්ෂව රු. මිලියන 5,007 කින් වැඩි කර | තවදුරටත් ප්‍රමාදයකින් තොරව ඉදිකිරීම් අවසන් කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. | කොන්ත්‍රාත් 05 වැඩ නැවැත්වීම සහ ඉතිරි වැඩ ප්‍රදානය හේතුවෙන් වැඩිවන ලද මුදල රු. මිලියන 3,886.6 ලෙස නිවැරදි විය යුතුය. අයකර නොගන්නා ලද අත්තිකාරම් මුදල ගණනය කිරීම්වල ඇතුළත්ව නොමැත. සේවාදායකයාගේ හිමිකම්පෑමෙන් මුදල අයකර ගැනීමට පියවර ගත යුතුය. | නැවත ප්‍රදානය කරන ලද කොන්ත්‍රාත්වල ප්‍රගතිය සතුටුදායකය. ADB කොන්ත්‍රාත් කිහිපයක් සඳහා දුර්වල කාර්යසාධනයක් සහිත නවත්වන ලද කොන්ත්‍රාත්කරුවන් පැමිණීම වැළැක්වීමට ලංසු ලියවිලිවල අලුත් වගන්ති කිහිපයක් |

| | | | | |
|---|---|---|---|---|
| | තිබුණි. | | | ඇතුළත් කර ඇත. |
| (ඊ) | සමාලෝචිත වර්ෂය තුළදී කි.මී. 100,000 යේ ග්‍රාමීය මාර්ග සංවර්ධන වැඩසටහන මඟින් අතහැර දැමූ කොන්ත්‍රාත් 04 ක ඉතිරි වැඩ කටයුතු එම අසාර්ථක කොන්ත්‍රාත්කරුගෙන්ම අවසන් කිරීමට ගිවිසුම් අත්සන් කර තිබුණු අතර මුල් කොන්ත්‍රාත් මිල හා සසඳන විට එවැනි කොන්ත්‍රාත් වල වටිනාකම රු. මිලියන 580.14 කින් වැඩිවී තිබුණි. | තවදුරටත් ප්‍රමාදයකින් තොරව සහ අමතර පිරිවැයකින් තොරව ඉදිකිරීම් නිම කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. | රු. මිලියන 580.14 අගය වැඩිවීම විගණකගේ වැරදි අවබෝධයක් වේ. කොන්ත්‍රාත්කරුවන්ට කරන ලද මුළු ගෙවීම් සහ නව කොන්ත්‍රාත්වල කොන්ත්‍රාත් එකතුව එකතුකර මුළු වැඩ ගණනය කර ඇත. නමුත් මෙම ගණනය කිරීමේදී කොන්ත්‍රාත්කරුවන්ට කරන ලද ගෙවීම් තුළ අඩු කළ යුතු අයකර නොගන්නා ලද අත්තිකාරම් ගෙවීමක් ඇතුළත් වේ. නිවැරදි අතිරේක පිරවැය රු. මිලියන 108ක් වන අතර එවැනි වැඩිවීම් සියළුම මැනීම සහ ගෙවීම් වර්ගයේ කොන්ත්‍රාත්වල අපේක්ෂා කෙරේ. ලංසු ලියවිල්ලේ වර්තමාන වගන්තිය අනුව නතර කල දින සිට වසර 05ක් සඳහා කිසිදු කොන්ත්‍රාත්තුවක් | සංශෝධනය කරන ලද වගන්ති භාවිතා කරනු ලැබේ. |

| | | | | |
|---|---|---|---|---|
| | | | කොන්ත්‍රාත්කරුවන්ට ප්‍රධානය කරනු නොලැබේ. | |
| (උ) | සමාලෝචිත වර්ෂය අවසාන වන විට පවා අතහැර දමා ඇති කොන්ත්‍රාත් පැකේජ 12 කට අදාළව රු. මිලියන 2,668.47 ක වටිනාකමකින් යුත් කාර්යසාධන බැඳුම්කර මුදල් කර ගැනීමට වැඩසටහන විසින් පියවර ගෙන නොතිබුණි. | හිඟ මුදල් අය කර ගැනීමට වැඩසටහන විසින් වහාම පියවර ගත යුතුය. | වාරණ නියෝගය ඉවත්කර බැඳුම්කර මුදල් කර ගැනීමේ නීතිමය කටයුතු සිදුකරමින් පවතී. | වාණිජ මහාධිකරණය මඟින් එක කොන්ත්‍රාත්තුවක් සඳහා වාරණ නියෝගය ඉවත් කර ඇත. මුදල් කර ගැනීමේ ලිපිය ලංකා බැංකුව වෙත ඉදිරිපත් කර ඇත. කෙසේ වෙතත්, කොන්ත්‍රාත්කරු අභියාචනයක් ඉදිරිපත්කර ඇති අතර තත්ත්වය පරීක්ෂා කිරීමට නියෝග කර ඇත. |
| (ඌ) | අවසන් කරන ලද කොන්ත්‍රාත් වලට අදාළ වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් අයකර ණය දෙන ආයතනයට මුදල් ආපසු ලබා දෙන ලෙස ණය දෙන ආයතනය උපදෙස් දී තිබුණද, අහෝසි කරන ලද කොන්ත්‍රාත් පැකේජ 8 කට අදාළව 2018, | හිඟ මුදල් අය කර ගැනීමට වැඩසටහන විසින් වහාම පියවර ගත යුතුය. | වාරණ නියෝගය ඉවත්කර බැඳුම්කර මුදල් කර ගැනීමේ නීතිමය කටයුතු සිදුකරමින් පවතී. | වාණිජ මහාධිකරණය මඟින් එක කොන්ත්‍රාත්තුවක් සඳහා වාරණ නියෝගය ඉවත් කර ඇත. මුදල් කර ගැනීමේ ලිපිය ලංකා බැංකුව වෙත ඉදිරිපත් කර ඇත. කෙසේ වෙතත්, කොන්ත්‍රාත්කරු |

| | | | | |
|---|---|---|---|---|
| | 2019 සහ 2020 වර්ෂ සඳහා අයකරගත යුතු වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් මුදල වූ රු. මිලියන 1,830 ක් අය කර ගැනීමට ව්‍යාපෘතිය අසමත් වී තිබුණි. ඒ අනුව, අතහැර දැමූ පැකේජ 04 ක් ඇතුළුව පැකේජ 12 කට අදාළව 2020 දෙසැම්බර් 31 දින වන විට අයකර නොගත් වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් මුළු එකතුව රු. මිලියන 2,793 ක් විය. | | | අභියාචනයක් ඉදිරිපත්කර ඇති අතර තත්ත්වය පරීක්ෂා කිරීමට නියෝග කර ඇත. |
| (එ) | 2019 වර්ෂයේ වයඹ පළාතේ අතහැර දැමූ කොන්ත්‍රාත් පැකේජ 05 කට අදාළ මාර්ග, ධාවනය කළහැකි තත්ත්වයට පත්කර ගැනීම සඳහා සිදුකළ යුතු හදිසි වැඩ කටයුතු අවසන් කිරීමට වෙනත් ක්‍රියාකාරී කොන්ත්‍රාත්කරුවන් දෙදෙනෙකුට 2020 දෙසැම්බර් 31 දක්වා රු. මිලියන 158.2 ක් වැය කර තිබුණි. | දැරූ අමතර වියදම් අදාළ කොන්ත්‍රාත්කරුවන්ගෙන් අය කර ගැනීමට අවශ්‍ය පියවර ගත යුතුය. | කාර්යසාධන සුරක්ෂණ මඟින් සේවාදායකයාගේ හිමිකම්පෑම් යටතේ මෙම මුදල අයකර ගනු ලැබේ. කෙසේ වෙතත් කොන්ත්‍රාත්කරු වාරණ නියෝගයක් ලබා ගෙන ඇත. වාරණ නියෝගය ඉවත්කර බැඳුම්කර මුදල් කර ගැනීමේ නීතිමය කටයුතු සිදුකරමින් පවතී. | නීතිමය කටයුතු සිදුකරමින් පවතී. |

| | | | | |
|---|---|---|---|---|
| (ඒ) | කළුතර දිස්ත්‍රික්කයේ කේඑල් 2 සහ කේඑල් 3 කොන්ත්‍රාත් පැකේජ සම්පූර්ණ කර ඇත්තේ සියයට 35.15 ක් සහ සියයට 51.83 ක් පමණක් වන අතර ඒවා 2019 වර්ෂයේදී අතහැර දමා තිබුණි. තවද, පාර දෙපස (Shoulders) සහ වෙනත් ව්‍යුහයාත්මක ඉදිකිරීම් සිදුකිරීමෙන් තොරව, පාරේ තැන් කිහිපයක තාර (Asphalt) දමා ඇති අතර එම පැකේජ දෙක සඳහා පිළිවෙලින් රු. මිලියන 772.84 ක් සහ රු. මිලියන 747.47 ක් ගෙවා තිබුණි. | එම කාර්යය තවදුරටත් ප්‍රමාදයකින් තොරව අවසන් කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. | කේඑල් 3 කොන්ත්‍රාත්තුවේ ඉතිරි වැඩ නිම කිරීමට නව කොන්ත්‍රාත් 03ක් පිරිනමා ඇත. කේඑල් 2හි කොන්ත්‍රාත්කරු නැවත ලංසු කැඳවීම සඳහා වාරණ නියෝගයක් ලබා ගෙන ඇත. | කේඑල් 3 හි ඉදිකිරීම් කටයුතු සිදු කරමින් පවතී. කේඑල් 2 සඳහා නීතිමය කටයුතු සිදුකරමින් පවතී. |
| (ඔ) | අක්කර 500 සිට දිවෙන සාගර පලන්සූරිය පාරේ (අයිඩී 30) 3+700 ස්ථානයේ පිහිටා තිබුණු බෝක්කුව නව බෝක්කුවක් ඉදිකිරීම සඳහා කඩා දමා තිබුණද, කේඑල් 03 කොන්ත්‍රාත් පැකේජය අතහැර දැමීම හේතුවෙන් එය පරීක්ෂණ දිනය වූ 2021 මාර්තු 10 දින වන | එම කාර්යය තවදුරටත් ප්‍රමාදයකින් තොරව අවසන් කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය | ඉතිරි වැඩ නිමකිරීමට කොන්ත්‍රාත්තුව ප්‍රදානය කර ඇත. | කටයුතු සිදුකරමින් පවතී. |

| | | | | |
|---|---|---|---|---|
| | විටත් ආරම්භ කර නොතිබුණි. මාර්ගය භාවිතා කරන්නන් අපහසුතාවයට පත්ව ඇති අතර මාර්ගය සම්බන්ධ කිරීම සඳහා මාර්ගය පසෙක පිහිටි පෞද්ගලික ඉඩමක් භාවිතා කිරීමෙන් තාවකාලික විසඳුමක් ලබා ගැනීමට සිදුව තිබුණු බව නිරීක්ෂණය විය. | | | |
| (ඕ) | ඒබීසී මිශ්‍රණ තට්ටුව ඇතිරීමෙන් පසු සමහර මාර්ග ප්‍රතිසංස්කරණය කිරීම අතහැර දමා තිබුණු බව නිරීක්ෂණය විය. | එම කාර්යය තවදුරටත් ප්‍රමාදයකින් තොරව අවසන් කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. | නීතිමය කටයුතු සිදුකරමින් පවතී. | නිවැරදි කර නොමැත. |
| (ඖ) | මන්දගාමී ප්‍රගතිය සහ සමහර කොන්ත්‍රාත් නැවැත්වීම හේතුවෙන් ණය මුදලින් භාවිතයට නොගත් අරමුදල් මත ණය දෙන ආයතනයට 2020 දෙසැම්බර් 31 දිනට රු. මිලියන 1,471.26 ක සමුච්චිත මුදලක් කැපකරු ගාස්තු ලෙස අනාර්ථිකව ගෙවා තිබුණි. | අනවශ්‍ය පිරිවැය අවම කිරීමට කටයුතු කළ යුතුයි. | (අයි-මාර්ග) වැඩසටහනේ ණය ගිවිසුමේ 2.03 වගන්තිය අනුව, ණය ගන්නා 0.15% ක බැදීම් ගාස්තුවක් වාර්ෂිකව ගෙවනු ලැබේ. එම ගාස්තුවමෙම ණය ගිවිසුමේ දිනෙන් දින 60කට පසු මුළු ණය මුදල මත (කලින් කලට ලබාගන්නා | නිවැරදි කර නොමැත. |

| | | | | |
|---|---|---|---|---|
| | | | මුදල අඩුකර) අයකිරීම් ආරම්භ කෙරේ. | |
| (ක) | වැඩසටහනේ පළමු සංරචකය අනුව සියලුම කාළගුණ තත්ත්වයන්ට ගැලපෙන ලෙස ග්‍රාමීය ප්‍රවේශ මාර්ග පුනරුත්තාපනය කළ යුතු අතර වර්ෂ 03ක කාලයක් නඩත්තු කළ යුතුය. කෙසේවෙතත්, කාපට් කරන ලද මතුපිට ඉරිතැලීම්, සෝදාපාලුවීම් සහ පැකේජ කේයූ 04 යටතේ කුරුණෑගල දිස්ත්‍රික්කයේ කාසිකෝට්ටේ හන්දියේ සිට පීල්ල හරහා මීඔය දක්වා සහ නෙලුම්පාටු වැව සිට උඩුදිවුල්වැව මාර්ගයේ සමහර ස්ථාන තරමක් යටවන බව 2019 නොවැම්බර් 27 දින කරන ලද භෞතික පරික්ෂාවේදී නිරීක්ෂණය විය. පසුව එම මාර්ග මැතකදී සිදු වූ ගංවතුරෙන් සම්පූර්ණයෙන්ම විනාශ වී තිබුණි. එම නිසා, වැඩසටහන | ඉදිකිරීම් ගැටළු නිවැරදි කිරීමට අවශ්‍ය පියවර ගත යුතු අතර මාර්ගවල තත්ත්වය සහතික විය යුතුය. | අත්තිකාරම සහ කාර්යසාධන සුරක්ෂණ මුදල් කර ගැනීමට නීතිමය ක්‍රියාමාර්ග ගනිමින් පවතී. කොන්ත්‍රාත් කොන්දේසි අනුව එවැනි සියළුම අමතර පිරිවැය කාර්යසාධන සුරක්ෂණ මුදල් කර ගැනීමෙන් අයකර ගනු ලැබේ. | නීතිමය ක්‍රියාමාර්ග සිදු කරමින් පවතී. |

| | | | | |
|---|---|---|---|---|
| | මඟින් සංරචකයේ අරමුණු පූර්ණය කර නොතිබුණු බව අනාවරණය විය. | | | |
| (ග) | 1981 අංක 03 දරණ පොදු කොන්ත්‍රාත් පනත අනුව දේශීය නියෝජිතයකු සමඟ සම්බන්ධ වී ක්‍රියාත්මක කරන විදේශීය කොන්ත්‍රාත්කරුවෙකු පොදු කොන්ත්‍රාත් රෙජිස්ට්‍රාර් වෙත ලියාපදිංචි විය යුතුය. කෙසේවෙතත්,දේශීය කොන්ත්‍රාත්කරුවන් සමඟසම්බන්ධ වී වයඹ පළාතේ සහ කළුතර දිස්ත්‍රික්කයේ මාර්ග පුනරුත්ථාපන කටයුතුවල සම්බන්ධ වී සිටින චීන සහ ඉන්දියාවේ කොන්ත්‍රාත් ආයතන 02ක ලියාපදිංචිය තහවුරු කර ගැනීමට මාර්ග සංවර්ධන අධිකාරිය පියවර ගෙන නොතිබුණි. කෙසේවෙතත්, වැඩසටහන ආරම්භක අදියරේදී කොන්ත්‍රාත්කරුගේ ධාරිතාවය නිසි පරිදි | වගකිව යුතු පාර්ශවයන් හඳුනාගැනීමට ව්‍යාපෘති කළමණාකරණ ඒකකය විසින් කඩිනම් පියවර ගැනීම අවශ්‍ය අතර චක්‍රලේඛයට උපදෙස් මගහැරීම පිළිබඳ පියවර ගත යුතුය. | ණය ගිවිසුමේ දෙපාර්ශවය විසින් එකඟ වූ පරිදි ADB ප්‍රසම්පාදන මාරගෝපදේශ අනුව ප්‍රසම්පාදන සිදු කරනු ලැබේ. අවශ්‍ය මූල්‍ය සහ තාක්ෂණික ධාරිතාවයක් ලබාගෙන නොමැති දේශීය කොන්ත්‍රාත්කරුවන් පැමිණීම වැළැක්වීමට ලංසු ලියවිලිවලට නව වගන්ති එකතු කර ඇත. | 2021 දී ප්‍රදානය කරන ලද RMG කොන්ත්‍රාත් සඳහා දුර්වල කාර්යසාධනයක් සහිත කොන්ත්‍රාත්කරුවන් තෝරාගෙන නොමැත. |

ඇගයීම් නොකිරීම හේතුවෙන් කුරුණෑගල දිස්ත්‍රික්කයේ පැකේජ කේයු 3 සහ කේයු 5 යටතේ අදාළ කොන්ත්‍රාත් පසුව නවතා තිබුණි.

**3.16 දෙවන ඒකාබද්ධ මාර්ග ආයෝජන වැඩසටහනේ (අයි-මාර්ග-II)-**

(i) දෙවන ඒකාබද්ධ මාර්ග ආයෝජන වැඩසටහනග්‍රාමීය ප්‍රජාව සහ සමාජ ආර්ථික මධ්‍යස්ථාන අතර මාර්ග ප්‍රවේශතාවය වැඩිදියුණු කිරීම සඳහා ක්‍රියාත්මක වේ.. මෙහි දිගුකාලීන බලපෑම වන්නේ ජාතික හා පළාත් මාර්ගවල ප්‍රවාහන කාර්යක්ෂමතාවය වැඩිදියුණු කිරීම වේ.

(ii) වැඩසටහනේ ඇස්තමේන්තුගත පිරිවැය රු.මිලියන 165,185 කට සමාන එ.ජ.ඩො. මිලියන 1,084.60ක් වන අතර ඉන් රු. මිලියන 137,070කට සමාන එ.ජ.ඩො. මිලියන 900 ක් මූල්‍යනය කිරීමට ආසියානු සංවර්ධන බැංකුව එකඟවී තිබුණි.

(iii) වැඩසටහන එහි කටයුතු 2018 ජූලි 20 දින ආරම්භ කරන ලද අතර 2027 මාර්තු 31 දින වන විට නිමකිරීමට නියමිතය.

(v) විගණකාධිපති විසින් ව්‍යාපෘතිය සම්බන්ධයෙන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන මත 2018 වර්ෂය සඳහා තත්ත්වාගණනය කළ මතයක් සහ 2019 සහ 2020 වර්ෂය සඳහා තත්ත්වාගණනය නොකළ මතයක් ප්‍රකාශ කර තිබුණි. කෙසේවෙතත්, මේ වනතෙක් නිරවුල් නොකරන ලද ව්‍යාපෘතියේ කාර්යසාධනය සම්බන්ධ ගැටළු කිහිපයක් පහත දැක්වේ.

| | විගණන නිරීක්ෂණ | විගණකාධිපතිගේ නිර්දේශ | ව්‍යාපෘතිය විසින් ගන්නා ලද වළක්වාලීමේ පියවර | වර්තමාන තත්ත්වය |
|---|---|---|---|---|
| (අ) | කොන්ත්‍රාත්තුවේ විශේෂ කොන්දේසිවල 14.6 උප වගන්තිය අනුව, කොන්ත්‍රාත්කරු | පිරිවැය, කාලය සහ කොන්ත්‍රාත්කරුවන් සඳහා වන අනවශ්‍ය වාසි අවම කිරීම සඳහා | හේතු දක්වමින් කොන්ත්‍රාත්කරු කරන ඉල්ලීම් වලට වඩා අඩු වටිනාකමකට ගෙවීම් | වෙනස් කරන ලද වගන්ති භාවිතා කරනු ලැබේ. |

| | | | | |
|---|---|---|---|---|
| | විසින් ඉදිරිපත් කළ යුතු අතුරු ගෙවීම් සහතිකයක අවම වටිනාකම පිළිගත් කොන්ත්‍රාත් වටිනාකමින් සියයට 1.5 කි. කෙසේ වෙතත්, පිළිවෙලින් 2019 සහ 2020 වර්ෂ තුළදී අවශ්‍ය සීමාවට වඩා අඩු අතුරු ගෙවීම් සහතික ඇගයීමේ අවස්ථා 130 සහ 259 ක් පැකේජ කිහිපයක් යටතේ ඉදිරිපත් කර තිබුණු බව නිරීක්ෂණය විය. | කොන්ත්‍රාත්තුවේ කොන්දේසිවල දක්වා ඇති සීමාවන්ට අනුගතවීම අවශ්‍ය වේ. | සහතික කිරීමට ඉංජිනේරුට ඉඩ දෙමින් කොන්ත්‍රාත් කොන්දේසි වෙනස් කර ඇත. මෙම ගෙවීම් කොවිඩ් - 19 තත්ත්වය සහ අමුද්‍රව්‍ය හිඟකමේ ප්‍රතිඵලයක් ලෙස ඇති වූ අමතර පිරිවැය කොන්ත්‍රාත්කරුට කළමනාකරණය කර ගැනීමට සහයක් වේ. | |
| (ආ) | කොන්ත්‍රාත්තුවේ සාමාන්‍යය කොන්දේසි වල 4.2 උප වගන්තිය අනුව, කොන්ත්‍රාත්කරුවන් විසින් කාර්ය සාධන සුරක්ෂණ ඔවුන්ගේ වියදමින් ලබා දිය යුතු වුවද, 2020 දෙසැම්බර් 31 දින වන විට කාර්ය සාධන සුරක්ෂණවල පිරිවැය ආපසු ගෙවීම සඳහා ඌව පළාතේ කොන්ත්‍රාත්කරුවන්ට රු. මිලියන 85.64ක මුදලක් ගෙවා තිබුණි. | ලංසු ලියකියවිලි නිකුත් කිරීමට පෙර ප්‍රසම්පාදන විශේෂඥ සහ තාක්‍ෂණික ඇගයීම් කමිටුව විසින් ප්‍රමාණ පත්‍ර සමාලෝචනය කළ යුතුය. | ප්‍රමාණ පත්‍රයේ ගෙවීම් අයිතම ඉවත් කර ඇත. | කොන්ත්‍රාත්කරු කාර්යසාධන සුරක්ෂණ ඔහුගේ වියදමින් ඉදිරිපත් කර ඇත. |

| | | | | |
|---|---|---|---|---|
| (ඇ) | කොන්ත්‍රාත්තුවේ විශේෂ කොන්දේසිවල 119.1 (1), (2) සහ (3) උප වගන්ති අනුව 2020 දෙසැම්බර් 31 දිනට කොන්ත්‍රාත්කරුවන් විසින් බීටී 02 සහ බීටී 03 පැකේජ වල වැඩ, උපකරණ, තෙවන පාර්ශවයන් සහ දේපල, කම්කරුවන්ගේ වන්දි සහ වෘත්තීය වන්දි රක්‍ෂණය කර නොතිබුණි. | කොන්ත්‍රාත් පිරිවිතරයන්හි දක්වා ඇති පරිදි කොන්ත්‍රාත්කරුවන්ගෙන් අවශ්‍ය රක්‍ෂණ ලබා ගැනීමට පියවර ගත යුතුය. | කොන්ත්‍රාත්කරු විසින් අවශ්‍ය රක්ෂනාවරණ ඉදිරිපත් කර ඇත. | රක්ෂනාවරණ බලාත්මක වේ. |
| (ඈ) | 2017 මාර්තු 15 දිනැති ප්‍රසම්පාදන අත්පොතෙහි 4.2.3 වගන්තිය සඳහා වූ 31 වන අතිරේකය අනුව ජාතික සහ ජාත්‍යන්තර මිල කැඳවීමේදී ප්‍රසම්පාදන ක්‍රියාවන් සඳහා උපරිම කාලසීමාව සති 15 ක් වුවද, උතුරු, නැගෙනහිර සහ ඌව පළාත්වල සිවිල් වැඩ ප්‍රසම්පාදනයන් සඳහා වූ සම්මත කාල සීමාව සති 25 සිට සති 38 දක්වා වූ කාලයකින් | ප්‍රසම්පාදන කටයුතු නියමිත කාල සීමාව තුළ අවසන් කළ යුතුය. | ප්‍රසම්පාදන කටයුතු එවැනි ප්‍රමාදයක අත්දැකීමකින් තොරව වර්තමානයේ සිදුකරනු ලැබේ.වාර්ෂික මූල්‍ය අවශ්‍යතාවය සැලකීමකින් තොරව මා. සං. අධි. ට I-Road කොන්ත්‍රාත් පිරිනැමීමට ඉඩදෙමින් මුල් අයවැය ඇස්තමේන්තුවේ ප්‍රතිපාදන ඉක්මවා මෑත වර්ෂවල ශ්‍රී ලංකා රජය අයවැය ප්‍රතිපාදනය ඉහළ දමා තිබේ. | වර්තමානයේ ප්‍රසම්පාදන කටයුතු සැලසුම් කරමින් පවතී. 2021 වියපැහැදම් රු. බිලියන 10ක් වූ අතර එය මුල් අයවැය ප්‍රතිපාදන ඉක්මවා ඇත. |

ඉක්මවා ගොස් තිබුණි.

| | | | |
|---|---|---|---|
| (ඉ) | 2014 අංක 33 දරණ ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන පනත අනුව, ශ්‍රී ලංකාවේ හඳුනාගත් ඕනෑම ඉදිකිරීම් කටයුත්තක නියැලීමට පෙර සෑම විදේශීය කොන්ත්‍රාත්කරුවෙකුම ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරියේ (CIDA) කොන්ත්‍රාත්කරුවෙකු වශයෙන් තාවකාලික ලියාපදිංචියක් ලබා ගත යුතුය. කෙසේවෙතත්, කොන්ත්‍රාත්කරුවන් 09 දෙනෙකුට අදාළ කොන්ත්‍රාත් ලබා දීමට පෙර වැඩසටහන විසින් සීඅයිඩීඒ ලියාපදිංචිවීමේ අවශ්‍යතාවය සලකා නොතිබුණු බව නිරීක්ෂණය විය. | කොන්ත්‍රාත්කරුවන් තෝරා ගැනීමට පෙර කොන්ත්‍රාත්කරුවන් ප්‍රමිතිකරණය කළ යුතුය. | ණය ගිවිසුමේ - දෙපාර්ෂවය විසින් එකඟ වූ පරිදි ADB ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අනුව ප්‍රසම්පාදනය සිදු කරමින් පවතී. |
| (ඊ) | රු. මිලියන 5 ට වැඩි වටිනාකමක් ඇති පොදු කොන්ත්‍රාත් වල ලංසුකරුවන් ලංසු තැබීමේ ලියකියවිලි ලබාගැනීමට පෙර පොදු කොන්ත්‍රාත් | ලංසුකරුවන් සහ ප්‍රදානය කරන ලද කොන්ත්‍රාත්, පොදු කොන්ත්‍රාත් පනත යටතේ ලියාපදිංචි කළ යුතුය. | ණය ගිවිසුමේ - දෙපාර්ෂවය විසින් එකඟ වූ පරිදි ADB ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අනුව ප්‍රසම්පාදනය සිදු කරමින් පවතී |

| | | | | |
|---|---|---|---|---|
| | පනත යටතේ ලියාපදිංචි විය යුතු අතර 1987 අංක 3 දරන පොදු කොන්ත්‍රාත් පනත අනුව කොන්ත්‍රාත්තුව පිරිනැමීමෙන් පසු කොන්ත්‍රාත් ලියාපදිංචිය ලබා ගත යුතුය. අදාළ ලංසුකරුවන්ගේ තාක්‍ෂණික ලංසු ඇගයීමේදී එම අවශ්‍යතාව ව්‍යාපෘතිය විසින් සලකා නොතිබුණු බව නිරීක්ෂණය විය. | | | |
| (උ) | මූලික සැලැස්ම අනුව, ව්‍යාපෘතිය විසින් පැකේජ 53 ක් යටතේ උතුර, නැගෙනහිර, ඌව සහ බස්නාහිර පළාත්වල ජාතික මාර්ග 27 ක කි.මී. 340 ක සහ ග්‍රාමීය මාර්ග 1405 ක කි.මී. 3400 ක මාර්ග ප්‍රතිසංස්කරණ කටයුතු සිදු කිරීමට බලාපොරොත්තු වූවත්, 2020 දෙසැම්බර් 31 දිනට ජාතික මාර්ග 27 ක කි.මී. 319.96 ක සහ ග්‍රාමීය මාර්ග 1349 ක | ව්‍යාපෘතියේ මූලික සැලැස්මට අනුකූලව සහ කාල සීමාව තුළදී ඉලක්කය සපුරා ගැනීමට අවශ්‍ය පියවර ගත යුතුය. | නැවත ලංසු කැඳවිය යුතු කොන්ත්‍රාත් 02ක් (කි. මී. 43.6) හැර සියළුම ග්‍රාමීය මාර්ග පිරිනමා ඇත. එදිනට බස්නාහිර පළාතේ අලුතින් යෝජනා කරන ලද ජාතික මාර්ග කි. මී. 73 න් කි. මී. 44 ක් පිරිනමා තිබුණි. අයි-මාර්ග වැඩසටහනේ ණය කාලය 2017 සිට 2027 දක්වා වර්ෂ10කි. එම නිසා, ව්‍යාපෘතියේ විෂය පථය 2020 දෙසැම්බර් 31 දිනට | ඉතිරි මාර්ගවල කොන්ත්‍රාත් පිරිනැමීමට පියවර ගනු ලැබේ. |

| | | | | |
|---|---|---|---|---|
| | කි.මී. 3313.16 ක ප්‍රතිසංස්කරණ කටයුතු පමණක් ප්‍රදානය කර තිබුණි. | | නොව 2027 නිම කළ යුතුවේ. ඉහත ඉලක්කය අනුව ප්‍රගතිය අත්කරගෙන ඇත. | |
| (එ) | 2020 දෙසැම්බර් 31 දිනට සමස්ථ දිග කි.මී. 25.05 කින් සමන්විත ග්‍රාමීය මාර්ග 13 ක් පමණක් නිම කර තිබුණු අතර මාර්ග සංවර්ධන අධිකාරියට භාරදී තිබුණි. තවද, පුනරුත්ථාපන කටයුතු සිදු කෙරෙමින් පවතින ඉතිරි මාර්ග අතරින්, 2020 දෙසැම්බර් 31 දින වන විට ජාතික මාර්ග කි.මී 39.97 ක් සහ ග්‍රාමීය මාර්ග කි.මී 731.62 ක් පමණක් නිම කර තිබුණි. මේ අනුව, එය පිරිනමන ලද ජාතික හා ග්‍රාමීය මාර්ග දිගින් සියයට 21.93 ක් පමණක් නියෝජනය විය. | වැඩසටහනේ අපේක්ෂිත ඉලක්ක සපුරා ගැනීම සඳහා සෑම උත්සාහයක්ම ගත යුතුය. | ඉදිකිරීම් කටයුතු සිදුකරමින් පවතින අතර කොවිඩ්-19 සහ අමුද්‍රව්‍ය හිඟකම වැනි අපේක්ෂා නොකරන ගැටළුවල බලපෑම අවම කර ගැනීමට කල් තබා පියවර ගනු ලැබේ. | 2021 දෙසැම්බර් 31 දිනට ග්‍රාමීය සහ ජාතික මාර්ග කිලෝමීටර් 2,000 කටයුතු නිමකර ඇත. |
| (ඔ) | කොන්ත්‍රාත් පැකේජ ප්‍රදානය කළ වහාම කොන්ත්‍රාත්කරුවන් විසින් සිවිල් වැඩ ආරම්භ කළ යුතු වුවත්, කොන්ත්‍රාත් පැකේජ | කොන්ත්‍රාත් පිරිනැමූ වහාම සිවිල් කටයුතු ආරම්භ කිරීමට කටයුතු කළ යුතුය. | වර්තමාන භාවිත කරන ලියවිලිවල කොන්ත්‍රාත් කොන්දේසි ප්‍රතිග්‍රහණ ලිපිය ලැබීමේ දින සිට දින 28 තුළ ආරම්භක දිනය දැමීමට | ගැටලු නිරාකරණය කරගැනීමට කොන්ත්‍රාත් ලියවිලි වෙනස් කර ඇත. |

| | | | | |
|---|---|---|---|---|
| | 37 ක සිවිල් වැඩ ආරම්භ කිරීමට දින 30 සිට දින 203 දක්වා වූ කාලයක් ප්‍රමාද වී තිබුණි. එසේ ප්‍රමාද වීමට හේතු විගණනයේදී අනාවරණය නොවුණි. | | සංශෝධනය කර ඇත. | |
| (ඕ) | ව්‍යාපෘතියේ ප්‍රසම්පාදන සැලැස්ම සහ වැඩ සටහන් ක්‍රියාත්මක කිරීමේ සැලැස්ම අනුව, ඇස්තමේන්තුගත පිරිවැය එ.ජ.ඩො. 2,230,000 ක උපකරණ ප්‍රසම්පාදන 06 ක ලංසු දැන්වීම් පළකිරීමට සැලසුම් කර තිබුණද, එම මිලදී ගැනීම් කිසිවක් 2020 දෙසැම්බර් 31 දින වන විටත් අවසන් කර නොතිබුණි. | වැඩසටහනේ නිසි ක්‍රියාකාරීත්වය සඳහා අවශ්‍ය උපකරණ නියමිත වේලාවට මිලදී ගත යුතුය. | උපකරණ ප්‍රසම්පාදනය ආරම්භ කර ඇත. | - |
| (ඖ) | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයට අනුව ප්‍රසම්පාදන කමිටුව සහ තාක්ෂණික ඇගයීම් කමිටුව විසින් ඉංජිනේරු ඇස්තමේන්තුව, ලංසු ලේඛන සහ ප්‍රමාණ | පාඩුව අය කර ගැනීම සඳහා වැඩසටහන විසින් වහාම පියවර ගත යුතුය. | ADB ලංසු ඇගයීම් නිර්ණායක අනුව, ඒවායේ මිල ඉහළ වුවත්, තනි අයිතමයන්වල මිල සාකච්ඡා කිරීමට අවස්ථා නොමැත. ADB මුළු ලංසු මිල පමණක් සාකච්ඡා | එය ප්‍රායෝගික නොවුනද තනි අයිතමයන්වල මිල සාකච්ඡා කිරීමට ඉඩදීමට ලංසු ඇඟයීමේ මාර්ගෝපදේශ වෙනස් කිරීමට ADBන් |

| | | | | |
|---|---|---|---|---|
| | පත්‍ර නිසි ලෙස ඇගයීම සිදුකළ යුතු වුවත්, ඉංජිනේරු ඇස්තමේන්තුව, ලංසු ලේඛන සහ ප්‍රමාණ පත්‍රවල වැරදි අර්ථකථනයන් සිදුකිරීම සහ අනුපාත විෂමතා හේතුවෙන්, බීජ් 4 සහ බීජ් 5 කොන්ත්‍රාත් පැකේජවලට අදාළව 2020 දෙසැම්බර් 31 දින වන විට ව්‍යාපෘතියට රු. මිලියන 48.2 ක පාඩුවක් දැරීමට සිදුව තිබුණි. | | කිරීමට ඉඩ ලබා දේ. කෙසේවෙතත්, ඉදිරි කොන්ත්‍රාත්වල BOQ වල එවැනි අයිතමයන් යොදා නොගැනීමට පියවර ගනු ලැබේ. | ඉල්ලීමක් කරනු ලැබේ. |
| (ක) | ජ්එම් 01, ජ්එම් 02 සහ ජ්එම් 03 පැකේජ වලට අදාළ ඉංජිනේරු ඇස්තමේන්තුව සහ ප්‍රමාණ පත්‍ර අතර මූලික අයිතම් කිහිපයක රේටයන්ගේ විෂමතාවයන් කිහිපයක් නිරීක්ෂණය විය. එම පැකේජ 03 ට අදාළව එකතු වටිනාකම රු. මිලියන 1,035 ක් වූ සියයට 50 ඉක්මවූ විචලනයන් නිරීක්ෂණය විය. | ඉංජිනේරු ඇස්තමේන්තු යථාර්ථවාදී ලෙස සකස් කිරීමට කටයුතු කළ යුතුය. | විවිධ කොන්ත්‍රාත්කරුවන් විසින් ඉදිරිපත් කරන මිල ඒ ක්ෂේත්‍රය පිළිබඳ ඇති සම්බන්ධතාව සහ කොන්ත්‍රාත්තුව සඳහා අවශ්‍ය ඉදිකිරීම් සම්පත් සැපයීමට ඔවුන්ට ඇති හැකියාව මත රදා පවතී. තවද, එක දිස්ත්‍රික්කයක විශාල ප්‍රමාණයේ කොන්ත්‍රාත් ප්‍රදානයේදී ඉල්ලුමේ ක්ෂණික වැඩිවීම සමඟ එම දිස්ත්‍රික්කයේ පස් සහ ශ්‍රමයේ මිල වැඩි වී | අනපේක්ෂිත අවධානම් සැළකිල්ලට ගනිමින් යථාර්ථවාදි ඉංජිනේරු ඇස්තමේන්තුවක් පිළියෙල කිරීම සඳහා ක්‍රමයක් සංවර්ධනය කිරීමට යෝජනා කර ඇත. |

| | | | | |
|---|---|---|---|---|
| | | | ඇත. පළපුරුද්දක් සහිත කොන්ත්‍රාත්කරුවන් සමාන්‍යයෙන් මෙම අවධානය ඇගයීම් කර ඔවුන්ගේ ලංසු වල යෝග්‍ය මිල ගණන් ඇතුළත් කරනු ලැබෙන අතර මෙම මිලගණන් HSR පිළිවලට වචන වැඩිවීමට ඉඩ ඇත. එම නිසා, ඇතිවිය හැකි සියළුම අවධානම් සැළකිල්ලට ගනිමින් වඩා යථාර්ථවාදි ඉංජිනේරු ඇස්තමේන්තුවක් පිළියෙල කිරීමට යෝග්‍ය ක්‍රමයක් සංවර්ධනය කිරීම අවශ්‍ය වේ | |
| (ග) | කොන්ත්‍රාත් කොන්දේසිවලට අනුව වැඩසටහන අවසානයේ සියළුම රසායනාගාර, ගෘහ භාණ්ඩ සහ මිනුම් උපකරණ කොන්ත්‍රාත්කරු වෙතම ආපසු ලබා දෙනු ලැබුවද, රසායනාගාර, ගෘහ | සාමාන්‍යයෙන්, අදාළ වත්කම් සේවායෝජකයා විසින් රඳවා ගනු ඇත. එබැවින්, ආධාර යටතේ අරමුදල් සපයන අනෙකුත් ව්‍යාපෘති මඟින් පිරිනමන කොන්ත්‍රාත් පැකේජවල පිරිවැය හා සැසඳීමේදී මෙම වැඩ සටහන යටතේ ඇති කොන්ත්‍රාත්වල පිරිවැය | කොන්ත්‍රාත් ලියවිලි අනුව ඉදිකිරීම් කාලය තුළ උපකරණ භාවිතයෙන් මෙම මිල ගණන් ඉදිරිපත් කිරීමට කොන්ත්‍රාත්කරුට සිදු වේ. RDA සතුව දනටමත් කටයුතු අවසන් I-Road සහ අනෙකුත් ව්‍යාපෘති වලින් ලැබුණු ඒ හා | ලී බඩු, මිනුම් සහ රසායනික උපකරණවල අවශ්‍යතාව පිළිබඳව මා.සං. අධි විස්තර PMU ලබා ගන්නා අතර අවශ්‍ය වේනම් ඒ අනුව කොන්දේසි වෙනස් කරනු |

| | | | | |
|---|---|---|---|---|
| | භාණ්ඩ සහ මිනුම් උපකරණ සඳහා එකවර සිදුකරණු ලබන ගෙවීමක් ලෙස පිළිවෙලින් රු. මිලියන 593 ක් සහ රු. මිලියන 16.23ක් 2020 දෙසැම්බර් 31 දින වන විට ගෙවා තිබුණි. මේ අනුව, අසාමාන්‍ය කොන්ත්‍රාත් කොන්දේසි කොන්ත්‍රාත්කරුවන්ට අනිසි ප්‍රතිලාභ ලබා දීමට හේතු විය හැකි බව එයින් දැක්වේ. | අඩු අගයක් ගතයුතු වනු ඇත. | සමාන උපකරණ ප්‍රමාණවත් තොග පවතින නිසා PMU මෙම කොන්දේසි කෙටුම්පත් කරන ලදි. මා.සං.අධි. ඉදිරියේදී කිසියම් ලී බඩු සහ රසායනනාගාර සහ මිනුම් උපකරණ අවශ්‍ය වේනම් මෙම කොන්දේසි එම කොන්දේසිවලට ගැලපෙන පරිදි වෙනස් කරනු ලැබේ. | ලැබේ. |
| (ච) | නැගෙනහිර පළාතේ 2020 දෙසැම්බර් 31 දිනට මාර්ග පුනරුත්පාදන ප්‍රගති වාර්තාවට ඇතුළත් කර ඇති මාර්ග 6 ක් පහසුකම් පරිපාලන අත්පොතට හෝ තෝරාගත් කොන්ත්‍රාත්කරුවන්ට ප්‍රදානය කළ අදාළ කොන්ත්‍රාත් පැකේජ යටතේ ඇතුළත් කර නොතිබුණි. එබැවින් අලුතින් එකතු කරන ලද මාර්ග සඳහා ව්‍යාපෘතිය මඟින් | විෂය පථය වෙනස් කළ යුත්තේ ණය දෙන ආයතනයේ සහ ජාතික සැලසුම් දෙපාර්තමේන්තුවේ එකඟතාවයෙන් පසුව පමණි. | ADB අනුමැතිය ලබාගැනීමට පියවර ගනු ලැබේ. | ADB අනුමැතිය ඉක්මනින් ලැබීමට ඉඩ ඇත. |

| | | | | |
|---|---|---|---|---|
| | ආ.ස.බැ. සහ ජාතික සැළසුම් දෙපාර්තමේන්තුවේ එකඟතාවය ලබාගෙන තිබේද යන්න විගණනයට තහවුරු නොවුණි. තවද, එම කොන්ත්‍රාත් ප්‍රදානය කිරීමේ ක්‍රමවේදය සහ විෂය පථය වෙනස් කිරීම සඳහා ණය දෙන ආයතනයේ අනුමැතිය ඉදිරිපත් කර නොතිබුණි. | | | |
| (ජ) | KL 06 යටතේ මාර්ග අංක 113 ඒ-බෝතලාව පාරේ (අතිරේක) මතුපිට තාර ස්ථරය ඇතිරීමට පෙර මාර්ගය දෙපස අත්‍යාවශ්‍ය ස්ථානවල පවා කාණු ඉදිකර නොතිබුණි. එම නිසා අනාගතයේදී යන්ත්‍රෝපකරණ භාවිතයෙන් කාණු සඳහා පස් කැණීමේදී තාර ස්ථරයට හානි වීමට එය හේතු විය හැකිය. ව්‍යාපෘතිය විසින් මාර්ගයේ 0+990 ස්ථානයේ බෝක්කුවක් ඉදිකිරීම සඳහා | ඉදිකිරීම් කටයුතු සම්මත පිරිවිතරයන්ට දැඩි ලෙස අනුකූල විය යුතුය. | ව්‍යාපෘති කළමනාකරණ ඒකකය සියලුම පළුදු වීම් සකස්කර ඇති බව සහ කොන්ත්‍රාත් පිරිවිතරයට අවසාන නිමවුම ගැලපෙන බව සහතික කිරීමට ඉංජිනේරුවරුන් වෙත උපදෙස් ලබා දී ඇත. | කොන්ත්‍රාත්කරු මා.සං.අධි කිසිදු අමතර පිරිවැයක් නොමැතිව පළුදු වීම් අළුත්වැඩියා කර ඇති අතර මාර්ග කොටස නිම කර ඇත. |

| | | | | |
|---|---|---|---|---|
| | සැලසුම් කර තිබුණද, හියුම් පයිප්පය ඇතුරු ප්‍රදේශය අවට කොන්ක්‍රීට් දැමීමෙන් තොරව තනි හියුම් පයිප්පයක් පමණක් අතුරා තිබුණි. තවද බෝක්කුවේ මතුපිට සහ බෝක්කුවේ දෙපස කොන්ක්‍රීට් කිරීමට ඉඩ නොතබා දැනටමත් තාර අතුරා ඇති බව නිරීක්ෂණය විය. | | | |
| (ට) | සමාලෝචිත වර්ෂය තුළදී ණය මුදලින් භාවිතයට නොගත් අරමුදල් මත ණය දෙන ආයතනයට රු. මිලියන 243.48ක කැපකරු ගාස්තු අනාර්ථික ලෙස ගෙවා තිබුණු අතර 2020 දෙසැම්බර් 31 දිනට සමුච්චිත කැපකරු ගාස්තුව රු. මිලියන 449.51 ක් විය. | අනවශ්‍ය පිරිවැය අවම කිරීමට කටයුතු කළ යුතුයි. | අයි- මාර්ග වැඩසටහනේ ණය ගිවිසුම අනුව ණය ගන්නා වාර්ෂිකව සියයට 0.15ක බැදීම් ගාස්තුවක් ගෙවනු ලැබේ. එම ගාස්තුවමෙම ණය ගිවිසුමේ දිනෙන් දින 60කට පසු මුළු ණය මුදල මත (කලින් කලට ලබාගන්නා මුදල අඩුකර) අයකිරීම් ආරම්භ කෙරේ. | 2021 වර්ෂය තුළදී ව්‍යාපෘතිය ඉහළ වියපැහැදමක් අත්කරගෙන ඇත. |
| (ඩ) | 2020 දෙසැම්බර් 31 දිනට ජ්‍යෙෂ්ඨ ඉංජිනේරු තනතුරු 6න් පුරප්පාඩු 5ක් සම්බන්ධීකරණ | වැඩසටහනේ කාර්යසාධනය උපරිම කිරීමට වැඩසටහන විසින් ප්‍රශස්ථ කාර්යමණ්ඩලයක් | මෙම පුරප්පාඩු ව්‍යාපෘතිය ආරම්භයේදී හදුනාගෙන ඇති අතර දැනටමත් බදවාගෙන ඇති කාර්යමණ්ඩලය | කාර්යමණ්ඩලයේ වැඩ ප්‍රමාණය අධීක්ෂණය කරන අතර පිරවිය යුතු |

| | | | | |
|---|---|---|---|---|
| | ඉංජිනේරු 14න් පුරප්පාඩු 10ක්, ඉංජිනේරු තනතුරු 28න් පුරප්පාඩු 08 සහ ව්‍යාපෘති ගණකාධිකාරි තනතුරු 04න් පුරප්පාඩු 02ක් පැවතුණි. | පවත්වා ගත යුතුය. | මගින් කිසියම් දෙන ලද කාලපරිච්ඡේදයක වැඩ ප්‍රමාණය කළමනාකරණය කර ගැනීමට නොහැකි නම් පමණක් පුරප්පාඩු පිරවිය යුතුය. කෙසේවෙතත්, ජ්‍යෙෂ්ඨ ඉංජිනේරුවන්, ව්‍යාපෘති ඉංජිනේරුවන් පත්කිරීමට පියවර ගනු ලැබේ. තවද, 2021දී ඉල්ලා අස්වෙන ලද කාර්යමණ්ඩලය පිරවීමට සහය කාර්යමණ්ඩලය බඳවා ගැනීමට අවශ්‍ය වේ. | පුරප්පාඩු හඳුනාගන්නා අතර කාර්යමණ්ඩලය බඳවා ගැනීම සිදුකරමින් පවතී. |
| (ණ) | ව්‍යාපෘති පහසුකම් පරිපාලන අත්පොත සහ 2019 මාර්තු 05 දිනැති අංක. 01/2019 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛයේ 9 වන වගන්තියට අනුව, ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ කටයුතු පාලනය කිරීම, අධීක්ෂණය කිරීම සහ සම්බන්ධීකරණය කිරීම සඳහා සෑම පළාතකම පළාත් සම්බන්ධීකරණ කමිටු සහ ව්‍යාපෘති මෙහෙයුම් කමිටු | සියලුම මෙහෙයුම් කමිටු නියමිත පරිදි ක්‍රියාත්මක කළ යුතුය. | මහාමාර්ග අමාත්‍යාංශය, මාර්ග සංවර්ධන අධිකාරිය සහ කොන්ත්‍රාත්කරුවන්ගේ කාර්ය මණ්ඩලයේ සහභාගීත්වයෙන් මාගේ සභාපතීත්වයෙන් 2021 දෙසැම්බර් 26 දින මාර්ගගත ක්‍රමයට ව්‍යාපෘති මෙහෙයුම් කමිටු රැස්වීම් පවත්වා තිබුණි. සේවාදායකයාගේ, ඉංජිනේරුවන්ගේ සහ කොන්ත්‍රාත්කරුවන්ගේ කාර්ය මණ්ඩලය සමග | සාමාන්‍ය රැස්වීම්වලට අමතරව අවශ්‍ය වූ විට විශේෂ සහ හදිසි රැස්වීම් පවත්වනු ලැබේ. |

| | | |
|---|---|---|
| රැස්වීම් අවම වශයෙන් කාර්තුමය වශයෙන් පැවැත්විය යුතුය. කෙසේ වෙතත්, කමිටු රැස්වීම් දෙකම ප්‍රශස්ත ගණපූරණය යටතේ ඒ අනුව පවත්වා නොතිබුණු බව නිරීක්ෂණය විය. | | සියලුම කොන්ත්‍රාත් සඳහා මාසික ප්‍රගති සමාලෝචන රැස්වීම පවත්වනු ලැබේ. |

## 4. විදුලිබල සහ බලශක්ති අංශය

### 4.1 හරිත බලශක්ති සංවර්ධන සහ බලශක්ති කාර්යක්ෂමතාවය වැඩිදියුණු කිරීමේ ආයෝජන වැඩසටහනේ (අදියර I)

(i) හරිත බලශක්ති සංවර්ධන සහ බලශක්ති කාර්යක්ෂමතාවය වැඩිදියුණු කිරීමේ ආයෝජන වැඩසටහනේ (අදියර I) පිවිතුරු විදුලිබල උත්පාදනය, පද්ධති කාර්යක්ෂමතාව හා විශ්වාසනීය බව වැඩිදියුණු කිරීම සඳහා ක්‍රියාත්මක වේ.

(ii) ජල විදුලි උත්පාදනය සහ ජාලයට සම්බන්ධ කිරීම, සම්ප්‍රේෂණ යටිතල පහසුකම්වල ධාරිතාවය වැඩි දියුණු කිරීම, මධ්‍ය වෝල්ටීයතා ජාලය කාර්යක්ෂම කිරීම, බලශක්ති කාර්යක්ෂමතාව දියුණු කිරීම සඳහා ඉල්ලුම් කළමනාකරණය, ධාරිතා වර්ධන සඳහා සහය යන සංරචක 5කින් වැඩසටහනේ කටයුතු සමන්විත වේ.

(iii) වැඩසටහනේ ඇස්තමේන්තුගත පිරිවැය රු. මිලියන 28,509.80කට සමාන එජඩො මිලියන 220ක් වන අතර ඉන් රු. මිලියන 23,325.50කට සමාන එජඩො මිලියන 180ක් මූල්‍යායනය කිරීමට ආසියානු සංවර්ධන බැංකුව හා ප්‍රංශ නියෝජිත ආයතනය එකඟවී තිබුණි.

(iv) වැඩසටහන එහි කටයුතු 2015 පෙබරවාරි 02 දින ආරම්භ කරන ලද අතර 2019 සැප්තැම්බර් 30 දින වන විට නිම කිරීමට සැලසුම් කර තිබුණි. කෙසේවෙතත්, වැඩසටහනේ කටයුතු අවසන් කිරීමේ දිනය 2023 නොවැම්බර් තෙක් දීර්ඝ කර තිබීම හේතුවෙන් රටේ මහජනතාවගේ පිවිතුරු විදුලිබල උත්පාදනය, පද්ධති කාර්යක්ෂමතාව හා විශ්වාසනීය බව වැඩිදියුණු කිරීමේ අරමුණ ආසන්න වශයෙන් වර්ෂ දෙකකින් ප්‍රමාද වී තිබුණි.

(v) විගණකාධිපති විසින් ව්‍යාපෘතිය සම්බන්ධයෙන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන මත 2018,2019 සහ 2020 වර්ෂ සඳහා තත්ත්වාගණනය කළ මතය මතයක් ප්‍රකාශ කර තිබුණි. කෙසේවෙතත්, මේ වනතෙක් නිරවුල් නොකරන ලද ව්‍යාපෘතියේ කාර්යසාධනය සම්බන්ධ ගැටළු කිහිපයක් පහත දැක්වේ.

| | විගණන නිරීක්ෂණ | විගණකාධිපතිගේ නිර්දේශ | ව්‍යාපෘතිය විසින් ගන්නා ලද වළක්වාලීමේ පියවර | වර්තමාන තත්ත්වය |
|---|---|---|---|---|
| (අ) | 2016 මාර්තු 29 දිනැති අංක 2016/03 පීඑෑ් දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය සහ 2020 ජුනි 08 දිනැති අංක එස්ඊසී/2020/03 (සංශෝධිත) දේශීය ආදායම් බදු චක්‍රලේඛයට පටහැනිව ව්‍යාපෘතිය අදාළ නිලධාරීන්ගේ වැටුප් මගින් අඩු කිරීමෙන් තොරව 2020 ඔක්තෝබර් 31 දක්වා උපයන විට බදු/ උසස් පෞද්ගලික බදු සහ බදු මත බදු රු.මිලියන 47.7ක් ගෙවා තිබුණි. | මණ්ඩල තීරණය අඛණ්ඩව ක්‍රියාත්මක කිරීමට පියවර ගත යුතුය. | 2020 ඔක්තෝබර් දක්වා උපයන විට ගෙවීම බද්ද ලං.වි.ම ගෙවා තිබුණු අතර 2020 නොවැම්බර් මස සිට APIT නිලධාරීන් විසින් දරනු ලැබේ. | |
| (ආ) | 2016 මාර්තු 23 දිනැති අංක 1/2016 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛයේ ( 2019 මාර්තු 15 දිනැති 01/2019 සංශෝධිත) | චක්‍රලේඛයේ ප්‍රතිපාදන සමග අනුගත වීම අවශ්‍ය වේ. | මෙය ලංකා විදුලිබල මණ්ඩලයේ නිලධාරීන් සියළු දෙනාටම අදාළ ලංකා විදුලිබල මණ්ඩලයේ ප්‍රතිපත්ති හා මාර්ගෝපදේශවලට අනුව වේ. | |

| | | | |
|---|---|---|---|
| | 4.3 වගන්තිය ප්‍රතිපාදනවලට පටහැනිව ව්‍යාපෘති නිලධාරීන්ට 2020 දෙසැම්බර් 31 දක්වා එකතුව රු.මිලියන 83.1ක නිවාඩු දීමනා සහ ප්‍රසාද දීමනා ගෙවා තිබුණි. | | |
| (ඇ) | **කොටස1-**<br>**ජලවිදුලි උත්පාදනය සහ ජාලයට සම්බන්ධ කිරීම**<br>ආරම්භක නිම කිරීමේ දිනය 2019 ජුනි වුවද එය 2023 නොවැම්බර් නිම කිරීමට අපේක්ෂිත විය. ආරම්භක නිම කිරීමේ දිනයට පසු දිනයක් වූ 2019 ඔක්තෝබර් 04 දින ප්‍රධාන සිවිල් කටයුතු සඳහා කොන්ත්‍රාත්තුව (ලොට් ඒ 2) පිරිනමා තිබුණි. 2016 ඔක්තෝබර් 24 දින (ලොට් 3) ලොට් ඒ1 සහ ලොට් ඒ2 මත උපදේශන කොන්ත්‍රාත්තුව පිරිනමා තිබුණද ලොට් ඒ1 සහ ලොට් ඒ 2 සඳහා කොන්ත්‍රාත්තුව පිළිවෙළින් 2018 මැයි | අපේක්ෂිත නිම කිරීමේ දින වන විට ව්‍යාපෘතියේ කටයුතු නිම කිරීමට පියවර ගත යුතුය | • MASL විසින් වේල්ල නැවත නිර්මාණය කිරීම සඳහා කරන ලද ඉල්ලීම සහ අනුමත කිරීමේ ක්‍රියාවලියේ පැවති ගැටළු හේතුවෙන් ලොට් ඒ **- 2** සහ ලොට් බී ප්‍රසම්පාදනය ප්‍රමාද විය. කොවිඩ් 19 වසංගතය ඇතුළුව පහත සඳහන් හේතු නිසා සමස්ත ප්‍රමාදය සිදුවී තිබුණි. පිපිරීමට ඉඩ ඇති ද්‍රව්‍ය සඳහා පනවන ලද ආනයන සීමා, විදේශිකයන් සඳහා වීසා නිකුත් කිරීමේ ප්‍රමාදය සහ විදේශ රටවල්වලින් ගමන් සීමා පැනවීම. |

| | | | |
|---|---|---|---|
| | සහ 2019 ඔක්තෝබර් පිරිනමා තිබුණි. | | |
| (ඇ) | **කොටස 2-**<br>**සම්ප්‍රේෂණ යටිතල පහසුකම්වල ධාරිතාවය වැඩි දියුණු කිරීම**<br>සියලුම කටයුතුවල ආරම්භක නිම කිරීමේ දිනය 2019 ජුනි වුවද, කෙරීගෙන යන වැඩ හතරක කටයුතු 2021 අගෝස්තු නිම කිරීමට අපේක්ෂිත විය. | අපේක්ෂිත නිම කිරීමේ දින වන විට ව්‍යාපෘතියේ කටයුතු නිම කිරීමට පියවර ගත යුතුය. | පාස්කු ඉරුදින ප්‍රහාරය අයහපත් කාලගුණය, උප කොන්ත්‍රාත්කරුවන්ගේ ගැටළු, සහ පිරවීමේ ද්‍රව්‍ය ප්‍රවාහනය කිරීම සඳහා පනවන ලද සීමා සහ කොවිඩ් 19 වසංගතය තත්ත්වය ප්‍රමාදය සඳහා හේතුවය. |
| (ඉ) | වැඩසටහනේ කටයුතු කොටස් 5කින් සමන්විත වන අතර ලංකා විදුලිබල මණ්ඩලය විසින් මෙහෙයවන සියලුම විදේශාධාර ව්‍යාපෘති අධීක්ෂණය සඳහා වග කියන අතිරේක සාමාන්‍ය කළමණාකරු වෙනුවට ලංකා විදුලිබල මණ්ඩලයේ විවිධ අංශ ප්‍රධානීන් යටතේ පැවතුණි. එම නිසා ව්‍යාපෘතියේ කොටස්වල සම්බන්ධීකරණය සතුටුදායක මට්ටමක නොපැවතුණි. | සැලසුම් කළ පරිදි ඉතිරි ව්‍යාපෘති කටයුතු නිම කිරීමේ අරමුණින් නිසි සම්බන්ධීකරණයක් තිබිය යුතුය. | මුල් කොටස් 2ක අතිරේක සාමාන්‍ය කළමණාකරු - ව්‍යාපෘති අංශය යටතේ සහ අනෙකුත් කොටස් ලංකා විදුලිබල මණ්ඩලය වෙනම අංශ මගින් ක්‍රියාත්මක කෙරේ. ප්‍රධාන උත්පාදන සහ සම්ප්‍රේෂණයට අදාළ ව්‍යාපෘති පමණක් ව්‍යාපෘති අංශය මගින් පාලනය කරන අතර ව්‍යාපෘති විෂය පථයේ බෙදාහැරීම් කොටසක් ඇතුළත් වන්නේ නම් බෙදාහැරීම් අංශය යටතේ PMU මගින් එම කොටස ආවරණය කරනු ලැබේ. |

| | | | |
|---|---|---|---|
| (ඊ) | ආසියානු සංවර්ධන බැංකුවේ ණය අංක (3146/3147) මුල් අවසන් වීමේ දිනය 2020 මාර්තු 31 වූ අතර එය 2021 මාර්තු 30 දක්වා දීර්ඝ කර තිබුණි. අපේක්ෂිත ප්‍රගතිය ලගා කර නොගැනීම හේතුවෙන් 2024 ජුලි 13 දක්වා තවදුරටත් දීර්ඝ කර තිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස ව්‍යාපෘති පරිපාලන වියදම් සහ අනෙකුත් වියදම් ඉහළ යාමට සහ වියපැහැදම් නොවූ ශේෂය මත බැදීම් ගාස්තු ගෙවීමට සිදු වේ. තවද, දිගුකාලීන අඩු පිරිවැය උත්පාදන සැලැස්ම අත්කර ගැනීමට නොහැකි වේ. | අපේක්ෂිත නිම කිරීමේ දින වන විට ව්‍යාපෘතියේ කටයුතු නිම කිරීමට පියවර ගත යුතුය. | මෙය ප්‍රධාන වශයෙන්ම ව්‍යාපෘතියේ 1 කොටසේ ඉදි කිරීම් කටයුතු සඳහා ලබා දෙන ලද කාලය දීර්ඝ කිරීම් නිසා වේ. ප්‍රමාදයන් සඳහා හේතු ඉහත විස්තර කර ඇත. මුල් නිම කිරීමේ දිනය ඉක්මවා කාලය දීර්ඝ කිරීම් ලබා දීමෙන් අමතර පිරිවැය දැරීමට සිදුවන බව සත්‍යයක් වේ. |
| (උ) | ව්‍යාපෘතියේ 2 කොටසේ ලොට් බී 2 ප්‍රමාණ පත්‍රයට අනුව, වාහන 3ක් ආනයනයට එ.ජ.ඩො. 158,065ක් වෙන්කර තිබුණි. ආනයනය කරන ලද වාහන 3නේ CIF අගය එ.ජ.ඩො. 58,446ක් වුවද වෙන් කරන ලද | අනාර්ථික වියදම් අවම කරගැනීමට පියවර ගත යුතුය. | ආරම්භක ලංසු මිළ, ලංසු අවස්ථාවේදී SCAPC අනුමැතිය සහිතව තීරණය වන අතර ලංකා විදුලිබල මණ්ඩලය 2016 මැයි අත්සන් කරන ලද ලොට් බී 2 කොන්ත්‍රාත් ගිවිසුම අනුව එකගවූ කොන්ත්‍රාත් මිළ ගෙවීමට බැදී සිටින අතර 2017දී වාහන ආනයනය කරන ලදී. |

එ.ජ.ඩො. 158,065 කොන්ත්‍රාත්කරු වෙත ගෙවා තිබුණි. ඊට අමතරව මුළු ආනයනික බදු මුදල රු. මිලියන 12.4 කොන්ත්‍රාත්කරු වෙත ප්‍රතිපූර්නය කර තිබුණි. ඒ අනුව ව්‍යාපෘතිය වාහන ආනයනයේදී අනාර්ථික වියදමක් දැරීමට සිදු වී තිබුණි.

**4.2 හරිත බලශක්ති සංවර්ධන සහ බලශක්ති කාර්යක්ෂමතාවය වැඩිදියුණු කිරීමේ ආයෝජන වැඩසටහනේ (අදියර II)**

(i) හරිත බලශක්ති සංවර්ධන සහ බලශක්ති කාර්යක්ෂමතාවය වැඩිදියුණු කිරීමේ ආයෝජන වැඩසටහනේ (අදියර II) ස්ථාවර පද්ධති ක්‍රියාකාරිත්වයක් සහතික කිරීම සඳහා වැඩිවන බලශක්ති ඉල්ලුම අවශෝෂණය කර ගැනීම සහ ප්‍රතික්‍රියාශීලි බලශක්ති කළමනාකරණයට කොටුමා උපපොළවල් සහ ආශ්‍රිත රැහැන් ඉදිකිරීම් මගින් රටේ සම්ප්‍රේෂණ යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම වේ.

(ii) ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත පිරිවැය රු. මිලියන 39,453කට සමාන එජඩො මිලියන 264.7ක් වන අතර ඉන් රු. මිලියන 27,793කට සමාන එජඩො මිලියන 184.7ක් මූලායනය කිරීමට ආසියානු සංවර්ධන බැංකුව සහ ප්‍රංශ නියෝජිත ආයතනය එකඟවී තිබුණි.

(iii) වැඩසටහන එහි කටයුතු 2017 ජුලි 10 දින ආරම්භ කරන ලද අතර 2021 දෙසැම්බර් 31 දින වන විට නිම කිරීමට සැලසුම් කර තිබුණි.

(iv) විගණකාධිපති විසින් ව්‍යාපෘතිය සම්බන්ධයෙන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන මත 2018,2019 වර්ෂ සඳහා තත්ත්වාගණනය නොකළ මතයක් සහ 2020 වර්ෂ සඳහා තත්ත්වාගණනය කළ මතය මතයක් ප්‍රකාශ කර තිබුණි. කෙසේවෙතත්, මේ වනතෙක් නිරවුල් නොකරන ලද ව්‍යාපෘතියේ කාර්යසාධනය සම්බන්ධ ගැටළු කිහිපයක් පහත දැක්වේ.

| | විගණන නිරීක්ෂණ | විගණකාධිපතිගේ නිර්දේශ | ව්‍යාපෘතිය විසින් ගන්නා ලද වළක්වාලීමේ පියවර | වර්තමාන තත්ත්වය |
|---|---|---|---|---|
| (අ) | 2016 ජූලි 31 දින සැලසුම් කළ දින සිට වර්ෂ 02කට වඩා ප්‍රමාදයන් සහිතව වැඩසටහනේ කටයුතු ආරම්භ කර තිබුණි. එමනිසා, මිල වෙනස්වීම්, බැඳීම් ගාස්තු වැනි කොන්ත්‍රාත් මත අමතර පිරිවැය සහ ව්‍යාපෘති කාලපරිච්ඡේදය දීර්ඝ කිරීම වැනි අවධානමක් පවතී. | කටයුතු කඩිනම් කිරීමට පියවර ගත යුතු අතර කොන්ත්‍රාත්කරුවන්ගේ කටයුතු සමීපව අධීක්ෂණය කිරීම අවශ්‍ය වේ. | සියලුම ව්‍යාපෘතිවල ප්‍රතිලබ්ධිවීමේ සැලැස්ම වෙනස් කර ඇත. උපයෝජිත මුදල් සඳහා පොළිය ගෙවනු ලබන අතර උපයෝජනය නොවූ මුදල් මත බැඳීම් ගාස්තු ගෙවනු ලැබේ. | ඉදිකිරීම් කටයුතු කඩිනම් කළ යුතු අතර දීර්ඝ කරන ලද කාලය තුළ නිම කිරීමට අපේක්ෂා කරනු ලැබේ. |
| (ආ) | මුළු ප්‍රතිපාදනය රු.මිලියන 37.89කට සමාන එජඩො මිලියන 260කින් 2020 දෙසැම්බර් 31 දිනට එකතුව රු.මිලියන 13.38කට සමාන එජඩො මිලියන 92ක් පමණක් උපයෝජනය කර තිබුණු බව නිරීක්ෂණය විය. | කටයුතු කඩිනම් කිරීමට පියවර ගත යුතු අතර කොන්ත්‍රාත්කරුවන්ගේ කටයුතු සමීපව අධීක්ෂණය කිරීම අවශ්‍ය වේ. | සියලුම ව්‍යාපෘතිවල ප්‍රතිලබ්ධිවීමේ සැලැස්ම වෙනස් කර ඇත. උපයෝජිත මුදල් සඳහා පොළිය ගෙවනු ලබන අතර උපයෝජනය නොවූ මුදල් මත බැඳීම් ගාස්තු ගෙවනු ලැබේ | ඉදිකිරීම් කටයුතු කඩිනම් කළ යුතු අතර දීර්ඝ කරන ලද කාලය තුළ නිම කිරීමට අපේක්ෂා කරනු ලැබේ. |

| | | | | |
|---|---|---|---|---|
| | තවද, වැඩසටහනේ පරිපාලන අත්පොතෙහි සඳහන් මූලා ඉලක්කවලට අනුව, සමාලෝචිත වර්ෂය අවසානය වන විට රු.මිලියන 37.9කට සමාන එජඩො මිලියන 259.9ක් උපයෝජනය කිරීමට අපේක්ෂා කර තිබුණි. කෙසේවෙතත්, එදිනට එම ඉලක්කයෙන් සියයට 35ක් පමණක් අත්කරගෙන තිබුණි. වෙන්කරන ලද අරමුදල්වල මන්දගාමී උපයෝජනයේ ප්‍රතිඵලයක් ලෙස ණය නියෝජිත ආයතනය විසින් රු.මිලියන 79.45ක බැඳීම් ගාස්තු අයකරගෙන තිබුණි. | | | |
| (ඇ) | ප්‍රගති වාර්තා අනුව, විවිධ හේතූන් නිසා බෙලිගහ සහ ඇතුල්කෝට්ටේ ප්‍රාථමික | කටයුතු කඩිනම් කිරීමට පියවර ගත යුතු අතර කොන්ත්‍රාත්කරුවන්ගේ කටයුතු සමීපව | නීතිපති දෙපාර්තමේන්තුව විසින් අනුමැතිය ලබාදීමේ ප්‍රමාදය හේතුවෙන් ණය | ඉදිකිරීම් කටයුතු කඩිනම් කළ යුතු අතර දීර්ඝ කරන ලද කාලය තුළ නිම කිරීමට අපේක්ෂා කරනු |

| | | | | |
|---|---|---|---|---|
| | උපපොළවල් වැඩිදියුණු කිරීමේ සහ රත්නපිටිය ප්‍රාථමික උපපොළ ඉදිකිරීමේ සුදුසු කොන්ත්‍රාත්කරුවකු තෝරාගැනීමේ ප්‍රසම්පාදන ක්‍රියාවලිය වර්ෂ 3½ වඩා වැඩි කාලයක් ගෙන තිබුණි. කොන්ත්‍රාත්තුව එ.ජ.ඩො මිලියන 7.973කට 2020 ජූලි 08 දින පරිනමා තිබුණු අතර 2020 සැප්තැම්බර් 21 දින කටයුතු ආරම්භ කර තිබුණි. මෙම අරමුණ සඳහා රත්නනපිටියේ තෝරාගත් ඉඩම අදාළ අරමුණ සඳහා 2021 ජූලි 26 දින තෙක් අත්පත් කර ගෙන නොතිබුණු බව අනාවරණය විය. | අධීක්ෂණය කිරීම අවශ්‍ය වේ. | ගිවිසුම බලාත්මක වන දිනය මාස 06 කින් ප්‍රමාද වී ඇත. | ලැබේ. 2020 අගෝස්තු 02 දින රත්නපිටිය ඉඩම ලං.වි.ම භාරදී ඇත. |
| (ඇ) | වැඩසටහන් පරිපාලන අත්පොතට අනුව, ස්මාර්ට් ජාල සහ මැනුම් උපදේශන සේවය රු. මිලියන | වැඩසටහනේ අරමුණු අත්පත් කර ගැනීමේ අරමුණින් වැඩසටහනේ කටයුතු නිසි පරිදි සැලසුම් කර ගැනීම සහ හඳුනා | අදියර 2 වැඩ විෂය පථයේ සැලැස්ම මුළු කටුනායක CSC ස්මාර්ට් මැනුම් කිරීම වේ. | උපදේශකවරයෙකුගේ සේවාව යොදා ගැනීමකින් තොරව වෙනස් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ උපායමාර්ගයක් සමග |

| | | | | |
|---|---|---|---|---|
| | 1,617.82කට සමාන එ.ජ.ඩො මිලියන 11.1ක පිරිවැයකට විදුලිබල කාර්යක්ෂමතාව සඳහා ඉල්ලුම් කළමනාකරණය යටතේ ක්‍රියාත්මක කළ යුතු අතර එය 2021 ජූලි 26 දින තෙක් ආරම්භ කර නොතිබුණි. | ගැනීම කළ යුතුය. | ඇස්තමේන්තුගත පිරිවැය එ.ජ.ඩො. මිලියන 8.85ක් වේ. (භාණ්ඩ සඳහා එ.ජ.ඩො. මිලියන 8 සහ උපදේශන සේවාව සඳහා එ.ජ.ඩො. මිලියන 0.75 වේ.) අදියර I සැලසුම් අදියරේ පැවති තත්වය මත ඇස්තමේන්තුව පදනම් වේ. | මෙයට සමාන වැඩ විෂය පථයක් ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර තිබේ. |
| (ඉ) | ලැබී තිබුණු තොරතුරු අනුව වැඩසටහනේ මෝටර් වාහන සෘජුවම ආනයනය කරන අතර, කොන්ත්‍රාත්කරුවන් හරහා මිලදී ගනු ලැබේ. එම හේතුව නිසා ඒ සඳහා කොන්ත්‍රාත්කරුගේ ලාභතීරුව සහ පොදුකාර්ය පිරිවැය ඇතුළුව ඉන්වොයිස් වටිනාකමට වඩා වැඩි මුදලක් | ලංකා විදුලි බල මණ්ඩලයට සිදු විය හැකි අවධානම අවම කිරීම සඳහා කොන්ත්‍රාත් ලියවිලිවලට වගන්ති ඇතුළත් කළ යුතුය | කොන්ත්‍රාත්කරු විසින් මෝටර් වාහන 35 ක් සපයා තිබුණු අතර කොන්ත්‍රාත් ගිවිසුම අනුව, එම වාහන සඳහා ගෙවීම් කර තිබුණි. | ව්‍යාපෘතිය අවසන් වූ වහාම එම වාහන සහ අනෙකුත් උපකරණ ලං.වි.ම. මාරු කරනු ලැබේ. එම අවස්ථාවේ දී වත්කම හඳුනා ගනු ලැබේ. |

ගෙවීමට සිදුවේ. 2016 සිට 2019 දක්වා කාලය තුළ මෝටර් වාහන 28 ක් මිලදී ගැනීමට වැඩසටහන මඟින් එකතුව රු. මිලියන 165.71 ක් ලබාදී තිබුණි ද වාහනවල අයිතිය කොන්ත්‍රාත්කරු සතු විය. එහි ප්‍රතිපලයක් ලෙස කොන්ත්‍රාත්කරු වැඩ නතර කළහොත් හෝ හදිසි අනතුරකට පත්වුවහොත් පාඩුව වැඩසටහනට දරාගත යුතු වේ.

**4.3 විදුලි සැපයුම් ස්ථායීතා ප්‍රවර්ධන සහය ව්‍යාපෘතිය**

(i) විදුලි සැපයුම් ස්ථායීතා ප්‍රවර්ධන සහය ව්‍යාපෘතිය විදුලි බලය සැපයීමේ හා බෙදාහැරීම් පද්ධතිවල කාර්යක්ෂමතාවය හා විශ්වාසනීයබව වැඩිදියුණු කිරීම සඳහා ක්‍රියාත්මක වේ.

(ii) ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත පිරිවැය රු.මිලියන 23,069කට සමාන එජඩො මිලියන 160.20ක් වන අතර ඉන් රු.මිලියන 16,560කට සමාන එජඩො මිලියන 115ක් මූල්‍යනය කිරීමට ආසියානු සංවර්ධන බැංකුව එකඟ වී තිබුණි.

(iii) ව්‍යාපෘතිය එහි කටයුතු 2017 ජුනි 29 දින ආරම්භ කරන ලද අතර 2021 සැප්තැම්බර් 30 දින වන විට නිම කිරීමට නියමිතය. කෙසේවෙතත්, කොන්ත්‍රාත් ප්‍රදානය කිරීමේ ප්‍රමාදය හේතුවෙන් ව්‍යාපෘතියේ කාලය 2023 දෙසැම්බර් 31 දක්වා දීර්ඝ කර තිබුණි.

(iv) විගණකාධිපති විසින් ව්‍යාපෘතිය සම්බන්ධයෙන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන මත 2018,2019 සහ 2020 වර්ෂ සඳහා තත්ත්වාගණනය කළ මතයක් ප්‍රකාශ කර තිබුණි.

කෙසේවෙතත්, මේ වනතෙක් නිරවුල් නොකරන ලද ව්‍යාපෘතියේ කාර්යසාධනය සම්බන්ධ ගැටළු කිහිපයක් පහත දැක්වේ.

| | විගණන නිරීක්ෂණ | විගණකාධිපතිගේ නිර්දේශ | ව්‍යාපෘතිය විසින් ගන්නා ලද වළක්වාලීමේ පියවර | වර්තමාන තත්ත්වය |
|---|---|---|---|---|
| (අ) | ව්‍යාපෘති පරිපාලන අත්පොතට අනුව, උතුරු පළාතේ ඇනලතීවු, ඩෙල්ෆ් සහ නයනතීවු දූපත්වල දෙමුහුන් පුනර්ජනනීය බලශක්ති පද්ධති ඉදිකිරීමේ කොන්ත්‍රාත්තුව 2017 තුන්වන කාර්තුවේ පිරිනැමීමට අවශ්‍ය වූ අතර කොන්ත්‍රාත්තුවේ කටයුතු 2017 හතරවන කාර්තුවේ ආරම්භ කිරිමට සැලසුම් කර තිබුණි. කෙසේවෙතත්, මෙම පැකේජය සඳහා කෙටුම්පත් ලංසු ලියවිලි 2017 ජුලි 4 දින ආ.සං.බැ විසින් අනුමත කර තිබුණි. කොන්ත්‍රාත්තුව 2020 දෙසැම්බර් 31 දින වන විටත් ප්‍රදානය කර නොතිබුණි. | තව දුරටත් ප්‍රමාද කිරීමකින් තොරව කොන්ත්‍රාත් ප්‍රදානය කිරීමට පියවර ගත යුතුයි. | ක්ෂණික ඇගයීම් කමිටු වාර්තාව SCAPC වෙත ඉදිරිපත් කර ඇති අතර කමිටුවේ තීරණය බලාපොරොත්තුවෙන් සිටී. එම නිසා කොන්ත්‍රාත් ප්‍රදානය කිරීම ප්‍රමාදවේ. | කොන්ත්‍රාත්තුව මේවන තෙක් ප්‍රදානය කර නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| (ආ) | ව්‍යාපෘති පරිපාලන අත්පොතට අනුව, ඇස්තමේන්තුගත වටිනාකම එ.ජ.ඩො.මිලියන 34.99ක කිලෝමීටර 270.5ක් දිග කිලෝවොට් 33 කුළුණු රැහැන් සහ කිලෝවොට් 33 සහිත ගැන්ට්‍රි 13 ඉදිකිරීමේ කොන්ත්‍රාත්තුව 2016 වර්ෂයේ තුන්වන කාර්තුවේ පිරිනැමීමට අවශ්‍ය වූ අතර කොන්ත්‍රාත්තුවේ කටයුතු 2017 හතරවන කාර්තුවේ ආරම්භ කිරීමට සැලසුම් කර තිබුණි. කෙසේවෙතත්, මෙම කොන්ත්‍රාත්තුව ප්‍රදානය කිරීම සඳහා ප්‍රසම්පාදන ක්‍රියාවලිය වර්ෂ 2කට වඩා ගත වී ඇති අතර අවසානයේදී කොන්ත්‍රාත්තුව එ.ජ.ඩො. මිලියන 40.48 පිරිවැයකට 2019 මැයි 30 දින ප්‍රදානය කර තිබුණි. තවද, මෙම සංරචකය යටතේ ගැන්ට්‍රි ඉදිකිරීම සඳහා ඉඩම් කොටස් 10 අත්පත් කර ගැනීමට සැලසුම් කර තිබුණි. | කටයුතු කඩිනම් කිරීමට පියවර ගත යුතු අතර කොන්ත්‍රාත්කරුවන්ගේ කටයුතු සමීපව අධීක්ෂණය කිරීම අවශ්‍ය වේ. | කොන්ත්‍රාත්කරු විසින් කාලය දීර්ඝ කිරීමක් ඉල්ලා ඇති අතර ඒ පිළිබඳ සලකා බලමින් සිටී.ණය වලංගු කාලය දීර්ඝ කිරීම සඳහා කළමනාකරණ මණ්ඩලය අනුමැතිය ලබාදී ඇත. එය බලශක්ති අමාත්‍යාංශය මගින් වි.ස.දෙ වෙත ඉදිරිපත් කර ඇත. | ඉදිකිරීම් කටයුතු කඩිනම් කළ යුතු අතර දීර්ඝ කරන ලද කාලය තුළ නිම කිරීමට අපේක්ෂා කරනු ලැබේ. |

| | | | | |
|---|---|---|---|---|
| | වර්ෂ 4ක් ගත වීමෙන් පසුවද කිසිදු ඉඩමක් අත්පත් කර ගෙන නොතිබුණි. | | | |
| (ඇ) | ව්‍යාපෘතියේ ඉතිරි මුදල් භාවිතයෙන් කරන ලද කොළඹ නගරයේ කොටුමා උපපොළෙහි MVAr Breaker Switched Capacitor Banks 124ක් ස්ථාපනය සහ තිඹිරිගස්යාය කොටුමා උපපොළෙහි Capacitor Banks ප්‍රතිස්ථාපනයේ 2020 දෙසැම්බර් 31 දිනට ප්‍රගතියක් නොපෙන්වන ලදී. | තව දුරටත් ප්‍රමාද කිරීමකින් තොරව කොන්ත්‍රාත් ප්‍රදානය කිරීමට පියවර ගත යුතුයි. | ලංසු කැඳවා ඇති අතර ඇගයීම සිදු කරමින් පවතී. ඉහල මිල ලංසු හේතුවෙන් අඩුම මිල ඇගයීම් ලංසුකරු සමග සාකච්ඡා පවත්වනු ලැබේ. | ඉදිකිරීම් කටයුතු කඩිනම් කළ යුතු අතර දීර්ඝ කරන ලද කාලය තුළ නිම කිරීමට අපේක්ෂා කරනු ලැබේ. |
| (ඈ) | ව්‍යාපෘති රු.මිලියන 16,560කට සමාන එ.ජ.ඩො මිලියන 115 මුළු ප්‍රතිපාදනයෙන් 2020 දෙසැම්බර් 31 දිනට රු. මිලියන 5,078.084 ක් පමණක් උපයෝජය කර තිබුණු බව නිරීක්ෂණය විය. ව්‍යාපෘති පරිපාලන අත්පොතෙහි සඳහන් මූල්‍ය ඉලක්කවලට | ව්‍යාපෘති පරිපාලන අත්පොතෙහි සඳහන් මූල්‍ය ඉලක්ක සමඟ අනුගත වීම අවශ්‍ය වේ. | රටේ පැවති කොවිඩ් වසංගත ව්‍යාප්තිය සහ අයහපත් කාලගුණය නිසා කොන්ත්‍රාත්තුවේ කාර්යසාධනය සැලකිය යුතු ලෙස අඩුවෙන් වාර්තා විය. එම නිසා අපේක්ෂිත ව්‍යාපෘති ඉලක්ක අත්කර ගෙන නොමැත. | ප්‍රමාද වූ වැඩ ආවරණය කිරීමට අවශ්‍ය පියවර ගත යුතුය. |

අනුව, 2020 වර්ෂය අවසානය වන විට රු.මිලියන 2,592 කට සමාන එ.ජ.ඩො මිලියන 18ක් උපයෝජනය කිරීමට අපේක්ෂා කර තිබුණි. කෙසේවෙතත්, එදිනට එම ඉලක්කයෙන් සියයට 42.56ක් නියෝජනය කරන රු. මිලියන 1,103.17ක මුදලක් පමණක් උපයෝජය කර තිබුණි.

**4.4 ලංකා විදුලි (පුද්ගලික) සමාගම මගින් සිදුකරනු ලබන කටයුතු**

(i) විදුලි සැපයුම් ස්ථායිතා ප්‍රවර්ධන සහය ව්‍යාපෘතිය බස්නාහිර පළාතේ පුනර්ජනනීය බලශක්ති ක්ෂුද්‍ර බෙදා හැරීමේ පද්ධතියක් ඉදි කිරීම මගින් දෙමුහුන් පුනර්ජනනීය බලශක්ති පද්ධති ස්ථාපනය කිරීමට සහය ලබා දීම සඳහා ක්‍රියාත්මක වේ.

(ii) ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත පිරිවැය රු. මිලියන 268.36 කට සමාන වූ එ.ජ.ඩො මිලියන 1.8 ක් වන අතර එම මුළු මුදලම ආසියානු සංවර්ධන බැංකුව විසින් මූල්‍යනය කිරීමට එකඟ වී තිබුණි.

(iii) ව්‍යාපෘතිය මගින් එහි කටයුතු 2017 ජූනි 29 දින ආරම්භ කර ඇති අතර 2021 සැප්තැම්බර් 30 දින වන විට එම කටයුතු අවසන් කිරීමට සැලසුම් කර ඇත.

(iv) විගණකාධිපති විසින් ව්‍යාපෘතිය සම්බන්ධයෙන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන මත 2018,2019 සහ 2020 වර්ෂ සඳහා තත්ත්වාගණනය නොකළ මතයක් ප්‍රකාශ කර තිබුණි. කෙසේවෙතත්, මේ වනතෙක් නිරවුල් නොකරන ලද ව්‍යාපෘතියේ කාර්යසාධනය සම්බන්ධ ගැටළු කිහිපයක් පහත දැක්වේ.

| | විගණන නිරීක්ෂණ | විගණකාධිපතිගේ නිර්දේශ | ව්‍යාපෘතිය විසින් ගන්නා ලද වළක්වාලීමේ පියවර | වර්තමාන තත්ත්වය |
|---|---|---|---|---|
| (අ) | පුනර්ජනනීය බලශක්ති ක්ෂුද්‍ර බෙදාහැරීමේ නියමු ව්‍යාපෘතිය සැලසුම් කිරීම, ඉදිකිරිම, ස්ථාපනය කිරීම සහ ආරම්භ කිරීම සඳහා තෝරාගත් ලංසුකරු ක්ෂුද්‍ර බෙදාහැරීමේ පද්ධතියේ වසර දෙකක ක්‍රියාකාරීත්වය සඳහා අනිවාර්ය අමතර කොටස් සඳහා මිල ගණන් සඳහන් කර නොමැත. කෙසේ වෙතත්, තාක්ෂණික ඇගයීම් කමිටුව කොන්ත්‍රාත්තුව ප්‍රදානය කිරීමට පෙර ඉහත ලංසු අයිතමයට අදාළ එකඟතාවයකින් යුත් විසඳුමකට යටත්ව ලංසුව නිර්දේශ කරන ලදී. පසුව, 2020 පෙබරවාරි 11 වන දින කොන්ත්‍රාත්තුව ප්‍රදානය කර ඇත්තේ කොන්ත්‍රාත්කරු විසින් මිල ගණන් දක්වා ඇති අනෙකුත් අනිවාර්ය අමතර කොටස් සඳහා | ක්ෂුද්‍ර බෙදාහැරීමේ පද්ධතියේ වසර දෙකක ක්‍රියාකාරීත්වය සඳහා අනිවාර්ය අමතර කොටස් සැපයීමට ලංසුකරු බැඳී සිටින බැවින් සැපයුම්කරු එකඟ වූ කාල සීමාවන් සඳහා වගකීමක් සමඟ මෙම කරුණ සලකා බැලිය යුතුය. | කොන්ත්‍රාත්තුව ප්‍රදානය කිරීමට පෙර කොන්ත්‍රාත්කරු සමඟ පැවති රැස්වීමකදී මේ පිළිබඳව සාකච්ඡා කෙරුණි. ඔවුන් අදාළ උපකරණ සඳහා වසර දෙකක හෝ ඊට වැඩි වගකීම් සහතිකයක් ලබා දී ඇති බැවින්, වසර දෙකක අමතර කොටස් සඳහා වන පිරිවැය ද පිරිනැමීම සමඟ ඇතුළත් වන බව සැලකේ. | - |

| | | | | |
|---|---|---|---|---|
| | වසර දෙකක් හෝ ඊට වැඩි වගකීමක් ලබා දී ඇති බැවිනි. | | | |
| (ආ) | මුළු ප්‍රදාන මුදලින් එ.ජ.ඩො මිලියන 1.5 ක් හා එ.ජ.ඩො මිලියන 0.3 ක් පිළිවෙලින් වැඩ සංරචකය සහ උපදේශන සේවා සඳහා වෙන් කර තිබුණි. ප්‍රදාන ගිවිසුමට අනුව ප්‍රදානය අවසන් වන දිනය 2022 මාර්තු 31 වුවත්, 2020 දෙසැම්බර් 31 දිනට වැඩ සංරචකය සඳහා එ.ජ.ඩො මිලියන 0.159 ක් හෝ සියයට 11 ක් සහ උපදේශන සේවා සඳහා එ.ජ.ඩො මිලියන 0.109 ක් හෝ සියයට 37 ක් පමණක් උපයෝජනය කර තිබුණි. | ව්‍යාපෘතිය සැලසුම් කළ කාලය තුළ සම්පූර්ණ කිරීම සඳහා ව්‍යාපෘති ක්‍රියාකාරකම් වේගවත් කිරීමට කඩිනම් ක්‍රියාමාර්ග ගත යුතු වේ. | 2021 පෙබරවාරි 10 දින ආසියානු සංවර්ධන බැංකුවේ එකඟතා ලිපිය ලැබීමත් සමඟ ණයවර ලිපිය ක්‍රියාත්මක තත්වයට පත් වීමෙන් පසුව පමණක් ඉදිකිරීම් වැඩ සඳහා ප්‍රදානය ප්‍රතිලබ්ධිවීම ආරම්භ විය. | වර්තමානයේ ප්‍රදානය ප්‍රතිලබ්ධිවීම එ.ජ.ඩො 1,164,241 සහ එය ආසන්න වශයෙන් මුළු ප්‍රදාන වටිනාකමින් 65% |
| (ඇ) | පුනර්ජනනීය බලශක්ති ක්ෂුද්‍ර බෙදාහැරීමේ පද්ධතිය නිර්මාණය කිරීම, සැපයීම සහ ස්ථාපනය කිරීම සඳහා වූ කොන්ත්‍රාත්තුව 2020 පෙබරවාරි 11 දින පිරිනමා තිබූ අතර | ව්‍යාපෘති කටයුතු වේගවත් කිරීම සඳහා කඩිනමින් ක්‍රියාමාර්ග ගත යුතු අතර ව්‍යාපෘති කාලය තුළ ව්‍යාපෘතිය අවසන් කිරීම සඳහා කොන්ත්‍රාත්කරුගේ කටයුතු සමීපව අධීක්ෂණය කිරීම | කොන්ත්‍රාත් ගිවිසුම අනුව, සේවා සම්බන්ධව අපේක්ෂිත නිම කිරීමේ දිනය ගණනය කළ යුත්තේ ක්‍රියාත්මක දිනයට කොන්ත්‍රාත්තුවේ සඳහන් කාලය එකතු | මේවන විට නිමකර ඇත. |

| | | |
|---|---|---|
| කොන්ත්‍රාත් ගිවිසුම 2020 ජූලි 03 දින අත්සන් කර තිබුණි. ව්‍යාපෘති ලේඛනය අනුව, 2021 නොවැම්බර් 30 දින වන විට ක්ෂුද්‍ර බෙදා හැරීම් පද්ධතිය ස්ථාපනය සම්බන්ධ ක්‍රියාකාරකම් අවසන් කිරීමට කොන්ත්‍රාත්කරු එකඟ වී තිබුණි. කෙසේ වුවද, සුදුසු ඩීසී කේබල් (DC Cable) මාර්ග හඳුනා ගැනීම, බැටරි බහාලුම සහ ඩීසල් ජෙනරේටරය සවි කිරීම සඳහා සුදුසු ස්ථාන හඳුනා ගැනීම වැනි මූලික ක්‍රියාකාරකම් පමණක් අවසන් කර තිබුණි. ව්‍යාපෘතියේ කටයුතු අවසන් කිරීම සඳහා මාස 05 ක් පමණක් ඉතිරිව තිබුණද අවශ්‍ය යන්ත්‍රෝපකරණ ආනයන කටයුතු විගණිත දිනය වනවිටත් අවසන්ව නොතිබුණි. | අවශ්‍ය වේ. | කිරීම වශයෙනි. |

**4.5 ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය මගින් සිදුකරනු ලබන කටයුතු**

(i) විදුලි සැපයුම් ස්ථායීතා ප්‍රවර්ධන සහය ව්‍යාපෘතිය උතුර පළාතේ යාපනය ප්‍රදේශයේ කුඩා හුදකලා දූපත් 03 (නයනතිව්, අනලතිව් හා ඩෙල්ෆ්ට්) තුළ වූ ග්‍රාමීය ප්‍රජාව සඳහා ඵලදායී බලශක්ති භාවිතයට සහය වීම ව්‍යාපෘතියේ අරමුණ වේ.

(ii) ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත පිරිවැය වූ රු.මිලියන 288 කට සමාන එජඩො මිලියන 2 ක් වන අතර එම මුදල ආසියානු සංවර්ධන බැංකුව විසින් පරිපාලනය කරනු ලබන දරිද්‍රතාවය අවම කිරීම සඳහා වූ ජපන් අරමුදල විසින් මූල්‍යනය කිරීමට එකඟ වී තිබුණි.

(iii) ව්‍යාපෘතිය එහි කාර්යයන් 2017 මාර්තු 19 දින ආරම්භ කර ඇති අතර 2021 සැප්තැම්බර් 30 වන විට අවසන් කිරීමට සැලසුම් කර ඇත.

(iv) විගණකාධිපති විසින් ව්‍යාපෘතිය සම්බන්ධයෙන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන මත 2018 වර්ෂ සඳහා තත්ත්වාගණනය නොකළ මතයක් සහ 2019 සහ 2020 වර්ෂ සඳහා තත්ත්වාගණනය කළ මතයක් ප්‍රකාශ කර තිබුණි. කෙසේවෙතත්, මේ වනතෙක් නිරවුල් නොකරන ලද ව්‍යාපෘතියේ කාර්යසාධනය සම්බන්ධ ගැටළු කිහිපයක් පහත දැක්වේ.

| | විගණන නිරීක්ෂණ | විගණකාධිපතිගේ නිර්දේශ | ව්‍යාපෘතිය විසින් ගන්නා ලද වළක්වාලීමේ පියවර | වර්තමාන තත්ත්වය |
|---|---|---|---|---|
| (අ) | ව්‍යාපෘතිය මුහුදු ජලය පිරිපහදු කිරීමේ පිරියත ස්ථාපනය හා ටොන් 0.5 ක අයිස් සාදන කර්මාන්තශාලාවක් සහ ශීතකරණ පද්ධතියක් සැපයීම හා ස්ථාපනය කිරීම යන සංරචක 02 කින් සමන්විත වූ අතර ඉන් දිනකට ඝණ මීටර් 75 ක මුහුදු ජලය පිරිපහදු | විදුලිබල මණ්ඩලයේ දෙමුහුන් විදුලි පද්ධති ව්‍යාපෘතිය ක්‍රියාත්මක වන තෙක් අඩු පිරිවැයට විදුලිබලය සැපයීමට තාවකාලික විසඳුමක් ලංකා විදුලිබල මණ්ඩලය සමඟ සාකච්ඡා කළ යුතුය. | අයිස් සාදන කර්මාන්තශාලාවක් සඳහා ටෙන්ඩර් කැඳවිය හැකිවන්නේ විදුලිබල මණ්ඩලයේ දෙමුහුන් විදුලි පද්ධති ව්‍යාපෘතිය අවසන් වූ විට වේ. 2022 පෙබරවාරි 21සහ 2022 පෙබරවාරි 24 අතර ආ.සං.බැ මෙහෙවර කණ්ඩායම පැමිණිදී ඔවුනගේ තීරණය ලබාගැනීමට සාකච්ඡා කරනු ලැබේ. | |

| | | | | |
|---|---|---|---|---|
| | කිරීමේ පිරියත 02 ක් සැපයීම හා ස්ථාපනය කිරීම සමඟ අදාල සිවිල් වැඩ පමණක් නිමකර 2020 දෙසැම්බර් 31 දිනට ආරම්භ කර තිබුණි. කෙසේවෙතත්, 2021 මාර්තු 31 වන තෙක් පිරිනමා නොතිබුණු විදුලිබල මණ්ඩලයේ දෙමුහුන් විදුලි පද්ධති ව්‍යාපෘතිය මඟින් ලබා දෙන විදුලි බල සැපයුම මතය රඳා පැවතීම හේතුවෙන් අයිස් සාදන කර්මාන්තශාලාවක් ඉදිකිරීමේ සංරචක පිරිනමා නොතිබුණි. එම නිසා, 2020 දෙසැම්බර් 31 දිනට මුහුදු ජලය පිරිපහදු කිරීමේ පිරියත සැපයීම හා ස්ථාපනය කිරීම සමඟ අදාල සිවිල් වැඩවල භෞතික හා මූල්‍ය ප්‍රගතිය පිළිවෙලින් සියයට 99 සහ සියයට 72 වේ. | | | |
| (ආ) | මහජනතාව සඳහා පානීය ජලය සැපයීමට නයනතිව් දූපතේ දිනකට ඝණ මීටර150 ක මුහුදු ජලය පිරිපහදු | PMU සහ NWSDB ජල සැපයුම් අංශය විසින් සැලසුම් කළ කාලය තුළ නිමකිරීමට කොන්ත්‍රාත්තුවේ | දීර්ඝ කරන ලද කාලය තුළ නිමකිරීමට කොන්ත්‍රාත්කරුට උපදෙස් ලබා දී ඇති අතර කොන්ත්‍රාත්කරු ඔහුගේ | නයනතිවුවල කුළුණු ඉදිකිරීම නිම කර ඇත. ජලයේ පීඩනය |

| | | |
|---|---|---|
| කිරීමේ පිරියත ස්ථාපනය කළද ව්‍යාපෘතියේ විෂය පථයට විධිමත් ජල සැපයුම් පද්ධතියක් ඇතුළත් කර නොතිබුණි. එම නිසා ආ.සං.බැ මූල්‍යනය කරන යාපනය කිලිනොච්චි ජල සැපයුම් හා සනීපාරක්ෂන ව්‍යාපෘතිය මගින් බෙදාහැරීමේ පද්ධතිය සහ කුළුණු නිමකිරීමට සැලසුම් කර ඇත. මෙම ව්‍යාපෘතිය යටතේ කුළුණු ඉදිකිරීම 2020 දෙසැම්බර් මස වන විට සැලසුම් කර තිබුණද සමස්ථ භෞතික ප්‍රගතිය සියයට 44ක් පමණක් විය. | ප්‍රගතිය සමීපව අධීක්ෂණය කළ යුතුය. | ශ්‍රම බලකාය වැඩි කර ඇත. අවාසනාවකට බොහෝ කම්කරුවන් සහ මාණ්ඩලික නිලධාරින් පසුගිය මාසවල කොවිඩ් 19 වලට බලපෑම, සිමෙන්ති,යකඩ විදුලි උපකරණ වැනි ඉදිකිරීම් අමුද්‍රව්‍ය සපයා ගැනීමට නෙහැකි වීම හේතුවෙන් කටයුතු මන්දගාමී විය. |

## 4.6 මන්නාරම් සුළං බලශක්ති උත්පාදන ව්‍යාපෘතිය

(i) මන්නාරම් සුළං බලශක්ති උත්පාදන ව්‍යාපෘතිය, සුළං බලශක්ති උත්පාදන ධාරිතාව වැඩිදියුණු කිරීම, පද්ධති ප්‍රතික්‍රියාශීලි බලශක්ති කළමනාකරණය වැඩිදියුණු කිරීම සහ ණය ලබා ගන්නාගේ ව්‍යාපෘති ඉංජිනේරු නිර්මානකරණය සමාලෝචනය සහ අධීක්ෂණ ධාරිතාව සවිබලගැන්වීම මගින් ශ්‍රී ලංකාවේ පිවිතුරු බලශක්තිය උත්පාදනය වැඩිකිරීම සඳහා ක්‍රියාත්මක වේ.

(ii) ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත පිරිවැය රු. මිලියන 39,923.06කට සමාන එජඩො මිලියන 257 වන අතර ඉන් රු. මිලියන 31,104.84කට සමාන එජඩො මිලියන 200ක් මූල්‍යායනය කිරීමට ආසියානු සංවර්ධන බැංකුව එකඟ වී තිබුණි.

(iii) ව්‍යාපෘතිය එහි කටයුතු 2018 ජනවාරි 01 දින ආරම්භ කරන ලද අතර 2020 දෙසැම්බර් 31 දින වන විට නිම කිරීමට සැලසුම් කර තිබුණි.

(iv) විගණකාධිපති විසින් ව්‍යාපෘතිය සම්බන්ධයෙන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන මත 2018 වර්ෂ සඳහා තත්ත්වාගණනය කළ මතයක් සහ 2019 සහ 2020 වර්ෂ සඳහා තත්ත්වාගණනය නොකළ මතයක් ප්‍රකාශ කර තිබුණි. කෙසේවෙතත්, මේ වනතෙක් නිරවුල් නොකරන ලද ව්‍යාපෘතියේ කාර්යසාධනය සම්බන්ධ ගැටළු කිහිපයක් පහත දැක්වේ.

| | **විගණන නිරීක්ෂණ** | **විගණකාධිපතිගේ නිර්දේශ** | **ව්‍යාපෘතිය විසින් ගන්නා ලද වළක්වාලීමේ පියවර** | **වර්තමාන තත්ත්වය** |
|---|---|---|---|---|
| (අ) | ව්‍යාපෘතිය විසින් දිස්ත්‍රික් ලේකම් වෙත තබන ලද රු.මිලියන 40ක තැන්පතු ශේෂය නිරවුල් කිරීමකින් තොරව වර්ෂ 4ක් පුරා පැවතුණි. | ඉඩම් අත්පත් කර ගැනීමේ ක්‍රියාවලිය සම්බන්ධයෙන් පසු විපරම් කළ යුතුය. | මෙම ශේෂ අනෙකුත් තැම්පතු යටතේ පවතින අතර ඉඩම්හිමියන් වෙත නිරවුල් කිරීම් පිළිබඳ විස්තර නොමැතිව ඉවත් කිරීමට හෝ ප්‍රාග්ධනිත කිරීමට නො හැකිය. | |
| (ආ) | මුදල් රෙගුලාසි 134(3) සහ 2010 ජුලි 26 දිනැති අංක 05 දරන කළමනාකරණ විගණන චක්‍රලේඛය සහ අංක 02/2016 අනුව, සමාලෝචිත වර්ෂය තුළදී ව්‍යාපෘතියේ කාර්යමණ්ඩලයෙන් අභ්‍යන්තර විගණක බඳවා ගැනීමට සහ ව්‍යාපෘතියේ | ව්‍යාපෘතියේ කටයුතු පිළිබඳ අභ්‍යන්තර විගණනයක් නිරන්තරයෙන් සිදු කළ යුතුය. | ව්‍යාපෘතියේ ගනුදෙනු සඳහා ලං.වි.ම අභ්‍යන්තර විගණන අංශය මගින් 2017 වර්ෂයේදී සවිස්තරාත්මක අභ්‍යන්තර විගණනයක් සිදුකර ඇත. | |

| | | | |
|---|---|---|---|
| | ගනුදෙනු ලං.වී.ම අභ්‍යන්තර විගණන අංශයේ විගණනයට යටත්වී නොතිබුණි. | | |
| (ඇ) | 2016 අප්‍රේල් 29 දිනැති අංක පීඊඩී/03/2016 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය සහ 2020 ජුනි 08 දිනැති අංක එස්ඊසී/2020/03(සංශෝධිත) දේශීය ආදායම් දෙපාර්තමේන්තු චක්‍රලේඛයට පටහැනිව, ව්‍යාපෘතිය අදාළ නිලධාරීන්ගේ වැටුප් මගින් අඩු කිරීමෙන් තොරව 2020 දෙසැම්බර් 31 දක්වා උපයන විට ගෙවීම් බදු/ උසස් පෞද්ගලික බදු සහ බදු මත බදු රු.මිලියන 15.76ක් ඔවුන්ගේ අරමුදල් මගින් ගෙවා තිබුණි. | උපයන විට ගෙවීම් බදු නිලධාරීන්ගේ වැටුපෙන් අඩු කර ගත යුතුය. | 2020 ඔක්තෝබර් දක්වා APIT ලං.වී.ම ගෙවා තිබුණු අතර 2020 නොවැම්බර් මස සිට APIT නිලධාරීන් විසින් දරනු ලැබේ. |
| (ඇ) | සුළං බල උත්පාදන ධාරිතාවය වැඩි කිරීමේ සංරචකයේ අපේක්ෂිත භෞතික කාර්යසාධනය සියයට 100 විය. කෙසේවෙතත්, ළඟාකර ගත් ප්‍රගතිය සියයට 87.6 වේ. ආරම්භක නිම කිරීමේ දිනය 2020 දෙසැම්බර් වුවද එය 2021 මාර්තු වන විට නිම කිරීමට අපේක්ෂිත විය. දිගු | අනවශ්‍ය පිරිවැය වළක්වා ගැනීමට සැලසුම් කළ ආකාරයට කටයුතු නිම කළ යුතුය. | ආරම්භක කාලසටහනට අනුව, ව්‍යාපෘතියේ අවසන් දිනය 2020 ඔක්තෝබර් 25 වූ අතර විවිධ හේතූන් නිසා ප්‍රමාදය සැලකීමෙන් පසු 2021 මාර්තු 31 දක්වා දීර්ඝ කර තිබුණි. |

| | | | |
|---|---|---|---|
| | කාලීන අඩු පිරිවැය උත්පාදන සැලැස්මේ අරමුණු නිසි පරිදි ලගා කර ගත නො හැකි වේ. | | |
| (ඉ) | පද්ධති ප්‍රතික්‍රියාශීලි බලශක්ති කළමනාකරණය වැඩිදියුණු කිරීමේ සංරචකයේ අපේක්ෂිත භෞතික කාර්යසාධනය සියයට 87 විය. කෙසේවෙතත්, ළගාකර ගත් ප්‍රගතිය සියයට 82 වේ. ආරම්භක නිම කිරීමේ දිනය 2021 ජනවාරි වුවද, එය 2021 අප්‍රේල් වන විට නිම කිරීමට අපේක්ෂිත විය. | අනවශ්‍ය පිරිවැය වළක්වා ගැනීමට සැලසුම් කළ ආකාරයට කටයුතු නිම කළ යුතුය. | ජාත්‍යන්තර ගමන් මත පනවන ලද බාධා නිසා සුපරික්ෂකගේ නිරීක්ෂණයවල ප්‍රමාද වීමට හේතු විය. |

## 4.7 පියැසි මත සූර්ය බලශක්ති උත්පාදන ණයමාලා ව්‍යාපෘතිය

(i) පියැසි මත සූර්ය බලශක්ති උත්පාදන ණයමාලා ව්‍යාපෘතිය සහභාගීවන මූල්‍ය ආයතන හරහා ශ්‍රී ලංකාවේ සුදුසුකම්ලත් පියැසි සූර්ය පද්ධති සඳහා මූල්‍යකරණය කිරීම සඳහා ක්‍රියාත්මක වේ.

(ii) ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත පිරිවැය රු.මිලියන 7,550කට සමාන එජඩො මිලියන 50 ක් වන අතර ආසියානු සංවර්ධන බැංකුව විසින් මුළු මුදලම මූල්‍යකරණය කිරීමට එකඟ විය.

(iii) ව්‍යාපෘතියේ කටයුතු **2019** අප්‍රේල් 17 දින ආරම්භ කර තිබුණු අතර **202**1 දෙසැම්බර් **31** දින වන විට අවසන් කිරීමට නියමිතව තිබුණි.

(iv) විගණකාධිපති විසින් ව්‍යාපෘතිය සම්බන්ධයෙන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන මත 2018 සහ 2019 වර්ෂ සඳහා තත්ත්වාගණනය නොකළ මතයක් ප්‍රකාශ කර තිබුණි. කෙසේවෙතත්, මේ වනතෙක් නිරවුල් නොකරන ලද ව්‍යාපෘතියේ කාර්යසාධනය සම්බන්ධ ගැටළු කිහිපයක් පහත දැක්වේ.

| | විගණන නිරීක්ෂණ | විගණකාධිපතිගේ නිර්දේශ | ව්‍යාපෘතිය විසින් ගන්නා ලද වළක්වාලීමේ පියවර | වර්තමාන තත්ත්වය |
|---|---|---|---|---|
| (අ) | ව්‍යාපෘතිය සඳහා සමාලෝචිත වර්ෂය තුළ වාර්ෂික අයවැය මගින් රු. මිලියන 2,390ක් වෙන්කර තිබුණ ද, 2020 දෙසැම්බර් 31 දිනට ප්‍රතිපාදනවලින් සියයට 12.7ක් උපයෝජනය කර නොතිබුණි. | වෙන් කරන ලද අරමුදල් උපරිම මට්ටමින් උපයෝජනය කිරීම අවශ්‍ය වේ. | නිරීක්ෂණය සමඟ එකඟ වේ. තවද, මෙම ණය යෝජනා ක්‍රමය සඳහා පැවති ඉල්ලුමට COVID -19 වසංගත තත්ත්වය මගින් අහිතකර ලෙස බලපා තිබුණි. | 2021.12.31 නිමකිරීමේ දින වනවිට ව්‍යාපෘතිය විසින් මුළු ණය මුදල ලබා දී ඇත. |
| (ආ) | 2020 දෙසැම්බර් 31 දිනට ආසියානු සංවර්ධන බැංකුව මගින් රු. මිලියන 5,315.71 ක මුදලක් ලබා දී තිබුණද, රු. මිලියන 3,835,29ක් පමණක් උපයෝජනය කර තිබුණු අතර, 2020 වර්ෂය අවසානයේ දී උපයෝජනය නොකළ මුදලක් වශයෙන් රු.මිලියන 1,4804.16 ක් මහ බැංකු ගිණුමේ ඉතිරිව තිබුණි. | ලැබුණු අරමුදල් ප්‍රමාදයකින් තොරව භාවිතා කිරීම අවශ්‍ය වේ. | නිරීක්ෂණය සමඟ එකඟ වේ. තවද, මහ බැංකු ගිණුමට අරමුදල් ලැබුණු දින සිට ලැබුණු අරමුදල් සඳහා භාණ්ඩාගාරය වෙත පොළියක් ගෙවීමට PFIs බැඳී සිටී. | 2021.12.31 නිමකිරීමේ දින වනවිට ව්‍යාපෘතිය විසින් මුළු ණය මුදල ලබා දී ඇත. |

## 5. අධ්‍යාපන හා වෘත්තීය සංවර්ධන අංශය

### 5.1 නිපුණතා අංශ සංවර්ධන වැඩසටහන

(i) 2020 වර්ෂය වනවිට විදේශීය ශ්‍රම වෙළඳපල ඉල්ලුමට සරිලන පරිදි කාර්යක්ෂම නිපුණතා පාදක අධ්‍යාපන ක්‍රමයක් ගොඩනැගීම හා වෘත්තීය පුහුණුව සඳහා ගුණාත්මකභාවය,

අදාළත්වය, ප්‍රවේශය, පිළිගැනීම සහ උපකාරක ප්‍රතිපත්ති, පද්ධති සහ ව්‍යුහයන් වැඩිදියුණු කිරීම සඳහා නිපුණතා අංශ සංවර්ධන වැඩසටහන ක්‍රියාත්මක කෙරේ. වැඩසටහන් ක්‍රියාකාරකම්වල ප්‍රතිඵල මත පදනම් වූ ණය දිමේ ක්‍රමය යටතේ මෙය ක්‍රියාත්මක වේ.

(ii) ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත පිරිවැය ඇ.එ.ජ. ඩොලර් මිලියන 1,061ක් හෙවත් රු. මිලියන 141,524ක් වන අතර ඒ සඳහා පිළිවෙලින් ඇ.එ.ජ. ඩොලර් මිලියන 200ක් හෙවත් රු. මිලියන 28,708ක් හා ඇ.එ.ජ. ඩොලර් මිලියන 100ක් හෙවත් රු. මිලියන 13,100ක් ආසියානු සංවර්ධන බැංකුව සහ ජාත්‍යාන්තර සංවර්ධන සංගමය විසින් මූල්‍යායනය කිරීමට එකඟ වී ඇත.

(iii) 2014 සැප්තැම්බර් මස ව්‍යාපෘතියේ කටයුතු ආරම්භ කරන ලද අතර 2021 ජුනි 30 දින වනවිට අවසන් කිරීමට නියමිතව තිබුණි. කෙසේ වෙතත්, කොවිඩ්-19 බලපෑම හේතුවෙන් ව්‍යාපෘති කාලය 2022 ජුනි 30 දින දක්වා දීර්ඝ කර තිබුණි.

(iv) ව්‍යාපෘතිය සම්බන්ධයෙන් 2018,2019 හා 2020 වර්ෂ සඳහා ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන සඳහා විගණකාධිපති විසින් තත්ත්වාගණනය කළ මතයක් දක්වා තිබුණි. කෙසේවෙතත්, ව්‍යාපෘතියේ කාර්යසාධනය සම්බන්ධයෙන් මෙතෙක් විසඳී නොමැති ගැටළු කිහිපයක් පහත දැක්වේ.

| | විගණන නිරීක්ෂණය | විගණකාධිපති නිර්දේශ | ව්‍යාපෘතිය විසින් ගනු ලැබූ වැළැක්වීමේ ක්‍රියාමාර්ග | වර්තමාන තත්ත්වය |
|---|---|---|---|---|
| (අ) | වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මට අනුව, සමාලෝචිත වර්ෂය තුළ ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලය මගින් ඩිප්ලෝමා පාඨමාලා 07ක් පැවැත්වීමට අපේක්ෂා කරන ලද අතර සිසුන් 232ක් ඇතුළත් කරගැනීමට අපේක්ෂා කරන ලදී. කෙසේ වෙතත්, විශ්වවිද්‍යාලය විසින් රු. මිලයන 1.4ක පිරිවැය යටතේ ප්‍රසිද්ධ කරන ලද පුවත්පත් | වගකිව යුතු පාර්ශව පිළිබඳ සොයා බැලීමට කටයුතු කළ යුතුය. | ප්‍රතිචාර දක්වා නොමැත. | |

| | | | | |
|---|---|---|---|---|
| | දැන්වීමේ ඇතුළත් වැරදි තොරතුරු හේතුවෙන් අදාළ පාඨමාලා මෙතෙක් ආරම්භ කර නොතිබුණි. | | | |
| (ආ) | 2017 වර්ෂයේදී දඹුල්ල හා රත්මලාන කාර්මික විද්‍යාල මගින් පවත්වනු ලැබූ මෝටර් සයිකල් හා ස්කූටර් අලුත්වැඩියා ඩිප්ලෝමාව සඳහා පුහුණු උපකරණ ලබාගැනීම වෙනුවෙන් රු. මිලියන 2.5ක් වැයකර තිබුණද, 2019 අප්‍රේල් 30 දින දක්වා එම කටයුතු අවසන් කර නොතිබුණි. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ මාලාවට අනුව පුහුණුව තුළින් අපේක්ෂිත ගුණාත්මකභාවය සහතික කිරීම සඳහා උපකරණ මිලදී ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. | කාර්යසාධන බැඳුම්කර ඉදිරිපත් නොකිරීම හේතුවෙන් 2017 ජූලි 09 දිනැති ඇණවුම අවලංගු කර ඇත. | පුහුණු උපකරණ මිලදී ගෙන නොතිබුණි. |
| (ඇ) | 2017 මාර්තු 15 දිනැති පරිපූරක අංක 33 අනුව ප්‍රසම්පාදන මාර්ගෝපදේශ 2006 මාර්ගෝපදේශ 2.14.1 සහ 4.4.2ට පටහැනිව දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව විසින් ජාතික තරඟකාරී ලංසු තැබීමේ ක්‍රමය භාවිතා කිරීම වෙනුවට ප්‍රාදේශීය ප්‍රසම්පාදන කමිටුව විසින් ප්‍රසම්පාදන ක්‍රමවේදයේ සාප්පු ක්‍රමය භාවිතා කරමින් ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු අධිකාරිය විසින් කටුනායක ඉංජිනේරු ආයතනය සඳහා රු. මිලියන 100ක වටිනාකමින් යුත් පුහුණු උපකරණ මිලදී ගෙන තිබුණි. | ලංසු තැබීමේ ක්‍රියාවලියේ තරඟකාරී බව සහතික කිරීම සඳහා රජයේ ප්‍රසම්පාදන ක්‍රියා පටිපාටි අනුගමනය කළ යුතුය. | ප්‍රතිචාර දක්වා නොමැත. | මෙම ගැටලු නිවැරදි කිරීමට අවශ්‍ය පියවර ගෙන නොතිබුණි. |
| (ඈ) | රසායනාගාර ගොඩනැගිල්ලේ යටිතල පහසුකම් නොමැතිවීම හේතුවෙන් 2015 වර්ෂයේදී | සිසුන්ට මෙම උපකරණ භාවිතා කළ හැකි පරිදි | විද්‍යාගාරයේ ඉදිකිරීම් කටයුතු ප්‍රමාදවීම මෙම | සිසුන් එම ක්ෂේත්‍රය සම්බන්ධයෙන් |

| | | | | |
|---|---|---|---|---|
| | රත්මලාන විශ්වවිද්‍යාල විද්‍යායතනයේ ආහාර තාක්ෂණ ඩිප්ලෝමා පාඨමාලාව හදාරන සිසුන්ගේ භාවිතය සඳහා රු. මිලියන 7ක පිරිවැය වූ රසායනාගාර උපකරණ භාවිතයට ගෙන නොතිබුණි. | විද්‍යාගාරයේ ඉදිකිරීම් කටයුතු කඩිනමින් අවසන් කිරීමට ක්‍රියා කළ යුතුය. | තත්ත්වය ඇතිවීමට ප්‍රධාන වශයෙන් හේතු වී ඇත. | දැනුම ලබා නොගෙන පුහුණු පාඨමාලා හදාරනු ලබයි. |
| (ඉ) | බටංගල විශ්වවිද්‍යාල විද්‍යායතනය විසින් සේවක අර්ථ සාධක අරමුදලට හා සේවක භාරකාර අරමුදලට අධිභාර ගෙවීම් වශයෙන් රු. 886,801ක මුදලක් අරමුදල තුළින් ගෙවා තිබුණි. | ව්‍යාපෘති අරමුදල් අපේක්ෂිත කාර්යය සඳහා යෙදවිය යුතුය. | පිළිගන්නා ලදී. | මෙතෙක් නිවැරදි කර නොමැත. |
| (ඊ) | ජාතික තරුණ සේවා සභාවේ විස්තරාත්මක ක්‍රියාකාරකම් සැලැස්මට අනුව අවශ්‍යතා සහිත අභ්‍යාසලාභීන් සඳහා 2014 වර්ෂයේ සිට 2020 වර්ෂය දක්වා කාලය සඳහා රු. මිලියන 4.8ක් හා වාර්ෂිකව රු. මිලියන 33.6ක් වෙන් කර තිබුණි. කෙසේ වෙතත්, 2019 දෙසැම්බර් 31 දින වනවිට ද මෙම වැඩසටහන ක්‍රියාත්මක කිරීමට කිසිඳු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. | වැඩසටහනට අදාළ මුදල් භාවිතා කරමින් මෙම ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කළ යුතුය. | 2014-2020 කාලසීමාව සඳහා වෘත්තීය අධ්‍යාපන හා තාක්ෂණ අංශයේ ක්‍රියාකාරී සැලැස්මට අනුව අවශ්‍යතා සහිත අභ්‍යාසලාභීන් සඳහා දීමනා ගෙවීමක් පිළිබිඹු වුවද, 2014-2020 කාලපරිච්ඡේදය සඳහා නිපුණතා අංශ සංවර්ධන වැඩසටහන් සැලැස්මට අනුව ජාතික තරුණ සේවා සභාවේ අවශ්‍යතා සහිත | මෙම ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කර නොතිබුණි.. |

| | | | | |
|---|---|---|---|---|
| | | | අභ්‍යාසලාභීන් සඳහා වන දීමනා වෙනුවෙන් අරමුදල් සැපයීමට නිපුණතා අංශයේ සංවර්ධන වැඩසටහන මගින් ක්‍රියා කර නෙමැත. | |
| (උ) | ජතික තරුණ සේවා සභාවේ විස්තරාත්මක ක්‍රියාකාරී සැලැස්මට අනුව පාඨමාලා ගාස්තු අයකිරීමේ ප්‍රතිපත්තියක් සකස් කිරීමට අදහස් කර තිබුණි. කෙසේ වෙතත්, සමාලෝචිත වර්ෂය අවසන් වන තෙක්ම සභාවට ප්‍රතිපත්තියක් සකස් කිරීමට නොහැකි වී තිබුණු අතර එහි පුහුණු මධ්‍යස්ථානවල පවත්වනු ලබන එම පුහුණු පාඨමාලා සඳහා විවිධ ගාස්තු අයකර තිබුණි. | පද්ධතිය විධිමත් කිරීමට අවශ්‍ය පියවර ගත යුතුය. | ජාතික තරුණ සේවා සභාවේ පූර්ණ කාලීන , අර්ධ කාලීන හා කෙටි කාලීන පාඨමාලා ගාස්තු 2020 වර්ෂයේ දෙවන අධ්‍යයන වාරයේ සිට විධිමත් කිරීමට කටයුතු කෙරේ. | පාඨමාලා ගාස්තු වෙනස් කිරීම පිළිබඳව ප්‍රතිපත්තියක් හඳුන්වා දී නොතිබුණි. |
| (ඌ) | ජතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු අධිකාරියේ හැව්ලොක් නගර කාර්යාලය ඉදිකිරීමේ ඇස්තමේන්තුගත පිරිවැය වූ රු. මිලියන 9.7ක් 2016 වර්ෂයේ දෙසැම්බර් මස මෙම අරමුදල් යටතේ සිදුකිරීමට එකඟ වී තිබුණි. අපේක්ෂිත ප්‍රගතිය පෙන්නුම් නොකිරීම හේතුවෙන් ව්‍යාපෘති කාර්යාලය විසින් මුදල් ලබාදීම ප්‍රතික්ෂේප කර ඇති අතර පසුව කොන්ත්‍රාත්කරුගේ ඉදිකිරීම් | ඉදිකිරීම් ප්‍රමාදයට වගකිව යුතු නිලධාරීන්ට එරෙහිව පියවර ගත යුතුය. | ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය විසින් ඉදිකිරීම් ප්‍රමාදවීම සඳහා බලපාන ලද විවිධ හේතු සඳහන් කර ඇත. | ඉදිකිරීම් කටයුතු අවසන් කර නොමැත. |

| | | | | |
|---|---|---|---|---|
| | කටයුතු 2018 සැප්තැම්බර් 26 දින සිට අත්හිටුවා තිබුණි. එහි ප්‍රතිඵලයක් වශයෙන් ජාතික ආධුනිකත්ව හා පුහුණු කිරීමේ අධිකාරිය විසින් දේශීය මුදල් යොදවා වෙනත් කොන්ත්‍රාත්කරුවෙකුට කොන්ත්‍රාත්තුව ලබාදී තිබුණි. | | | |
| (එ) | වෘත්තීය පුහුණු අධිකාරියේ විස්තරාත්මක ක්‍රියාකාරී සැලැස්මට අනුව පුහුණු මධ්‍යස්ථාන 20ක් ඉදිකිරීමට අපේක්ෂිත අතර ඒ සඳහා ඇස්තමේන්තුගත මුදල රු . මිලියන 3,495කි. කෙසේ වෙතත්, සමලෝචිත වර්ෂය අවසන් වනවිට පුහුණු මධ්‍යස්ථාන 14ක කටයුතු ආරම්භ කර නොතිබුණි. තවද, පුහුණු මධ්‍යස්ථාන 6ක ඉදිකිරීම් කටයුතු ආරම්භ කරන ලද අතර ඉන් පුහුණු මධ්‍යස්ථාන 4ක ඉදිකිරීම් කටයුතු සමාලෝචිත වර්ෂය අවසන් වන විටද නිම කර නොතිබුණි. සමාලෝචිත වර්ෂය අවසන් වනවිට එහි භෞතික ප්‍රගතිය සියයට 30කි. ඊට අමතරව, පුහුණු මධ්‍යස්ථාන 90ක් නවීකරණය කිරීමට අපේක්ෂා කරන ලද අතර ඒ සඳහා ඇස්තමේන්තුගත මුදල රු. මිලියන 3,935ක් විය. කෙසේ වෙතත්, පුහුණු මධ්‍යස්ථාන 27ක නවීකරණ කටයුතු සඳහා රු. මිලියන 857ක් දරා තිබූ අතර සියයට 31ක ප්‍රගතියක් ළඟා | ඉදිකිරීම් හා නවීකරණ කටයුතු සඳහා හඳුනාගෙන ඇති පුහුණු මධ්‍යස්ථානවල ඉදිකිරීම් කාර්යයන් කඩිනම් කිරීම සඳහා විශේෂ අවධානය යොමු කළ යුතුය. | වෘත්තීය පුහුණු අධිකාරියේ කළමනාකරිත්ව ය විගණන නිරීක්ෂණ සමඟ එකඟ වේ. ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරියේ ක්‍රියාකාරී සැලැස්මට අනුව නව පුහුණු මධ්‍යස්ථාන 20ක් ඉදිකිරීමට සැගැසුම් කර තිබුණද, මහා භාණ්ඩාගාරය විසින් අරමුදල් සීමිතව මුදා හැරීම හේතුවෙන් මධ්‍යස්ථාන 7ක් පමණක් ආරම්භ කරන ලදී. මධ්‍යස්ථාන 07ක වැඩ කටයුතු වලින් | ව්‍යාපෘතියේ අපේක්ෂිත ඉලක්ක සපුරා ගෙන නොමැත. |

| | | | | |
|---|---|---|---|---|
| | කරගෙන තිබුණි. | | මධ්‍යස්ථාන 04ක කටයුතු අවසන් කර ඇත. | |
| (ඒ) | වර්ෂ 2014-2020 කාලසීමාව සඳහා වෘත්තීය පුහුණු අධිකාරියේ විස්තරාත්මක ක්‍රියාකාරී සැලැස්මට අනුව සමාලෝචිත වර්ෂය තුළ පුහුණු මධ්‍යස්ථාන 20ක් තුළ අභ්‍යාසලාභීන් 15,000ක් පුහුණු කිරීමට අපේක්ෂා කරන ලදී. කෙසේ වෙතත්, සමාලෝචිත වර්ෂයේ පළමු අර්ධ වර්ෂය තුළ පුහුණුව ලබා ඇත්තේ අභ්‍යාසලාභීන් 586ක් පමණි. | යටිතල පහසුකම් සංවර්ධනය කර පුහුණුව ලබාදීමේ හැකියාවන් වැඩි දියුණු කිරීම සඳහා අවශ්‍ය ක්‍රියා මාර්ග ගත යුතුය. | මහා භාණ්ඩාගාරය විසින් සීමිත අරමුදල් ප්‍රමාණයක් නිකුත් කිරීම හේතුවෙන් පුහුණු මධ්‍යස්ථාන ඉදිකිරීම සීමා වූ අතර අලුත්වැඩියා කිරීමේ හා මධ්‍යස්ථාන වැඩිදියුණු කිරීමේ ප්‍රගතිය ඒ හේතුවෙන් දුර්වල විය. | ව්‍යාපෘතියේ ඉලක්ක සපුරා ගැනීමට නොහැකි වී ඇත. |
| (ඒ) | ලැබී ඇති තොරතුරුවලට අනුව, ආසියානු සංවර්ධන බැංකුවේ ණය මුදල් යටතේ ක්‍රියාත්මක කිරීමට නියමිත විය පැහැදම් දර්ශක 9ක් යටතේ ක්‍රියාකාරකම් 51කින් ක්‍රියාකාරකම් 18ක ඉලක්ක සමාලෝචිත වර්ෂය අවසන් වනවිටත් අවසන් කර නොතිබුණි. | ආසියානු සංවර්ධන බැංකුවේ ණය ගිවිසුම යටතේ විය පැහැදම් දර්ශක ක්‍රියාකාරකම්වල ඉලක්ක සපුරා ගැනීමට කළමනාකාරිත්වය විසින් අවශ්‍ය පියවර ගත යුතුය. | ආසියානු සංවර්ධන බැංකුවේ ණය ගිවිසුම අනුව සියලුම විය පැහැදම් දර්ශකයන්ගේ ඉලක්කය සපුරාගැනීම 2021 ජුනි 30 දින දක්වා ප්‍රමාද විය. ප්‍රධාන වශයෙන් කොවිඩ් 19 | ව්‍යාපෘතියේ අපේක්ෂිත ඉලක්කය සපුරා ගෙන නොමැත. |

| | | | | |
|---|---|---|---|---|
| | | | වසංගත තත්ත්වය හේතුවෙන් පුහුණු මධ්‍යස්ථාන හා කර්මාන්ත වසා දැමීමට හා අර්ධ වශයෙන් ක්‍රියාත්මක කිරීමට සිදුවිය. | |
| (ඔ) | ආසියානු සංවර්ධන බැංකුවේ අංක 3650 හා අංක 3651 දරන ණය ගිවිසුම් අනුව ඇ.එ.ජ. ඩොලර් මිලියන 100ක් සමාලෝචිත වර්ෂය අවසන් වනවිට ලබාදීමට ඉලක්ක කර තිබුණි. කෙසේ වෙතත්, ඉන් ඇ.එ.ජ. ඩොලර් මිලියන 36ක් ලබාදී නොතිබුණි. | මුදල් පරිහරණයේ අකාර්යක්ෂමතාවයක් පෙන්නුම් කරන බැවින් ව්‍යාපෘතියේ අපේක්ෂිත ඉලක්ක සපුරා ගැනීමට කළමනාකාරිත්වය විසින් අවශ්‍ය පියවර ගත යුතුය. | ආසියානු සංවර්ධන බැංකුවේ ණය ගිවිසුම අනුව 2021 දෙසැම්බර් 31 දින වනවිට ඇ.එ.ජ. ඩොලර් මිලියන 100ක් වැය කිරීමට නියමිතය. | ව්‍යාපෘතියේ අපේක්ෂිත ඉලක්කය සපුරා ගෙන නොමැත. |
| (ඕ) | කොන්ත්‍රාත්කරු විසින් කාර්යය නිම කිරීම හේතුවෙන් 2018 අගෝස්තු මස සිට ජාතික තරුණ සේවා සභාවේ නිපුණතා අංශයේ සංවර්ධන අරමුදල යටතේ රු. මිලියන 84ක මුදලක් ගෙවීම අත්හිටුවා තිබුණි. | ඉදිකිරීම් කටයුතු කඩනමින් අවසන් කිරීම සඳහා අවශ්‍ය පියවර ගත යුතුය. | දඹුල්ල හා ත්‍රිකුණාමලය පුහුණු මධ්‍යස්ථානවල ප්‍රතිසංස්කරණ කටයුතු වැඩිදියුණු කිරීමේ කොන්ත්‍රාත්තු අවසන් කර නොමැත. | මේ වනවිට මෙම කොන්ත්‍රාත්තු දෙක වෙනත් කොන්ත්‍රාත්කරුවෙකු වෙත ලබාදී නොමැති අතර කොන්ත්‍රාත්කරු පසු ලේඛනගත කර නොමැත. |
| (ඖ) | කාර්යසාධන වාර්තාවට අනුව ජාතික ආධුනිකත්ව හා පුහුණු | ඉදිකිරීම් හා නවීකරණය සඳහා | අදහස් දක්වා නොමැත. | ව්‍යාපෘතියේ අපේක්ෂිත |

| | | | | |
|---|---|---|---|---|
| | කිරීමේ අධිකාරියේ පුහුණු මධ්‍යස්ථාන 4ක වැඩිදියුණු කිරීමේ කටයුතු 2019 නොවැම්බර් මාසය වනවිට අවසන් කිරීමට නියමිතව තිබුණි. කෙසේ වෙතත්, සමාලෝචිත වර්ෂය අවසන් වනවිටත් වැඩිදියුණු කිරීමේ ක්‍රියාමාර්ග ආරම්භ කර නොතිබුණි. ජාතික සැලසුම් දෙපාර්තමේන්තුව විසින් ව්‍යාපෘති යෝජනාව අනුමත කර නොතිබුණි. | හඳුනාගෙන ඇති පුහුණු මධ්‍යස්ථානවල වැඩ කටයුතු අවසන් කිරීම සඳහා කඩිනමින් අවධානය යොමුකළ යුතුය. | | ඉලක්කය සපුරා ගෙන නොමැත. |
| (ක) | රත්මලාන ප්‍රදේශයේ නව ගොඩනැගිල්ලක් ඉදිකිරීම සඳහා 2014 අගෝස්තු 5 වන දින අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී තිබුණද, සමාලෝචිත වර්ෂය තුළ ඉදිකිරීම් කටයුතු ආරම්භ කර නොතිබුණි. ප්‍රමාද කාලය වර්ෂ 5කට අධික වූ අතර ඒ සඳහා වැයකර තිබූ මුදල රු. මිලියන 200කි. 2019 වර්ෂයේදී වැඩසටහන අවසන් කිරීමට නියමිතව තිබූ අතර 2020 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ භෞතික ප්‍රගතිය සියයට 60ක් විය. | ඉදිකිරීම කටයුතු කඩිනම් කිරීම සඳහා කළමනාකාරිත්වයේ අවධානය යොමු කළ යුතුය. | රත්මලාන වෘත්තීය පුහුණු අධිකාරියේ ගොඩනැගිල්ලක් ඉදිකිරීමේ කටයුතු බුබුළු සංකල්පය යටතේ සෙමින් සිදුවන නමුත් එහි ප්‍රගතිය සමස්ත විෂය පථයෙන් සියයට 95කි. ඉතිරි වැඩ 2021 ඔක්තෝබර් මාසයේදී අවසන් වේ. | ඉදිකිරීම් කටයුතු අවසන් කර නොමැත. |
| (ග) | ජාතික තරුණ සේවා සභාවේ වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මට අනුව රැකියා විශේෂිත කුසලතා සහ කර්මාන්ත අවශ්‍යතා අපේක්ෂා කරන සිසුන්ට බහුවිධ ප්‍රවේශය හා | අපේක්ෂිත ප්‍රතිඵල ලබාගැනීම සඳහා කටයුතු කළ යුතුය. | පුහුණු මධ්‍යස්ථාන දැනුවත් කර පාඨමාලා ආරම්භ කිරීමට උපදෙස් | ව්‍යාපෘතියේ අපේක්ෂිත ඉලක්කය සපුරා ගෙන නොමැත. |

| | | | | |
|---|---|---|---|---|
| | පිටවීම සක්‍රීය කිරීම සඳහා නම්‍යශීලී වූ බෙදාහැරීම් ප්‍රවර්ධනය වෙනුවෙන් රු. මිලියන 1ක් වෙන්කර තිබුණි. කෙසේ වෙතත්, ප්‍රගති වාර්තාව අනුව එම කටයුතු කිසිවක් සිදු නොවී තිබුණි. | | ලබාදුන් අතර කොවිඩ් 19 වසංගත තත්ත්වය හේතුවෙන් සිසුන් සහභාගී නොවීම නිසා පුහුණු වැඩසටහන් සාර්ථක නොවුණි. | |
| (ග) | ජාතික තරුණ සේවා සභාවේ වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මට අනුව උතුරු මැද හා ඌව පළාත්වල පුහුණු මධ්‍යස්ථාන හතරක පුහුණු පාඨමාලා පහක් සඳහා අමතර භෞතික සම්පත් හා කණ්ඩායම් හඳුනාගැනීම සඳහා රු. මිලියන 4ක් වෙන්කර තිබුණි. කෙසේ වෙතත්, සමාලෝචිත වර්ෂය තුළදී භෞතික සම්පත් හා කණ්ඩායම් හඳුනාගෙන නොතිබුණි. | අදාළ පාඨමාලා ආරම්භ කිරීමට කඩිනමින් පියවර ගත යුතුය. | මොණරාගල හොරොව්පතාන ඕරුබැදිවැව සහ උලපනේ පුහුණු මධ්‍යස්ථානය - ඉදිකිරීම් කටයුතු හේතුවෙන් එම උපකරණ ලබාගැනීමට නොහැකි විය. | ව්‍යාපෘතියේ අපේක්ෂිත ඉලක්කය සපුරා ගෙන නොමැත. |
| (ඝ) | ලංකා ජර්මානු කාර්මික අභ්‍යාස ආයතනය විසින් නිපුණතා අංශ ප්‍රතිපාදන වැඩසටහන යටතේ කොන්ත්‍රාත් වටිනාකම රු. මිලියන 757ක් වන කාර්යය 2020 ඔක්තෝබර් 30 දින අවසන් කිරීමට නියමිතව තිබුණු අතර සමාලෝචිත වර්ෂය අවසාන වනවිට එහි ප්‍රගතිය සියයට 65ක් විය. | ඉදිකිරීම්කරු වෙත පවරා ඇති කාර්යය අඛණ්ඩව අධීක්ෂණය කිරීම කෙරෙහි අවධානය යොමු කළ යුතුය. | ජීව බුබුළු සංකල්පය යටතේ ශිෂ්‍ය නේවාසිකාගාර ගොඩනැගිල්ල ඉදිකිරීමේ භෞතික ප්‍රගතිය දැනට සියයට 70කි. | ඉදිකිරීම් කටයුතු අවසන් කර නොමැත. |

| | | | | |
|---|---|---|---|---|
| (න) | තත්ත්ව කළමනාකරණ පද්ධතිය තවදුරටත් වැඩිදියුණු කිරීම සඳහා 2017 වර්ෂයේදී තත්ත්ව වැඩිදියුණු කිරීමේ පද්ධති හඳුන්වා දී තිබුණි. ලංකා ජර්මානු කාර්මික පුහුණු ආයතනය විසින් සමාලෝචිත වර්ෂය අවසන් වන තෙක් පද්ධති ස්ථාපනය සිදුකර තත්ත්ව සහතිකය ලබාගැනීමට කටයුතු කර නොතිබුණි. | අපේක්ෂිත ඉලක්ක සපුරා ගැනීම සඳහා කළමනාකාරිත්වය විසින් අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. | කාර්ය මණ්ඩල ඌනතාවය හේතුවෙන් අභ්‍යන්තර සිසුන් පුහුණු කිරීම සඳහා පුහුණුව සපයන්නන් පූර්ණ කාලීනව සිටින අතර තත්ත්ව වැඩිදියුණු කිරීමේ පද්ධතිය දිගුකාලීන සංකල්පයක් වන බැවින් එය ක්‍රමයෙන් හඳුන්වා දිය යුතුය. | ව්‍යාපෘතියේ අපේක්ෂිත ඉලක්ක සපුරා ගැනීමට නොහැකි වී තිබුණි. |
| (ත) | සමාලෝචිත වර්ෂය තුළ සේවක පුහුණු වැඩසටහන් සඳහා රු. මිලියන 69.43ක් වෙන් කර තිබූ අතර 2020 වර්ෂය සඳහා පුහුණු ගිවිසුම් අත්සන් කර නොතිබුණි. ඉලක්කගත පරිදි අතිරේක අභ්‍යාසලාභීන් 2000ක් බඳවා ගැනීමට කොන්ත්‍රාත් ලබාදී නොතිබුණි. | වැඩසටහනේ ඉලක්ක සපුරා ගැනීම සඳහා කළමනාකරණය විසින් අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. | 2020 වර්ෂය තුළදී කොන්ත්‍රාත්තු 2000ක් ප්‍රදානය කිරීමට මුලින් සැලසුම් කර තිබුණි. එහෙත් කොවිඩ් 19 වසංගතයේ බලපෑම සමඟ රට මාස 3ක් සඳහා වසා තිබුණි. | ව්‍යාපෘතියේ ඉලක්කගත අරමුණු ඉටුකරගැනීමට නොහැකි වී තිබුණි. |
| (ථ) | කර්මාන්ත ආයතනවල සේවය කරන කාර්ය මණ්ඩලයේ කුසලතා | අපේක්ෂිත නිමවුම් ප්‍රතිඵලය ලබාගැනීම | කොවිඩ් 19 වසංගතය | ව්‍යාපෘතියේ ඉලක්ක සපුරා |

| | | | |
|---|---|---|---|
| වැඩිදියුණු කිරීම සහ සහතික ලත් අයගේ කුසලතා පරතරය අවම කිරීමේ අරමුණින් නම්‍යශීලී පුහුණු වැඩසටහන් සඳහා සමාලෝචිත වර්ෂය තුළදී රු. මිලියන 13,889ක් වෙන් කර තිබුණි. කෙසේ වෙතත් එයින් රු. මිලියන 0.0195ක් වැය කර ඇති අතර කාර්මික අංශයේ නම්‍යශීලී පුහුණු වැඩසටහන් සඳහා කුසලතා වැඩිදියුණු කිරීමට අවම වශයෙන් අතිරේක සේවකයන් 2000ක් වූ ඉලක්ක ගත ප්‍රමාණයසපුරා ගැනීමට නොහැකි වී තිබුණි. | සඳහා කටයුතු කළ යුතුය. | හේතුවෙන් කර්මාන්තයට ඇති සෘණාත්මක බලපෑම සහ පුහුණු සපයන්නන්ගේ (රාජ්‍ය හා පෞද්ගලික) අවම වීම ඉලක්ක ළඟා කරගැනීම ප්‍රමාද වීමට ප්‍රධාන වශයෙන් හේතු විය. | ගැනීමට නොහැකි වී ඇත. |

## 5.2 ශ්‍රී ලංකාවේ වෘත්තීය අධ්‍යාපන හා තාක්ෂණ අංශය සඳහා පෞද්ගලික අංශයේ හා කාන්තා සවිබල ගැන්වීමේ නව්‍ය ප්‍රවේශය

(i) ශ්‍රී ලංකාවේ වෘත්තීය අධ්‍යාපන හා තාක්ෂණ අංශය සඳහා පෞද්ගලික අංශය හා කාන්තා සවිබල ගැන්වීම සඳහා නව්‍ය ප්‍රවේශයන් ඉදිරිපත් කිරීම, කාන්තා ශ්‍රම බලකායේ සහභාගිත්වය වැඩි කිරීම හා වෘත්තීය අධ්‍යාපන හා තාක්ෂණ අංශය තුළින් කාන්තා ආර්ථික සවිබල ගැන්වීම සඳහා ක්‍රියාත්මක කෙරේ.

(ii) ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත වියදම රු. මිලියන 534ක් හෙවත් ඇ.එ.ජ. ඩොලර් 03ක් වන අතර, දරිද්‍රතාවය අවම කිරීම සඳහා වූ ජපන් අරමුදල මගින් ප්‍රදානයක් ලෙස එය මූල්‍යයනය කිරීමට එකඟ වී ඇත.

(iii) 2018 අගෝස්තු 31දින ව්‍යාපෘතියේ කටයුතු ආරම්භ කර ඇති අතර 2021 මාර්තු 31 දින අවසන් කිරීමට නියමිතව තිබුණි.  කෙසේ වෙතත්, කොවිඩ් 19 බලපෑම හේතුවෙන් ව්‍යාපෘති කාලය 2022 ජූනි 30 දක්වා දීර්ඝ කර ඇත.

(iv) ව්‍යාපෘතිය සම්බන්ධයෙන් 2019 හා 2020 වර්ෂ සඳහා ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන සඳහා විගණකාධිපති විසින් තත්ත්වාගණනය කළ මතයක් දක්වා තිබුණි. කෙසේවෙතත්, ව්‍යාපෘතියේ කාර්යසාධනය සම්බන්ධයෙන් මෙතෙක් විසඳී නොමැති ගැටළු කිහිපයක් පහත දැක්වේ.

| | විගණන නිරීක්ෂණය | විගණකාධිපති නිර්දේශ | ව්‍යාපෘතිය විසින් ගනු ලැබූ වැළැක්වීමේ ක්‍රියාමාර්ග | වර්තමාන තත්ත්වය |
|---|---|---|---|---|
| (අ) | වැඩසටහනේ විස්තරාත්මක ක්‍රියාකාරී සැලැස්මට අනුව, මෙම වැඩසටහනේ අපේක්ෂිත නිමවුම් 04ක් යටතේ ක්‍රියාකාරකම් 19ක් ක්‍රියාත්මක කිරීමට බලාපොරොත්තු වූ අතර ඒ සඳහා ඇස්තමේන්තුගත මුදල ඇ.එ.ජ. ඩොලර් 462,060කි. කෙසේ වෙතත්, ක්‍රියාකාරකම් 07ක් පමණක් ක්‍රියාත්මක කර ඇති අතර ඒ සඳහා වසර අවසානයේදී ඇ.එ.ජ. ඩොලර් 31,823ක මුදලක් වැය වී තිබුණි. | වැඩසටහනේ කාලසීමාවෙන් අඩකට වඩා දැනටමත් අවසන් කර ඇත බැවින් වැඩසටහනේ අපේක්ෂිත ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කිරීම සඳහා කඩිනමින් කටයුතු කළ යුතුය. | ව්‍යාපෘති කාලසීමාව අවසන් වීමට පෙර සියලුම ක්‍රියාකාරකම් ආවරණය කිරීමට අමාත්‍යාංශය ක්‍රියාකාරී සැලැසුමක් ආරම්භ කර ඇත. | ව්‍යාපෘතියේ අපේක්ෂිත අරමුණු ඉටු වී නොතිබුණි. |
| (ආ) | මෙම වැඩසටහනේ ප්‍රධාන අරමුණ ශ්‍රී ලංකාවේ තෘතියික හා වෘත්තීය අධ්‍යාපන පුහුණු අංශයේ කාන්තාවන් සවිබල ගැන්වීමයි. වැඩසටහනේ අරමුණ සාර්ථක කරගැනීම සඳහා සමාලෝචිත කාල පරිච්ඡේදය තුළ පුහුණුකරුවන් 6,524 දෙනෙකුගේ සහභාගිත්වයෙන් | වැඩසටහනේ අරමුණ ඉටුකරගැනීම කෙරෙහි අවධානය යොමු කළ යුතුය. | සටහන් කරගන්නා ලදී. | ව්‍යාපෘතියේ අපේක්ෂිත අරමුණු ඉටුවී නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| | පුහුණු මධ්‍යස්ථාන 84කදී පුහුණු වැඩසටහන් 226ක් පවත්වා තිබුණි. එම පුහුණු වැඩසටහන් සඳහා සහභාගී වී තිබුණේ සමස්ත සහභාගීවන්නන්ගෙන් සියයට 24ක් නියෝජනය කරමින් කාන්තාවන් 1,543ක් පමණි. තවද, පවත්වන ලද වැඩසටහන් 226න් පුහුණු වැඩසටහන් 110ක් තනි කාන්තා සහභාගිත්වයකින් තොරව පවත්වා ඇති බව නිරීක්ෂණය විය. | | | |
| (ඇ) | 2019 අප්‍රේල් 9 දිනැති වැඩසටහනේ ආරම්භක වාර්තාවට අනුව බස්නාහිර, උතුර, වයඹ, ඌව හා සබරගමුව යන පළාත් 5 තුළ ව්‍යාපෘති ක්‍රියාකාරකම් ආරම්භ කර ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර තිබුණි. කෙසේ වෙතත්, වර්ෂය තුළ පුහුණු වැඩසටහන් පවත්වා තිබුණේ වයඹ හා උතුරු පළාත්වල පමණි. | අපේක්ෂිත ඉලක්ක ළඟා කරගැනීම සඳහා කළමනාකරණය විසින් අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. | බස්නාහිර පළාත තුළ දරිද්‍රතා සමීක්ෂණය සඳහා 2020 ජූනි සිට ජූලි දක්වා කාලය තුළ සිදුකරන ලදී. | ව්‍යාපෘතියේ අපේක්ෂිත අරමුණු ඉටුවී නොතිබුණි. |
| (ඇ) | වර්ෂ 2018-2020 කාලපරිච්ඡේදය සඳහා විස්තරාත්මක ක්‍රියාකාරි සැලැසුමට අනුව මෙම වැඩසටහන යටතේ ප්‍රධාන ඉලක්කගත කාර්යයන් 24ක් යටතේ උප ඉලක්කගත ක්‍රියාකාරකම් 110ක් ක්‍රියාත්මක කිරීමට අපේක්ෂා කර තිබුණි. | අපේක්ෂිත ඉලක්ක ළඟා කරගැනීම සඳහා කළමනාකරණය විසින් අවශ්‍ය කටයුතු සිදුකළ යුතුය. | රට තුළ පැවති නොවැළැක්විය හැකි ඇතැම් තත්ත්වයන් හේතුවෙන් වැඩසටහන ක්‍රියාත්මක කිරීමට නොහැකි විය. | ව්‍යාපෘතිය තුළින් අපේක්ෂිත ඉලක්ක ළඟා කරගෙන නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| | කෙසේ වෙතත්, ප්‍රධාන ඉලක්ක 17ක් යටතේ උප ඉලක්ක 48ක් අපේක්ෂා කළ පරිදි ළඟා කරගෙන නොතිබුණි. | | | |
| (ඉ) | වැඩසටහනේ විස්තරාත්මක ප්‍රගති වාර්තාවට අනුව සංරචක 23ක් සඳහා අයවැයෙන් වෙන් කර ඇත ප්‍රතිපාදන ඇ.එ.ජ. ඩොලර් 2,253,620ක් වූ අතර එයින් සමාලෝචිත වර්ෂය අවසන් වනවිට වැය කර ඇති ප්‍රමාණය ඇ.එ.ජ. ඩොලර් 74,542ක් පමණි. | අපේක්ෂිත ඉලක්ක ළඟා කරගැනීම සඳහා කළමනාකරණය විසින් අවශ්‍ය කටයුතු සිදුකළ යුතුය. | රට තුළ පැවති නොවැළැක්විය හැකි ඇතැම් තත්ත්වයන් හේතුවෙන් වැඩසටහන ක්‍රියාත්මක කිරීමට නොහැකි විය. | ව්‍යාපෘතිය තුළින් අපේක්ෂිත ඉලක්ක ළඟා කරගෙන නොතිබුණි. |
| (ඊ) | ජාත්‍යන්තර සැලසුම් ආයතනය විසින් කාර්මික නිපුණතා අංශයේ උපාය මාර්ග සංවර්ධනය හා පහසුකම් සැලසීම සඳහා වූ මෙහෙයුම් සැලැස්ම සකස් කිරීමේ තක්සේරුව සඳහා ලංසු කැඳවා තිබූ අතර ඒ සඳහා රු. 3,079,125ක් වශයෙන් සිව්වන අවම ලංසුව ඉදිරිපත් කළ කාර්මික සේවා කාර්යාංශය තෝරාගෙන තිබුණි. අවම ලංසු ලද ආයතනය හා තෝරාගත් ආයතනයේ ලංසුව අතර රු. 967,125ක වෙනසක් නිරීක්ෂණය විය. කාර්මික සේවා කාර්යාංශය තෝරාගැනීම සඳහා ප්‍රධාන වශයෙන් තාක්ෂණික ධාරිතාව, උපදේශක පැතිකඩ හා අයවැය යන කරුණු ප්‍රධාන වශයෙන් පදනම් වූ බව ප්‍රකාශ | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අනුගමනය කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. | කාර්මික සේවා කාර්යාංශය තෝරා ගන්නා ලද්දේ තරඟකාරී ලංසු ප්‍රසම්පාදන ක්‍රමයක් අනුගමනය කිරීමෙන් සහ සම්මුඛ පරීක්ෂණ ක්‍රියාවලියක් හා තාක්ෂණික ඇගයීමක් මගිනි. අදාළ ලිය කියවිලි ඉදිරිපත් කර ඇත. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ ක්‍රියාත්මක කිරීමට කටයුතු කර නොතිබුණි. |

කළද, යොමුගත කොන්දේසිවලට අනුව තෝරාගත් ආයතනයේ උපදේශකයන් විසින් දැරිය යුතු පශ්චාත් උපාධි හා අනෙකුත් සුදුසුකම් සම්බන්ධයෙන් අදාළ තොරතුරු විගණනය වෙත ඉදිරිපත් කර නොතිබුණි.

**5.3 පොදු අධ්‍යාපන නවීකරණ ව්‍යාපෘතිය**

(i) පොදු අධ්‍යාපන ක්‍රමයේ ගුණාත්මකභාවය ඉහළ නැංවීම හා භාරකාරත්වය ශක්තිමත් කිරීම සඳහා පොදු අධ්‍යාපන නවීකරණ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කෙරේ. ප්‍රාථමික හා ද්විතීයික අධ්‍යාපනයේ ගුණාත්මකභාවය ඉහළ නැංවීම හා භාරකාරත්වය ශක්තිමත් කිරීම, වැඩසටහන් ක්‍රියාත්මක කිරීම හා තාක්ෂණික සහාය යන අංග 2ක් යටතේ ව්‍යාපෘති ක්‍රියාකාරකම් සිදුකෙරේ.

(ii) ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත පිරිවැය ඇ.එ.ජ. ඩොලර් මිලියන 2,900ක් හෙවත් රු. මිලියන 449,645ක් වන අතර එයින් ඇ.එ.ජ. ඩොලර් 100ක් හෙවත් රු. මිලියන 15,505ක් ජාත්‍යන්තර සංවර්ධන සංගමය විසින් මූල්‍යායනය කිරීමට එකඟ වී ඇත.

(iii) 2018 අගෝස්තු 30 දින ව්‍යාපෘතියේ කටයුතු ආරම්භ කර ඇති අතර 2024 ජුනි 30 දින වනවිට අවසන් කිරීමට නියමිත වේ.

(iv) ව්‍යාපෘතිය සම්බන්ධයෙන් 2019 හා 2020 වර්ෂ සඳහා ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන සඳහා විගණකාධිපති විසින් තත්ත්වාගණනය නොකළ මතයක් දක්වා තිබුණි. කෙසේවෙතත්, ව්‍යාපෘතියේ කාර්යසාධනය සම්බන්ධයෙන් මෙතෙක් විසඳී නොමැති ගැටළු කිහිපයක් පහත දැක්වේ.

| | විගණන නිරීක්ෂණය | විගණකාධිපති නිර්දේශ | ව්‍යාපෘතිය විසින් ගනු ලැබූ වැළැක්වීමේ ක්‍රියාමාර්ග | වර්තමාන තත්ත්වය |
|---|---|---|---|---|
| (අ) | 2019 වර්ෂය තුළ සාමාන්‍ය අධ්‍යාපන නවීකරණ ව්‍යාපෘතිය සඳහා රු. මිලියන 144.12ක ප්‍රසම්පාදන ක්‍රියාකාරකම් 19ක් සැලසුම් කර තිබූ අතර වර්ෂය අවසන් වනවිට රු. මිලියන 0.71ක් වන ප්‍රසම්පාදන 02ක් පමණක් සිදුකර තිබුණි. | සැලසුම් කර ඇති පරිදි නියමිත කාලසීමාවන් තුළ නිම කිරීමට හා අපේක්ෂිත කාර්යයන් අවසන් කර අපේක්ෂිත භෞතික ප්‍රගතිය ළඟා කරගැනීමට කටයුතු කළ යුතුය. | අදාළ නිලධාරීන් දැනුවත් කර ඇත. | තවදුරටත් දුර්වල භෞතික කාර්යසාධනයක් පවතී |
| (ආ) | ව්‍යාපෘති ඇගයීම් ලේඛනයේ 52වන වගන්තියට අනුව, ව්‍යාපෘති දර්ශක මත අත්පත්කරගැනීම පිළිබඳ ස්වාධීන ඇගයීම් වාර්තාව සෑම වර්ෂයක් සඳහාම පෙබරවාරි 28 දිනට පෙර ලෝක බැංකුව වෙත ඉදිරිපත් කළ යුතුය. කෙසේ වෙතත්, 2021 ජුලි 09 දක්වා 2020 වර්ෂය සඳහා වන තෙවන පාර්ශවීය වලංගු කිරීමේ ආයතනයක් පත් කර නොතිබූ අතර දර්ශක අත්පත් කරගැනීම පිළිබඳ ස්වාධීන තක්සේරු වාර්තාව ලෝක බැංකුව වෙත ඉදිරිපත් කර | ව්‍යාපෘති ක්‍රියාකාරකම් ඉටු කිරීම සඳහා පියවර ගත යුතුය. | කොවිඩ් 19 වයාප්තිය සමඟ පාසල් වසා දැමීම හේතුවෙන් 2020 වර්ෂය සඳහා තෙවන පාර්ශවීය වලංගුකරණ වාර්තා සකස් කිරීමට නොහැකි විය. | තෙවන පාර්ශවීය වලංගුකරණ වාර්තා සකස් කර නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| | නොතිබුණි. | | | |
| (ඇ) | 2020 මැයි 29 දිනැති අංක එච්ඩී/21/05/05-01 දරන අධ්‍යාපන අමාත්‍යාංශ ලිපියට අනුව I හා II සංරචක යටතේ කොවිඩ් 19 ව්‍යාප්තිය වැළැක්වීම සඳහා 2020 වර්ෂය වෙනුවෙන් රු. මිලියන 617.36ක් පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තු වෙත මුදා හැර තිබුණි. භෞතික හා මූල්‍ය ප්‍රගති වාර්තා අදාළ දෙපාර්තමේන්තු විසින් අමාතයාංශය වෙත ඉදිරිපත් කර නොතිබුණි. එබැවින් අදාළ කටයුතු සඳහා යොදාගත් අරමුදල් සම්බන්ධයෙන් විගණනයේදී තහවුරු කරගැනීමට නොහැකි විය. | අමාත්‍යාංශ මාර්ගෝපදේශ අනුව කටයුතු කළ යුතුය. | එම වාර්තා ඉදිරිපත් කරන ලෙස සියලුම පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තු වෙත උපදෙස් දෙන ලදී. පවතින තත්ත්වය හේතුවෙන් අපේක්ෂිත පරිදි වාර්තා නොලැබුණි. | මෙතෙක් එම වාර්තා විගණනය වෙත ඉදිරිපත් කර නොමැත. |
| (ඈ) | ව්‍යාපෘති මෙහෙයුම් අත්පොතේ 07 වන වගන්තිය, 2016 ජුනි 10 දිනැති අංක 02/2016 දරන කළමනාකරණ විගණන චක්‍රලේඛය හා මුදල් රෙගුලාසි අංක 133 අනුව ව්‍යාපෘතියේ අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබුණි. | අභ්‍යන්තර විගණනයක් සිදුකිරීමට කටයුතු කළ යුතුය. | අධ්‍යාපන අමාත්‍යාංශ අභ්‍යන්තර විගණනය සිදුකිරීමේ ප්‍රමාදයක් පවතී නම් අදාළ ශාඛාව සමඟ සාකච්ඡා කර එය නිවැරදි කරගත හැකිය. | අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| (ඉ) | රු. මිලියන 335ක ප්‍රතිපාදන යටතේ සෞඛ්‍ය හා පෝෂණ ශාඛාව මගින් දිවයින පුරා පාසල් 10,175ක් සඳහා මුහුණු ආවරණ මිලදී ගෙන ඒවා ලබාදීමට සැලසුම් කර තිබුණද, ඒ සඳහා වැය කර තිබුණේ රු. මිලියන 71.2ක් පමණි. එහි මූල්‍ය ප්‍රගතිය සියයට 21ක් වුවද, භෞතික ප්‍රගති වාර්තා විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබුණි. | අරමුණු ඉටු කරගැනීම සඳහා කටයුතු කළ යුතුය. | අධ්‍යාපන අමාත්‍යාංශය වෙත ලැබී ඇති ප්‍රකාශන අනුව සියලුම පාසල් සඳහා පාසල් පාදක ප්‍රදානයන් ලබා දී ඇත. මෙම සන්දර්භය තුළ පාසල් සෞඛ්‍යය හා පෝෂණ ශාඛාව මගින් ලේකම්වරයාගේ අනුමැතිය සහිතව සියලුම පාසල් වෙත පූර්ණ ප්‍රදානයන් සිදුකරන ලදී. | භෞතික ප්‍රගති වාර්තා විගණනය වෙත ඉදිරිපත් කර නොමැත. |
| (ඊ) | විෂය මාලා සංවර්ධනය සඳහා ජාතික අධ්‍යාපන ආයතනය වෙත රු. මිලියන 10ක මුදලක් ලබාදී තිබුණද, ව්‍යාපෘති අරමුණු ඉටුකරගැනීමට අදාළව කිසිදු සාක්ෂියක් විගණනය වෙත ඉදිරිපත් කර නොතිබුණි. | අරමුදල් උපයෝජනය සම්බන්ධයෙන් සාක්ෂි ලබා ගැනීමට කටයුතු කළ යුතුය. | ජාතික අධ්‍යාපන ආයතනය විසින් විෂය මාලා සංවර්ධනය සඳහා රු. මිලියන 10ක් භාවිතා කර ඇති බව දන්වා ඇත. | මෙතෙක් විගණනය වෙත සාක්ෂි ඉදිරිපත් කර නොමැත. |

**5.4 කඩිනම් උසස් අධ්‍යාපන ව්‍යාප්ති හා සංවර්ධන මෙහෙයුම් ව්‍යාපෘතිය (ව්‍යාපෘති සංරචකය)**

(i) රාජ්‍ය විශ්වවිද්‍යාල, ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනය, උසස් තාක්ෂණ ආයතනය හා රාජ්‍ය නොවන උසස් අධ්‍යාපන ආයතන සඳහා ප්‍රමුඛතා විෂයයන් (විද්‍යා හා තාක්ෂණ, ඉංජිනේරු විද්‍යාව, වෛද්‍ය විද්‍යාව) තුළ බඳවාගැනීම් ඉහළ නැංවීම, උපාධි වැඩසටහන්වල

ගුණාත්මකභාවය වැඩිදියුණු කිරීම, උසස් අධ්‍යාපන අංශයේ පර්යේෂණ හා නවෝත්පාදන ප්‍රවර්ධනය කිරීම සඳහා කඩිනම් උසස් අධ්‍යාපන ව්‍යාප්ති හා සංවර්ධන මෙහෙයුම් ව්‍යාපෘතිය (ව්‍යාපෘති සංරචකය) ක්‍රියාත්මක කෙරේ.

(ii) ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත පිරිවැය ඇ.එ.ජ. ඩොලර් මිලියන 100ක් හෙවත් රු. මිලියන 18,136ක් වන අතර එය ජාත්‍යන්තර සංවර්ධන සංගමය විසින් මූල්‍යායනය කිරීමට එකඟ වී ඇත.

(iii) 2018 මාර්තු 01 දින ව්‍යාපෘතියේ කටයුතු ආරම්භ කර ඇති අතර 2023 ජුනි 30 දින වනවිට අවසන් කිරීමට නියමිතව තිබුණි.

(iv) ව්‍යාපෘතිය සම්බන්ධයෙන් 2018,2019 හා 2020 වර්ෂ සඳහා ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන සඳහා විගණකාධිපති විසින් තත්ත්වාගණනය නොකළ මතයක් දක්වා තිබුණි. කෙසේවෙතත්, ව්‍යාපෘතියේ කාර්යසාධනය සම්බන්ධයෙන් මෙතෙක් විසඳී නොමැති ගැටළු කිහිපයක් පහත දැක්වේ.

| විගණන නිරීක්ෂණය | විගණකාධිපති නිර්දේශ | ව්‍යාපෘතිය විසින් ගනු ලැබූ වැළැක්වීමේ ක්‍රියාමාර්ග | වර්තමාන තත්ත්වය |
| --- | --- | --- | --- |
| ව්‍යාපෘතියේ මෙහෙයුම් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් ශේෂයන් හා අධීක්ෂණ සහාය කණ්ඩායමේ සහ ව්‍යාපෘති මෙහෙයුම් තාක්ෂණික ලේකම් කාර්යාලයේ වාර්තා අතර වෙනස්කම් නිරීක්ෂණය විය. | තථ්‍ය වියදම් වාර්තා කළ යුතුය. | මෙම වෙනස්කම් සඳහා හේතු කීපයක් බලපා ඇත.<br>වියදම් ගිණුම්ගත කිරීමේදී අනුමත ප්‍රතිපාදන ඉක්මවා යාමට ව්‍යාපෘතියට හැකියාවක් නොමැත. එනිසා වර්ෂය සඳහා අයවැය ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවීම | මෙතෙක් තථ්‍ය වියදම් වාර්තා කිරීමේ යාන්ත්‍රණයක් ක්‍රියාත්මක කර නොමැත. |

හේතුවෙන් මෙහෙයුම් තාක්ෂණික ලේකම් කාර්යාලය විසින් වාර්තා කරන ලද මුළු වියදම් ගණනය කිරීමට අධීක්ෂණ සහාය කණ්ඩායම වෙත හැකියාවක් නොමැත.

**5.5 විද්‍යා හා තාක්ෂණ මානව සම්පත් සංවර්ධන ව්‍යාපෘතිය**

(i) රටේ උසස් අධ්‍යාපන පද්ධතිය තුළ රැකියා ඉලක්ක කරගත් තාක්ෂණ උපාධි වැඩසටහන් සඳහා ප්‍රවේශ පහසුකම් වැඩිදියුණු කිරීම සඳහා විද්‍යා හා තාක්ෂණ මානව සම්පත් සංවර්ධන ව්‍යාපෘතිය ක්‍රියාත්මක කෙරේ.

(ii) ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත පිරිවැය ඇ.එ.ජ. ඩොලර් මිලියන 165ක් හෙවත් රු. මිලියන 30,051ක් වන අතර එයින් ඇ.එ.ජ. ඩොලර් මිලියන 145ක් හෙවත් රු. මිලියන 26,409ක් ආසියානු සංවර්ධන බැංකුව විසින් මූල්‍යයනය කිරීමට එකඟ වී ඇත.

(iii) 2018 අප්‍රේල් 17 වන දින ව්‍යාපෘතිය ආරම්භ කර ඇති අතර 2023 දෙසැම්බර් 31 දින වනවිට අවසන් කිරීමට නියමිත වේ.

(iv) ව්‍යාපෘතිය සම්බන්ධයෙන් 2018,2019 හා 2020 වර්ෂ සඳහා ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන සඳහා විගණකාධිපති විසින් තත්ත්වාගණනය නොකළ මතයක් දක්වා තිබුණි. කෙසේවෙතත්, ව්‍යාපෘතියේ කාර්යසාධනය සම්බන්ධයෙන් මෙතෙක් විසඳී නොමැති ගැටළු කිහිපයක් පහත දැක්වේ.

| | විගණන නිරීක්ෂණය | විගණකාධිපති නිර්දේශ | ව්‍යාපෘතිය විසින් ගනු ලැබූ වැළැක්වීමේ ක්‍රියාමාර්ග | වර්තමාන තත්ත්වය |
|---|---|---|---|---|
| (අ) | ලැබී ඇති තොරතුරුවලට අනුව වැඩ කටයුතු ආරම්භ කිරීමේ ප්‍රමාදයන් හේතුවෙන් 2020 දෙසැම්බර් 31 දින වනවිට ව්‍යාපෘතියේ භෞතික හා මූල්‍ය ප්‍රගතිය අඩු වී ඇති බව නිරීක්ෂණය විය. තවද, රජරට, සබරගමුව,කැලනිය හා ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාල සඳහා ඇ.එ.ජ. ඩොලර් මිලියන 66.14ක වටිනාකමින් යුත් පහසුකම් සහිත ගොඩනැගිලි හතරක් ඉදිකිරීම සඳහා පවතින කොන්ත්‍රාත්තු තෝරාගැනීමේ ප්‍රසම්පාදන ක්‍රියාවලිය 2017 ජනවාරි මස ආරම්භ වූ අතර තෝරා ගැනීම සඳහා වර්ෂ 3කට වැඩි කාලයක් ගතවන බව අනාවරණය විය. තවද,2020 දෙසැම්බර් 31 දිනට රජරට විශ්වවිද්‍යාලයේ ඉදිකිරීම් කටයුතු ආරම්භ කර නොතිබූ බවද අනාවරණය විය. | ප්‍රමාද වූ ක්‍රියාකාරකම් කඩිනම් කිරීමට පියවර ගත යුතුය. | කළමනාකරණයේ ප්‍රතිචාර අනුව ව්‍යාපෘති කාර්ය මණ්ඩලයේ ප්‍රමාදය හේතුවෙන් පීය ගොඩනැගිලි ඉදිකිරීම් වැඩ කටයුතු 2018 වර්ෂය අග භාගයේදී ආරම්භ කරන ලදී. | කැලණිය, ශ්‍රී ජයවර්ධනපුර හා සමබරගමුව යන විශ්වවිද්‍යාලවල ඉදිකිරීම් වැඩ කටයුතු 2020 වර්ෂය අග භාගයේදී ආරම්භ කර ඇත. 2021 සැප්තැම්බර් 17 දින රජරට විශ්වවිද්‍යාලයේ කොන්ත්‍රාත් වැඩ ප්‍රදානය කර ඇත. |
| (ආ) | ව්‍යාපෘතිය ආරම්භ කර වර්ෂ 03ක් ගතව ඇතත්, 2020 දෙසැම්බර් 31 දින වනවිට අ.එ.ජ. ඩොලර් මිලියන 145ක් වූ ණය මුදලෙන් සියයට 6.8ක | ව්‍යාපෘති කාලසීමාව තුළ ව්‍යාපෘතියේ අරමුණු සාක්ෂාත් කරගැනීම සඳහා | ආසියානු සංවර්ධන බැංකුවේ සංශෝධිත විය පැහැදම් සැලැසුමට අනුව අපේක්ෂිත මුදල් | ව්‍යාපෘතියේ අපේක්ෂිත ඉලක්ක සපුරාගෙන නොතිබුණි. |

| | | |
|---|---|---|
| ප්‍රතිශතයක් නියෝජනය කරමින් ඇ.එ.ජ. ඩොලර් මිලියන 9.86ක් පමණක් භාවිතා කර තිබූ බව නිරීක්ෂණය විය. තවද, ව්‍යාපෘති පරිපාලන අත්පොතේ දක්වා ඇති සංශෝධිත මූල්‍ය ඉලක්කයන්ට අනුව සමාලෝචිත වර්ෂය අවසානයේදී ඇ.එ.ජ. ඩොලර් මිලියන 18.59ක් හෙවත් රු. මිලියන 3,457.74ක් භාවිතා කිරීමට අපේක්ෂා කර තිබුණි. කෙසේ වෙතත්, 2020 දෙසැම්බර් 31 දින වනවිට ඇ.එ.ජ. ඩොලර් මිලියන 8.7ක් හෙවත් රු. මිලියන 1,672.6ක් වැය කර අදාළ ඉලක්ක වලින් සියයට 48ක් ළඟා කරගෙන තිබුණි. ඊට අමතරව ඉදිකිරීම් වැඩ සඳහා වන කොන්ත්‍රාත්තුව ප්‍රමාද වීම හේතුවෙන් 2020 දෙසැම්බර් 31 දිනට රු. මිලියන 750.36ක් වූ ඉලක්කගත විය පැහැදම් සඳහා රු. මිලියන 99.5ක් පමණක් භාවිතා කර තිබුණි. | කටයුතු කළ යුතුය. | ලැබීම් ඇ.එ.ජ. ඩොලර් මිලියන 18.59ක් බව පිළිගැනේ. නමුත් ඉදිකිරීම් කටයුතු සම්බන්ධයෙන් නොවැළැක්විය හැකි තත්ත්වයන් නිසා කොන්ත්‍රාත් තුනක් පමණක් ප්‍රදානය කර ඇත. |

## 6. කෘෂිකාර්මික අංශය

-----------------------

### 6.1 කුඩා කෘෂි ව්‍යාපාර හිමියන්ගේ හවුල් ව්‍යාපාර වැඩසටහන

-------------------------------------------------------------------

(i) කුඩා කෘෂි ව්‍යාපාර හිමියන්ගේ හවුල් ව්‍යාපාර වැඩසටහන වාණිජමය වශයෙන් අරමුණු කරගත් නිෂ්පාදන සහ අලෙවිකරණ ක්‍රමයට සම්බන්ධ කුඩා වතු නිවාස 57,000ක

හිමිකරුවන්ගේ ආදායම සහ ආහාර වල ගුණාත්මකභාවය තිරසාර ලෙස ඉහළ නැංවීම සඳහා ක්‍රියාත්මක වේ.

(ii) ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත පිරිවැය රු. මිලියන 17,170 ට සමාන ඇමරිකානු ඩොලර් මිලියන 105.03 ක් වූ අතර එයින් රු. මිලියන 8,892 ට සමාන ඇමරිකානු ඩොලර් මිලියන 54.4 ක් කෘෂිකාර්මික සංවර්ධනය සඳහා වූ ජාත්‍යන්තර අරමුදල විසින් මූල්‍යකරණය කිරීමට එකඟ වී තිබුණි.

(iii) ව්‍යාපෘතිය 2017 ජූනි 26 දින එහි කටයුතු ආරම්භ කර 2023 ජූනි 30 වන විට අවසන් කිරීමට නියමිතව තිබුණි.

(iv) 2018,209 සහ 2020 වසර සඳහා ව්‍යාපෘතිය වෙනුවෙන් ඉදිරිපත් කර තිබූ මූල්‍ය ප්‍රකාශන සඳහා විගණකාධිපති විසින් ත්ත්වාගණනය කරන ලද විගණන මතයක් ලබා දී තිබුණි. කෙසේ වෙතත්, ව්‍යාපෘතියේ කාර්ය සාධනය සම්බන්ධයෙන් මෙතෙක් විසඳී නොමැති ගැටළු කිහිපයක් පහත දැක්වේ.

| | විගණන නිරීක්ෂණ | විගණකාධිපතිගේ නිර්දේශය | ව්‍යාපෘතිය මගින් ගෙන ඇති වැලැක්වීමේ ක්‍රියාමාර්ග | වර්ථමාන තත්වය |
|---|---|---|---|---|
| (අ) | 2017 ජූලි 01 සිට 2018 දෙසැම්බර් 31 දක්වා මාස 18ක කාලය තුළ කුඩා වතු හිමියන් ඇතුළු ප්‍රතිලාභීන් 45,000කට උප ණය ලබාදීමට ඉලක්ක කර තිබුණි. ප්‍රගති වාර්තාවට අනුව, 2018 දෙසැම්බර් 31 වන විට ප්‍රතිලාභීන් 13,887ක් හඳුනාගෙන තිබුණි. ඉන් ප්‍රතිලාභීන් 2,119ක් පමණක් ශ්‍රී ලංකා මහ බැංකුවේ ලියාපදිංචි කර තිබූ අතර එම දිනය වන ඉන් ප්‍රතිලාභීන් 1,715ක් සඳහා රු. මිලියන 320.13ක උප ණය ලබා දී තිබුණි. | ඉලක්කය සපුරා ගැනීමට හැකි වන පරිදි ව්‍යාපෘතියේ ක්‍රියාකාරකම් ප්‍රචලිත කිරීමට කටයුතු කළ යුතුය. | පාර්ශ්වකරුවන්ගේ රැස්වීම් පවත්වමින් ව්‍යාපාරික යෝජනා ලබා ගැනීම සඳහා ව්‍යාපාරික ප්‍රජාව සහ රාජ්‍ය නිලධාරීන් (GAs) දැනුවත් කිරීමට කටයුතු කර | ව්‍යාපෘතියේ ඉලක්කය සපුරා නොතිබුණි |

| | | | | |
|---|---|---|---|---|
| | | | ඇත. | |
| (ආ) | කුඩා තේ වතු හිමියන්ට අවශ්‍ය පුහුණුව, යටිතල පහසුකම්, තාක්ෂණික දැනුම සහ අනෙකුත් ආධාර නොමැති වීම හේතුවෙන් ගාලු දිස්ත්‍රික්කයේ පිට වගාකරුවන් තේ තවාන් සකස් කිරීම හා නඩත්තු කිරීම සඳහා සම්ප්‍රදායික ක්‍රම භාවිතා කර තිබුණි. | ප්‍රවර්ධක සමාගම/බැංකු විසින් ක්‍රියාත්මක කරන ක්‍රියාකාරකම් පිළිබඳව සමීප අධීක්ෂණයක් සිදුකල යුතුවිය. | වැළැක්වීමේ පියවර ගෙන නොතිබුණි. | ව්‍යාපෘතිය 4P පමණක් ණය වන අතර ගොවීන් 441දෙනෙකුත ණය පමණක් පහසුකම් සලසා තිබුණි. මේ වන විට SAPP විසින් නිකුත් කරන ලද සියලුම ණය සම්පූර්ණයෙන් ම අයකරගෙන ICB-3 කොන්ත්‍රාත්තුව අවසන් කර ඇත. |
| (ඇ) | 2019 වසර සඳහා වන අයවැය ඇස්තමේන්තුවට අනුව වෙන් කර ඇති මුදල රු. මිලියන 2,044. වූ අතර වැඩසටහනේ කටයුතු ක්‍රියාත්මක කිරීම සඳහා ජනාධිපති ලේකම්වරයා යටතේ සංශෝධිත වාර්ෂික අයවැයෙන් රුපියල් මිලියන 2,600 ක් ප්‍රත්පාදනය කර තිබුණි. කෙසේ වෙතත්, මෙයින් 2019 දෙසැම්බර් 31 වන විට වැඩසටහන භාවිතා කර තිබුණේ | වැඩසටහන් කාල සීමාව තුළ වැඩසටහනේ අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා වැඩසටහන් ක්‍රියාකාරකම් අධීක්ෂණය කිරීමට කටයුතු කළ යුතුය. | වැඩසටහනේ කටයුතු නිරීක්ෂණය කිරීමට කටයුතු කර නොතිබුණි. | සමස්ත ඉලක්ක සපුරා ගෙන නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| | සියයට 63 ක් ක් වූ රු. මිලියන 1,654.25 ක් පමණි. | | | |
| (ඈ) | 2019 වර්ෂය සඳහා ප්‍රදාන නිදහස්කරගනීම් යටතේ ඉලක්කගත ප්‍රතිලාභීන් සංඛ්‍යාව 5,500 කි. කෙසේ වෙතත්, වර්ෂය තුළ ප්‍රදාන ලබා දී තිබුණේ ප්‍රතිලාභීන් 4,502 ක් සඳහා පමණි. ගෙවතු කුකුළු ගොවිපළ ව්‍යාපෘතිය යටතේ අපේක්ෂිත ප්‍රතිලාභීන් 500ක් වූ නමුත් ප්‍රතිලාභීන් 94 දෙනෙකු සඳහා පමණක් මුදල් ප්‍රදානය කර තිබුණු බව වැඩිදුරටත් නිරීක්ෂණය විය. තවද, කුරුඳු වගාව සඳහා ඉලක්කගත මුළු ප්‍රතිලාභීන් 140 ක් වූ අතර ප්‍රතිලාභීන් 40 කට පමණක් ප්‍රදාන බෙදා දී තිබුණි. | වැඩසටහන් කාල සීමාව තුළ වැඩසටහනේ අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා වැඩසටහන් ක්‍රියාකාරකම් අධීක්ෂණය කිරීමට කටයුතු කළ යුතුය. | කලාපීය වැඩසටහන් සම්බන්ධීකරුවන් (RPC) තිදෙනෙකු පත් කර කලාප පැවරීම. | සම්පූර්ණ ඉලක්ක සපුරා නොතිබුණි. |
| (ඉ) | ණය සංරචකය යටතේ 2019 දෙසැම්බර් 31 දිනට ප්‍රතිලාභීන් 15,223ක් ආවරණය වන පරිදි රාජ්‍ය-පෞද්ගලික-නිෂ්පාදක හවුල්කාරිත්ව ගිවිසුම් පහළොවක් අත්සන් කර, වැඩසටහන මඟින් 2019 දෙසැම්බර් 31 දින දක්වා ප්‍රතිලාභීන් 7,499 දෙනෙකුට ණය ලබා දීමට ඉලක්ක කර තිබුණි. නමුත් ශ්‍රී ලංකා මහ බැංකුවේ ලියාපදිංචි වී තිබුනේ රු. මිලියන 1,037 ක් වූ ප්‍රතිලාභීන් 5,219 කට පමණි. | වැඩසටහන් කාල සීමාව තුළ වැඩසටහනේ අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා වැඩසටහන් ක්‍රියාකාරකම් අධීක්ෂණය කිරීමට කටයුතු කළ යුතුය. | පුද්ගලික මූල්‍ය ආයතන මඟින් ගොවීන්ට ණය ලබා දීම කඩිනම් කිරීම සඳහා සමූහ ණය පහසුකම් ක්‍රමයක් හඳුන්වා දීම.. | සම්පූර්ණ ඉලක්ක සපුරා නොතිබුණි. |
| (ඊ) | ගෙවතු කුකුළු ව්‍යාපෘතියට අදාළව 2018 දෙසැම්බර් සිට 2019 | විසර්ජන සැලැස්ම මත පදනම්ව | කිසිදු වැළැක්වීමේ පියවරක් ගෙන | ව්‍යාපෘතිය ක්‍රියාත්මකව |

| | | | | |
|---|---|---|---|---|
| | දෙසැම්බර් දක්වා මුදල් ගෙවීමේ සැලැස්ම සැලසුම් කර තිබු නමුත් මෙම ගිවිසුම 2019 ජනවාරි 04 සහ 2019 පෙබරවාරි 26 යන දිනවල අත්සන් කර තිබුණි. | ගිවිසුම් අත්සන් කිරීමට කඩිනම් පියවර ගත යුතුය. | නොතිබුණි. | පවතී. |
| (උ) | කිරි නිෂ්පාදන ව්‍යාපෘතිය සඳහා වූ ගිවිසුමට අනුව ව්‍යාපෘති කාලය වසර දෙකකි. වසරක කාලයක් ගෙවී ගියද 2019 දෙසැම්බර් 31 දක්වා කිසිදු ගොවියෙකු මෙම ව්‍යාපෘතිය යටතේ ලියාපදිංචි වී නොමැති බව නිරීක්ෂණය විය. 2018 දෙසැම්බර්, 2019 ජනවාරි මාසය වන විට ප්‍රතිලාභීන්ට ප්‍රදාන අයිතම ලබා දීමේ විසර්ජන සැලැස්මට අනුගතව, වැඩසටහනේ කිසිදු පාර්ශ්වයකට විසර්ජන සැලැස්මට අනුව කාල ඉලක්කය ප්‍රකාර කටයතු කිරීමට නොහැකි වී තිබුණි. | ප්‍රමාදය අවම කර ගැනීමට කඩිනම් පියවර ගත යුතුය. | කිසිදු වැළැක්වීමේ පියවරක් ගෙන නොතිබුණි. | ව්‍යාපෘතිය ක්‍රියාත්කව පවතී. |
| (ඌ) | කුරුඳු වගාවට අදාළ නය ගිවිසුමට අනුව ණය ආපසු ගෙවීමේ ඇපකරු ලෙස ප්‍රවර්ධකයා කටයුතු කළ යුතුය. සමහර ප්‍රතිලාභීන් පැහැර හැර තිබූ බව නිරීක්ෂණය වූ අතර එම හේතුව නිසා ප්‍රවර්ධක බැංකුව විසින් ඉතිරි ණය මුදල මුදා හැරීම නතර කර තිබුණි. තවද, ඉහත ගිවිසුමේ 2 (a) (ii) වගන්තියට අනුව ප්‍රවර්ධක සමාගම් පිහිටුවීමට අවශ්‍ය නමුත් 2019 දෙසැම්බර් 31 වන විට සමිති පිහිටුවීමට අදාළව කිසිදු | පසු විපරම් ක්‍රියාමාර්ග ගත යුතුයි. | අදාළ පසු විපරම් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | ගැටළු තවමත් නොවෙනස්ව පවතී. |

| | | | | |
|---|---|---|---|---|
| | කාර්යයක් ස්ථාපිත කර නොතිබුණි. | | | |
| (ඔ) | තේ පැකට් කිරීමේ ව්‍යාපෘතිය සඳහා 2019 ඔක්තෝබර් 10 වන විට ප්‍රතිලාභීන් 500ක් හඳුනාගෙන තිබුණද, ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රතිලාභීන් 119 දෙනෙකු පමණක් ලියාපදිංචි කර ඇති අතර වර්ෂය අවසන් වන විට තේ වගාකරුවන් 31 දෙනෙකුට පමණක් ණය ලබා දී තිබුණි. | ගිවිසුම්වලට අනුව ඉලක්ක සපුරා ගැනීම සඳහා කඩිනම් පියවර ගත යුතුය. | වැළැක්වීමේ පියවර ගෙන නොතිබුණි. | ගිවිසුමට අනුව ඉලක්ක සපුරා නොතිබුණි. |
| (ඕ) | ජනාධිපති ලේකම්, දාසිනි විජලන මධ්‍යස්ථානය සහ ලංකා බැංකුව අතර ඇති කර ගත් ගිවිසුමේ 2 (ඇ) වගන්තිය සහ උපලේඛන 03 අනුව, විසර්ජන සැලැස්මේ පළමු අදියර 2018 නොවැම්බර් මස ප්‍රදාන සහ ණය පහසුකම් ප්‍රතිලාභීන් 250ක් සඳහා 2018 සහ ශේෂය 2019 මැයි මාසයේදී ප්‍රතිලාභීන් 250ක් සඳහා ලබාදීමට නියමිතව තිබුණි. කෙසේ වෙතත්, රු. 2019 දෙසැම්බර් 31 වන විට ප්‍රතිලාභීන් 97 දෙනෙකු සඳහා රුපියල් මිලියන 9.33ක් පමණක් ණය පහසුකම් ලබා දී තිබුණි. | ගිවිසුම්වලට අනුව ඉලක්ක සපුරා ගැනීම සඳහා කඩිනම් පියවර ගත යුතුය. | ගිවිසුම්වලට අනුව ඉලක්ක සපුරා ගැනීමට කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. | 120ක් ලෙස සංශෝධිත ගොවීන් සංඛ්‍යාව ලංකා බැංකුවෙන් ගොවීන් 91 දෙනෙකු සඳහා පමණක් ණය නිකුත් කර ඇති අතර ගොවීන්ගේ අංක 116 වෙත ප්‍රදාන නිකුත් කර තිබුණි. |
| (ක) | මුරුංගා වගාව සම්බන්ධයෙන් ජනාධිපති ලේකම්, දාසිනි විජලන මධ්‍යස්ථානය සහ ලංකා බැංකුව අතර ඇති කර ගත් ගිවිසුමේ 3 (k) ඡේදයට අනුව, ප්‍රවර්ධකයා විසින් | කාල රාමුව තුළ ප්‍රවර්ධකයින් විසින් මාසික ප්‍රගති වාර්තාව ඉදිරිපත් කිරීමට පසු විපරම් | පසු විපරම් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | මාසික ප්රගති වාර්තා තවමත් කාල රාමුව තුළ නොලැබේ. පසු |

| | | | | |
|---|---|---|---|---|
| | මාසික ප්‍රගති වාර්තාව PMU වෙත ඉදිරිපත් කළ යුතුය, කෙසේ වෙතත්, 2019 ඔක්තෝබර් 28 වැනි දින විගණන දිනය දක්වා ප්‍රවර්ධකයා විසින්කිසිදු ප්‍රගති වාර්තාවක් ඉදිරිපත් අර නොතිබුණි. | ක්‍රියාමාර්ග ගත යුතුය. | | විපරම් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. |
| (ග) | රාජ්‍ය මුද්‍රණ නීතිගත සංස්ථාවෙන් රු. මිලියන 1.36 ක් වය කර මුද්‍රණය කරන ලද ස්වයං මිහෙයවීම් පොත් 14,830 න් පොත් 4,547 ක් පමණක් ප්‍රතිලාබීන් අතර බෙදාහැර තිබුණ අතර ඉතිරි පොත් 10,283 ක් ගල්ඔය වැව්ලි සමාගමට බෙදාහැරීමකින් තොරව ව්‍යාපෘති මෙහෙයුම් කාර්යාලයේ ගබඩාවක රදවා තිබුන අතර ඒවා 2020 මැයි 24 දින දක්වා ප්‍රතිලාභීන්ට බෙදා දී නොතිබුණි. | මුද්‍රිත ස්වයං මිහෙයවීම් පොත් කාල රාමුව තුළ ප්‍රතිලාභීන් වෙත බෙදා හැරීම පිළිබඳ පසු විපරම් ක්‍රියාමාර්ග ගත යුතුය. | 1 වන මුද්‍රණය සම්පූර්ණයෙන්ම බෙදා හැර ඇත. | සිංහල පොත් 6,000 කින් සහ 2 වන මුද්‍රණයේ දෙමළ පොත් 2,495 න්, සිංහල පොත් 2,875 ක් සහ දෙමළ පොත් 2,333 ක් මේ කවා පවතී. |
| (ච) | ප්‍රතිලාභීන් 21,823 කට ප්‍රතිලාභ ලබා දීම සඳහා ව්‍යාපෘතිය 4P ගිවිසුම් 25 කට එළැඹී ඇති අතර රු. 2020 අවසානයේ රුපියල් මිලියන 1,778 ක් වෙන් කර ඇත. කෙසේ වෙතත්, අපේක්ෂිත ප්‍රතිලාභීන්ගෙන් සියයට 63 ක් සහ වෙන් කළ අරමුදලින් සියයට 19 ක් නියෝජනය කරමින් රුපියල් මිලියන 340 ක ප්‍රතිපාදන භාවිතා කිරීමෙන් පමණක් ව්‍යාපෘතිය ප්‍රතිලාභීන් 13,871 කට ප්‍රතිලාභ ලබා දී තිබුණි. | ව්‍යාපෘති කළමනාකරණ ඒකකය (PMU) භෞතික හා මූල්‍ය ප්‍රගතිය එකවර අත්කර ගත යුතුය. | පියවර ගෙන නොතිබුණි. | ව්‍යාපෘතියේ අරමුණු අනුව ඉලක්ක සපුරා ගෙන නොතිබුණි. |
| (ජ) | සමාලෝචිත වර්ෂය සඳහා "ග්‍රාමීය | ව්‍යාපෘති | ක්‍රියාමාර්ග ගෙන | ණය සඳහා ශ්‍රී |

| | | | | |
|---|---|---|---|---|
| | මූල්‍ය වෙත ප්‍රවේශය" සංරචක 02 යටතේ ණය වශයෙන් ව්‍යාපෘතිය විසින් GOSL අරමුදලින් රුපියල් මිලියන 74ක් වෙන් කර තිබුණි. මෙම සංරචකයේ අරමුණ වන්නේ ප්‍රතිලාභීන් සඳහා තිරසාර ආකාරයකින් සහ දැරිය හැකි මිලකට ග්‍රාමීය මූල්‍ය සේවාවන් වෙත ප්‍රවේශය පහසු කිරීමයි. කෙසේ වෙතත්, අයවැයට අනුව සමාලෝචිත වර්ෂය තුළ ණය සඳහා කිසිදු මුදලක් භාවිතා කර නොතිබුණි. | ක්‍රියාකාරකම් නිසි ලෙස අධීක්ෂණය කර වේගවත් කළ යුතුය. | තිබුණේ නොතිබුණි. | ලංකා රජයේ (GOSL) ප්‍රතිමුදල් මේ වන විට භාවිතා කිරීම ආරම්භ කර ඇත. |
| (ට) | ව්‍යාපෘති කාර්යාලය 2020 මැයි 22 වන දින රාජගිරියේ කුලී ගොඩනැගිල්ලක සිට වෙනත් කුලී ගොඩනැගිල්ලකට ගෙන යාම නිසා පැරණි ගොඩනැගිල්ලේ බදු ගිවිසුම අවසන් වීම හේතුවෙන් ව්‍යාපෘතියට ආපසු ගෙවිය හැකි රු. මිලියන 3.2 ක තැන්පතුවක් කපා හැරීමට සිදු වී තිබුණි. එමෙන්ම එම කාර්යාලය වෙනත් ස්ථානයකට ගෙන යාම හේතුවෙන් රු. මිලියන 6.8ක් වටිනා කාර්යාල ගොඩනැගිල්ලේ කොටස් ව්‍යාපෘතිය සඳහා තවදුරටත් අවශ්‍ය නොවන බැවින් ශ්‍රී ලංකා යුද හමුදාව වෙත භාර දී තිබුණි. මේ නිසා ව්‍යාපෘතියට සිදු වී තිබූ බලපෑම ව්‍යාපෘතියේ අරමුණුවලට පටහැනි කරුණක් විය. | ව්‍යාපෘතියට සිදුවන පාඩු හා හානි අවම වන පරිදි තීරණ ගත යුතුය. | වැළැක්වීමේ පියවර ගෙන නොතිබුණි. | ගැටලුව නොවිසඳී පවතී. |

## 6.2 දේශගුණික සුහුරු වාරි කෘෂිකාර්මික ව්‍යාපෘතිය

(i) තෝරාගත් උණුසුම් ප්‍රදේශ වල කුඩා වතු හිමියන්ගේ කෘෂිකර්මාන්ත වල ඵලදායිතාව සහ දේශගුණයට ඔරොත්තු දීමේ හැකියාව වැඩි දියුණු කිරීම සඳහා දේශගුණ සුහුරු වාරි කෘෂිකාර්මික ව්‍යාපෘතිය ක්‍රියාත්මක කර තිබුණි.

(ii) ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත වියදම ඇමරිකානු ඩොලර් මිලියන 140 කට සමාන රු. මිලියන 25,200ක් වූ අතර ඉන් ඇමරිකානු ඩොලර් මිලියන 125 කට සමාන රු. මිලියන 22,500ක් ජාත්‍යන්තර සංවර්ධන සංගමය විසින් මූල්‍යකරණය කිරීමට එකඟ වී තිබුණි.

(iii) ව්‍යාපෘතිය 2019 මැයි 07 වන දින එහි කටයුතු ආරම්භ කර 2024 ජුනි 30 වන විට අවසන් කිරීමට නියමිතව තිබුණි.

(iv) ව්‍යාපෘතිය සඳහා ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන සඳහා විගණකාධිපති විසින් 2019 වසර සඳහා තත්වාගණනය කරණ ලද විගණන මතයක් සහ 2020 වසර සඳහා තත්වාගණනය නොකරණ ලද විගණන මතයක් ලබා දී තිබුණි. කෙසේ වෙතත්, ව්‍යාපෘතියේ කාර්යසාධනය සම්බන්ධයෙන් මෙතෙක් විසඳී නොමැති ගැටළු කිහිපයක් පහත දැක්වේ.

| | විගණන නිරීක්ෂණ | විගණකාධිපතිගේ නිර්දේශය | ව්‍යාපෘතිය මගින් ගෙන ඇති වැලැක්වීමේ ක්‍රියාමාර්ග | වර්ථමාන තත්වය |
|---|---|---|---|---|
| (අ) | ව්‍යාපෘතිය කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ කාර්ය මණ්ඩලය සඳහා 2018 සැප්තැම්බර් 12 සහ 2019 මාර්තු 18 දිනයන්හිදී අනුමැතිය ලැබී තිබුණද,ව්‍යාපෘතියේ කාර්ය මණ්ඩලයේ රාජකාරි ආවරණය කිරීම සඳහා රේඛීය අමාත්‍යාංශයේ සහ අදාළ පළාත් සභාවල නිලධාරීන් 40 දෙනෙකු | (a). ව්‍යාපෘති අධ්‍යක්ෂ/ නියෝජ්‍ය ව්‍යාපෘති අධ්‍යක්ෂ විසින් මාසය ආරම්භයේදී අර්ධකාලීන කාර්ය මණ්ඩලයට මාසික කාර්ය කාලසටහන ලබා දිය යුතුය.<br>(b). සිදු කරන ලද සැබෑ වැඩ පිළිබඳ විස්තර අදාළ | කිසිදු වැළැක්වීමේ පියවරක් ගෙන නොතිබුණි. | අනුමත සේවක සංඛ්‍යාවට අනුව පුරප්පාඩු පිරවීමට තවමත් කටයුතු කර නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| | අර්ධකාලීන පදනමින් සහ සේවකයින් 06 දෙනෙකු දෛනික ගෙවීම් පදනම මත සේවයේ යෙදවීමට කටයුතු කර 2019 දෙසැම්බර් 31 දක්වා එම සේවකයන්ගේ පාරිශ්‍රමික වශයෙන් රු. මිලියන 8 ක් ගෙවා තිබුණි. | අධීක්ෂණ නිලධාරීන් විසින් අර්ධකාලීන කාර්ය මණ්ඩලයෙන් ලබා ගත යුතුය<br><br>(c). අර්ධකාලීන නිලධාරීන්ගේ පැමිණීම PMU විසින් පවත්වාගෙන යා යුතුය<br><br>(d). නියෝජ්‍ය ව්‍යාපෘති අධ්‍යක්ෂ (PMU) විසින් නිකුත් කර ඇති 2019 සැප්තැම්බර් 18 දිනැති අංක MOA/CSIAP/PMU/Admin දරන චක්‍රලේඛයට අනුව සෑම මාසයක් සඳහාම අර්ධකාලීන නිලධාරියාගේ සැබෑ වැඩ කරන වේලාවන් මත පදනම්ව මාසික දීමනා ගණනය කළ යුතුය. | | |
| (ආ) | ක්‍රියාකාරී සැලැස්මට අනුව, සමාලෝචිත වර්ෂය තුළ සංරචක 3ක් යටතේ රුපියල් මිලියන 520.5ක් වැය කිරීමට අපේක්ෂා කළද, භාණ්ඩාගාරයේ අය වැය ඇස්තමේන්තුවෙන් ප්‍රතිපාදනය කර ඇති මුදල රු. මිලියන 440 ක් පමණක් විය. නමුත්, ව්‍යාපෘතියේ සැබෑ වියදම රු. මිලියන 256.5 ක් වූ අතර එය මහා භාණ්ඩාගාරය විසින් ප්‍රතිපාදිත රු. මිලියන 440 | ක්‍රියාකාරී සැලැස්මට අනුව අරමුදල් උපයෝජනය කිරීමට කටයුතු කළ යුතුය | කිසිදු වැළැක්වීමේ පියවරක් ගෙන නොතිබුණි. | ව්‍යාපෘතියේ සමස්ත මූල්‍ය ප්‍රගතිය ඉහළ නැංවීමට කටයුතු කර නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| | න් සියයට 58 ක් පමණක් විය. | | | |
| (ඇ) | සමාලෝචිත වර්ෂය වන විට මණ්ඩලයේ ව්‍යාපෘති කළමනාකරණ ඒකකයේ සහ නියෝජ්‍ය ව්‍යාපෘති අධ්‍යක්ෂ කාර්යාලයේ අනුමත කාර්ය අනුව පැවති පුරප්පාඩු 26ක් පිරවීමට කටයුතු කර නොතිබූ අතර දැනට සිටින කාර්ය මණ්ඩලයෙන් සේවකයන් 43ක් අර්ධකාලීන පදනමින් බඳවාගෙන තිබුණි. | ව්‍යාපෘතියේ සුමට මෙහෙයුම් සඳහා තවදුරටත් ප්‍රමාදයකින් තොරව පුරප්පාඩු පිරවිය යුතුය | කිසිදු වැළැක්වීමේ පියවරක් ගෙන නොතිබුණි. | තවමත් පුරප්පාඩු පවතී. |
| (ඈ) | මෙම වගන්තිය අනුව කාලීන සමාලෝචනය සහ ඇගයීම සක්‍රීය කරමින් කළමනාකරණ තොරතුරු පද්ධතියක් (MIS) ස්ථාපිත කර පවත්වාගෙන යාම අවශ්‍ය වුවද, 2021 ජුනි 30 වන විටත් එවැනි පද්ධතියක් ව්‍යාපෘතිය මගින් ස්ථාපිත කර නොතිබුණි. | කළමනාකරණ තොරතුරු පද්ධතිය ප්‍රමාදයකින් තොරව ස්ථාපිත කළ යුතුය. | කළමනාකරණ තොරතුරු පද්ධතිය ස්ථාපිත කිරීමට කටයුතු කර නොතිබුණි. | කළමනාකරණ තොරතුරු පද්ධතිය මේ දක්වා ස්ථාපිත කර නොතිබුණි. |
| (ඉ) | පැමිණීම සටහන් කිරීම සඳහා පැමිණීමේ ලේඛනයක් තබා නොගෙන සහ ව්‍යාපෘතියේ සේවය කළ කාලය පිළිබඳ නිසි තක්සේරුවක් නොමැතිව අර්ධකාලීන පදනමින් බඳවාගත් රාජ්‍ය හා අර්ධ රාජ්‍ය නිලධාරීන් 54 දෙනෙකුට දායකත්වය තක්සේරු කිරීමකින් තොරව රු. මිලියන 24 ක මුදලක් ගෙවා තිබුණි. | පැමිණීම වාර්තා කිරීම සඳහා නිසි පද්ධතියක් පවත්වාගෙන යා යුතුය. | අර්ධකාලීන නිලධාරීන් සඳහා පැමිණීමේ ලේඛනය පවත්වාගෙන ගොස් ඇත. කෙසේ වෙතත්, වාර්තාගත පැමිණීම සඳහා නිසි ක්‍රමවේදයක් ස්ථාපිත කිරීමට | වාර්තාගත පැමිණීම සඳහා නිසි ක්‍රමවේදයක් ස්ථාපිත කිරීමට ව්‍යාපෘතිය කටයුතු කර නොතිබුණි. |

| | | | |
|---|---|---|---|
| | | | ව්‍යාපෘතිය කටයුතු කර නොතිබුණි. |

**6.3 කුඩා තේ සහ රබර් වතු හිමියන් පුනර්ජීවන ව්‍යාපෘතිය**

(i) කුඩා තේ සහ රබර් වතු හිමියන් පුනර්ජීවන ව්‍යාපෘතිය මගින් ව්‍යාපෘති ප්‍රදේශයේ කුඩා තේ සහ රබර් වතු හිමියන්ගේ වගා කටයුතු වඩාත් ඵලදායී, ලාභදායී සහ ඔරොත්තු දෙන ආර්ථික ක්‍රියාකාරකම් සංවර්ධනය කිරීම සඳහා ක්‍රියාත්මක කර තිබුණි.

(ii) ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත වියදම රු. මිලියන 8,502 ට සමාන ඇමරිකානු ඩොලර් මිලියන 65.4 ක් වන අතර එයින් රු. මිලියන 3,349 ට සමාන ඇමරිකානු ඩොලර් මිලියන 26 ක් කෘෂිකාර්මික සංවර්ධනය සඳහා වූ ජාත්‍යන්තර අරමුදල විසින් මූල්‍ය කිරීමට එකඟ වී තිබුණි.

(iii) ව්‍යාපෘතිය 2016 අගෝස්තු 15 වන දින එහි කටයුතු ආරම්භ කර තිබුන අතර 2021 අප්‍රේල් 23 වන විට අවසන් කිරීමට නියමිතව තිබුණි. කෙසේ වෙතත්, ව්‍යාපෘතියේ කටයුතු 2023 ජුනි 30 දක්වා දීර්ඝ කර තිබුණි.

(iv) ව්‍යාපෘතිය සඳහා ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන සඳහා විගණකාධිපතිවරයා විසින් 2018 වර්ෂය සඳහා තත්වාගණනය නොකළ විගණන මතයක් සහ 2019 වසර සඳහා තත්වාගණනය කල විගණන මතය සහ 2020 වසර සඳහා තත්වාගණනය නොකළ විගණන මතයක් ලබා දී තිබුණි. කෙසේ වෙතත්, වියාපෘතියේ කාර්ය සාධනය සම්බන්ධයෙන් මෙතෙක් විසඳී නොමැති ගැටළු කිහිපයක් පහත දැක්වේ.

| | විගණන නිරීක්ෂණ | විගණකාධිපතිගේ නිර්දේශය | ව්‍යාපෘතිය මගින් ගෙන ඇති වැලැක්වීමේ ක්‍රියාමාර්ග | වර්ථමාන තත්වය |
|---|---|---|---|---|
| (අ) | 2016 සිට 2022 දක්වා තෝරාගත් දිස්ත්‍රික්ක 06ක තේ හෙක්ටයාර 5500ක් | සැලැස්මේ කටයුතු ඉඩම් නියමිත පරිදි සිදු | තේ වගාවේ පාංශු සංරක්ෂණ කාලය මාස 12 දක්වා අඩු | 2022 යල සහ මහ දෙකන්නයේ සහ 2023 යල කන්නයේ |

| | | | | |
|---|---|---|---|---|
| | ප්‍රතිසංස්කරණය කර නැවත වගා කිරීමට ව්‍යාපෘතිය සැලසුම් කර තිබුණි. කෙසේ වෙතත්, 2016 වසරේ සැලසුම් කළ පරිදි ව්‍යාපෘතිය එහි මෙහෙයුම් ආරම්භ කර නොතිබුණි. එබැවින්, 2020 දෙසැම්බර් 31 වන විට පුනරුත්ථාපනය කර නැවත වගා කර ඇත්තේ හෙක්ටයාර 2,102 ක් පමණි. ඒ අනුව තේ ඉඩම් ප්‍රතිසංස්කරණය කර නැවත වගා කිරීමේ ඉලක්කය හෙක්ටයාර් 4500 දක්වා සංශෝධනය කිරීමට ව්‍යාපෘතිය තීරණය කර තිබුණි. ඒ අනුව වසරකට අවම වශයෙන් තේ ඉඩම් හෙක්ටයාර් 650ක් ප්‍රතිසංස්කරණය කළ යුතු අතර ව්‍යාපෘතිය ආරම්භ කර වසර 5ක් ඇතුළත මුළු තේ ඉඩම්වලින් සියයට 75ක් ප්‍රතිසංස්කරණය කර නැවත වගා කළ යුතුව තිබුණද එම ඉලක්කයෙන් සාක්ෂාත් කර ගෙන තිබුන ප්‍රතිශතය සියයට 46ක් පමණක් විය. | කළ යුතුය. | කරමින් මාස 18 වගාව වෙනුවට CO3 තෘණ වගාව ක්ෂේත්‍රයට හඳුන්වාදීම ඊට හේතු විය. | ඉඩම් හෙක්ටයාර් 2,580 ක නැවත තේ වගා කිරීමට අපේක්ෂා කෙරේ. |
| (ආ) | වෙබ් අඩවි පාදක කළමනාකරණ තොරතුරු පද්ධතියක් ස්ථාපිත කිරීම සඳහා රුපියල් මිලියන 4.6ක් වෙන් කර තිබුණ අතර ව්‍යාපෘතිය ආරම්භ කර වසර 5ක් ගතවී තිබුනද 2020 වර්ෂය සඳහා එම පද්ධතිය ස්ථාපිත කර නොතිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස දැනට පවතින දිස්ත්‍රික් කාර්යාලය සම්බන්ධීකරණය කිරීමට අවශ්‍ය | කළමනාකරණ තොරතුරු පද්ධතිය ස්ථාපිත කළ යුතුය | වෙබ් පාදක කළමනාකරණ තොරතුරු පද්ධතියේ කටයුතු මේ වන විට අවසන් කර ඇත. | තොරතුරු පද්ධතියට දත්ත ඇතුළත් කිරීම ආරම්භ කර ඇත. |

| | | | | |
|---|---|---|---|---|
| | කළමනාකරණ තොරතුරු පද්ධතිය පවත්වාගෙන යාමට ව්‍යාපෘතියට නොහැකි වී තිබුණි. | | | |
| (ඇ) | 2020 වසරේ ව්‍යාපෘති ප්‍රතිඵල පිළිබඳ සමීක්ෂණයක් පැවැත්වීම සඳහා උපදේශනය සඳහා රු. මිලියන 4.6ක් වෙන් කර තිබුණද එම සමීක්ෂණය ක්‍රියාත්මක කර නොතිබුණි. | ව්‍යාපෘති ප්‍රතිඵල ඇගයීම සඳහා ව්‍යාපෘති ප්‍රතිඵල සමීක්ෂණ ක්‍රියාත්මක කළ යුතුය. | COVID 19 වසංගතය හේතුවෙන් සමීක්ෂණය ප්‍රමාද වූ අතර එහි අවසන් වාර්තාව ව්‍යාපෘතියට ඉදිරිපත් කර ඇත. | ව්‍යාපෘතියේ ප්‍රතිඵල මත පදනම් වූ සමීක්ෂණ වාර්තාව 2021 දෙසැම්බර් 13-17 දිනවල පැවති වලංගු කිරීමේ දූත මණ්ඩලයට ඉදිරිපත් කරන ලද අතර එහි තීරණ සහ නිර්දේශ ජාතික මෙහෙයුම් කමිටුව වෙත ඉදිරිපත් කරන ලදී. |

### 6.4 කෘෂිකර්ම අංශය නවීකරණ ව්‍යාපෘතිය-01 කොටස

(i) උතුරු, නැගෙනහිර, උතුරු-මැද, මධ්‍යම සහ ඌව පළාත්වල කුඩා වතු හිමියන්ගේ සහ කෘෂි ව්‍යාපාරවල කෘෂිකාර්මික ඵලදායිතාව ඉහළ නැංවීම, වෙළඳපල ප්‍රවේශය වැඩිදියුණු කිරීම සහ අගය එකතු කිරීම වැඩිදියුණු කිරීම සඳහා සහය දැක්වීම සඳහා කෘෂිකාර්මික අංශය නවීකරණ ව්‍යාපෘතිය-01 කොටස ක්‍රියාත්මක කර තිබුණි.

(ii) ව්‍යාපෘතියේ ක්‍රියාකාරකම් කොටස් 03ක් යටතේ ක්‍රියාත්මක වේ, එනම් ආයෝජන සූදානම් කිරීමේ සහාය, ගොවි නිෂ්පාදක සංවිධාන සහ කෘෂි ව්‍යාපාර සඳහා ගැළපෙන ප්‍රදාන සහ අර්ධ ණය සහතිකය.

(iii) ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත වියදම ඇමරිකානු ඩොලර් මිලියන 107 ට සමාන වේ. රු. මිලියන 15,612 ක් වන අතර එයින් ඩොලර් මිලියන 63 ක් නොහොත් රු. මිලියන 9,176 ක් ජාත්‍යන්තර සංවර්ධන සංගමය විසින් මූල්‍යකරණය කිරීමට එකඟ වී තිබුණි.

(iv) ව්‍යාපෘතිය 2017 ජනවාරි 23 වන දින එහි කටයුතු ආරම්භ කර 2022 ජනවාරි 23 වන විට අවසන් කිරීමට නියමිතව තිබුණි. කෙසේ වෙතත්, ව්‍යාපෘති කාලය 2023 ජූනි 30 දක්වා දීර්ඝ කර තිබුණි.

(v) ව්‍යාපෘතිය සඳහා 2018, 2019 සහ 2020 වර්ෂ සඳහා ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන සඳහා විගණකාධිපති විසින් තත්වාගණනය කළ විගණන මතයක් ලබා දී තිබුණි. කෙසේ වෙතත්, ව්‍යාපෘතියේ කාර්යසාධනය සම්බන්ධයෙන් මෙතෙක් විසඳී නොමැති ගැටළු කිහිපයක් පහත දැක්වේ.

| | විගණන නිරීක්ෂණ | විගණකාධිපතිගේ නිර්දේශය | ව්‍යාපෘතිය මගින් ගෙන ඇති වැලැක්වීමේ ක්‍රියාමාර්ග | වර්ථමාන තත්වය |
|---|---|---|---|---|
| (අ) | ව්‍යාපෘතිය සඳහා 2020 දෙසැම්බර් 31 දක්වා යෝජිත සමාගම් 65ක් සඳහා ගැළපෙන ප්‍රදාන ලෙස රු. මිලියන 1,184.7ක් අනුමත කර මාස 6 සිට 30 දක්වා කාලයක් ඉකුත් වී තිබුණද ගැලපුම් ප්‍රදාන නිකුත් කර නොතිබුණි. | ව්‍යාපෘතියේ අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා ව්‍යාපෘති ක්‍රියාකාරකම් අධීක්ෂණය කිරීමට කටයුතු කළ යුතුය. | ප්‍රමාදය ප්‍රධාන වශයෙන් පහත සඳහන් හේතූන් මත සිදු වේ; ව්‍යාපෘතිය ආරම්භ කිරීමට සූදානම් වී නොතිබීම, කෝවිඩ් හේතුවෙන් නියමිත වේලාවට නීතිමය ලියකියවිලි ඉදිරිපත් නොකිරීම, ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේදී අනුමැතිය ලබා ගැනීම ප්‍රමාද වීම සහ යෝජනා ඉදිරිපත් කිරීම ප්‍රමාද වීම. | ව්‍යාපෘතිය විසින් මේ දක්වා යෝජිත සමාගම් 310ක් සඳහා ගැළපෙන ප්‍රදාන වශයෙන් රුපියල් මිලියන 4,639.7 ක මුදලක් නිකුත් කර තිබුණි. |
| (ආ) | දෙවන ආධාර මුදල වූ රු. මිලියන 341 ක අනුමත ප්‍රදාන වලින් 2020 දෙසැම්බර් 31 දින දක්වා මිලියන 144 ක් නිදහස් කර නොතිබුණි. පළමු වාරික නිකුත් කර මාස 5ක් 15ක් ගතවී ඇතත් වැඩ | යෝජිත සමාගම් විසින් ක්‍රියාත්මක කරන ක්‍රියාකාරකම් පිළිබඳව සමීප අධීක්ෂණයක් අවශ්‍ය වී තිබුණි. | දෙපාර්ශවයම අනවශ්‍ය ප්‍රමාදයන් ඉවත් කිරීම සහ නියමිත පරාමිතීන් තුළ වාරික කඩිනම් කිරීම සඳහා ක්‍රියා කරමින් පවතී. | රු. මිලියන 2,853.7ක් වූ දෙවන වාරිකය ලෙස යෝජිත සමාගම් 144ක් වෙත මේ දක්වා මුදා හැර ඇත. |

| | | | | |
|---|---|---|---|---|
| | අසම්පූර්ණ නිසා නදහස් කිරීම ප්‍රමාද වී ඇත. | | | |
| (ඇ) | අනුමත ප්‍රදානයන් රු. 2017, 2018 සහ 2019 වසර දෙක තුනක කාලයක් තුළ ආයෝජකයින් 232ක් සඳහා රු. මිලියන 4,830ක් ලබා දී තිබුණි. නමුත් රු. මිලියන 57.83 ක ආයෝජකයින් පමණක් 2020 වසර අවසන් වන විට ඔවුන්ගේ ආයෝජනය සම්පූර්ණ කර තිබුණි. | යෝජක සමාගම් විසින් ක්‍රියාත්මක කරන ක්‍රියාකාරකම් පිළිබඳව සමීප අධීක්ෂණයක් අවශ්‍ය වේ. | දෙපාර්ශවයම අනවශ්‍ය ප්‍රමාදයන් ඉවත් කිරීම සහ නියමිත පරාමිතීන් තුළ වාරික කඩිනම් කිරීම සඳහා ක්‍රියා රකමින් පවතී. | රු. මිලියන 14.7ක් තුන්වන වාරිකය ලෙස යෝජිත සමාගම් 36ක් වෙත මුදා හැර තිබුණි. |
| (ඈ) | දරිද්‍රතාවය ඉහළ මට්ටමක පවතින යාපනය, මුලතිව්, අනුරාධපුර, මඩකලපුව, මොණරාගල, මාතලේ සහ පොළොන්නරුව යන ප්‍රමුඛතා දිස්ත්‍රික්ක 7ක ආසන්න වශයෙන් හිටපු නිෂ්පාදක සංවිධාන 350කට ගැළපීම් ප්‍රදාන වැඩසටහන මඟින් ආධාර කිරීමට අපේක්ෂා කෙරේ. කෙසේ වෙතත්, අදාළ ප්‍රදාන ලබාදීම සඳහා ව්‍යාපෘතිය මගින් කොළඹ, ගම්පහ, කළුතර, කුරුණෑගල ඇතුළු තවත් දිස්ත්‍රික්ක 15ක් තෝරාගෙන තිබුණි. ඉහත සඳහන් කළ අනෙකුත් දිස්ත්‍රික්ක 15 සඳහා මුළු ප්‍රදානවලින් සියයට 86.6ක් | යෝජක සමාගම් විසින් ක්‍රියාත්මක කරන කටයුතු පිළිබඳව සමීප අධීක්ෂණයක් සිදු කිරීම අවශ්‍ය වී තිබුණි. | මෙම හඳුනාගත් දිස්ත්‍රික්කවල මහා පරිමාණ දැනුවත් කිරීමේ වැඩසටහන් සංවිධානය කරමින් ප්‍රදාන යෝජනා ක්‍රමය පිළිබඳව ආයෝජකයින් දැනුවත් කිරීමට ව්‍යාපෘතිය හැකි සෑම පියවරක්ම ගන්නා ගෙන තිබුණි. | දරිද්‍රතාවයෙන් පෙළෙන දිස්ත්‍රික්කවල අඩු ප්‍රතිචාර හේතුවෙන්**,** ඉහළ ආයෝජන සහිත වඩාත් ශක්‍ය ව්‍යාපෘති පැවැති බැවින් අනෙකුත් දිස්ත්‍රික්කවල ආයෝජන යෝජනා සලකා බැලීමට **PMU** හට සිදු විය. |

| | | | | |
|---|---|---|---|---|
| | වෙන් කරන තිබුණි. | | | |
| (ඉ) | ව්‍යාපෘති ඇගයුම් ලේඛනයේ ඇමුණුම 2 හි 8(b) vi ඡේදයට අනුව, ආයෝජන යෝජනා සහ අනුරූප ප්‍රදාන වසර දෙක තුනකට නොවැඩි කාලයක් තුළ ක්‍රියාත්මක කරනු ලබයි. කෙසේ වෙතත්, යෝජිත සමාගම් 232 ක් සඳහා අනුමත ගැලපුම් ප්‍රදාන වලින් 2017, 2018 සහ 2019 වර්ෂවල දී රු. මිලියන 4,829.79 න් රු. මිලියන 57.83 ක් වටිනා යෝජකයින් 4 දෙනෙකු පමණක් 2020 වර්ෂය අවසානයේදී ආයෝජන කටයුතු අවසන් කර ඇත. එය අනුමත ගැලපුම් ප්‍රදානයේ අගය ප්‍රතිශතයක් ලෙස ගත් විට සියයට 1.19 කි. ඊට අමතරව තුන්වන වාරිකය ලැබී තිබුණේ යෝජකයින් 4 දෙනෙකුට පමණයි.. | යෝජිත සමාගම් විසින් ක්‍රියාත්මක කරන ක්‍රියාකාරකම් පිළිබඳව සමීප අධීක්ෂණයක් අවශ්‍ය වේ. | PAD යනු ඉතා ධනාත්මක පරිසරයක් මත ප්‍රදාන බෙදා හැරීම සඳහා මාර්ගෝපදේශයක් පමණක් වන නමුත් ප්‍රායෝගිකව අවස්ථා වෙනස් වන අතර ප්‍රමාදයන් නොවැළැක්විය හැකිය. | යෝජිත සමාගම් 36ක් තම ආයෝජන කටයුතු අවසන් කර තිබුණි. |
| (ඊ) | ගැලපෙන දීමනා රු. 2017 සහ 2018 වසරවල දී රු. මිලියන 71.58ක් නිදහස් කර තිබුණේ ව්‍යාපෘති ක්‍රියාකාරකම් අත්හැර දමා ඇති සමාගම් 09ක් සඳහා රු. මිලියන 71.58ක් | තත්ත්වය නිවැරදි කිරීමට අවශ්‍ය කඩිනම් ක්‍රියාමාර්ග සහ ගැළපෙන ප්‍රදාන ගිවිසුමට අනුව පූර්ව ක්‍රියාමාර්ග ගත යුතුය. | ව්‍යාපෘති තුනක් පමණක් අතහැර දමා ඇති බව ඔවුන් දන්නා අතර ගෙවා ඇති ප්‍රදාන අයකර ගැනීමට දැනටමත් නීතිමය ක්‍රියාමාර්ග ගෙන ඇත. | එම ආධාර මුදල අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| | පමණි. සමාලෝචිත වර්ෂය අවසානයේ දී රු. මිලියන 1.35 කි. පසුගිය වසරේ මගේ වාර්තාවේ සඳහන් පරිදි ඉතිරි රු.මිලියන 70.23 අයකර ගැනීම සඳහා අදාළ සමාගම් වලට එරෙහිව නීතිමය ක්‍රියා මාර්ග සමාලෝචිත වර්ෂය අවසානය වන විට ගෙන ඇත. | | | |
| (උ) | ව්‍යාපෘතියේ අරමුණුවලට පටහැනිව අපනයන ගම්මාන 5000ක් පිහිටුවීමට පියවර ගෙන තිබූ අතර එය 2019 ජූනි 17 වැනි දින දෙහියතකණ්ඩියේදී ආරම්භ කිරීම සඳහා රුපියල් මිලියන 4.24ක මුදලක් වැය කර වැය කර තිබුණි. කෘෂිකාර්මික නිෂ්පාදන සඳහා අමතර වටිනාකමක් ලබා දීම ව්‍යාපෘතියේ අරමුණ වුවද එළුවන් මිල දී ගෙන ගොවීන් අතර බෙදා හැරීමට රු.මිලියන 3.4 ක වැය කර තිබුණි. | ව්‍යාපෘතියේ අරමුණට අනුගත විය යුතු අතර ව්‍යාපෘතියේ මෙහෙයුම් පිරිවැය අවම කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. | අපනයන ගම්මාන පිහිටුවීම සමාජ සවිබල ගැන්වීම් සහ අපනයන කෘෂිකර්ම අමාත්‍යාංශය මගින් සිදු කළ වැඩසටහනකි. | - |
| (ඌ) | ව්‍යාපෘතියේ අර්ධ ණය ඇපකර සංචාරකය යටතේ ක්‍රියාකාරකම් සිදු කිරීම සඳහා ඇ.ඩො. මිලියන 7.12 ක ප්‍රතිපාදන 2020 දෙසැම්බර් 31 දින | පෞද්ගලික බැංකු හරහා මෙම ණය යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කිරීමට සහය ලබා ගැනීමට කටයුතු කළ යුතුයි. | අර්ධ ණය සහතිකය පිළිබඳ විගණකගේ මතය සත්‍ය සහ පිළිගත හැකි ය. | පෞද්ගලික බැංකු හරහා මෙම ණය යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කිරීමට කටයුතු කර නොතිබුණි. |

දක්වා ප්‍රයෝජනයට ගෙන
නොතිබූ බව නිරීක්ෂණය
විය.

**6.5 කෘෂිකාර්මික අංශ නවීකරණ ව්‍යාපෘතිය- 02 කොටස**

(i) කෘෂිකාර්මික අංශය නවීකරණ ව්‍යාපෘතිය-02 කොටස යාපනය, මුලතිව්, අනුරාධපුර, මඩකලපුව, මොණරාගල, මාතලේ සහ පොළොන්නරුව දිස්ත්‍රික්කවල කෘෂිකාර්මික ඵලදායිතාව ඉහළ නැංවීම, වෙළඳපල ප්‍රවේශය වැඩිදියුණු කිරීම සහ කුඩා වතු හිමියන්ගේ සහ කෘෂි ව්‍යාපාරවල අගය එකතු කිරීම සඳහා සහය දැක්වීම සඳහා ක්‍රියාත්මක කෙරේ. තවද, කුඩා වතු හිමියන්ට තරඟකාරී සහ අලෙවි කළ හැකි භාණ්ඩ නිෂ්පාදනය කිරීම, වෙළඳපල අවශ්‍යතාවලට ප්‍රතිචාර දැක්වීමේ ඔවුන්ගේ හැකියාවන් වැඩිදියුණු කිරීම සහ වාණිජකරණය කරා ගමන් කිරීම සඳහා වන සහයෝගය කෘෂිකාර්මික අංශ නවීකරණ ව්‍යාපෘතිය - 02 කොටස යටතේ සිදු කිරීමට අපේක්ෂා කර තිබුණි.

(ii) ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත වියදම ඇමෙරිකානු ඩොලර් මිලියන 65ක් වන අතර එයින් රු. මිලියන 9,176ක් ජාත්‍යන්තර සංවර්ධන සංගමය විසින් ලබාදීමට එකඟ වී තිබුණි.

(iii) ව්‍යාපෘතිය **2017** ජනවාරි **01** දින එහි කටයුතු ආරම්භ කර **2021** දෙසැම්බර් **31** වන විට අවසන් කිරීමට නියමිතව තිබුණි. කෙසේ වෙතත්**,** ව්‍යාපෘති කාලය **2023** ජුනි **30** දක්වා දීර්ඝ කර තිබුණි.

(iv) ව්‍යාපෘතිය සඳහා ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන සඳහා විගණකාධිපති විසින් 2018 වර්ෂය සඳහා තත්වාගනනය කල විගණන මතයක් සහ 2019 සහ 2020 වසර සඳහා තත්වාගනනය නොකල විගණන මතයක් ඉදිරිපත් කර තිබුණි. කෙසේ වෙතත්, ව්‍යාපෘතියේ ක්‍රියාකාරීත්වය සම්බන්ධයෙන් මෙතෙක් විසඳී නොමැති ගැටළු කිහිපයක් පහත දැක්වේ.

| | විගණන නිරීක්ෂණ | විගණකාධිපතිගේ නිර්දේශය | ව්‍යාපෘතිය මගින් ගෙන ඇති වැලැක්වීමේ ක්‍රියාමාර්ග | වර්ථමාන තත්වය |
|---|---|---|---|---|
| (a) | ජාත්‍යන්තරව පිළිගත් කෘෂිකර්ම තාක්ෂණ සේවා සපයන්නාගේ සහාය ඇතිව | ජාත්‍යන්තර සේවා සපයන්නා සමඟ සම්බන්ධීකරණයක් | විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණය පිළිගනු ලැබේ. | කෘෂිකාර්මික තාක්ෂණ ජාත්‍යන්තර ප්‍රදර්ශන උද්‍යාන |

| | | | |
|---|---|---|---|
| යාපනය, මුලතිව්, මඩකලපුව, මොනරාගල, අනුරාධපුර, පොළොන්නරුව සහ මාතලේ දිස්ත්‍රික්කවල නවීන කෘෂිකර්ම තාක්ෂණ උද්‍යාන පිහිටුවීම ව්‍යාපෘතියේ මූලික ක්‍රියාකාරකම විය.කෙසේ වෙතත්, කෘෂිකාර්මික තාක්ෂණ ප්‍රදර්ශන උද්‍යාන සැලසුම් කිරීම, ස්ථාපනය කිරීම, ක්‍රියාත්මක කිරීම, කළමනාකරණය කිරීම සහ පැවරීම සඳහා වූ කොන්ත්‍රාත්තුව 2019 ඔක්තෝබර් 16 දින ඇමෙරිකානු ඩොලර් මිලියන 4.35ක ඇස්තමේන්තුගත වියදමකින් ජාත්‍යන්තර සේවා සපයන්නා වෙත ප්‍රදානය කර තිබුනේ මාස 33කට වැඩි ප්‍රමාදයකින් පසුව වන අතර එම කටයුතු 2021 නොවැම්බර් 30 වන විට අවසන් කිරීමට අපේක්ෂා කර තිබුණි. කෙසේ වෙතත්, 2021 දෙසැම්බර් 31 දිනට කිසිදු පාර්ල් එකක් ස්ථාපිත කර නොතිබුණි. මේ හේතුවෙන් ව්‍යාපෘතියේ සියලු කටයුතු ප්‍රමාද විය හැකිව තිබුණි. | පවත්වා ගත යුතු අතර ප්‍රමාද වූ ක්‍රියාකාරකම් යතාවත් කිරීමට කඩිනම් ක්‍රියාමාර්ග ගත යුතුය. | සේවා සපයන්නා තෝරාගැනීමේදී ඉතා දීර්ඝ ප්‍රසම්පාදන ක්‍රියා පටිපාටියක් අනුගමනය කිරීමට සිදුවීම ප්‍රමාදයට හේතුව විය. | 07ක් සැලසුම් කිරීම, ස්ථාපිත කිරීම, ක්‍රියාත්මක කිරීම, කළමනාකරණය කිරීම සහ පැවරීම සඳහා වන කොන්ත්‍රාත්තුව 2019 ඔක්තෝබර් 16 වැනි දින ඇමෙරිකානු ඩොලර් මිලියන 4.35ක ඇස්තමේන්තුගත මුදලකට ජාත්‍යන්තර සේවා සපයන්නා වෙත ප්‍රදානය කරන කර ඇත. |

## 7. සෞඛ්‍ය අංශය

### 7.1 හදිසි ප්‍රතිචාර සහ සෞඛ්‍ය පද්ධති සූදානම ව්‍යාපෘතිය

(i) Covid 19 හදිසි ප්‍රතිචාර සහ සෞඛ්‍ය පද්ධති සූදානම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කර ඇත්තේ COVID-19 මගින් එල්ල වන තර්ජනය වැළැක්වීම, හඳුනා ගැනීම සහ ඒවාට ප්‍රතිචාර දැක්වීම සහ ශ්‍රී ලංකාවේ මහජන සෞඛ්‍ය සූදානම සඳහා ජාතික පද්ධති ශක්තිමත් කිරීම සඳහාය.

(ii) ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත වියදම රු. මිලියන 25,655 ට සමාන ඇමරිකානු ඩොලර් මිලියන 128.6 ක් වන අතර ඉන් රු. මිලියන 18,673.2 ට සමාන ඇමරිකානු ඩොලර් මිලියන 93.6 ක් ජාත්‍යන්තර සංවර්ධන සංගමය විසින් මූල්‍යකරණය කිරීමට එකඟ වී තිබූ අතර ඉතිරි ඩොලර් මිලියන 35 ට සමාන රු. මිලියන 6,982.5 ක් ප්‍රතිසංස්කරණය හා සංවර්ධනය සඳහා වූ ජාත්‍යන්තර බැංකුව විසින් මූල්‍යකරණය කිරීමට එකඟ වී තිබුණි.

(iii) ව්‍යාපෘතිය 2020 අප්‍රේල් 02 දින එහි කටයුතු ආරම්භ කර 2023 දෙසැම්බර් 31 වන විට අවසන් කිරීමට නියමිතව තිබුණි.

(iv) ව්‍යාපෘතිය සම්බන්ධයෙන් 2020 වසර සඳහා ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන සඳහා විගණකාධිපති විසින් තත්වාගණනය නොකළ විගණන මතයක් ලබා දී තිබූ අතර ව්‍යාපෘතියේ ක්‍රියාකාරීත්වය සම්බන්ධයෙන් මෙතෙක් නිරාකරණය කර නොමැති ගැටළු කිහිපයක් පහත දැක්වේ.

| විගණන නිරීක්ෂණ | විගණකාධිපතිගේ නිර්දේශය | ව්‍යාපෘතිය මගින් ගෙන ඇති වැලැක්වීමේ ක්‍රියාමාර්ග | වර්ථමාන තත්වය |
|---|---|---|---|
| (අ) UNICEF සංවිධානය විසින් සැපයීමට එකඟ වී තිබූ වෛද්‍ය සැපයුම් වල සැබෑ පිරිවැය ගණනය කිරීමකින් තොරව ඇස්තමේන්තුගත පිරිවැය වූ රු. මිලියන 5,550ක් | භාණ්ඩ ලැබුණු බව තහවුරු කර පිරිවැය ගණනන් කළ යුතු අතර මෙම වියදම් සනාථ කිරීමට අදාළ ලිඛිත සාක්ෂි විගණනයට | නිරීක්ෂණය සමඟ එකඟ වෙමි. | විගණනයට ලිඛිත සාක්ෂි 2022 මාර්තු 31 දක්වා ඉදිරිපත් කර නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| | ලෙස ගිණුම්ගත කර තිබුණි. තවද, මෙම වෛද්‍ය සැපයුම් රිසිට්පත් තහවුරු කිරීම සහ නිකුත් කිරීම සඳහා වන සාක්ෂි විගණනය වෙත ඉදිරිපත් නොතිබුණි . | ඉදිරිපත් කල යුතුය. | | |
| (ආ) | සමාලෝචිත කාලසීමාව තුළ අවස්ථා 33කදී සිදු කරන ලද ගෙවීම් සඳහා අදාළ ගෙවන්නාගෙන් තහවුරු කිරීම් ලබාගෙන නොතිබූ අතර රඳවා ගැනීමේ මුදල් සඳහා තහවුරු කිරීම් ලබාගෙන නොතිබූ අතර සමාලෝචිත කාලසීමාව තුළ අවස්ථා 56කදී රෝහල් 7කට රජයේ ආදායම රු. මිලියන 42.40ක් ප්‍රේෂණය කර තිබුණි. | මෙම වියදම් සනාථ කරන ලිඛිත සාක්ෂි විගණනයට ඉදිරිපත් කළ යුතුය. | නිරීක්ෂණය සමඟ එකඟ වෙමි. | ලිඛිත සාක්ෂි විගණනයට ඉදිරිපත් කර නැත |
| (ඇ) | ශ්‍රී ලංකා යුධ හමුදාව විසින් මිලදී ගත් උපකරණවල වටිනාකම වූ රු. මිලියන 188.74 න් 2020 දෙසැම්බර් 31 දිනට ඉතිරි තොගය නොසලකා සමාලෝචිත කාල සීමාව සඳහා වියදමක් ලෙස ගිණුම්ගත කර තිබුණි. | කාල සීමාවට අදාළ වියදම් පැහැදිලිව හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුය. | මෙම ඉතිරි ද්‍රව්‍ය ඉදිරියේදී නිරෝධායන මධ්‍යස්ථානවල සහ අතරමැදි සත්කාර මධ්‍යස්ථානවල සුමට ක්‍රියාකාරීත්වයක් සඳහා ලබා දීමට යොදා ගැනේ. | ලිඛිත සාක්ෂි විගණනයට ඉදිරිපත් කර නැත. |
| (ඈ) | ව්‍යාපෘතිය රුපියල් මිලියන 239 ක වියදමින් යතුරුපැදි 805 ක් මිලදී ගෙන මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන් වෙත නිකුත් කර තිබූ නමුත් නිලධාරීන් සහ | දෙපාර්ශවය අතර ගිවිසුමක් ඇතිකර ගත යුතුය. | නිරීක්ෂණය සමඟ එකඟ වෙමි | මේ දක්වා ගිවිසුම අත්සන් කර නොතිබුණි. |

අමාත්‍යාංශය අතර ලිඛිත එකඟතාවකට පැමිණ තිබූ බව තහවුරු වී නොතිබුණි.

### 7.2 ප්‍රාථමික සෞඛ්‍ය සේවා පද්ධතිය ශක්තිමත් කිරීමේ ව්‍යාපෘතිය (සංරචක I සහ II)

(i) ප්‍රාථමික සෞඛ්‍ය සේවා පද්ධතිය ශක්තිමත් කිරීමේ ව්‍යාපෘතිය (සංරචක I සහ II) ප්‍රාථමික සෞඛ්‍ය සේවාවල ප්‍රයෝජනය සහ ගුණාත්මක භාවය ඉහළ නැංවීම සඳහා, රටේ තෝරාගත් ප්‍රදේශයන්හි, අධි අවදානම් ජනගහන කණ්ඩායම්වල බෝ නොවන රෝග හඳුනා ගැනීම සහ කළමනාකරණය කිරීම පිළිබඳ අවධාරණය කිරීම සඳහා ක්‍රියාත්මක කර තිබුණි.

(ii) ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත වියදම රු. මිලියන 697,937 ට සමාන ඇමරිකානු ඩොලර් මිලියන 4,419 ක් වන අතර ඉන් රු. මිලියන 31,588 ට සමාන ඇමරිකානු ඩොලර් මිලියන 200 ක් ප්‍රතිසංස්කරණ හා සංවර්ධනය සඳහා වූ ජාත්‍යන්තර බැංකුව විසින් මූල්‍යකරණය කිරීමට එකඟ වී තිබුණි.

(iii) ව්‍යාපෘතිය 2019 ජනවාරි 23 වන දින එහි කටයුතු ආරම්භ කර 2023 දෙසැම්බර් 31 වන විට අවසන් කිරීමට නියමිතව තිබුණි.

(iv) ව්‍යාපෘතිය සම්බන්ධයෙන් 2019 සහ 2020 වසර සඳහා ඉදිරිපත් කළ මූල්‍ය ප්‍රකාශන සඳහා විගණකාධිපති විසින් තත්වාගණනය කරන ලද විගණන මතයක් ලබා දී තිබුණි. කෙසේ වෙතත්, ව්‍යාපෘතියේ කාර්ය සාධනය සම්බන්ධයෙන් මෙතෙක් විසඳී නොමැති ගැටළු කිහිපයක් පහත දැක්වේ.

| | **විගණන නිරීක්ෂණ** | **විගණකාධිපතිගේ නිර්දේශය** | **ව්‍යාපෘතිය මගින් ගෙන ඇති වැලැක්වීමේ ක්‍රියාමාර්ග** | **වර්ථමාන තත්වය** |
|---|---|---|---|---|
| (අ) | භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තු වාර්තාවලට අනුව, 2020 දෙසැම්බර් 31 දිනට අරමුදල් | ව්‍යාපෘතිය සඳහා ලැබුණු සියලුම අරමුදල් මූල්‍ය ප්‍රකාශනවල හෙළි | නිරීක්ෂණය පිළිගන්නා අතර ERD සහ ව්‍යාපෘති කාර්යාලය විසින් පවත්වාගෙන | මෙම වෙනස සඳහා හේතු මේ දක්වා විගණනයට |

| | | | | |
|---|---|---|---|---|
| | නියෝජිතායතනය ව්‍යාපෘතිය සඳහා රු. මිලියන 9,851ක් ලබා දී තිබුණි. නමුත් එයින් සංරචකය-i සඳහා මුදා හැර ඇත්තේ රු. මිලියන 4,317ක් පමණි. කෙසේ වෙතත්, රු. මිලියන 4,169 ක් අනාවරණය කර ඇති අතර ඉතිරි රු. මිලියන 5,534ක් මූල්‍ය ප්‍රකාශනවල පෙන්වා නොතිබුණි. තවද, රු. මිලියන 231 මහා භාණ්ඩාගාරයෙන් නිකුත් කරන ලද මුදල සහ ව්‍යාපෘතියට ලැබුණු මුදලට අදාළ තොරතුරු ලබා දී නොතිබුණි. | දරව් කළ යුතුය. | යනු ලබන වාර්තා අතර සසඳීම් සිදු කිරීමෙන් වෙනස හඳුනා ගැනීමට දැනටමත් කටයුතු කර ඇත. | ඉදිරිපත් කර නොතිබුණි. |
| (ආ) | 1989 නොවැම්බර් 30 දිනැති අංක.පම්/PS/05 දරන අග්‍රාමාත්‍ය කාර්යාලයේ චක්‍රලේඛ අනුව දිවයිනට පැමිණෙන නිලධාරීන් විසින් වාර්තාවක් ඉදිරිපත් කළ යුතු නමුත්, තායිලන්තය, කොස්ටාරිකා සහ චීන වැනි රටවල සංචාරය කළ නිලධාරීන් 27 දෙනෙකු විසින් විදේශ සංචාරවලින් පසුව එවැනි වාර්තාවක් ඉදිරිපත් කර නොතිබුණි. | වාර්තාව නොපමාව ඉදිරිපත් කළ යුතුය. | අමාත්‍යාංශ ලේකම්වරයා දැනුවත් කිරීමට පියවර ගෙන ඇත. | 2022 මාර්තු 31 වන විට නිලධාරීන් 18 දෙනෙකු පමණක් වාර්තා ඉදිරිපත් කර ඇත. |

| | | | | |
|---|---|---|---|---|
| (ඇ) | ව්‍යාපෘතියේ 1 වන සංරචකය යටතේ ප්‍රතිපාදනවලින් සියයට 70ක් පමණ පළාත් සෞඛ්‍ය සේවය සඳහා වෙන් කර තිබුණද, සමාලෝචිත වර්ෂය සඳහා සෞඛ්‍ය අමාත්‍යාංශයට වෙන් කළ මුදලින් රු. මිලියන 94.13ක් පළාත් සෞඛ්‍ය සේවා සඳහා වැය කර තිබුණි. | පළාත් මට්ටමේ සහ මධ්‍යම මට්ටමේ ක්‍රියාකාරකම් පැහැදිලිව හඳුනාගෙන ක්‍රියාත්මක කළ යුතුයි. | අනෙකුත් ක්‍රියාකාරකම් පළාත් ආයතනවල සිදුවී ඇති අතර, අධීක්ෂණ සහ නියාමනයේ වගකීම සෞඛ්‍ය අමාත්‍යාංශයේ අධ්‍යක්ෂවරුන්, නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්වරුන් සහ අතිරේක ලේකම්වරුන් වෙත පැවරී ඇත. | මේ සඳහා විධිමත් යාන්ත්‍රණයක් 2021 වර්ෂයේදී ස්ථාපිත කර නොතිබුණි |

**7.3 සෞඛ්‍ය පද්ධතිය වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය**

(i) ගුණාත්මක අත්‍යවශ්‍ය සෞඛ්‍ය සේවාවන් සඳහා විශ්වීය ප්‍රවේශය සහ අඛණ්ඩ සත්කාර සැපයීමේ සංකල්පය මත පදනම්ව ප්‍රාථමික සෞඛ්‍ය සේවා පද්ධතියේ කාර්යක්ෂමතාව, සමානාත්මතාවය සහ ප්‍රතිචාරාත්මක බව වැඩිදියුණු කිරීම සඳහා සෞඛ්‍ය පද්ධති වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කර තිබුණි.

(ii) ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත පිරිවැය ඇමරිකානු ඩොලර් මිලියන 50 කට සමාන රු. මිලියන 7,751 ක් වූ අතර, එයින් ඩොලර් මිලියන 37.5 ට සමාන රුපියල් මිලියන 5,813 ක සහන ණයක් ක් සහ ඩොලර් මිලියන 12.5 ට සමාන රු. මිලියන 1,938 ක් ප්‍රදානයක් ලෙස ආසියානු සංවර්ධන බැංකුව විසින් ලබා දීමට එකඟ වී තිබුණි.

(iii) ව්‍යාපෘතිය 2018 දෙසැම්බර් 01 දින එහි ක්‍රියාකාරකම් ආරම්භ කර 2023 නොවැම්බර් 30 වන විට අවසන් කිරීමට නියමිතව තිබුණි. කෙසේ වෙතත්, ව්‍යාපෘතියේ විෂය පථයේ වෙනස්වීම් නිසා අමතර මූල්‍ය වශයෙන් ඇමරිකානු ඩොලර් මිලියන 110ක් ණයක් ලෙස සහ ඩොලර් මිලියන 3ක් ප්‍රදානයක් ලෙස ලැබීම හේතුවෙන් ව්‍යාපෘති කාලය 2025 මැයි 31 දක්වා දීර්ඝ තිබුණි.

(iv) විගණකාධිපති විසින් 2018, 2019 වසර සඳහා ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන සඳහා තත්වාගණනය නොකළ විගණන මතයක් සහ 2020 වසර සඳහා තත්වාගනනය කල

විගණන මතයක් ව්‍යාපෘතිය සම්බන්ධයෙන් ලබා දී තිබුණි. කෙසේ වෙතත්, ව්‍යාපෘතියේ ක්‍රියාකාරීත්වය සම්බන්ධයෙන් මෙතෙක් විසඳී නොමැති ගැටළු කිහිපයක් පහත දැක්වේ.

| | විගණන නිරීක්ෂණ | විගණකාධිපතිගේ නිර්දේශය | ව්‍යාපෘතිය මගින් ගෙන ඇති වැලැක්වීමේ ක්‍රියාමාර්ග | වර්ථමාන තත්වය |
|---|---|---|---|---|
| (අ) | තෝරාගත් ඉඩමේ නොගැලපීම් හේතුවෙන්දොලොස්බාගේ ප්‍රාදේශීය රෝහල් ව්‍යාපෘතියේ ඉදිකිරීම් කටයුතු අතරමග නවතා තිබුණද, කොන්ත්‍රාත්කරුට ගෙවන ලද රු. මිලියන 5.71ක වැඩ ආරම්බකිරීමේ අත්තිකාරම් මුදල අය කර ගෙන නොතිබුණි. | රජයට පාඩුවක් සිදු නොවන පරිදි මේ ප්‍රශ්නය කඩිනමින් විසඳිය යුතුයි. | පළාත් සෞඛ්‍ය දෙපාර්තමේන්තුව විසින් යෝජනා කරන ලද පරිදි දොළොස්බාගේ ප්‍රාදේශීය රෝහල ඉදිකිරීමේ උප ව්‍යාපෘතියේ විෂය පථය වෙනස් කිරීම හේතුවෙන් ගෙවූ අත්තිකාරම් මුදල ආපසු ලබාගෙන නොමැත. | කොන්ත්‍රාත්තුවේ මිල රු. මිලියන 5.26 කින් වැඩි වී ඇත්තේ ගොඩනැගිල්ලේ සැලසුම් කළ ස්ථානය වෙනස් කිරීම හේතුවෙණි. |
| (ආ) | 2020 දෙසැම්බර් 31 වන විට ඇ.ඩො. මිලියන 37.5 ක මුළු ණය මුදලින් නිදහස් කරගෙන ඇත්තේ ඩොලර් මිලියන 13.64 ක් පමණක් වන අතර එය මුළු ණය මුදලින් සියයට 36.37 ක් පමණක් විය. එහි ප්‍රතිඵලයක් ලෙස 2020 වසර අවසානයේදී භාවිත නොකළ ණය ශේෂය මත කැපවීමේ ගාස්තු ලෙස රු. මිලියන 34ක් ගෙවීමට සිදු වී තිබුණි. | අපේක්ෂිත ප්‍රගතිය සාක්ෂාත් කර ගැනීමට සහ කැපවීම් ගාස්තු අවම කිරීමට ක්‍රියා කළ යුතුය. | ආසියානු සංවර්ධන බැංකුව විසින් ණය ගිවිසුමේ එකඟ වූ පරිදි ණය ගිණුමෙන් සෘජුවම හර කරමින් කැපවීම් ගාස්තු අය කර ඇති අතර එය ව්‍යාපෘතියේ ණය ගැනීමේ පිරිවැය ලෙස මූල්‍ය ප්‍රකාශ වල දක්වා ඇත. | 2021 වර්ෂයේදී, භාවිතයට නොගත් ශේෂය සඳහා කැපවීම් ගාස්තු ලෙස රු.මිලියන 60.6 ක් ගෙවා තිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| (ඇ) | ඩබල් කැබ් රථ 07ක් සහ වෑන් රථ 09ක් ප්‍රසම්පාදනය සඳහා ලැබී තිබූ ලංසු ඉල්ලා අස්කරගෙන තිබූ බැවින් රු. මිලියන 2.95ක ලංසු බැඳුම්කර දෙක මුදල් කර ඇත. කෙසේ වෙතත්, කිසිදු හේතුවක් හෝ අධිකාරියක් නොමැතිව රු. මිලියන 1.66 ක මුදලක් සැපයුම්කරු වෙත ආපසු ලබා දී තිබුණි. | මේ මුදල වගකිවයුතු පාර්ශ්වවලින් අයකරගත යුතුය. | ලංසු වලංගු කාලය තුළ ද්විත්ව කැබ් රථ 7ක් සහ වෑන් රථ 9ක් සඳහා ඉදිරිපත් කළ ලංසු සැපයුම්කරු විසින් ඉල්ලා අස්කර ගෙන ඇත. ඒ මත පදනම්ව රු. 2,950,000 ක අදාළ ලංසු බැඳුම්කර වහාම රාජසන්තක කර ති ඇත. | මෙම මුදල 2022 ජනවාරි 31 වන විට අය කර නොතිබුණි. |
| (ඈ) | බදු ඉන්වොයිසියක් ඉදිරිපත් නොකළ කොන්ත්‍රාත්කරුවන් 04 දෙනෙකුට අවස්ථා 07කදී රු. 808,027ක අගය එකතු කළ බද්දක් ගෙවා තිබුණි. තවද, දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි නොකළ සැපයුම්කරුවෙකුට වෛද්‍ය උපකරණ අලෙවි කිරීමේදී එකතු කළ අගය මත බද්ද අයකර ගැනීම සඳහා වෛද්‍ය උපකරණ මිලදී ගැනීමේදී එකතු කළ මුළු මුදල රු. 1,590,832 ක් සමාලෝචිත වර්ෂය තුළ අවස්ථා දෙකකදී එකතු කළ බද්ද ලෙස ගෙවා ඇත. | පනතට අනුව එකතු කළ අගය මත බද්ද ගෙවිය යුතුය. | එකතු කළ අගය මත බද්දට (VAT) වගකියන සැපයුම් ඇති විට, ව්‍යාපෘතිය ප්‍රසම්පාදන අදියරේදී (බදු සමඟ සම්බන්ධතා ප්‍රදානය කිරීමට පෙර) මෙන්ම ඒ අනුව ගෙවීම් අදියරේදී වැට් බදු ලියාපදිංචි කිරීමේ විස්තර පරීක්ෂා කර සත්‍යාපනය කරයි. | වැට් බද්ද නිසි පරිදි ඔවුන්ගේ බදු වාර්තාවල ඇතුළත් කර ඇති බවට සනාථ කරන ලිඛිත සාක්ෂි 2022 ජනවාරි 31 වන දින දක්වා විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. |

## 8. නාගරික සංවර්ධන අංශය

### 8.1 පළාත් පාලනය වැඩිදියුණු කිරීමේ ආංශික ව්‍යාපෘතිය

(i) පළාත් පාලනය වැඩිදියුණු කිරීමේ ආංශික ව්‍යාපෘතිය ගිණුම් කටයුතුභාවය හා මූල්‍යමය හා තාක්ෂණිකව ශක්තිමත් වූ පළාත් පාලන ආයතන මඟින් දියුණු පළාත් පාලන යටිතල පහසුකම් හා කාර්යක්ෂම සේවා සැපයීමක් ඉටුකර ගැනීම සඳහා ක්‍රියාත්මක වේ.

(ii) ව්‍යාපෘතියේ පසුබිම මුදලෙහි අරමුණු වනුයේ දැඩි ලෙස වකුගඩු රෝගයෙන් බලපෑමට ලක්වූ ශ්‍රී ලංකා පළාත් 07 හි අඩු දියුණු ප්‍රදේශවල පළාත් පාලන ආයතන හා ජාතික ජල සම්පාදන හා ජලා පවහන මණ්ඩලයේ යටිතල පහසුකම් හා සපයන සේවා දියුණු කිරීම වේ. එම නිසා, ජල සැපයුම් පද්ධති, යටිතල පහසුකම්, මූලික සේවා සැපයීම් පිළිබඳ පළාත් පාලන ප්‍රතිපත්ති ප්‍රතිසංස්කරණ ගැටලු පිළිබඳව අවධානය යොමු කිරීම අරමුණු වේ.

(iii) ව්‍යාපෘතිය එහි කටයුතු 2012 ජූලි 01 දින ආරම්භ කරන ලද අතර 2019 දෙසැම්බර් 31 වන විට නිම කිරීමට සැලසුම් කර තිබුණි. කෙසේවෙතත්, ව්‍යාපෘතියේ කාලපරිච්ජේදය 2021 දෙසැම්බර් 31 දක්වා දීර්ඝ කර තිබුණි. පළාත් සභා සහ පළාත් පාලන රාජ්‍ය අමාත්‍යාංශයේ ලේකම් ව්‍යාපෘතියේ කාලය 2023 මාර්තු 31 දක්වා දීර්ඝ කිරීමට විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබා ගැනීමට බලාපොරොත්තුවෙන් සිටී.

(iv) විගණකාධිපති 2018 ,2019 සහ 2020 වර්ෂ සඳහා ව්‍යාපෘතිය සම්බන්ධයෙන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන මත තත්ත්වාගණනය නොකළ මතයක් ප්‍රකාශ කර තිබුණි. කෙසේවෙතත්, මේ වනතෙක් නිරවුල් නොකරන ලද ව්‍යාපෘතියේ කාර්යසාධනය සම්බන්ධ ගැටළු කිහිපයක් පහත දැක්වේ.

| | විගණන නිරීක්ෂණ | විගණකාධිපතිගේ නිර්දේශ | ව්‍යාපෘතිය විසින් ගන්නා ලද වළක්වාලීමේ පියවර | වර්තමාන තත්ත්වය |
|---|---|---|---|---|
| (අ) | ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ සැලැස්මට අනුව, ව්‍යාපෘතිය පළාත් 07 ක පළාත් පාලන ආයතන 105 ක ඔවුන්ගේ යටිතල | ව්‍යාපෘතිය අවශ්‍ය ප්‍රමිතිය සහතික වෙමින් නියමිත පරිදි සිවිල් කටයුතු නිම කිරීමට | වර්ෂය අවසානයේදී බොහෝ කටයුතු නිම කරනු ලබන අතර ඉතිරි වැඩ | කොන්ත්‍රාත්කරුවන්ගේ මන්දගාමී කාර්යසාධනය හේතුවෙන් 2021 දෙසැම්බර් 31 දක්වා කටයුතු නිමකිරීමට |

| | | | |
|---|---|---|---|
| පහසුකම් අවශ්‍යතා වැඩිදියුණු කර ගැනීමට සහයෝගය දක්වා තිබුණු අතර, 2017 වර්ෂය අවසාන වන විට අදාළ පළාත් පාලන ආයතන 178ක සංවර්ධන කටයුතු සම්පූර්ණ කර තිබුණි. තවද, අතිරේක ණය පහසුකම් යටතේ පළාත් පාලන ආයතන 29 ක ජල සම්පාදන ව්‍යපෘති 29 ක්, ඉදිකිරීම් කටයුතු 35 සිදු කිරීමට සැලසුම් කර තිබුණු අතර, ඉන් පෙර වර්ෂය අවසානය වන විට ජල සම්පාදන ව්‍යාපෘති 03ක් හා යටිතල පහසුකම් ව්‍යපෘති 11ක් සම්පූර්ණ කර තිබුණි. සමාලෝචිත වර්ෂය තුළදී ජල සම්පාදන ව්‍යාපෘති 08ක් සහ යටිතල පහසුකම් ව්‍යාපෘති 12ක කටයුතු සම්පූර්ණ කර තිබුණි. ඊට අමතරව ව්‍යාපෘති 17ක් මාස 6කට වඩා ප්‍රමාද වී තිබුණි. | කොන්ත්‍රාත්කරු පෙළඹවීම අවශ්‍ය වේ. | කඩිනම් කිරීමට සියලුම ක්‍රියාමාර්ග ගෙන ඇත. | නොහැකි වේ. |

| | | | | |
|---|---|---|---|---|
| (ආ) | මාස 21 සිට මාස 43 දක්වා ආරම්භ කිරීමේ ප්‍රමාදයක් සහිත ජල සැපයුම් ව්‍යාපෘති 09 ක් සඳහා එකතුව රු. මිලියන 3,131.35 ක් වෙන්කර තිබුණි. | කොන්ත්‍රාත්වල පිරිවැය ඉහළ යාමේ හැකියාව සහ අනවශ්‍ය කාලදීර්ඝ කිරීම්වලින් වැළකීම අවශ්‍ය වේ. | ණය ගිවිසුමට අනුව, සවිස්තරාත්මක සැලසුම ජලසම්පාදන හා ජලපවාහන මණ්ඩලය මගින් පිළියෙල කළ යුතුය. විස්තරාත්මක සැලැස්ම, ව්‍යාපෘතිය වෙත ජලසම්පාදන හා ජලාපවාහන මණ්ඩලයෙන් 2018 මාර්තු ලැබී තිබුණි. | 2023 මාර්තු 31 දක්වා ව්‍යාපෘති කාලය දීර්ඝ කිරීමට ඉල්ලීමක් යවා ඇත. |
| (ඇ) | ජල සම්පාදන ව්‍යාපෘති 05 සඳහා එකතුව රු. මිලියන 2,291.71ක් සහ ප්‍රාදේශීය සහා කාර්යාල ගොඩනැගිලි 02ක් සඳහා රු. මිලියන 113.42 ක් වෙන්කර තිබුණද එය 2021 ජුනි 20 දක්වා ආරම්භ කර නොතිබුණි. | හැකි විගස උප ව්‍යාපෘති ආරම්භ කළ යුතු හෝ ව්‍යාපෘති පරිපාලන අත්පොතෙහි සඳහන් වැඩ සැලැස්ම සංශෝධනය කළ යුතුය. | ජල මූලාශවල හිඟකම හේතුවෙන් ජල ව්‍යාපෘති ඉවත් කර ඇති අතර ජාතික සමාලෝචන කමිටුවේ උපදෙස් පරිදි ඉඩම් ගැටළු නිසා ප්‍රාදේශීය සභා ගොඩනැගිලි ඉදිකිරීම ඉවත් කර ඇත. | ගැටලුව මේවන තෙක් විසඳා නොතිබුණි. |
| (ඈ) | අඩු ආදායම් සහිත | මෙම ව්‍යෘපෘති | අදාළ ප්‍රාදේශීය | ගැටලුව මේවන තෙක් |

| | | | | |
|---|---|---|---|---|
| | ප්‍රාදේශීය සභා සඳහා විසඳුමක් ලෙස පරිගණක මෘදුකාංගයක් වන ඊ-පුර නැගුම මෘදුකාංගය පළාත් 07 ක තෝරාගත් ප්‍රාදේශීය සභා 137ක ස්ථාපනය කර ඇත. කෙසේවෙතත්, මධ්‍යම සහ වයඹ පළාත්වල ප්‍රාදේශීය සභා 41කින් ක් ප්‍රාදේශීය සභා 16ක මෘදුකාංගය භාවිත කර නොමැති අතර මොඩුලය සඳහා නිර්මාණය කරන ලද කාර්යයන් අතරින් අපේක්ෂිත ප්‍රතිලාභ ළඟාකර ගැනීමට මෘදුකාංගයට නොහැකි වී තිබුණි. | විදේශ ණය භාවිතා කරන නිසා අපේක්ෂිත අරමුණු අත්කර ගැනීමට අවභ්‍ය පියවර ගත යුතුය. | සභාවල නිලධාරීන්ගේ අඩු කැමැත්ත, අභන්තර සහ බාහිර ස්ථාන මාරුවීම්, වෙනත් මෘදුකාංභ භාවිතය, පුහුණුව ලද කාර්ය මණ්ඩල විසින් පුහුණුව නොලද කාර්ය මණ්ඩල පුහුණු නොකිරීම අධීක්ෂණය නොකිරීම. | විසදා නොතිබුණි. |
| (ඉ) | ප්‍රාදේශීය සභා 12 වෙත භාරදෙන ලද පුර නැගුම ව්‍යාපෘතිය යටතේ රු. මිලියන 332.19ක පිරිවැයකට ඉදිකරන ලද ජල සම්පාදන ව්‍යාපෘති සහ ප්‍රවේශ මාර්ග මාස 30 සිට මාස 57 ක් දක්වා නිෂ්කාර්ය | | පළාත් ප්‍රධානීන් ගැටළුව පිළිබඳ සොයා බැලීමට සහ අවශ්‍ය පියවර ගැනීමට උපදෙස් ලබදී ඇත. | ගැටලුව මේවන තෙක් විසදා නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| | පවතින අතර රු. මිලියන 16.49ක පිරිවැයකට ඉදිකර හෙට්ටිපොල ප්‍රාදේශීය සභාව වෙත භාරදෙන ලද ආදාහනාගාරය මාස 36 වඩා නිශ්කාර්ය පවතී. | | | |
| (ඊ) | රු. මිලියන 513.73 පිරිවැයකට ඉදිකරන ලද බහුකාර්ය ගොඩනැගිලි 12, රු. මිලියන 18.90ක පිරිවැයකට ඉදි කරන ලද පුස්තකාලයක් සහ රු. මිලියන 105.06ක පිරිවැයකට ඉදි කරන ලද සති පොළවල් 03 ක් විවිධ හේතූන් නිසා ඌන උපයෝජිතව පැවතුණි. | -එම- | වෙන් කරන ලද කඩ කුලියට දීම සඳහා රත්තොට සති පොල සඳහා ලංසු කැඳවා ඇති අතර තිස්සමහාරාම මාළු වෙළෙඳපොළ පලතුරු තොග වෙළෙන්දෙකුට කුලියට ලබාදී ඇත. | ගැටලුව මේවන තෙක් විසඳා නොතිබුණි. |
| (උ) | බස්නැවතුම් පොළවල්, බහුකාර්ය ගොඩනැගිලි සහ පානීය ජල ව්‍යාපෘති ඇතුළුව උප ව්‍යාපෘති 16ක් මෙම ව්‍යාපෘති යටතේ නිමකර ප්‍රාදේශීය සභා වෙත භාරදී තිබුණු අතර | අපේක්ෂිත ප්‍රතිලාභ අත්කර ගැනීමට පියවර ගත යුතුය. | අපේක්ෂිත ප්‍රතිලාභ අත්කර ගැනීමට අවශ්‍ය පියවර ගැනීමට සහ නිරන්තරයෙන් තත්වය අධීක්ෂණය කිරීමට අදාළ | මේ වනවිට අපේක්ෂිත ප්‍රතිලාභ අත්කර ගෙන නොතිබුණි. |

| | | | |
|---|---|---|---|
| අපේක්ෂිත ප්‍රතිලාභ අත්කර ගැනීමට අසමත් වී තිබුණි. | | නිලධාරීන්ව දැනුවත් කර ඇත. | |

**8.2** **නැගී එන කලාපවල ග්‍රාමීය යටිතල පහසුකම් සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය**

(i) නැගී එන කලාපවල ග්‍රාමීය යටිතල පහසුකම් සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය ශ්‍රී ලංකාවේ උතුර, උතුරු මැද, නැගෙනහිර සහ ඌව පළාත්වල මූලික යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම මගින් මිනිසුන්ගේ ජීවන තත්ත්වයන් ඉහල නැංවීම හා ජීවනෝපාය සංවර්ධනය කිරීම සඳහා ක්‍රියාත්මක වේ.

(ii) ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත පිරිවැය රු.මිලියන 20,622කට සමාන ජපන් යෙන් මිලියන 15,409 ක් වන අතර ඉන් රු.මිලියන 17,185කට සමාන ජපන් යෙන් මිලියන 12,957 ක් මූල්‍යයනය කිරීමට ජපන් ජාත්‍යන්තර සහයෝගිතා ආයතනය එකඟවී තිබුණි.

(iii) ව්‍යාපෘතිය එහි කටයුතු 2017 ජූලි 07 දින ආරම්භ කර තිබුණු අතර 2024 ජූලි දින වන විට නිම කිරීමට සැලසුම්කර තිබුණි.

(iv) විගණකාධිපති විසින් ව්‍යාපෘතිය සම්බන්ධයෙන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන මත 2018 සහ 2019 වර්ෂ සඳහා තත්ත්වාගණනය නොකළ මතයක් සහ 2020 වර්ෂ සඳහා තත්ත්වාගණනය කළ මතයක් ප්‍රකාශ කර තිබුණි. කෙසේවෙතත්, මේ වනතෙක් නිරවුල් නොකරන ලද ව්‍යාපෘතියේ කාර්යසාධනය සම්බන්ධ ගැටළු කිහිපයක් පහත දැක්වේ.

| විගණන නිරීක්ෂණ | විගණකාධිපතිගේ නිර්දේශ | ව්‍යාපෘතිය විසින් ගන්නා ලද වළක්වාලීමේ පියවර | වර්තමාන තත්ත්වය |
|---|---|---|---|
| I. ව්‍යාපෘතියේ සියලුම ඉදිකිරීම් 2021 සැප්තැම්බර් වන විට නිම කළ යුතු වේ. කෙසේවෙතත්, නිම කළ යුතු උප ව්‍යාපෘති 418න් ක්‍රියාත්මක කිරීම සඳහා උප ව්‍යාපෘති 355ක් පමණක් තෝරාගෙන තිබුණු අතර ඉන් උප ව්‍යාපෘති 232ක කිසිදු ප්‍රගතියක් දක්වා නොතිබුණි. | අපේක්ෂිත කාර්යසාධන මට්ටමක් අත්කර ගැනීමට පියවර ගත යුතුය. | විගණනයට පෙර පැහැදිලි කළ ආකාරයට මෙම ව්‍යාපෘතියට උපදේශකවරුන් බඳවා ගැනීම 2019 සැප්තැම්බර් සිදු වූ අතර ඒ අනුව ව්‍යාපෘතියේ අනෙකුත් කටයුතුවල ප්‍රමාදය හේතුවෙන් සඳහන් කරන ලද කාලය තුළදී අපේක්ෂිත ප්‍රගතියක් අත්කර ගැනීමට නොහැකි වී තිබුණි. | |

ව්‍යාපෘතියේ සැලැස්ම සහ ඉදිකිරීම් නිර්මාණය කිරීමට උපදේශන ආයතන 2ක් පත්කර තිබුණු අතර එම ආයතනවලින් අපේක්ෂිත ප්‍රගතියක් ලබා ගැනීමට අසමත් වී තිබුණි. ව්‍යාපෘති සංදේශය අනුව, 2020 වර්ෂය අවසාන වන විට එකතුව ජපන් යෙන් මිලියන 8,697 ක් උපයෝජනය කළ යුතුවේ. කෙසේවෙතත්, අරමුදල්වලින් සියයට 7.39ක් නියෝජනය වන ජපන් යෙන් මිලියන 643.33ක් පමණක් උපයෝජනය කර තිබුණි.

කෙසේවෙතත්, නිරන්තර අධීක්ෂණය මඟින් එවැනි ප්‍රමාදයන් වළක්වා ගැනීමට පියවර ගනිමින් සිටී.

**8.3 ප්‍රදේශීය සංවර්ධන සහය ව්‍යාපෘතිය**

(i) ප්‍රදේශීය සංවර්ධන සහය ව්‍යාපෘතිය ප්‍රජාවන්ට ප්‍රතිචාරාත්මකව හා වගවීමකින් යුතුව සේවා සැපයීම සඳහා පළාත් පාලන ආයතනවල හැකියාවන් ශක්තිමත් කිරීම සහ උතුර, උතුරු මැද, නැගෙනහිර සහ ඌව පළාත් තුළ ආර්ථික යටිතල පහසුකම් සංවර්ධනයට සහය වීම සඳහා ක්‍රියාත්මක වේ.

(ii) ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත පිරිවැය රු.මිලියන 17,665.63කට සමාන එජඩො මිලියන 100.65ක් වන අතර ඉන් රු.මිලියන 12,222.41කට සමාන එජඩො මිලියන 70ක් මූල්‍යායනය කිරීමට ජාත්‍යන්තර සංවර්ධන සමායතනය එකඟවී තිබුණි.

(iii) ව්‍යාපෘතිය එහි කටයුතු 2019 ජුනි 30 දින ආරම්භ කර තිබුණු අතර 2022 දෙසැම්බර් 30 දින වන විට නිම කිරීමට සැලසුම්කර තිබුණි.

(v) විගණකාධිපති විසින් ව්‍යාපෘතිය සම්බන්ධයෙන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන මත 2019 වර්ෂ සඳහා තත්ත්වාගණනය නොකළ මතයක් සහ 2020 වර්ෂ සඳහා තත්ත්වාගණනය කළ මතයක් ප්‍රකාශ කර තිබුණි. කෙසේවෙතත්, මේ වනතෙක් නිරවුල් නොකරන ලද ව්‍යාපෘතියේ කාර්යසාධනය සම්බන්ධ ගැටළු කිහිපයක් පහත දැක්වේ.

| | විගණන නිරීක්ෂණ | විගණකාධිපතිගේ නිර්දේශ | ව්‍යාපෘතිය විසින් ගන්නා ලද වළක්වාලීමේ පියවර | වර්තමාන තත්ත්වය |
|---|---|---|---|---|
| (අ) | 2020 වර්ෂය සඳහා වාර්ෂික ඇස්තමේන්තුවෙන් මෙම ව්‍යාපෘතිය සඳහා රුපියල් මිලියන 650.70ක් වෙන්කර තිබුණද වර්ෂය තුළදී රු. මිලියන 60.54ක වියදමක් දැරීම හේතුවෙන් වර්ෂය තුළ මූල්‍ය ප්‍රගතිය 9.30% ක් අත්කර ගෙන තිබුණි. | අපේක්ෂිත කාලය තුළදී ව්‍යාපෘතිය නිම කිරීමට අපේක්ෂිත කාර්ය සාධන මට්ටමක් අත්කර ගැනීමට පියවර ගත යුතුය. | වර්ෂය තුළදී අදාළ අග්‍රිමය නිදහස් කිරීමට නොහැකි වීම නිසා ව්‍යාපෘතියට වර්ෂය තුළදී කිසිදු ප්‍රගතියක් ලබා ගැනීමට නොහැකි වීම . | - |
| (ආ) | පූර්ණකාලීන ව්‍යාපෘති අධ්‍යක්ෂකවරයකු සමඟ ව්‍යාපෘති කළමනාකරණ ඒකකය ස්ථාපිත කර නොතිබුණු අතර මෙම ව්‍යාපෘතියේ ව්‍යාපෘති අධ්‍යක්ෂක දේශීය ණය සහ සංවර්ධන අරමුදලේ වැඩ බලන අධ්‍යක්ෂක වන මෙම අමාත්‍යංශයේ අධ්‍යක්ෂක (සැලසුම්) වේ. ඊට අමතරව, ව්‍යාපෘතියේ ආරම්භක කටයුතු සඳහා වැඩ බැලීමේ පදනමින් පත්කර ගන්නා ලද කාර්ය මණ්ඩලයක් ව්‍යාපෘති කළමනාකරණ ඒකකයේ කටයුතුවල අනුයුක්ත කර ඇත. | ව්‍යාපෘතියේ කාර්ය සාධන මට්ටම පවත්වා ගැනීමට යෝග්‍ය කාර්ය මණ්ඩලයක් පත්කර ගත යුතුය. | කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය සහිතව බඳවා ගැනීම් සිදු කර ඇත. | - |
| (ඇ) | උතුර, උතුර මැද, නැගෙනහිර | අදාළ සැලැස්ම | අපේක්ෂිත අරමුණු | - |

| | | | |
|---|---|---|---|
| | සහ ඌව පළාත්වල පළාත් පාලන මට්ටමින් සහභාගීත්ව සංවර්ධන වැඩසටහන සකස්කිරීම මත එකතුව රු. මිලියන 4.93ක් වැයකර තිබුණි. පළාත් පාලන සහභාගීත්ව සංවර්ධන සැලැස්මේ ප්‍රමුඛතාව අනුව සංවර්ධනය සඳහා ව්‍යාපෘති තෝරාගත යුතු වුවත්, මාර්ග සංවර්ධන ව්‍යාපෘති ව්‍යාපෘති කළමනාකරණ කාර්යාලයේ උපදෙස් අනුව ක්‍රියාත්මක කර තිබුණි. | සමස්ථ පළාත් පාලන ආයතන වල අවශ්‍යතාව සඳහා පිළියෙල කර ඇති අතර එහි සඳහන් උප ව්‍යාපෘති ඕනෑම අරමුදලක් භාවිතයෙන් නිම කළ හැකිවේ. ඒ අනුව, මෙම ව්‍යාපෘතියෙන් එහි මුල් ව්‍යාපෘති නිම කළ යුතු බව අදහස් නොවේ. | අත්කර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | ව්‍යාපෘතියේ ආරම්භක කටයුතු සඳහා පත්කරන ලද උපදේශකවරු සිව්දෙනා විසින් කළ යුතු වැඩ නිම නොකිරීම හේතුවෙන් රු. මිලියන 6.47ක් අනාර්ථික වියදමක් ලෙස ගෙවා තිබුණු බව නිරීක්ෂණය විය. | වියදම අනාර්ථික වියදමක් නොවන බව තහවුරු කර ගැනීමට අවශ්‍ය පියවර ගත යුතුය. | ගැටලුව පිළිබඳ තවදුරටත් සොයා බැලීමට කමිටුවක් පත්කර ඇති අතර ඒ අනුව වැඩිදුර තීරණ ගනු ලැබේ. |

## 8.4 යෝජිත නාගරික සංවර්ධන ව්‍යාපෘතියේ පහසුකම් සැපයීමේ ව්‍යාපෘතිය

(i) යෝජිත නාගරික සංවර්ධන ව්‍යාපෘතියේ පහසුකම් සැපයීමේ ව්‍යාපෘතිය ප්‍රමුඛතා නාගරික ව්‍යාපෘති සඳහා ඉහල මට්ටමේ සූදානමක් ඇති කර ගැනීම සඳහා ක්‍රියාත්මක වේ.

(ii) ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත පිරිවැය රු.මිලියන 1,879කට සමාන එජඩො මිලියන 12.20 ක් වන අතර ඉන් රු.මිලියන 1,540කට සමාන එජඩො මිලියන 10ක් මූල්‍යායනය කිරීමට ආසියානු සංවර්ධන බැංකුව එකඟවී තිබුණි. ඉන් රු.මිලියන 884කට සමාන එජඩො මිලියන 5.74ක් පළාත් සභා සහ පළාත් පාලන කටයුතු පිළිබඳ රාජ්‍ය අමාත්‍යාංශය වෙත වෙන්කර තිබුණු අතර ඉතිරි මුදල නාගරික සංවර්ධන, ජල සම්පාදන සහ නිවාස අමාත්‍යාංශය වෙත වෙන්කර තිබුණි.

(iii) ව්‍යාපෘතිය එහි කටයුතු 2019 ජුනි 01 දින ආරම්භ කර තිබුණු අතර 2021 සැප්තැම්බර් 30 දින වන විට නිම කිරීමට සැලසුම්කර තිබුණි.

(iv) විගණකාධිපති විසින් ව්‍යාපෘතිය සම්බන්ධයෙන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන මත 2019 වර්ෂ සඳහා තත්ත්වාගණනය නොකළ මතයක් සහ 2020 වර්ෂ සඳහා තත්ත්වාගණනය කළ මතයක් ප්‍රකාශ කර තිබුණි. කෙසේවෙතත්, මේ වනතෙක් නිරවුල් නොකරන ලද ව්‍යාපෘතියේ කාර්යසාධනය සම්බන්ධ ගැටළු කිහිපයක් පහත දැක්වේ.

### *8.4.1 පළාත් සභා සහ පළාත් පාලන කටයුතු පිළිබඳ රාජ්‍ය අමාත්‍යාංශය මගින් සිදුකරනු ලබන කටයුතු*

| | විගණන නිරීක්ෂණ | විගණකාධිපතිගේ නිර්දේශ | ව්‍යාපෘතිය විසින් ගන්නා ලද වළක්වාලීමේ පියවර | වර්තමාන තත්ත්වය |
|---|---|---|---|---|
| (අ) | විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්ගේ උපදෙස් අනුගමනය කිරීමකින් සහ ප්‍රමාණවත් අධ්‍යනයක් සිදු කිරීමකින් තොරව ව්‍යාපෘති කළමනාකරණ සහ නිර්මාණකරණය සහ සැලසුම් කිරීමේ එකතු කළ වටිනාකම වන රු. මිලියන 169.66ක පාඩුවකට ව්‍යාපෘතිය අවසන් කර තිබුණි. | පාඩුව හඳුනා ගත යුතු අතර විධිමත් පියවර ගත යුතුය. | ව්‍යාපෘතිය අවසන් කිරීමට දෙන ලද උපදෙස් අනුව, එහි කටයුතු විධිමත්ව අවසන් කර තිබුණි. මේ සම්බන්ධව විස්තරාත්මක පිළිතුර මේ වන විටත් විගණනය සඳහා ඉදිරිපත් කර ඇත. | වගකිවයුතු පාර්ශවයන්ගෙන් අලාභය අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| (ආ) | ව්‍යාපෘති අධ්‍යක්ෂක වෙත වැටුප් ගෙවීම සම්බන්ධයෙන් 2019 මාර්තු 05 දිනැති අංක 01/2019 දරන කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ චක්‍රලේඛය ප්‍රකාරව පිහිටුවිය යුතු වැටුුප් පරිමාණයේ පිහිටුවීමකින් තොරව මාසිකව රු.60,000ක් වනසේ මාස 16ක් සදහා රු.960,000ක වැඩිපුර ගෙවීමක් ගෙවා තිබුණි. | නීත්‍යානුකුල නොවන ගෙවීම් සම්බන්ධයෙන් | ව්‍යාපෘතියේ වටිනාකම සැලකිල්ලට ගනිමින් අදාළ වැටුප් ගෙවා තිබුණි. | වගකිවයුතු නිලධාරීන්ට එරෙහිව පියවර ගෙන නොතිබුණි. |
| (ඇ) | 2019 මාර්තු 05 දිනැති අංක 01/2019 දරන කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ චක්‍රලේඛයට පටහැනිව පුරනැගුම ව්‍යාපෘතියේ මූල්‍ය විශ්ලේශක මෙම ව්‍යාපෘතියේ වැඩ බලන පදනම යටතේ ගණකාධිකාරී ලෙස පත්කර තිබුණ අතර එකතුව රු.මිලියන 720,000ක වැටුපක් ගෙවා තිබුණි. | -එම- | මෙම නිලධාරියා ව්‍යාපෘතියේ ආරම්භක කටයුතු සදහා වැඩබලන පදනමින් පත්කර තිබුණි. | -එම- |

***8.4.2 නාගරික සංවර්ධන, ජල සම්පාදන සහ නිවාස අමාත්‍යාංශය මගින් සිදුකරනු ලබන කටයුතු***

| | විගණන නිරීක්ෂණ | විගණකාධිපතිගේ නිර්දේශ | ව්‍යාපෘතිය විසින් ගන්නා ලද වළක්වාලීමේ පියවර | වර්තමාන තත්ත්වය |
|---|---|---|---|---|
| (අ) | උපදේශන වාර්තාවන් 38 ක් ලබා දී තිබුණද, එම වාර්තාවන් ලැබී මාස 1 ත් 6 ත් අතර කාලයක් ගත වූ පසුවද එම වාර්තා 2021 මාර්තු මාසය දක්වාම සමාලෝචනය කර නොතිබුණි. | ව්‍යාපෘතියෙහි වැඩකටයුතු අවසන් කිරීම තුළින් ව්‍යාපෘතියේ අරමුණු ඉටු කර ගැනීම සඳහා ශක්තිමත් හා කාර්යක්ෂම උපදේශන සේවාවන් කළමනාකරණය කිරීමේ ක්‍රමවේදයක් ක්‍රියාත්මක කළ යුතුය. | පියවර ගෙන නොතිබුණි. | 2020/07/28 දිනැති මහා භාණ්ඩාගාරය චක්‍රලේඛය හා ඊආර්/ඒබී/යූඑස්/01/(Voli) මගින් කරන ලද ඉල්ලීම අනුව අමාත්‍යාංශයේ ලේකම් උපදේශන සේවාව අවසන් කර තිබුණි. |
| (ආ) | සමාලෝචිත වර්ෂය අවසාන වීමට පෙර ඉදිරිපත් කළ යුතුව තිබුණු උපදේශන වාර්තාවන් 30 ක්, 2021 අප්‍රේල් මාසය අවසානය දක්වාම ඉදිරිපත් කර නොතිබුණි. උපදේශන වාර්තා මාස 1 සිට 13 දක්වා කාලයක් ප්‍රමාද | ව්‍යාපෘතියෙහි වැඩකටයුතු අවසන් කිරීම තුළින් ව්‍යාපෘතියේ අරමුණු ඉටු කර ගැනීම සඳහා ශක්තිමත් හා කාර්යක්ෂම උපදේශන | පියවර ගෙන නොතිබුණි. | නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි. |

| | | | |
|---|---|---|---|
| | කර තිබුණද, කිසිදු උපදේශකවරයෙකුගෙන් ප්‍රමාද ගාස්තු අයකර නොතිබුණි. එසේම, ප්‍රමාද ගාස්තු අයකර ගැනීමට අදාළ ප්‍රතිපාදන කිසිවක් ගිවිසුම්වලට ඇතුළත් කරද නොතිබුණි. ප්‍රමාණවත් උපදේශක කාර්ය මණ්ඩලයක් වැඩ කටයුතු සඳහා යෙදවීමට කටයුතු නොකිරීම මෙම ප්‍රමාදයට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි. | සේවාවන් කළමනාකරණය කිරීමේ ක්‍රමවේදයක් ක්‍රියාත්මක කළ යුතුය. | |
| (ඇ) | ලැබුණු තොරතුරුවලට අනුව, ණය ලබාදීමේ නියෝජිතායතනය මඟින් ලබාදී තිබුණු රු.මිලියන 883.88කට සමාන එ.ජ.ඩො මිලියන 4.65 ක මුදලින්, ව්‍යාපෘතියේ කටයුතු ආරම්භ කර 2020 දෙසැම්බර් 31 දිනට මාස 21 ක් ගත වූ පසුවද උපයෝජනය කර තිබුණෙන් එ.ජ.ඩො මිලියන 1.32 කට සමාන රු.මිලියන 255.40ක් හෙවත් මුළු ප්‍රතිපාදනයෙන් සියයට 29 ක් පමණි. එසේම | ව්‍යාපෘතියේ වැඩකටයුතු සැලසුම් කළ කාලය තුළ හා අයවැය ලේඛනයට අනුකූලව නිම කිරීමට කටයුතු කළ යුතුය. | පියවර ගෙන නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| | ව්‍යාපෘති කටයුතුවල පැවති දුර්වල ප්‍රගතිය හා ව්‍යාපෘතියෙහි දුර්වල මූල්‍ය පුරෝකතනය හේතුවෙන් රු.මිලියන 14.79කට සමාන එ.ජ.ඩො මිලියන 79,394 ක් උපයෝජනය කිරීමකින් තොරව 2020 දෙසැම්බර් 31 දිනට විශේෂ (ඩොලර්) ගිණුමේ රඳවා ගෙන තිබුණි. | | | |
| (ඇ) | 2020 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියෙහි අනුමත කාර්ය මණ්ඩලය 28 ක් වූ අතර තථ්‍ය කාර්ය මණ්ඩලය 20 ක් විය. ඒ අනුව පුරප්පාඩු සේවක සංඛ්‍යාව 8 ක් විය. මෙම තත්ත්වය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ කටයුතුවලට අහිතකර ලෙස බලපා තිබුණි. | අනුමත කාර්ය මණ්ඩලය අනුව තනතුරු සඳහා බඳවා ගැනීමට කටයුතු කළ යුතුය. | පියවර ගෙන නොතිබුණි. | -එම- |

## 8.5 උපාය මාර්ගික නගර සංවර්ධන ව්‍යාපෘතිය

(i) ශ්‍රී ලංකාවේ සහභාගීත්ව නගර කලාපවල තෝරාගත් නාගරික සේවා හා පොදු නාගරික ස්ථාන වැඩි දියුණු කිරීමයි.

(ii) ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත පිරිවැය රු.මිලියන 34,912.48කට සමාන එජඩො මිලියන 257.08ක් වන අතර ඉන් රු.මිලියන 27,507කට සමාන එජඩො මිලියන 202ක් මූල්‍යායනය කිරීමට අන්තර්ජාතික සංවර්ධන සංගමය එකඟවී තිබුණි.

(iii) ව්‍යාපෘතිය එහි කටයුතු 2014 මැයි 05 දින ආරම්භ කර තිබුණු අතර 2019 දෙසැම්බර් 31 දින වනවිට නිම කිරීමට සැලසුම්කර තිබුණි. කෙසේවෙතත්, ව්‍යාපෘතියේ කාලය 2021 දෙසැම්බර් 31 දක්වා දීර්ඝ කර තිබුණි.

(iv) විගණකාධිපති විසින් ව්‍යාපෘතිය සම්බන්ධයෙන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන මත 2018,2019 සහ 2020 වර්ෂ සඳහා තත්ත්වාගණනය කළ මතයක් ප්‍රකාශ කර තිබුණි. කෙසේවෙතත්, මේ වනතෙක් නිරවුල් නොකරන ලද ව්‍යාපෘතියේ කාර්යසාධනය සම්බන්ධ ගැටළු කිහිපයක් පහත දැක්වේ.

| | විගණන නිරීක්ෂණ | විගණකාධිපතිගේ නිර්දේශ | ව්‍යාපෘතිය විසින් ගන්නා ලද වළක්වාලීමේ පියවර | වර්තමාන තත්ත්වය |
|---|---|---|---|---|
| (අ) | ව්‍යාපෘතිය එහි කටයුතු 2014 මැයි 05 දින ආරම්භ කරන ලද අතර 2019 වර්ෂය අවසාන වන විට අවසන් විය යුතු වුවද, ව්‍යාපෘති කාලය 2021 දෙසැම්බර් 31 ක් දක්වා තවත් වර්ෂ 02 කින් දීර්ඝ කර තිබුණි. කෙසේවෙතත්, ව්‍යාපෘතිය සඳහා ණය සපයනු ලබන නියෝජිතායතනය විසින් වෙන්කරන ලද රු.මිලියන | මන්දගාමී මූල්‍ය සහ භෞතික කාර්යසාධනයට හේතු සඳහා සහ නිවැරදි ක්‍රියාමාර්ග කාලීනව ගැනීමට අවශ්‍ය පියවර ගත යුතුය. | ප්‍රථම එ.ජ.ඩො මිලියන 147ක මුදල මූල්‍යනය කිරීම 2014 ජුලි 01 ආරම්භ කළ අතර අතිරේක එ.ජ.ඩො මිලියන 55ක මුදල මූල්‍යනය කිරීම 2016 ඔක්තෝබර් 19 දින ක්‍රියාත්මක විය. ව්‍යාපෘතියේ ඉලක්ක අත්කර ගැනීමේ අඩු කාර්යසාධනය හේතුවෙන් මුදල් ප්‍රතිපාදන අඩුකිරීම කෙරෙහි බලපාන ලදි. | 2021 දෙසැම්බර් 31 දිනට රු.මිලියන 13,113.05කට සමාන එජඩො මිලියන 23.90 ක් පමණක් උපයෝජනය කර තිබුණි. එ.ජ.ඩො මිලියන 65 සහ එ.ජ.ඩො මිලියන 27ක් කොවිඩ් අරමුදල සඳහා ඉවත්කිරීම 2021 වර්ෂයේදී බලපාන ලදි. |

| | | | | |
|---|---|---|---|---|
| | 27,507 කට සමාන එජඩො මිලියන 202ක මුළු අරමුදල්වලින්, ව්‍යාපෘතියේ කටයුතු ආරම්භ කිරීමේ දින සිට වර්ෂ 6 ½ ක් ඉකුත් වූ පසු එනම් 2020 දෙසැම්බර් 31 දිනට මුළු වෙන්කිරීමෙන් සියයට 36 ක් නියෝජනය වන රු.මිලියන 11,645.64 කට සමාන එජඩො මිලියන 72.61ක් පමණක් උපයෝජනය කර තිබුණි. | | | |
| (ආ) | ව්‍යාපෘතියෙහි අපේක්ෂිත ප්‍රතිලාභීන් ගණන 600,000ක් වුවද, ව්‍යාපෘතිය අවසාන වන විට තථ්‍ය ප්‍රතිලාභීන් ප්‍රමාණය 400,000 දක්වා අඩු වී තිබුණි. | සැලසුම් කළ කාලපරිච්ඡේදය තුළ ව්‍යාපෘතියෙහි වැඩකටයුතු අවසන් කර ව්‍යාපෘතියෙහි අරමුණු ඉටුකර ගැනීම සඳහා ශක්තිමත් හා කාර්යක්ෂම ව්‍යාපෘති කළමනාකරණ පද්ධතියක් ක්‍රියාත්මක කළ යුතුය. | ව්‍යාපෘතියෙන් ප්‍රතිලාභ ලබන ප්‍රතිලාභීන්ගේ සංඛ්‍යාව අඩුවීමට ප්‍රධාන වශයෙන් හේතු වූයේ ව්‍යාපෘතියට ලබාදුන් අරමුදල්වලින් එ.ජ.ඩො මිලියන 92 ක් (එ.ජ.ඩො මිලියන 27 ක් කොවිඩ් අරමුදල සඳහා එ.ජ.ඩො මිලියන 65 ක් මහනුවර බහු කාර්ය ප්‍රවාහන අංගනය) වෙත ලබාදීම වේ. | KMTT සඳහා සහ කොවිඩ් අරමුදලට එ.ජ.ඩො මිලියන 92ක් ලබාදීම හැරුන විට ඉතිරි එ.ජ.ඩො.මිලියන 97ක මුදල සඳහා ව්‍යාපෘති දියත් කර ඇති යාපන දිස්ත්‍රික්කයේ AB-21 (පාර) හැර අනෙකුත් සියලුම ව්‍යාපෘති මේ වන විට අවසන් කර |

| | | | | |
|---|---|---|---|---|
| | | | | ඇත. |
| (ඇ) | ව්‍යාපෘතියේ උපදේශන ආයතනයේ ශක්‍යතා අධ්‍යයන වාර්තාව මගින් ගාල්ල නගරයේ ගංවතුර පාලනයට මොරගොඩ ඇල ඉවුරෙහි ගංවතුර රඳවාගත හැකි ස්ථාන 10ක් ස්ථාපනයට හඳුනා ගෙන තිබුණද මෙකී ස්ථාන ගංවතුර රඳවා ගතහැකි ප්‍රදේශ පිහිටි ඉඩම් පවරා ගැනීමේ කටයුතු ඉකුත් වර්ෂය අවසාන වන විට අත්හිටුවා තිබුණි. තවද ඒ මත තෙත් බිම් කළමනාකරණ සැලැස්මක් පිළියෙල කර නොතිබුණි. | අදාලවන අනෙකුත් රාජ්‍ය ආයතන සමඟ මනා සම්බන්ධීකරණයකින් යුතුව ඉඩම් පවරා ගැනීමේ කටයුතු ක්‍රියාත්මක කළ යුතුය. හඳුනාගන්නා ලද මහජන අවශ්‍යතා කාර්යක්ෂම ව්‍යාපෘති කළමනාකරණ පද්ධතියක් ක්‍රියාත්මක කිරීම තුළින් සපුරාලීමට කටයුතු කළ යුතුය. | තෙත් බිම් කළමනාකරණ සැලසුමක් පිළියෙල කර නොතිබුණි. | ව්‍යාපෘතිය විසින් ඉඩම් අත්කරගැනීම් ආරම්භ කර අත්කර ගැනීම් ඉදිරියට යන අවස්ථාවේ එවකට පැවති ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටු තීරණයක් අනුව අත්කරගැනීම් කටයුතු නවතා දැමීම නිසා ගැටළුව මතු විය. |
| (ඇ) | බද්දේගම මාර්ගයේ මොරගොඩ ඇල හරහා දිවෙන කහතුඩුව පාලම නැවත ඉදි කිරීමේ කොන්ත්‍රාත්තුවේ වැඩ කටයුතුවල අඩු ප්‍රගතිය හේතුවෙන් රු.මිලියන 22.4 ක් | ඉතිරි වැඩ කොටස් නිම කිරීම සඳහා අවශ්‍ය නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග ගත යුතුය. | අදහස් දක්වා නොමැත. | කහඳුවත්ත පාලමේ සම්පූර්ණ වැඩ අවසන් කර 2020 නොවැම්බර් මස 26 දින මාර්ග සංවර්ධන අධිකාරිය, ගාල්ල වෙත භාරදී ඇත. |

| | | | | |
|---|---|---|---|---|
| | වැය කළ පසුව කොන්ත්‍රාත්තුව අවසන් කර තිබුණි. පසුව කොන්ත්‍රාත්තුව නැවත ප්‍රදානය කර තිබුණි. ඉදිකිරීම් පිරිවැය රු.මි. 42 වීම නිසා ව්‍යාපෘතිය විසින් අතිරේක පිරිවැය රු.මිලියන 10ක් දරා තිබුණි. | | | |
| (ඇ) | 2018 දෙසැම්බර් 31 දිනට මොරගොඩ ප්‍රධාන ඇල මාර්ගය ප්‍රතිසංස්කරණය කිරීමේ කටයුතුවල භෞතික ප්‍රගතිය සියයට 65 ක් දක්වා අපේක්ෂා කර තිබුණද තථ්‍ය ප්‍රගතිය සියයට 19 ක් විය. මන්දගාමී ප්‍රගතිය හේතුවෙන් පසුව කොන්ත්‍රාත්තුව අවසන් කර ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථාව වෙත ලබා දී ඇත. | කොන්ත්‍රාත් කටයුතු ඵලදායී ලෙස අධීක්ෂණය කිරීම අවශ්‍ය වේ. | කොන්ත්‍රාත්තුවේ දුර්වල කාර්යසාධනය හේතුවෙන්, එහි භෞතික ප්‍රගතිය අපේක්ෂා කළ මට්ටමට වඩා පහල තත්ත්වයක් පෙන්නුම් කෙරුණි. | ඉදිකිරීම් කටයුතු (Ch 0+000) සිට (Ch.1+850) දක්වා කොටස 2021 දෙසැම්බර් මස 29 දින වන විට වැඩ අවසන් කර ඇති අතර මේ වන විට පළාත් වාරිමාර්ග දෙපාර්තමේන්තුව සහ ගාල්ල මහා නගර සභාව වෙත භාර දීමට කටයුතු කරමින් පවතී. |
| (ඉ) | ගාලු නගර සීමාව තුළ සංවර්ධනය කළ | අදාලවන අනෙකුත් රාජ්‍ය ආයතන සමඟ | තෙත් බිම් කළමනාකරණ | ව්‍යාපෘතිය විසින් ඉඩම් අත්කරගැනීම් |

| | | | |
|---|---|---|---|
| යුතු කාර්යයන් පිළිබඳව අධ්‍යයනය කිරීමෙන් පසුව, මොරගොඩ ඇල ඉවුරෙහි පිහිටි ස්ථාන 10 ක් ගංවතුර රඳවාගත හැකි ස්ථාන ලෙස උපදේශකවරුන් විසින් හඳුනා ගන්නා ලදී. මෙකී ස්ථාන ගංවතුර රඳවා ගතහැකි ප්‍රදේශ ලෙස සංවර්ධනය කිරීම සඳහා මෙම ස්ථාන පිහිටි ඉඩම් පවරා ගැනීමට ව්‍යාපෘතිය අපොහොසත් වී තිබුණු අතර තෙත් බිම් කළමනාකරණ සැලැස්මක් පිළියෙල කරද නොතිබුණි. ගාල්ල පරිපාලන සංකීර්ණය ඉදිකිරීම සහ අනෙකුත් ඉඩම් අත්පත් කර ගැනීමේ යෝජනාවක් හේතුවෙන් ඉහත කී ඉඩම් අත්පත් කර ගැනීම් කටයුතු අත්හිටුවා තිබුණි. ඒ අනුව, අනෙකුත් සම්බන්ධිත පාර්ශවයන් සමඟ | මනා සම්බන්ධීකරණයකින් යුතුව ඉඩම් පවරා ගැනීමේ කටයුතු ක්‍රියාත්මක කළ යුතුය. හඳුනාගන්නා ලද මහජන අවශ්‍යතා කාර්යක්ෂම ව්‍යාපෘති කළමනාකරණ පද්ධතියක් ක්‍රියාත්මක කිරීම තුළින් සපුරාලීමට කටයුතු කළ යුතුය. | සැලසුමක් පිළියෙල කර නොතිබුණි. | ආරම්භ කර අත්කර ගැනීම් ඉදිරියට යන අවස්ථාවේ එවකට පැවති ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටු තීරණයක් අනුව අත්කරගැනීම් කටයුතු නවතා දැමීම නිසා ඉහත ගැටළුව මතු විය. |

| | | | | |
|---|---|---|---|---|
| | සම්බන්ධීකරණය වීමකින් තොරව ශක්‍යතා අධ්‍යයනයක් සිදුකර ස්ථාන 10ක් තෝරාගෙන තිබුනද ගාලු නගරය තුළ ගංවතුර පාලන කාණු පද්ධති 16 ක් ඉදිකිරීමේ කටයුතු ආරම්භ කර නොතිබුණු අතර ඒ සඳහා අවශ්‍ය ඉඩම් අත්පත් කරගෙනද නොතිබුණි. | | | |
| (ඊ) | මහනුවර බහුකාර්ය ප්‍රවාහන පර්යන්තය ඉදිකිරීම් කටයුතු සඳහා මුළු පිරිවැය රු.මිලියන 9,316.60කට සමාන එ.ජ.ඩො මිලියන 60.11පිරිවැයක් වූ අතර 2020.12.31 දින වන විට රු.මිලියන 419.52 ක් දරා තිබූ නමුත් ව්‍යාපෘති කාලය තුළ ඉදිකිරීම් කටයුතු නිම කිරීමට නොහැකි වීම හේතු කොටගෙන මූල්‍යනය කිරීමේ කටයුතු ජාත්‍යන්තර | ව්‍යාපෘතියෙහි අරමුණු ඉටුකර ගැනීම සඳහා ශක්තිමත් ව්‍යාපෘති කළමනාකරණ පද්ධතියක් ක්‍රියාත්මක කළ යුතුය. | නාගරික සංවර්ධන සහ නිවාස අමාත්‍යාංශය විසින් ගන්නා ලද තීරණයකට අනුව උපායමාර්ගික නගර සංවර්ධන ව්‍යාපෘතිය සඳහා වෙන්කර තිබුණු මුදලින් එ.ජ.ඩොලර් මිලියන 65 ක් ලෝක බැංකුව විසින් නැවත ඉවත් කර ගන්නා ලදි. | මෙම ව්‍යාපෘතිය 2021 දෙසැම්බර් මස මහා මාර්ග අමාත්‍යාංශයට අනුයුක්ත කරන ලදි. එම අමාත්‍යාංශය මගින් ඉතිරි කටයුතු කරගෙන යනු ලැබේ. |

| | | | | |
|---|---|---|---|---|
| | සංවර්ධන නියෝජිතායතනය විසින් අත්හිටුවීමට තීරණය කර තිබුණි. | | | |
| (උ) | රු.මිලියන 1,110.15 ක පිරිවැයක් යටතේ යාපනය පොන්නාලෙයි - පේදුරුතුඩුව පාර (AB21) ඉදිකිරීමේ කොන්ත්‍රාත් කටයුතු 2019 අගොස්තු 12 දින ආරම්භ කර තිබුණු අතර එහි වැඩකටයුතු 2021 මැයි 15 දින නිම කිරීමට සැලසුම් කර තිබුණි. එසේවුවත්, කොන්ත්‍රාත් වැඩකටයුතුවල 2021 මාර්තු වනවිට දිනට භෞතික ප්‍රගතිය අපේක්ෂිත ප්‍රගතිය වූ සියයට 65 සමඟ සැසඳීමේදී සියයට 33 ක් පමණක් විය. එමනිසා, මෙම තත්ත්වය සමනය කර ගැනීම සඳහා කොන්ත්‍රාත්තකරු වෙත මාස 2 ක කාලය දීර්ඝ කිරීමක්ද ලබාදී | දැනට පවතින වර්තමාන ප්‍රගතිය ඇගයීමෙන් පසුව, ඉදිරි කොන්ත්‍රාත්වල වැඩකටයුතු කඩිනම් කිරීම සඳහා අවශ්‍ය පියවර ගත යුතුය. | කොන්ත්‍රාත්කරුවන්ගේ කාර්යසාධනය ඉතා පහල මට්ටමක විය. | අමාත්‍යාංශය හා ව්‍යාපෘතිය මැදිහත් වී සාකච්ඡා කිහිපයක් පැවත් වූ අතර එහි ප්‍රතිඵලයක් වශයෙන් මේ වන විට 72.2%ක භෞතික ප්‍රගතියක් ලබා ඇත. |

තිබුණි.

## 8.6 අනුරාධපුර ඒකාබද්ධ නාගරික සංවර්ධන ව්‍යාපෘතිය

(i) අනුරාධපුර ඒකාබද්ධ නාගරික සංවර්ධන ව්‍යාපෘතිය සංස්කෘතික හා ස්වාභාවික උරුමයන් රැක ගනිමින් අනුරාධපුර නගරයේ පෞරාණික හා නවීකරණය වූ ප්‍රදේශ අතර සමබර සංවර්ධනයක් ප්‍රවර්ධනය කිරීම සඳහා ක්‍රියාත්මක වේ.

(ii) ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත පිරිවැය රු.මිලියන 9,779.95කට සමාන යුරෝ මිලියන 62.40ක් වන අතර ඉන් රු.මිලියන 8149.96කට සමාන යුරෝ මිලියන 52ක් මූල්‍යායනය කිරීමට සංවර්ධනය සඳහා වූ ප්‍රංශ නියෝජිතායතනය මුල්‍යානය කිරීමට එකගවී තිබුණි.

(iii) ව්‍යාපෘතිය එහි කටයුතු 2016 දෙසැම්බර් 01 දින ආරම්භ කර තිබුණු අතර 2021 දෙසැම්බර් 31 දින වනවිට නිම කිරීමට සැලසුම්කර තිබුණි. කෙසේවෙතත්, ව්‍යාපෘතියේ කාලය 2023 සැප්තැම්බර් 30 දක්වා දීර්ඝ කර තිබුණි.

(iv) විගණකාධිපති විසින් ව්‍යාපෘතිය සම්බන්ධයෙන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන මත 2018 සහ 2020 වර්ෂ සඳහා තත්ත්වාගණනය නොකළ මතයක් සහ 2019 වර්ෂ සඳහා තත්ත්වාගණනය කළ මතයක් ප්‍රකාශ කර තිබුණි. කෙසේවෙතත්, මේ වනතෙක් නිරවුල් නොකරන ලද ව්‍යාපෘතියේ කාර්යසාධනය සම්බන්ධ ගැටළු කිහිපයක් පහත දැක්වේ.

| | විගණන නිරීක්ෂණ | විගණකාධිපතිගේ නිර්දේශ | ව්‍යාපෘතිය විසින් ගන්නා ලද වළක්වාලීමේ පියවර | වර්තමාන තත්ත්වය |
|---|---|---|---|---|
| (අ) | ව්‍යාපෘතිය විස්තරාත්මක නිර්මානකරණ අධ්‍යයනය සඳහා උපදේශන සේවාව රු.මිලියන 212.66ක (යුරෝ මිලියන 1.18) මුදලකට ගෟප් හිට් ග්‍රීන් ටෙක් උපදේශක සමාගම සමග එළඹ තිබුණු අතර උපදේශන වාර්තා 2018 | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධාන අනුගමනය කර ප්‍රමාද ගාස්තු අයකර ගත යුතුය. | අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් 2021 මැයි මාසයේදී වෙනත් ප්‍රසම්පාදන කමිටුවක් පත් කර ලදී. කොන්ත්‍රාත් | ව්‍යාපෘති උපදේශක ප්‍රසම්පාදන කමිටුව (CPCP) මෙම උපදේශන සේවා සඳහා 2022 මාර්තු 31 දක්වා කාලය දීර්ඝ කර ලබා දී ඇත. |

| | | | | |
|---|---|---|---|---|
| | ඔක්තෝබර් 12 දින ලබාදීමට එකග වී තිබුණි. පසුව ගිවිසුම් කාලය 2020 මාර්තු 31 දක්වා දීර්ඝ කර තිබුණි. කෙසේවෙතත්, ඇතැම් භාරදිය යුතු කොටස් 2021 මැයි මාසය දක්වා නිමකර නොතිබුණු අතර 2020 දෙසැම්බර් 31 දිනට උපදේශක සමාගම වෙත එකතුව රු.මිලියන 100.32 ක් ගෙවා තිබුණි. | | කාලය (EOT) දීර්ඝ කිරීම සම්බන්ධව සමාලෝචනය කරමින් පවතින අතර සමාලෝචනය අවසන් වූ පසු ප්‍රමාද ගාස්තු අය කිරීම සම්බන්ධව සලකා බලනු ඇත. | |
| (ආ) | අනුරාධපුර දුම්රිය ස්ථානයේ ඇති මහජන චතුරශ්‍රය සහ අනුරාධපුර සිංහ කණුව වට රවුම රු.මිලියන 122.62 ක ඇස්තමේන්තුගත මුදලින් සංවර්ධනය කිරීමේ කොන්ත්‍රාත්තුවේ වැඩ කටයුතු 2021 ජුලි මාසයේදී නිම කිරීමට සැලසුම් කර තිබුණද සමාලෝචිත වර්ෂය අවසානය වන විට මුළු එකතුව රු.මිලියන 17.99ක් වැයකර තිබුණ අතර එහි භෞතික ප්‍රගතිය සියයට 4 ක අගයක් ගෙන තිබුණි. | ව්‍යාපෘතියේ කාර්යයන් නිම කිරීම මගින් ව්‍යාපෘති අරමුණු ඉටුකර ගැනීම සඳහා ශක්තිමත් හා ඵලදායී කොන්ත්‍රාත් පරිපාලන ක්‍රමවේදයන් ක්‍රියාත්මක කළ යුතුය. | නිරීක්ෂණය හා එකඟ වේ. මෙම නිර්මාණ සැලසුම් වෙනස් කිරීම ව්‍යාපෘතියේ භෞතික ප්‍රගතියට බලපාන ලදී. | ව්‍යාපෘතිය මේවනවිට 90% වැඩ අවසන් කර ඇත. පාර්ශවික අවසන් සහතිකය (Partially Completion Certificate) 2022.01.31 දින නිකුත් කරන ලදි. |
| (ඇ) | ව්‍යාපෘතියේ උප ව්‍යාපෘති 4 කොන්ත්‍රාත් | නිර්මාණ සැලසුම් හා විස්තරාත්මක | නිරීක්ෂණය සමඟ එකඟ වේ. | පැකේජ අංක 01 හි සහ පැකේජ අංක 02හි |

| | | | | |
|---|---|---|---|---|
| | කටයුතු රු.මිලියන 336.25 ක ඇස්තමේන්තුගත පිරිවැයකට ප්‍රදානය කර තිබුණු අතර එම කොන්ත්‍රාත් කටයුතු 2021 ජුලි මාසයේදී නිම කිරීමට සැලසුම් කර තිබුණි. එම ව්‍යාපෘතිවලින් ව්‍යාපෘති 3 ක ප්‍රගතිය 2020 දෙසැම්බර් 31 දිනට සියයට 10 ත් සියයට 30 ත් අතර වූ පහල මට්ටමක විය. | සැලසුම් ඇගයීමෙන් පසුව ප්‍රමාණ පත්‍රිකා පිළියෙල කළ යුතුය. | | භෞතික ප්‍රගතිය 90%ක් සහ 82% වේ. 2022 පෙබරවාරි මස අවසන් වන විට සියළු වැඩ අවසන් කිරීමට සැලසුම් කර ඇත. |
| (ඇ) | ණය ලබාදීමේ නියෝජිතායතනය මඟින් ලබා දී තිබුණු රු.මිලියන 8,354.32 කට සමාන යුරෝ මිලියන 52ක මුදලින්, ව්‍යාපෘතියේ වැඩකටයුතු ආරම්භ කර 2020 දෙසැම්බර් 31 දිනට අවුරුදු 4 ක් ගතවී තිබුණද උපයෝජනය කර තිබුණේ යුරෝ මිලියන 1.84කට සමාන රු.මිලියන 308.84 ක් හෙවත් මුළු ප්‍රතිපාදනයෙන් සියයට 3 ක් පමණි. එසේම 2018 වර්ෂයේදී ලබාගෙන තිබුණු අත්තිකාරම් මුදලින් 2021 දෙසැම්බර් 31 දින වනවිට යුරෝ | ව්‍යාපෘතියේ අරමුදල් ඵලදායී හා ආර්ථිකමය වශයෙන් උපයෝජනය කිරීමට හැකිවන පරිදි ශක්තිමත් හා ඵලදායී ව්‍යාපෘති කළමනාකරණ ක්‍රමවේදයන් ක්‍රියාත්මක කළ යුතුය. | නිරීක්ෂණය සමඟ එකඟ වේ. | මේ වනවිට රු.මිලියන 2,123.31 වටිනා කොන්ත්‍රාත් පැකේජ 5ක් ප්‍රදානය කර තිබුණු අතර සියලු අරමුදල් උපයෝජනය කිරීමට හැකි වන පරිදි ව්‍යාපෘතියේ ගිවිසුම් කාලය 2023.09.30 දක්වා දීර්ඝ කර ඇත. |

මිලියන 0.08ක සමාන
රු.මිලියන 19.08ක්
උපයෝජනය කිරීමකින්
තොරව බැංකු ගිණුම්වල
රඳවාගෙන තිබුණි.

## 8.7 කොළඹ අගනගර ආශ්‍රිත නාගරික සංවර්ධන ව්‍යාපෘතිය

(i) කොළඹ අගනගර ආශ්‍රිත නාගරික සංවර්ධන ව්‍යාපෘතිය කොළඹ ජල ද්‍රෝණියේ ජල පෝෂක ප්‍රදේශයේ ජලගැල්ම අඩුකිරීම, කොළඹ අගනගරයේ පළාත් පාලන ආයතනවල ධාරිතාවය ශක්තිමත් කිරීම සහ තෝරාගත් ආදර්ශන ආයෝජනයන් මගින් ප්‍රාදේශීය යටිතල හා සේවා වැඩිදියුණු කිරීම හා නඩත්තු කිරීම සඳහා ක්‍රියාත්මක වේ.

(ii) ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත පිරිවැය රු.මිලියන 42,031.74කට සමාන එ.ජ.ඩො මිලියන 321ක් වන අතර ඉන් රු.මිලියන 27,890.22කට සමාන එ.ජ.ඩො මිලියන 213ක් මූල්‍යයනය කිරීමට ප්‍රතිසංස්කරණය සහ සංවර්ධනය සඳහා වූ අන්තර්ජාතික බැංකුව මගින් මුල්‍යනය කිරීමට එකගවී තිබුණි.

(iii) ව්‍යාපෘතිය එහි කටයුතු 2012 ජුලි 10 දින ආරම්භ කර තිබුණු අතර 2017 ජුනි 30 දින වනවිට නිම කිරීමට සැලසුම්කර තිබුණි. කෙසේවෙතත්, ව්‍යාපෘතියේ කාලය 2021 දෙසැම්බර් 31 දක්වා දීර්ඝ කර තිබුණි.

(iv) විගණකාධිපති විසින් ව්‍යාපෘතිය සම්බන්ධයෙන් ඉදිරිපත් කරන ලද මුල්‍ය ප්‍රකාශන මත 2018, 2019 සහ 2020 වර්ෂ සඳහා තත්ත්වාගණනය කළ මතයක් ප්‍රකාශ කර තිබුණි. කෙසේවෙතත්, මේ වනතෙක් නිරවුල් නොකරන ලද ව්‍යාපෘතියේ කාර්යසාධනය සම්බන්ධ ගැටළු කිහිපයක් පහත දැක්වේ.

| විගණන නිරීක්ෂණ | විගණකාධිපතිගේ නිර්දේශ | ව්‍යාපෘතිය විසින් ගන්නා ලද වළක්වාලීමේ පියවර | වර්තමාන තත්ත්වය |
|---|---|---|---|
| (අ) කොන්ත්‍රාත් ප්‍රදාන කිරීමේ ප්‍රමාදය සහ | කටයුතු කඩිනම් කිරීමට | පවතින තත්ත්වය පියවර සැලකීමෙන් පසු | කොන්ත්‍රාත්තුවේ මිලියන 120ක් පමණ |

| | | | | |
|---|---|---|---|---|
| | පාස්කු ඉරු දින ප්‍රහාරය හේතුවෙන් 2020 දෙසැම්බර් 31 දිනට ටොරින්ටන් සහ නව මුතුවෙල උමං ඉදිකිරීමේ ප්‍රගතිය පිළිවෙලින් සියයට 65 සහ සියයට 88 විය. ඉදිකිරීම් 2020 මැයි 30 දින වන විට නිම කිරීමට සැලසුම් කර තිබුණද, එය 2021 දෙසැම්බර් 31 දක්වා දීර්ඝ කර තිබුණි. එම දිනට USD 28,465,877.57 ක් සහ රු. 233,706,653.07 ක් ගෙවීම් කර ඇති අතර ව්‍යාපෘතියේ භෞතික කාර්ය සාධනය 97% ක් හා මුල්‍ය කාර්ය සාධනය 91% ක් වේ. | ගත යුතු අතර ඉදිකිරීම් කටයුතු සමීපව අධීක්ෂණය කිරීම අවශ්‍ය වේ. | වර්තමානයේ ව්‍යාපෘතිය නිම කිරීමේ කාලය දිර්ඝ කිරීම් 2021 දෙසැම්බර් 21 දක්වා ලබාදී ඇත. | වැඩ කොටසක් 2021 දෙසැම්බර් 31 දින වනවිටත් අවසන් කිරීමට නොහැකි විය. අමාත්‍යංශය හරහා ප්‍රතිපාදන ලබාගැනීමට අවශ්‍ය කටයුතු සිදුකරමින් පවතී. |
| (ආ) | ශාන්ත සෙබස්තියන් උතුරු ජල අගුළු දොරටු සහ පොම්පාගාරය සැලසුම් කිරීම සහ ඉදිකිරීම, අඹතලේ වැසි ජල පොම්පාගාරය සැලසුම් කිරීම සහ | කටයුතු කඩිනම් කිරීමට පියවර ගත යුතු අතර ඉදිකිරීම් කටයුතු සමීපව අධීක්ෂණය කිරීම අවශ්‍ය වේ. | ගංවතුර යටවීම සහ අයහපත් කාලගුණ තත්ත්වය, පාස්කු ප්‍රහාරය, කොවිඩ් 19 වසංගතය වැනි විවිධ හේතුන් නිසා උප ව්‍යාපෘති 06ක | 2021 දෙසැම්බර් 31 පෙර අවසන් කර ඇත. |

| | | | | |
|---|---|---|---|---|
| | ඉදිකිරීම, කෝට්ටේ කොටුබැම්ම ජෛව විවිධත්ව උද්‍යානය සංවර්ධනය, කොලොන්නාව ඇළ හැරවීමේ යෝජනා ක්‍රම අදියර I සහ අදියර IV යනාදී රු. මිලියන 6,760.52ක් වටිනා කොන්ත්‍රාත් 05ක ඉදිකිරීම් කටයුතු 2020 වර්ෂය තුළදී නිම කිරීමට එකඟ වූ පරිදි නිම කර නොතිබුණි. | | නිමකිරීම් ප්‍රමාද විය. | |
| (ඇ) | නොරිස් ඇළ මාර්ගය වැඩි දියුණු කිරීම සඳහා කොන්ත්‍රාත්තුව 2018 අගෝස්තු 21 දින රු.මිලියන 353 ක පිරිවැයකට පිරිනමා තිබුණු අතර 2019 අගෝස්තු 23 දින වන විට නිම කිරීමට අපේක්ෂිත විය. කෙසේවෙතත්, 2020 දෙසැම්බර් 31 දිනට පිළිවෙලින් සියයට 78 සහ සියයට 58 ඉදිකිරීම්වල | කටයුතු කඩිනම් කිරීමට පියවර ගත යුතු අතර ඉදිකිරීම් කටයුතු සමීපව අධීක්ෂණය කිරීම අවශ්‍ය වේ. | වලංගු හේතූන් නිසා උප ව්‍යාපෘති ඉදිකිරීමේ කටයුතුවල ප්‍රගතිය ප්‍රමාද වූ අතර මන්දගාමී ප්‍රගතියක් පෙන්වීය. | කොළඹ මහනගර සභාව විසින් ඉදිකිරීමට අවශ්‍ය ආර්නෝල්ඩ් රත්නායක මාවත ඉදිරිපස මීටර් 126ක දිගුවෙහි සන්තකය භාරදීම ප්‍රමාදවීම නිසා යෝජිත ඇල මාර්ගයේ මුළු දුර වූ මීටර් 632කින් මීටර් 506ක ඉදිකිරීම් පමණක් සම්පූර්ණ කර ඇත. ඉතිරි ඉදිකිරීම් සඳහා අවශ්‍ය ප්‍රතිපාදන ශ්‍රී ලංකා රජයේ අරමුදල (GOSL) මඟින් ඉල්ලා ඇත. |

| | | | | |
|---|---|---|---|---|
| | මන්දගාමී භෞතික හා මූල්‍ය ප්‍රගතියක් විය. තවද ආර්නෝල්ඩ් රත්නායක මාවතේ කොළඹ නගර සභාවට අයිති ගොඩනැගිල්ල කඩා දැමීමේ කටයුතු ප්‍රමාද වීම නිසා ඉදිකිරීම් වර්තමානය වන විට තාවකාලිකව අත්හිටුවා ඇත. එමනිසා, ව්‍යාපෘති කාලපරිච්ඡේදය තුළදී ඉදිකිරීම් කටයුතු නිම කිරීමට නොහැකි වී ඇත. | | | |
| (ඇ) | ව්‍යාපෘතිය විසින් 2017 අගෝස්තු සිට තත්කාලීන ගංවතුර පාලන පද්ධතිය සංවර්ධනය කර ක්‍රියාත්මක කිරීමට උපදේශකවරයකු ලබා ගෙන තිබුණු අතර 2020 ජුනි 30 දිනට දීමනා ලෙස රු. මිලියන 32.9ක් ගෙවා තිබුණි. කෙසේවෙතත්, කටයුතු නිමකිරීමකින් | ව්‍යාපෘතියේ අරමුණු සමග අනුගතවීම අවශ්‍ය අතර ව්‍යාපෘතියේ මෙහෙයුම් පිරිවැය අවම කිරීමට අවශ්‍ය පියවර ගත යුතුය. | පැහැදිලි පිළිතුරක් ලබා දී නොමැත. | ඒකාබද්ධ ගංවතුර කළමනාකරණ පද්ධතිය (IFMS) Integrated Flood Management System තුළින් ගංවතුර පාලනය සඳහා වන සේවය ලබා ගැනීමට අවශ්‍ය කටයුතු මේ වන විට ක්‍රියාත්මක කර ඇති අතර, 2021 දෙසැම්බර් 31 වන විට නිමකිරීමට නොහැකි වූ කොටස් ශ්‍රී ලංකා අරමුදලෙන් |

| | | | | |
|---|---|---|---|---|
| | තොරව ක්ෂණිකව උපදේශකගේ සේවය නිමකර තිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස ව්‍යාපෘතියට උපදේශකගෙන් අපේක්ෂිත ප්‍රතිඵල ලැබී නොතිබුණි. | | | නිමකිරීමට අවශ්‍ය ප්‍රතිපාදන ලබා ගැනීමට අමාත්‍යශය හරහා මුදල් අමාත්‍යශයෙන් ඉල්ලුම් කර ඇත. |
| (ඉ) | බම්බලපිටිය සහ කොල්ලුපිටිය මඟී ගුවන් පාලම සැලසුම් කිරිම සහ ඉදිකිරීම් අධීක්ෂණය සඳහා වන උපදේශන කොන්ත්‍රාත් දෙක රු.මිලියන 27.22ක පිරිවැයකට 2013 දෙසැම්බර් මස සමාගමක් වෙත පිරිනමා තිබුණි. මහා නගර ප්‍රධාන සැලැස්ම සමඟ උපදේශක ඉදිරිපත් කරන ලද සැලැස්ම අනුගත නොවන බව එම සමාගම දැනුවත් නොකර උපදේශන ගාස්තු රු. මිලියන 16.79 ක් ගෙවා තිබුණි. | අරමුණු සමග අනුකූලවීම අවශ්‍ය වේ | පැහැදිලි පිළිතුරක් ලබා දී නොමැත. | මෙම ගුවන් පාලම ඉදිකිරිම සිදු නොවුන අතර, සැලසුම් නිමකර අදාල ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ ආයතනය වන CMC වෙත 2016 වසරේ ලබා දී ඇත. සැලසුම් නිමකිරීමට අදාල ගෙවීම් සිදුකර තිබුණි. CMC විසින් සැලැස්ම අනුගත නොවන බව 2018 දන්වා ඇත. |
| (ඊ) | කිරි මණ්ඩල මාවත, කොළඹ 05 හි පිහිටි ගංවතුර පාලනය සහ | ඉදිකිරීම් කටයුතු කඩිනමින් නිම කිරීමට වගකිව | මිලදී ගත් උපාංග/උපකරණ වන මහලේ | කොවිඩ් 19 උවදුර හේතුවෙන් ගොඩනැගිල්ලේ |

| | | | |
|---|---|---|---|
| ජල කළමනාකරණය සඳහා වන ගොඩනැගිල්ලේ ඉදිකිරීම් කටයුතු නිමකර නොතිබීමේ ප්‍රතිඵලයක් ලෙස, නව ගොඩනැගිල්ලේ තත්කාලීන ගංවතුර පාලන පද්ධතිය ස්ථාපනය කිරීමේ කටයුතු විගණිත දිනය වූ 2021 මැයි 05 දින වන විටත් ආරම්භ කිරීමට නොහැකි වී තිබුණි. මෙම හේතුව නිසා රු. මිලියන 92.15ක පිරිවැයකට මිලදී ගත් මෙම පද්ධතියට අදාළ පරිගණක, පරිගණක තිර(monitor), දත්ත ගබඩා(servers) වැනි මෙම පද්ධතියට සම්බන්ධ උපාංග සවි කිරීමට ස්ථිර ස්ථානයක් නොතිබුණි. තවද, ඉහත ගොඩනැගිල්ල නිම නොකිරීම හේතුවෙන් මෙම පද්ධතියට අදාළ රු. මිලියන 643.3ක් වටිනා ප්‍රසම්පාදන කටයුතු ප්‍රමාද කිරීමට | යුතු පාර්ශවයන් පෙළඹවීමට පියවර ගත යුතුය. | තත්කාලීන ගංවතුර පාලන පද්ධතිය ඒකකයේ සවිකර සහ/හෝ එලීම සිදු කර ඇති අතර ඉදිකිරීම් අවසන් වූ විට නව ගොඩනැගිල්ල වෙත මාරු කරනු ලැබේ. නව ගොඩනැගිල්ල නිම කිරීමේ ප්‍රමාදය හේතුවෙන් සමහර ප්‍රසම්පාදනයන් ප්‍රමාද කිරීමට සිදු වූ බව පිළිගනු ලැබේ. | ඉදිකිරීම් කටයුතු නිම කිරීමට නොහැකි වූ බැවින් සේවා සැපයීමට නොහැකි වී ඇත. ඉතිරි කොටස් නිමකිරීම සඳහා අවශ්‍ය රු.මි. 124 පමණ ඇස්තමේන්තු ගත මුදලක් ශ්‍රී ලංකා රජයේ අරමුදලින් සිදුකිරීමට අවශ්‍ය වන බව දන්වන ලදී. |

සිදු වූ බව අනාවරණය විය. කෙසේවෙතත්, මෙම ව්‍යාපෘතිය 2021 දෙසැම්බර් 31 වන විට අවසන් කිරීමට සිදුවේ. ඉහත ප්‍රසම්පාදන කටයුතු සඳහා වෙන් කරන ලද අරමුදල් උපයෝජනය කරගත හැකි බවට තහවුරු නොවුණි.

## 9. වෙනත් අංශ

### 9.1 ව්‍යාපෘති සකස් කිරීමේ පහසුකම වැඩසටහන

(i) ව්‍යාපෘති සකස් කිරීමේ කටයුතු සඳහා පහසුකම් සැලසීම සඳහා ක්‍රමලේඛන ව්‍යාපෘති සකස් කිරීමේ පහසුකම ක්‍රියාත්මක කෙරෙන අතර, ණය දීමේ නියෝජිතායතනයේ මූල්‍ය ආධාර යටතේ සිදු කිරීමට බලාපොරොත්තු වේ.

(ii) ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත වියදම ඇමරිකානු ඩොලර් මිලියන **4** ට සමාන රුපියල් මිලියන **636** ක් වන අතර සම්පූර්ණ මුදල ප්‍රතිසංස්කරණය හා සංවර්ධනය සඳහා වූ ජාත්‍යන්තර බැංකුව විසින් මූල්‍යකරණය කිරීමට එකඟ විය.

(iii) ව්‍යාපෘතියේ කටයුතු 2018 ජනවාරි 30 වන දින ආරම්භ කර 2020 දෙසැම්බර් 31 දින වන විට අවසන් කිරීමට නියමිතව තිබුණි.

(iv) ව්‍යාපෘතිය සම්බන්ධයෙන් 2018,2019 සහ 2020 වසර සඳහා ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන සඳහා විගණකාධිපතිවරයා විසින් තත්වාගණනය නොකළ විගණන මතයක් ප්‍රකාෂ කර තිබුණ අතර ව්‍යාපෘතියේ ක්‍රියාකාරීත්වය සම්බන්ධයෙන් මෙතෙක් විසඳා නොමැති ගැටළු කිහිපයක් පහතින් දැක්වේ.

| විගණන නිරීක්ෂණය | විගණකාධිපතිවරයාගේ නිර්දේශය | ව්‍යාපෘතිය මගින් ගනු ලබන වැලැක්වීමේ ක්‍රියාමාර්ග | වර්තමාන තත්වය |
|---|---|---|---|
| ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශයෙන් ලද තොරතුරුවලට අනුව, යෝජිත ව්‍යාපෘති **9** සකස් කිරීමට පහසුකම් සැලසීම සඳහා මූල්‍ය ආධාර සැපයීම ව්‍යාපෘතියේ ප්‍රධාන අරමුණයි. ඉන් ව්‍යාපෘති **4**ක් 2018-2020 වර්ෂය තුළ ක්‍රියාත්මක කර තිබුණි. අනෙකුත් ව්‍යාපෘති 5 ක සූදානම් කිරීමේ කටයුතු අත්හැර දමා තිබූ අතර ව්‍යාපෘති කටයුතු **2020** දෙසැම්බර් **31** දිනට නවතා දමා තිබුණි. මේ හේතුවෙන් ඇ.ඩො.මිලියන 04 ක ප්‍රතිපාදනයෙන් ව්‍යාපෘතිය අවසානයේ භාවිතා කර තිබුනේ මුළු ප්‍රතිපාදන වලින් සියයට 9.75 ක් වූ ඩොලර් මිලියන 0.39 ක් පමණක් වූ අතර 2020 වර්ෂය තුළදී ඩොලර් මිලියන 3.61 ක් ණය දෙන නියෝජිතායතනයට ආපසු ගෙවා තිබුණි. | ව්‍යාපෘති කාල සීමාව තුළ ව්‍යාපෘතියේ අරමුණු සාක්ෂාත් කර ගැනීමට කටයුතු කළ යුතුය. | කළමනාකාරිත්වය එකඟ වී ඇති අතර රජයේ ප්‍රතිපත්ති ප්‍රමුඛතා වෙනස් වීම හේතුවෙන් අපේක්ෂිත පරිත්‍යාගශීලීන්ගේ අරමුදල් සහිත ව්‍යාපෘති 05 ක් ස්ථාපිත කර නොතිබුණි. | ව්‍යාපෘතිය වසා දමා තිබුණි. |

**9.2 නායයෑම් අවදානම අවම කිරීමේ ව්‍යාපෘතිය**

(i) නායයෑම් අවදානම අවම කිරීම සහ නායයෑම් කළමනාකරණයට අදාළ ප්‍රතිපත්ති සහ රෙගුලාසි වැඩි දියුණු කිරීම තුළින් නායයෑම් අවදානම සහ හානි අවම කිරීම සඳහා ප්‍රතිපත්ති සකස් කිරීම සහ පහසුකම ක්‍රියාත්මක කිරීම.

(ii) ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත වියදම ඇමරිකානු ඩොලර් මිලියන **110** ට සමාන රු**.** මිලියන **19,976** ක් වන අතර එයින් ඇමරිකානු ඩොලර් මිලියන **80** කට සමාන රු. මිලියන

**14,528** ක් ආසියානු යටිතල පහසුකම් ආයෝජන බැංකුව විසින් මූල්‍යකරණය කිරීමට එකඟ වී තිබුණි.

(iii) ව්‍යාපෘතියෙහි කටයුතු 2019 ජුලි 01 දින ආරම්භ කර 2023 ජූනි 30 වන විට අවසන් කිරීමට නියමිතව තිබුණි.

(iv) ව්‍යාපෘතිය සම්බන්ධයෙන් 2019 සහ 2020 වසර සඳහා ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශයන් සඳහා විගණකාධිපති විසින් තත්වාගණනය කල විගණන මතයක් ලබා දී තිබූ අතර, ව්‍යාපෘතියේ ක්‍රියාකාරීත්වය සම්බන්ධයෙන් මෙතෙක් නිරාකරණය කර නොමැති ගැටළු කිහිපයක් පහතින් දැක්වේ.

| **විගණන නිරීක්ෂණය** | **විගණකාධිපතිවරයාගේ නිර්දේශය** | **ව්‍යාපෘතිය මගින් ගනු ලබන වැලැක්වීමේ ක්‍රියාමාර්ග** | **වර්තමාන තත්වය** |
|---|---|---|---|
| ව්‍යාපෘතියේ **1** වන සංරචකයේ පරමාර්ථය වන්නේ ස්ථාන 147 සඳහා ක්ෂේත්‍ර විමර්ශන, සවිස්තරාත්මක සැලසුම්, ඉදිකිරීම් සහ අධීක්ෂණය/ ක්‍රියාකාරකම් කළමනාකරණය ඇතුළු ප්‍රමුඛතා අවම කිරීමේ ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කිරීම වන අතර මෙම සංරචකය සඳහා ඇමරිකානු ඩොලර් මිලියන 97ක් වෙන් කර තිබුණි. පළමු අදියර යටතේ ස්ථාන 147 න් 27 ක් තීරණාත්මක සහ ක්‍රියාත්මක ප්‍රමුඛතා පදනම ලෙස තෝරාගෙන තිබුණි. කෙසේ වෙතත්, ස්ථාන 27 ක් ඇමෙරිකානු ඩොලර් මිලියන 19.5 ක වටිනාකමකින් යුත් සිවිල් වැඩ කටයුතු වැඩ කොන්ත්‍රාත්තු 4 ක් යටතේ ඉටු කර ඇති අතර 2019 වර්ෂයේදී ප්‍රදානය | ප්‍රමාදයන් හඳුනා ගැනීමට ක්‍රියාමාර්ග ගත යුතු අතර අමතර වියදම් මඟහරවා ගැනීම සඳහා කොන්ත්‍රාත්තුවේ වැඩ නියමිත වේලාවට අවසන් කිරීමට සහතික විය යුතුය. | 2020 වසරේ කොවිඩ් 19 වසංගතයේ බලපෑම සහ 2019 අප්‍රේල් 21 පාස්කු ඉරිදා බෝම්බ ප්‍රහාරය හේතුවෙන් ඉතිරි පැකේජ මිලදී ගැනීම ප්‍රමාද වී ඇත. | 2020 සහ 2021 වර්ෂ වල සිවිල් කොන්ත්‍රාත් වැඩ 8ක් ප්‍රදානය කර තිබූ අතර ඒ සඳහා ඇස්තමේන්තුගත මුදල රු. මිලියන 2,038 කි. |

කිරීමට තීරණය කර තිබුණි. කෙසේ වෙතත්, 2020 දෙසැම්බර් 31 දින වන විට කිසිදු කොන්ත්‍රාත්තුවක් ප්‍රදානය කර නොතිබුණි. එබැවින් ව්‍යාපෘති කාලසීමාව තුළ ඉදිකිරීම් අවසන් කිරීමට හැකිවීම සැක සහිතය. මෙම හේතුව නිසා, 2020 වසර අවසානයේ කිසිදු ණය අරමුදල් ප්‍රමාණයක් භාවිතා කර නොතිබුණි.

**9.3 සමාජ ආරක්ෂණ ජාල ව්‍යාපෘතිය**

(i) සමාජ ආරක්ෂණ ජාල ව්‍යාපෘතිය ශ්‍රී ලංකාවේ දිළිඳු සහ අවදානමට ලක්විය හැකි කණ්ඩායම්වල ප්‍රයෝජනය සඳහා සමාජ ආරක්ෂණ ජාල වැඩසටහන්වල කාර්යක්ෂමතාව සහ විනිවිදභාවය ඉහළ නැංවීම සඳහා දායක වීමට ක්‍රියාත්මක වේ.

(ii) ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුදල රු. මිලියන 11,212.50 ට සමාන ඇමරිකානු ඩොලර් මිලියන **75** ක් වන අතර ව්‍යාපෘතියේ සම්පූර්ණ පිරිවැය ජාත්‍යන්තර සංවර්ධන සංගමය විසින් ලබා දීමට එකඟ වී තිබුණි.

(iii) ව්‍යාපෘතියෙහි කටයුතු 2017 ජනවාරි 01 දින ආරම්භ කර 2022 මාර්තු 31 වන විට අවසන් කිරීමට නියමිතව තිබුණි.

(iv) ව්‍යාපෘතිය සම්බන්ධයෙන් 2018,2019 සහ 2020 වසර සඳහා ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන සඳහා විගණකාධිපති විසින් තත්වාගණනය නොකළ විගණන මතයක් ප්‍රකාශ කර තිබුණ අතර ව්‍යාපෘතියේ ක්‍රියාකාරීත්වය සම්බන්ධයෙන් මෙතෙක් විසඳා නොමැති ගැටළු කිහිපයක් පහතින් දැක්වේ.

| | විගණන නිරීක්ෂණය | විගණකාධිපතිවරයාගේ නිර්දේශය | ව්‍යාපෘතිය මගින් ගනු ලබන වැලැක්වීමේ ක්‍රියාමාර්ග | වර්තමාන තත්වය |
|---|---|---|---|---|
| (අ) | 2019 ජුනි 20 වැනි දින ව්‍යාපෘතිය මගින් නව සුබසාධන ප්‍රතිලාභ යෝජනා ක්‍රමයක් කෙටුම්පත් කර තිබුණද. එය 2021 මාර්තු 23 විගණන දිනය වන විටත් පාර්ලිමේන්තුව විසින් අනුමත කර නොතිබුණි. | සුබසාධන ප්‍රතිලාභ යෝජනා ක්‍රමයේ ගැසට් නිවේදනය අනුමත කිරීමට අදාළ පාර්ශ්වවලට බලපෑම් කිරීමට ක්‍රියා කල යුතු වේ. | 2019 නොවැම්බර් මාසයේ සිට පාර්ලිමේන්තුව විසුරුවා හැරීම හේතුවෙන් රෙගුලාසි අනුමැතිය සඳහා ඉදිරිපත් කිරීමට නොහැකි විය. | නව සුබසාධන ප්‍රතිලාභ යෝජනා ක්‍රමයට මේ දක්වා පාර්ලිමේන්තුවේ අනුමැතිය ලැබී නොතිබුනි. |
| (ආ) | ව්‍යාපෘතියේ 01 සංරචකයේ පරමාර්ථය වන්නේ ඒකාබද්ධ සමාජ ලේඛනය පද්ධතියක් ගොඩනැගීමයි. ප්‍රතිසංස්කරණය කරන ලද සුබසාධන ක්‍රමයේ හරය වනුයේ සියලුම වත්මන් සහ කලින් වැඩසටහන්ගත ප්‍රතිලාභීන් පිළිබඳ දත්ත අඩංගු ඒකාබද්ධ සමාජ ලේඛනයක් සැකසීම වේ. ලැබී ඇති තොරතුරුවලට අනුව, මෙම කොන්ත්‍රාත්තුව 2018 මාර්තු 31 වන දින පුද්ගලික පාර්ශවයකට ලබා දී තිබුණි. කෙසේ වෙතත්, සංවර්ධන කටයුතු 2021 වර්ෂයේදී අවසන් කර තිබුණි. එම හේතුව නිසා අනෙකුත් සියලුම කටයුතු ප්‍රමාද වී තිබුණි. | ප්‍රමාද වූ ක්‍රියාකාරකම් යතාවත් කර ගැනීමට කඩිනම් පියවර ගත යුතුය. | කොන්ත්‍රාත්තුවේ කාලසීමාව දීර්ඝ කිරීමට සිදු වූ අතර එය ව්‍යාපෘතියේ සමස්ත කාලසටහන් වලට බලපා තිබුණි. | සංවර්ධන කටයුතු 2021 වර්ෂයේදී අවසන් කර තිබුණි. |

## 9.4 මූල්‍ය අංශය නවීකරණ ව්‍යාපෘතිය

(i) ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් (MSMEs) සහ පුද්ගලයන් අතර මූල්‍ය වෙළෙඳපොළ කාර්යක්ෂමතාව සහ මූල්‍ය සේවා භාවිතය ඉහළ නැංවීම සඳහා දායක වීමට මූල්‍ය අංශය නවීකරණ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කර තිබුණි.

(ii) ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත වියදම ඇමරිකානු ඩොලර් මිලියන 75 ට සමාන රු. මිලියන 13,125 ක් වන අතර සම්පූර්ණ මුදල ජාත්‍යන්තර සංවර්ධන සංගමය විසින් මූල්‍යකරණය කිරීමට එකඟ වී තබුණි.

**(iii)** ව්‍යාපෘතියෙහි කටයුතු 2017 ඔක්තෝබර් **04** දින ආරම්භ කර 2022 දෙසැම්බර් 31 වන විට අවසන් කිරීමට නියමිතව තිබුණි.

(iv) ව්‍යාපෘතිය සම්බන්ධයෙන් 2018,2019 සහ 2020 වසර සඳහා ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන සඳහා විගණකාධිපති විසින් තත්වාගණනය නොකළ විගණන මතයක් ප්‍රකාශ කර තිබුණ අතර ව්‍යාපෘතියේ ක්‍රියාකාරීත්වය සම්බන්ධයෙන් මෙතෙක් විසඳා නොමැති ගැටළු කිහිපයක් පහතින් දැක්වේ.

| | විගණන නිරීක්ෂණය | විගණකාධිපතිවරයාගේ නිර්දේශය | ව්‍යාපෘතිය මගින් ගනු ලබන වැලැක්වීමේ ක්‍රියාමාර්ග | වර්තමාන තත්වය |
|---|---|---|---|---|
| (අ) | 10 වෙනි ව්‍යාපෘති අරමුදල් නිදහස් කිරීමේ ලේඛනයට අනුව 2019 දෙසැම්බර් 31 දිනට ලබා ගැනීමට සැලසුම් කර ඇති බෙදාහැරීමේ සැලසුම් එම දිනය වන විට සාක්ෂාත් කර ගෙන නොතිබුණි. කෙසේ | අපේක්ෂිත පරිදි සියලු ඉලක්ක සපුරා ගැනීම සඳහා අවශ්‍ය පියවර ගත යුතුය. | 2021 වසර තුළ නිම කිරීමට අපේක්ෂා කරන අතර සංරචක 02 යටතේ ඇති බොහෝ ප්‍රසම්පාදන ක්‍රියාකාරකම් 2021 වසර තුළ | බෙදාහැරීමේ සබැඳි ප්‍රතිඵල 07 (DLRs) 2022 මාර්තු 23 වන විට ලබා ගෙන ඇති අතර අදාළ අරමුදල් ලෝක බැංකුව විසින් ලබා දී ඇත. |

| | | | | |
|---|---|---|---|---|
| | වෙතත්, 2020 අප්‍රේල් මස සිදු කරන ලද මුදල් ගිවිසුමේ සංශෝධනයට අනුව, මෙම බෙදාහැරීම් සම්බන්ධිත ප්‍රතිඵලවල වර්ෂය 2021 වර්ෂය ලෙස සංශෝධනය කර ඇත. | | අවසන් කර ප්‍රදානය කිරීමට අපේක්ෂා කෙරේ. | |
| (ආ) | සංරචක 02 යටතේ අරමුණු කරගෙන තිබුණේ නියාමන ආයතන තුනක සංවිධාන ධාරිතාව ශක්තිමත් කිරීම, වුවත් ප්‍රසම්පාදන කටයුතු ප්‍රමාද වීම හේතුවෙන් එහි ප්‍රගතිය දුර්වල වී තිබුණි. | අපේක්ෂිත පරිදි සියලු ඉලක්ක සපුරා ගැනීම සඳහා අවශ්‍ය පියවර ගත යුතු වේ. | 2021 වසර තුළ නිම කිරීමට අපේක්ෂා කරන අතර සංරචක 02 යටතේ ඇති බොහෝ ප්‍රසම්පාදන ක්‍රියාකාරකම් 2021 වසර තුළ අවසන් කර ප්‍රදානය කිරීමට අපේක්ෂා කෙරේ. | ප්‍රසම්පාදන කටයුතු අවසන් කිරීම ප්‍රමාද වීම හේතුවෙන් ලෝක බැංකුව මුදල් අමාත්‍යාංශය සහ ක්‍රියාත්මක කරන ආයතන තුන එක්ව ප්‍රසම්පාදන කටයුතු පමණක් කරගෙන යාමට එකඟ වී ඇත. |
| (ඇ) | අයවැය ඇස්තමේන්තුවෙන් වෙන් කර තිබූ රුපියල් මිලියන 430.3 ක් වූ මුළු ප්‍රතිපාදනවලින් සමාලෝචිත වර්ෂය සඳහා ව්‍යාපෘතියේ ක්‍රියාකාරකම් සඳහා සියයට 17 ක් වූ රු. මිලියන 74.96 ක මුදලක් පමණක් ව්‍යාපෘතිය මගින් භාවිතා කර තිබුණි. | අපේක්ෂිත පරිදි සියලු ඉලක්ක සපුරා ගැනීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම සහ වෙන් කරන ලද අරමුදල් උපරිම ලෙස භාවිතා කළ යුතු වේ. | නියමිත පරිදි ප්‍රතිපාදන නිදහස් කර ගැනීමට නොහැකි වීම. ප්‍රසම්පාදන ක්‍රියාවලියේ ප්‍රමාදයන් සහ රට තුළ පවතින කොවිඩ් වසංගතය හේතුවෙන් වෙන් කළ ප්‍රතිපාදන අපේක්ෂිත පරිදි | 2021 වර්ෂය සඳහා රු. මිලියන 791.8 ක්, වන මුළු අයවැය ප්‍රතිපාදනවලින් සියයට 98 ක් නියෝජනය වන පරිදි රුපියල් මිලියන 777.9 ක් පමණක් ව්‍යාපෘතිය සඳහා යොදා ගෙන තිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| | | | ප්‍රයෝජනයට ගැනීමට නොහැකි විය. | |
| (ඇ) | ව්‍යාපෘතියේ සම්පූර්ණ ඇස්තමේන්තුගත වියදම ඇමෙරිකානු ඩොලර් මිලියන 75ක් වන අතර එය රු. මිලියන 13,125 කි. ව්‍යාපෘතිය ආරම්භ කර 2020 දෙසැම්බර් 31 වැනි දිනට වසර දෙකක් ගත වුවද මුළු ණය මුදලින් ප්‍රයෝජනයට ගෙන තිබුනේ රු. මිලියන 577.11 කි, එය ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත පිරිවැයෙන් සියයට 4ක් පමණක් වී තිබුණි. | වෙන් කර ඇති මුළු මුදල් ප්‍රයෝජනයට ගැනීමට කටයුතු කළ යුතුයි. | නියමිත පරිදි ප්‍රතිපාදන නිදහස් කර ගැනීමට නොහැකි වීම 10ක් 2021 වර්ෂයේදී ළඟා කර ගැනීමට සැලසුම් කර ඇති අතර, සංරචක 02 යටතේ ප්‍රසම්පාදන ක්‍රියාකාරකම් බොහොමයක් 2021 වර්ෂයේදී අවසන් කර ප්‍රදානය කිරීමට බලාපොරොත්තු වන බැවින්, එම මුදල් භාවිතා කිරීමෙන් 2021 වර්ෂය තුළ භාවිතය සැලකිය යුතු ලෙස වැඩි කළ හැක. | ව්‍යාපෘතියේ සම්පූර්ණ ඇස්තමේන්තුගත පිරිවැය ඇමෙරිකානු ඩොලර් මිලියන 75ක් වන අතර ඉන් ඇමෙරිකානු ඩොලර් මිලියන 11.2ක් ලෝක බැංකුව විසින් ලබා දී ඇති අතර එය දළ වශයෙන් සියයට 15කි. ව්‍යාපෘතියේ සම්පූර්ණ වියදමෙන් ඇමෙරිකානු ඩොලර් මිලියන 58.8ක් අවලංගු කිරීමට තීරණය කර තිබුණි. |

## 9.5 පරිසර පද්ධති සංරක්ෂණ හා කළමනාකරණ ව්‍යාපෘතිය

(i) ප්‍රජාවගේ සංරක්ෂණ අරමුණ සහ ප්‍රතිලාභ සඳහා ශ්‍රී ලංකාවේ තෝරාගත් ස්ථාන වල පරිසර පද්ධති කළමනාකරණයේ තත්ත්වය වැඩිදියුණු කිරීම සඳහා පරිසර පද්ධති සංරක්ෂණ හා කළමනාකරණය සඳහා ව්‍යාපෘතිය ක්‍රියාත්මක කර තිබුණි.

(ii) ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුදල රු. මිලියන 7,827 ට සමාන ඇමරිකානු ඩොලර් මිලියන 45 ක් වන අතර සම්පූර්ණ මුදල ජාත්‍යන්තර සංවර්ධන සංගමය විසින් මූල්‍යකරණය කිරීමට එකඟ වී තිබුණි.

(iii) ව්‍යාපෘතිය 2016 දෙසැම්බර් 01 දින එහි කටයුතු ආරම්භ කර 2021 ජුනි 30 වන විට අවසන් කිරීමට නියමිතව තිබුණි. කෙසේ වෙතත්, ව්‍යාපෘති කාලය 2022 ජුනි 30 දක්වා දීර්ඝ කර තිබුණි.

(iv) ව්‍යාපෘතිය සම්බන්ධයෙන් 2019 සහ 2020 වසර සඳහා ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශයන් සඳහා විගණකාධිපති විසින් තත්වාගණනය නොකල විගණන මතයක් ලබා දී තිබූ අතර, ව්‍යාපෘතියේ ක්‍රියාකාරීත්වය සම්බන්ධයෙන් මෙතෙක් නිරාකරණය කර නොමැති ගැටළු කිහිපයක් පහතින් දැක්වේ.

| | විගණන නිරීක්ෂණය | විගණකාධිපතිවරයාගේ නිර්දේශය | ව්‍යාපෘතිය මගින් ගනු ලබන වැලැක්වීමේ ක්‍රියාමාර්ග | වර්තමාන තත්වය |
|---|---|---|---|---|
| (අ) | ක්ෂේත්‍රගත කාර්ය මණ්ඩලයේ පරිහරණය සඳහා සමාලෝචිත වර්ෂය තුළ රුපියල් මිලියන 112.50 ක වියදමින් මිලදී ගත් මෝටර් රථ 03 ක් ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනයේ සහ ජනාධිපති ලේකම් කාර්යාලයේ නිලධාරීන් වෙත වෙන් කර ඇති බව නිරීක්ෂණය විය. | ව්‍යාපෘතියේ අපේක්ෂිත අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා අරමුදල් භාවිතා කිරීම තහවුරු කිරීම අවශ්‍ය වේ. | වාහන වනජීවී හා වන සංරක්ෂණ අමාත්‍යාංශය වෙත ආපසු ලබා දෙන ලෙස පරිසර අමාත්‍යාංශ ලේක විසින් ඉල්ලා ඇත. | හිමිකාරිත්වය නිරවුල් කිරීමට කටයුතු කර තිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| (ආ) | ව්‍යාපෘති ණය ගිවිසුමේ වටිනාකම ඇමෙරිකානු ඩොලර් මිලියන 45ක් වන අතර 2020 වන විට එය ඇමෙරිකානු ඩොලර් මිලියන 35 දක්වා අඩු කර තිබූ අතර ව්‍යාපෘතිය සඳහා සකස් කළ ප්‍රසම්පාදන සැලැස්මේ ව්‍යාපෘති කටයුතු 544ක් සඳහා ඇමෙරිකානු ඩොලර් මිලියන 53.8ක් වෙන් කර තිබුණි. | ප්‍රසම්පාදන කටයුතු නිවැරදිව හඳුනාගෙන වරින් වර සමාලෝචනය කළ යුතුය. | ක්‍රියාත්මක කරන ආයතන දෙකක් වන වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ සහ වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ අවශ්‍යතා මත පදනම්ව (FD, DWC). ප්‍රසම්පාදන සැලැස්ම සකස් කර ඇත. | ව්‍යාපෘතිය ප්‍රසම්පාදන ගැටලුවකට මුහුණ දී තිබුණි.එබැවින් ණය මුදලට අනුව, 2022 ජනවාරි 31 වන විට සංරචකය 58.6 මූල්‍ය ප්‍රගතියක් වාර්තා කර තිබුණි. |
| (ඇ) | ව්‍යාපෘති ගිවිසුමට අනුව සංරචක අංක **01** සඳහා ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය ලෙස හඳුනාගෙන තිබූ තිරසර සංවර්ධන ලේකම් කාර්යාලය විගණනය කරන විට ඉහත කී කාර්යයට සක්‍රීය දායකත්වයක් ලබා දී නොතිබුණි. | නිවැරදි ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කළ යුතුයි. | තිරසර සංවර්ධන ලේකම් කාර්යාලය අමාත්‍යාංශය යටතේ පිහිටුවීමට නියමිතව තිබූ බැවින් එය පිහිටුවීම සඳහා මූල්‍ය ආධාර ලබාදීමට ව්‍යාපෘතිය එකඟ වී ඇත. | ගැටලුව තවමත් විසඳී නොමැත. |
| (ඇ) | තෙත් කලාපීය සහ වියළි කලාපීය භූ දර්ශන සැලසුම් සකස් කිරීමෙන් පසු ක්‍රියාත්මක කිරීමට සහ අවශ්‍ය නෛතික අනුමැතිය ලබා | ආයතනික රාමුව සකස් කළ යුතුයි. | භාණ්ඩාගාර නියෝජ්‍ය ලේකම්වරයාගේ ප්‍රධානත්වයෙන් පැවැති රැස්වීමකදී මෙම ගැටලුව ඉදිරිපත් කර සාකච්ඡා කෙරිණි. | කිසිදු මාර්ගෝපදේශයක් සකස් කර නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| | ගැනීමට අවශ්‍ය ආයතනික පසුබිම විගණනය කරන විටත් ලබාගෙන නොතිබුණි. | | | |
| (ඉ) | ව්‍යාපෘති සංරචක 2බී - අලි-මිනිස් සහජීවනය සඳහා වන පූර්ව අනතුරු ඇඟවීමේ පද්ධතියක් ගම්මාන දෙකක පමණක් පරීක්ෂා කර තිබුණි. එහෙත් එය ව්‍යාපෘතියේ අරමුණ ඉටුකර ගැනීමට ප්‍රමාණවත් නොවන බව නිරීක්ෂණය විය. | ක්‍රියාකාරකම් තුළින් ව්‍යාපෘති අරමුණු සාක්ෂාත් කරගත යුතුය. | කාර්මික තාක්ෂණ ආයතනය (ITI) ඔවුන්ගේ නව නිපැයුම් වලින් එකක් ලෙස එය අත්හදා බැලීමට උදව් කරන ලෙස ව්‍යාපෘති යෝජනාවක් ඉදිරිපත් කර තිබුණි. | ව්‍යාපෘති අරමුණු සාක්ෂාත් කර ගත හැකි අයුරින් ක්‍රියාකාරකම් සැලසුම් වලට අනුව සම්පූර්ණ කර ගත යුතුයි. |

### 9.6 දේශගුණයට ඔරොත්තු හැකියාව වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය

(i) දේශගුණික අවදානම්වලට නිරාවරණය වන පුද්ගලයින්ගේ සහ වත්කම්වල අවදානම අවම කිරීම සහ ආපදාවලට ඵලදායී ලෙස ප්‍රතිචාර දැක්වීමේ ලබන්නාගේ හැකියාව වැඩිදියුණු කිරීම සඳහා දේශගුණික ඔරොත්තුදීමේ හැකියාව වැඩිදියුණු කිරීම සඳහා ව්‍යාපෘතිය ක්‍රියාත්මක කර තිබුණි.

(ii) ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත වියදම රුපියල් මිලියන 14,617 ට සමාන ඇමරිකානු ඩොලර් මිලියන 111.8 ක් වන අතර ඉන් රුපියල් මිලියන 14,382 ට සමාන ඇමරිකානු ඩොලර් මිලියන 110 ක් ජාත්‍යන්තර සංවර්ධන සංගමය විසින් මූල්‍යකරණය කිරීමට එකඟ වී තිබුණි.

(iii) ව්‍යාපෘතියෙහි කටයුතු **2014** අගෝස්තු **05** දින ආරම්භ කර **2020** ජූනි **30** වන විට අවසන් කිරීමට නියමිතව තිබුණි.

(iv) ව්‍යාපෘතිය සම්බන්ධයෙන් 2018,2019 සහ 2020 වසර සඳහා ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන සඳහා විගණකාධිපති විසින් තත්වාගණනය නොකළ විගණන මතයක් ලබා දී

තිබුණ අතර ව්‍යාපෘතියේ ක්‍රියාකාරීත්වය සම්බන්ධයෙන් මෙතෙක් විසඳා නොමැති ගැටළු කිහිපයක් පහතින් දැක්වේ.

| | විගණන නිරීක්ෂණය | විගණකාධිපතිවරයා ගේ නිර්දේශය | ව්‍යාපෘතිය මගින් ගනු ලබන වැලැක්වීමේ ක්‍රියාමාර්ග | වර්තමාන තත්වය |
|---|---|---|---|---|
| (අ) | ව්‍යාපෘති කාලය වසරකට අඩු වුවද ව්‍යාපෘති කාර්යාලය විසින් පරිගණක උපාංග, ගෘහ භාණ්ඩ, සවිකෘත සහ කාර්යාල උපකරණ මිලදී ගැනීම සඳහා රු. මිලියන 14.09 ක් වැය කර තිබුණි. | ව්‍යාපෘතිය යටතේ ඇති වත්කම් ප්‍රයෝජනයට ගැනීමට කටයුතු කළ යුතුය. | CRIP ව්‍යාපෘතිය යටතේ යෝජිත මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර ඇත. ව්‍යාපෘතියේ සියලුම වත්කම් යෝජිත නව ව්‍යාපෘතියේ භාවිතය සඳහා යොදා ගැනේ. | ව්‍යාපෘතිය 2021 ඔක්තෝබර් 15 දින අවසන් වී තිබුණ අතර සියලු වත්කම් මාරු කර ඇත. |
| (ආ) | විගණනය සඳහා ලබා දී ඇති තොරතුරු අනුව, කොන්ත්‍රාත් පැකේජ 631 ක් 2020 දෙසැම්බර් 31 දක්වා කොන්ත්‍රාත්කරුවන්ට රු. මිලියන 13,634.98 කට ප්‍රදානය කර තිබුණි. විවිධ හේතූන් මත ඉන් රු. මිලියන 230.42 ක් වටිනා කොන්ත්‍රාත් පැකේජ 15ක් අත්හැර දමා තිබුණි. | සැලසුම් කළ පරිදි කොන්ත්‍රාත් පැකේජ අවසන් කළ යුතු අතර අතහැර දැමූ ව්‍යාපෘතියේ වැඩ අවසන් කළ යුතුය. | කොන්ත්‍රාත්කරුවන් ගේ අසාර්ථකත්වය, ජල ගැටලු, ඉඩම් අත්පත් කර ගැනීමේ දුෂ්කරතා වැනි විවිධ හේතූන් මත ක්‍රියාකාරී නොවන කොන්ත්‍රාත් පැකේජ අවසන් කරන ඇත. | අත්හිටුවා තිබූ කොන්ත්‍රාත් පැකේජ අවසන් නොකර ව්‍යාපෘතිය 2021 ඔක්තෝබර් 15 දින නිම කර තිබුණි. |
| (ඇ) | මෙම ව්‍යාපෘතිය යටතේ අල්ලයි යෝජනා ක්‍රමයේ දකුණු ඉවුර ඇල බැම්මේ මාර්ග කොටස රු. මිලියන 19,298,754 කට 2018 ජූනි මාසයේදී සංවර්ධනය කර ඇත නමුත් වෙනත් | ආර්ථිකමය නොවන වටිනාකම අදාළ පාර්ශවයෙන් අයකරගත යුතුයි. | 2017 මාර්තු මස ආරම්භ කර 2018 ජූනි වන විට අවසන් කර ඇත. ප්‍රදේශයේ ප්‍රජාවගේ ඉහළ ඉල්ලීම මත වාරිමාර්ග දෙපාර්තමේන්තුව | මාර්ගය සංවර්ධනය කර තිබූ කොටස නැවත සංවර්ධනය කිරීමට වගකිව යුතු පාර්ශ්වවලට |

| | | | | |
|---|---|---|---|---|
| | සංවර්ධන ව්‍යාපෘති දෙකක් යටතේ එම මාර්ගයේ කොටස් 2ක් තාර දමා තිබුණි. එබැවින් මෙම මාර්ගය සංවර්ධනය කිරීමට සඳහා මෙම ව්‍යාපෘතිය මගින් වැය කරන මුදල ආර්ථික නොවන වියදමක් විය. | | විසින් කිලෝමීටර් 14.0 න් මීටර් 400 ක කාපට් කිරීමට අවසර ලබා දී තිබුණ. | එරෙහිව කිසිදු පියවරක් ගෙන නොතිබුණි. |
| (ඈ) | මෙම ව්‍යාපෘතිය යටතේ ප්‍රධාන ඇළ මාර්ගයේ කොටසක් 2018 මාර්තු මාසයේදී රු. මිලියන 4,381,360 ක් වැයකර සංවර්ධනය කර තිබුණි. කෙසේ වෙතත්, එය 2019 වසරේ 'සිරිසර පිවිසුම' සංවර්ධන ව්‍යාපෘතිය යටතේ අලුතින් තාර දමා තිබුණි. ඒ නිසා මේ ව්‍යාපෘතිය යටතේ මාර්ගය සංවර්ධනය වියදම් කළ මුදල් අනාර්ථික වියදමක් විය. | ආර්ථිකමය නොවන වටිනාකම අදාළ පාර්ශවයෙන් අයකරගත යුතුයි. | මෙම කොන්ත්‍රාත්තුව යටතේ CRIP ඉදිකිරීම් ආරම්භ කරන අවස්ථාවේ "සිරිසර ප්‍රවේශය" වැඩසටහනට සම්බන්ධ වූ බවක් දක්නට නොතිබුණි. | -එම - |
| (ඉ) | 2019 ඔක්තෝම්බර් මාසයේදී කන්තලේ පාකිකිරවන්වෙට්ටියේ මාර්ගය රුපියල් මිලියන 4.8 ක වියදමින් ව්‍යාපෘතිය යටතේ සංවර්ධනය කර තිබුණි. නමුත් වෙනත් සංවර්ධන ව්‍යාපෘතියක් යටතේ මාර්ගය කොන්ක්‍රීට් කර තිබුණු බැවින් මෙම ව්‍යාපෘතිය යටතේ මාර්ගය | රේඛීය ආයතන සමඟ යහපත් සම්බන්ධීකරණයක් තිබිය යුතුය | මෙම කොන්ත්‍රාත්තුව යටතේ CRIP ඉදිකිරීම් ආරම්භ කරන විට, අනෙක් වැඩසටහනට සම්බන්ධ වූ බවක් දක්නට නොතිබුණි. | -එම- |

සංවර්ධනය කිරීම සඳහා වියදම් කළ මුදල ආර්ථික නොවන වියදමකි.

**9.7 දේශගුණයට ඔරොත්තු දීම වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය (අතිරේක මූල්‍යකරණය)**

(i) දේශගුණික අවදානම් වලට නිරාවරණය වන පුද්ගලයින් සහ වත්කම් වල අවදානම අවම කිරීම සහ ආපදාවලට ඵලදායී ලෙස ප්‍රතිචාර දැක්වීමේ හැකියාව වැඩිදියුණු කිරීම සඳහා දේශගුණික ඔරොත්තු දීමේ වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය (අතිරේක මූල්‍යකරණය) ක්‍රියාත්මක කර තිබුණි.

(ii) ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුදල රු. මිලියන 6,048 ට සමාන ඇමරිකානු ඩොලර් මිලියන 42 ක් වූ අතර එම සම්පූර්ණ මුදලම ජාත්‍යන්තර සංවර්ධන සංගමය විසින් මූල්‍යකරණය කිරීමට එකඟ වී තිබුණි.

(iii) ව්‍යාපෘතිය 2016 ඔක්තොම්බර් 15 වන දින එහි ක්‍රියාකාරකම් ආරම්භ කර 2020 ජුනි 30 වන විට අවසන් කිරීමට නියමිතව තිබුණි.

(iv) ව්‍යාපෘතිය සම්බන්ධයෙන් 2018, 2019 සහ 2020 වසර සඳහා ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන සඳහා විගණකාධිපති තත්වාගණනය කල විගණන මතයක් ලබා දී තිබුණි. කෙසේ වෙතත්, ව්‍යාපෘතියේ ක්‍රියාකාරීත්වය සම්බන්ධයෙන් මෙතෙක් විසඳී නොමැති ගැටළු කිහිපයක් පහත දැක්වේ.

| | විගණන නිරීක්ෂණ | විගණකාධිපතිගේ නිර්දේශය | ව්‍යාපෘතිය මගින් ගෙන ඇති වැලැක්වීමේ ක්‍රියාමාර්ග | වර්ථමාන තත්වය |
|---|---|---|---|---|
| (අ) | රුපියල් මිලියන 58.82 ක් වටිනා සෙල්ලකතරගම කිරිවෙහෙර මාර්ග සංවර්ධන ව්‍යාපෘතිය සඳහා වැඩ ප්‍රමාණන පත්‍රය අනුව යෙදිය යුතු ගනත්වයට කොන්ක්‍රීට් | වැඩ කටයුතු ක්‍රමානුකූලව අවසන් කරන ලෙසත්, සිදුවිය හැකි අලාභයක් අයකර ගැනීමට කටයුතු කරන ලෙසත් | පරීක්ෂණ පවත්වා නිර්දේශ ඉදිරිපත් කිරීම වැල්ලවාය ප්‍රාදේශීය ඉංජිනේරුවරයාට | අත්හිටවූ ගෙවීම් සඳහා අදාළ මුදල CRIP ව්‍යාපෘතිය මගින් නිදහස් කර මාර්ග සංවර්ධන දෙපාර්තමේන්තුවේ |

| | | | | |
|---|---|---|---|---|
| | යොදවා නොතිබුණි. මේ නිසා රු. මිලියන 1.8 ක අලාබයක් සිදු වී තිබුණි . | කොන්ත්‍රාත්කරුවන්ට උපදෙස් දිය යුතුය. | පැවරිණි. | ගිණුමේ රඳවා තිබුණි. |
| (ආ) | විගණනයට ලබා දී ඇති තොරතුරුවලට අනුව, කොන්ත්‍රාත් පැකේජ 153 ක් 2020 දෙසැම්බර් 31 දින දක්වා කොන්ත්‍රාත්කරුවන්ට රු. මිලියන 7,090.90 කට ප්‍රධානය කර ඇත. ඉන් කොන්ත්‍රාත් පැකේජ 03ක් රු. මිලියන 182.18 නවත්වා තිබුණි. ඉන් රු. මිලියන 182.18 ක් වූ කොන්ත්‍රාත් පැකේජ 03ක් විවිධ හේතු නිසා නවත්වා තිබුණි. | අතිකාල හා ශ්‍රමය නොසලකා හැර ව්‍යාපෘතියේ කටයුතු කඩිනම් කිරීමට කටයුතු කළ යුතුය. | විවිධ හේතු නිසා ක්‍රියාකාරී නොවන කොන්ත්‍රාත් පැකේජ අවසන් කරන ලදී. | ව්‍යාපෘතිය 2021 ඔක්තෝම්බර් 15 වන දින අවසන් කර සියලු ගෙවීම් අවසන් කර තිබුණද, මෙම කොන්ත්‍රාත් පැකේජ සම්පූර්ණ කිරීමට කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. |

## 9.8 මහවැලි ජල සුරක්ෂිතතා ආයෝජන වැඩසටහන - අධියර 01

(i) මහවැලි ජල සුරක්ෂිතතා ආයෝජන වැඩසටහනේ 01 අධියර වැඩසටහනට අයත් ප්‍රදේශයේ කෘෂිකාර්මික හා පානීය කටයුතු සඳහා ජල සම්පත් වෙත ප්‍රවේශය සුරක්ෂිත කිරීම සඳහා ව්‍යාපෘතිය ක්‍රියාත්මක කර තිබුණි.

(ii) ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත වියදම රු. මිලියන 28,713 ට සමාන ඇමරිකානු ඩොලර් මිලියන 190 ක් වන අතර එයින් ඩොලර් මිලියන 150 කට සමාන රු. මිලියන 22,668ක් ආසියානු සංවර්ධන බැංකුවෙන් ලබා දීමට එකඟ වී තිබුණි.

**(iii)** වැඩසටහන 2015 ජූනි 24 දින එහි ක්‍රියාකාරකම් ආරම්භ කර 2019 දෙසැම්බර් 31 වන විට අවසන් කිරීමට නියමිතව තිබුණි. කෙසේ වෙතත්, වැඩසටහන් කාලය 2022 ජූනි 30 දක්වා දීර්ඝ කර තිබුණි.

**(iv)** ව්‍යාපෘතිය වෙනුවෙන් 2018, 2019 සහ 2020 වසර සඳහා ඉදිරිපත් කර තිබූ මූල්‍ය ප්‍රකාශන සඳහා විගණකාධි විසින් තත්වාගණනය නොකළ විගණන මතයක් ලබා දී තිබුණි. කෙසේ වෙතත්, ව්‍යාපෘතියේ ක්‍රියාකාරීත්වය සම්බන්ධයෙන් මෙතෙක් විසඳී නොමැති ගැටළු කිහිපයක් පහත දැක්වේ.

| | විගණන නිරීක්ෂණ | විගණකාධිපතිගේ නිර්දේශය | ව්‍යාපෘතිය මගින් ගෙන ඇති වැලැක්වීමේ ක්‍රියාමාර්ග | වර්ථමාන තත්වය |
|---|---|---|---|---|
| (අ) | හෙක්ටයාර 50 ක වනාන්තර ප්‍රදේශයක නැවත ගස් සිටුවීම, ආක්‍රමණශීලී ශාක ඉවත් කිරීම, පරිසර සංරක්ෂණය යනාදිය පිළිබඳව ජනතාව දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම සම්බන්ධ ක්‍රියාකාරකම් 2018 දෙසැම්බර් 31 දින දක්වා ක්‍රියාත්මක කර නොතිබුණි. | නැවත වන වගා හා දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීමට පියවර ගත යුතුය. | හෙක්ටයාර 25ක් සැලැස්මෙන් ඉවත් කිරීමට කටයුතු කර ඇත. | හෙක්ටයාර් 25ක් පමණක් වන වගාව, ආක්‍රමණශීලී ශාක ඉවත් කිරීම සහ සංරක්ෂණ කටයුතු සිදු කර ඇති බව දන්වා ඇත. |
| (ආ) | මාතලේ සහ ගලේවෙල දිස්ත්‍රික් ලේකම් කොට්ඨාශවල ඉඩම් කට්ටි 443ක් අත්පත් කර ගැනීම සඳහා රු. මිලියන 233.90ක් මාරු කර තිබුණි. කෙසේ වෙතත්, එයින් රු. මිලියන 103.8 ක් පමණක් 2020 අවසන් වන විට උපයෝජනය කර තිබුණි. | එම කටයුතු නිසි පරිදි සිදුකිරීමට ඉඩම් පවරා ගැනීමට පියවර ගත යුතුය. | වන්දි ගෙවීම සම්බන්ධයෙන් සැසඳීමට අවශ්‍ය වාර්තා ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලින් ඉල්ලා ඇත.. | ඉඩම් කට්ටි 443 න් ඉඩම් කට්ටි 320 ක් 2022 පෙබරවාරි වන විට අත්පත් කර ගෙන ඇත. |
| (ඇ) | I අදියර යටතේ ප්‍රදානය කරන ලද කොන්ත්‍රාත් පැකේජ 09 න් කොන්ත්‍රාත් පැකේජ 06 ක් කොන්ත්‍රාත් කාලය අවසන් වන විට සම්පූර්ණ කර නොතිබුණි. ඉතිරි කොන්ත්‍රාත් පැකේජ 03 අපේක්ෂිත ප්‍රගතිය ලබා | කොන්ත්‍රාත්කරු විසින් ක්‍රියාත්මක කරන ක්‍රියාකාරකම් පිළිබඳව සමීප අධීක්ෂණයක් අවශ්‍ය වේ. | කොන්ත්‍රාත් පැකේජ 09න් 05ක් අවසන් කිරීමට පියවර ගෙන ඇත. | කොන්ත්‍රාත්තු පහක් අවසන් කර ඇති අතර ඉතිරි පැකේජ ප්‍රධානය කර නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| | නොතිබුණි. | | | |
| (ඇ) | උපදේශන සේවා සඳහා රු. මිලියන 543ක් වෙන් කර තිබුණ නමුත් ඒ සඳහා රු. මිලියන 1,396 ක් වැය කර තිබූ බැවින් අයවැය ප්‍රතිපාදනවලටට ඉක්මවා සියයට 157 ක් වියදම් කර තිබුණි. | ඇස්තමේන්තුව තුළ වියදම් කිරීමට කටයුතු කළ යුතුයි. | පිරිවැය විචලනය සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගැනීමෙන් පසු, පසුගිය වසරවල ගෙවිය යුතු උපදේශන ගාස්තු ගෙවීම් අත්හැරීමට පියවර ගන්නා ලදී. | පිරිවැය විචලනය සඳහා කැබිනට් අනුමැතිය ලබාගෙන තිබුණි. |
| (ඉ) | දේවහුව වාරි කඳවුර නවීකරණයට රු. මිලියන 10ක් වෙන් කර තිබූ අතර ඉහත කඳවුර වැඩිදියුණු කිරීමකින් තොරව කාර්යාල උපකරණ මිලදී ගැනීම සහ කුලියට ගැනීම සඳහා රුපියල් මිලියන 5.2 ක් වැය කර තිබුණි. | සැලසුම් කළ පරිදි වැඩ කිරීමට කටයුතු කළ යුතුය. | ඉඩම් අත්පත් කර ගැනීමේ ප්‍රමාදය සහ වන්දි මණ්ඩලයේ කටයුතු ප්‍රමාද වීම හේතුවෙන් එය ප්‍රමාද වී තිබුණි. | කොන්ත්‍රාත් පැකේජයෙන් සියයට 67.7ක් අවසන් කර ති අතර කොන්ත්‍රාත් කාලය 2022 සැප්තැම්බර් 24 දක්වා දීර්ඝ කර ඇත. |
| (ඊ) | උපදේශන ප්‍රගති වාර්තාවට අනුව නබඩගහවත්තේ සිට මහකිතුල ජලාශය ඇතුළු උමං මාර්ගය දක්වා වයඹ පළාත් ඇළ ඉදිකිරීමේ කොන්ත්‍රාත්තුවේ වටිනාකම රු. මිලියන 7,226.6 ක් වුවත් එම වටිනාකම ඉදිකිරීමේ ඇස්තමේන්තුගත ප්‍රමාණය ඉක්මවීම හේතුවෙන් රු. මිලියන 1,413 න් ඉක්මවා තිබුණි. | කොන්ත්‍රාත්තුවල අපේක්ෂිත ප්‍රගතිය ළඟා කර ගැනීමට ක්‍රියා කළ යුතුය. | වනජීවී කලාපයක ඉදිකිරීම් සිදුවන බැවින් ඒ අනුව ව්‍යුහයන් වෙනස් කිරීම. | ඇළේ මුළු දිග කිලෝමීටර් 17.05 න් කිලෝමීටර 15.93 ක් කොන්ත්‍රාත්කරුට ඉදිකිරීම් සඳහා ප්‍රධානය කර ඇත. |
| (උ) | උපදේශන ප්‍රගති වාර්තාවට අනුව ඉහළ ඇළහැර ඇළ ඉදිකිරීමේ කොන්ත්‍රාත් | කොන්ත්රාත්තුවේ වෙනස්කම් අවම කිරීමට කටයුතු | අතිරේක කොන්ත්‍රාත් පැකේජයක් වන NCPCP-3 යටතේ ඉතිරි | 2022 පෙබරවාරි වන විට භෞතික ප්‍රගතිය |

| | | | | |
|---|---|---|---|---|
| | වටිනාකම රු. මිලියන 3,742 ක් වුවත් කොන්ත්‍රාත්තුවේ ප්‍රමාණය ඇස්තමේන්තුගත ප්‍රමාණය ඉක්මවීම හේතුවෙන් කොන්ත්‍රාත් වටිනාකම රු. මිලියන 658.5 ක් වැඩි වී තිබුණි. | කළ යුතුය. | වැඩ එයට ඇතුළත් වේ. | සියයට 64ක් විය. |
| (ඌ) | මිනිපේ වම් ඉවුර ඇළ ප්‍රතිසංස්කරණය කිරීම යටතේ මිනිපේ වම් ඉවුර ඇළ ප්‍රතිසංස්කරණය කිරීමේ කොන්ත්‍රාත් කාලය 2020 නොවැම්බර් 12 දිනෙන් අවසන් විය යුතුය. කොන්ත්‍රාත්කරු කොන්ත්‍රාත් කාලය තුළ ඉදිකිරීම් කටයුතු නිම කිරීමට අපොහොසත් වීම හේතුවෙන් කොන්ත්‍රාත් කාලය 2021 ජනවාරි 07 දක්වා දීර්ඝ කර තිබුණි. කෙසේ වෙතත්, දීර්ඝ කල කාලසීමාව තුළ වැඩ නිම කර නොතිබූ අතර 2020 දෙසැම්බර් 31 වන විට භෞතික ප්‍රගතිය සියයට 50ක් ලෙස පෙන්නුම් කර තිබුණි. | කොන්ත්‍රාත් කාලය තුළ වැඩ නිම කිරීමට කටයුතු කළ යුතුයි. | 2022 නොවැම්බර් වන විට අවසන් කිරීමට අපේක්ෂා කෙරේ. | 2020 දෙසැම්බර් 31 වන විට අපේක්ෂිත ඉලක්කවලින් සියයට 73ක් ලගාකරගෙන ඇත. |
| (එ) | 2020 දෙසැම්බර් 31 දින වන විට ඉහළ ඇළහර ඇළ ව්‍යාපෘතියට අදාළව ඉඩම් කට්ටි 741ක් අත්පත් කර ගැනීමට අපේක්ෂා කළද 2020 දෙසැම්බර් 31 වන විට කිසිදු ඉඩම් කැබැල්ලක් අත්පත් කර ගෙන නොතිබුණි. වයඹ පළාත් ඇල ව්‍යාපෘතිය හා සම්බන්ධව | ඉඩම් අත්පත් කර ගැනීමේ කටයුතු කඩිනම් කිරීමට කටයුතු කළ යුතුයි. | ඉඩම් අත්පත් කර ගැනීමේ පනතේ 44 වැනි වගන්තිය යටතේ ලියාපදිංචි කිරීමට කටයුතු කරමින් සිටී. | 2022 පෙබරවාරි වන විට ඉඩම් අත්පත් කර ගැනීමේ ප්‍රගතියේ වෙනසක් නොතිබුණි. |

2020 දෙසැම්බර් 31 දිනට ඉඩම් කට්ටි 947ක් අත්පත් කරගෙන ඇත. කෙසේ වෙතත්, 2020 දෙසැම්බර් 31 දිනට ඉඩම් අත්පත් කර ගැනීමේ පනතේ 44 වැනි වගන්තිය යටතේ කිසිදු ඉඩම් කට්ටියක් ලියාපදිංචි කර නොතිබුණි.

## 9.9 මහවැලි ජල සුරක්ෂිතතා ආයෝජන වැඩසටහන - අධියර 02

(i) වැඩසටහනට අයත් ප්‍රදේශයේ කෘෂිකාර්මික හා පානීය කටයුතු සඳහා ජල සම්පත් සඳහා ප්‍රවේශය සුරක්ෂිත කිරීම සඳහා මහවැලි ජල සුරක්ෂිතතා ආයෝජන වැඩසටහන - 02 කොටස ක්‍රියාත්මක කර තිබුණි.

(ii) ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත වියදම රු. මිලියන 43,734 ට සමාන ඇමරිකානු ඩොලර් මිලියන 242 ක් වන අතර එයින් රු. මිලියන 37,951 ට සමාන ඇමරිකානු ඩොලර් මිලියන 210 ක් ආසියානු සංවර්ධන බැංකුව විසින් මූල්‍යකරණය කිරීමට එකඟ වී තිබුණි.

**(iii)** මෙම වැඩසටහන **2018 ජූලි 23** වන දින එහි කටයුතු ආරම්භ කර **2024** දෙසැම්බර් **31** වන විට අවසන් කිරීමට නියමිතව තිබුණි.

(iv) විගණකාධිපති විසින් 2018, 2019 වසර සඳහා ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන සඳහා තත්වාගණනය කරනලද විගණන මතයක් සහ 2020 වර්ෂය සඳහා අදාළ ව්‍යාපෘතිය සම්බන්ධයෙන් තත්වාගණනය නොකළ විගණන මතයක් ලබා දී තිබුණි. කෙසේ වෙතත්, ව්‍යාපෘතියේ ක්‍රියාකාරීත්වය සම්බන්ධයෙන් මෙතෙක් විසඳී නොමැති ගැටළු කිහිපයක් පහත දැක්වේ.

| | **විගණන නිරීක්ෂණ** | **විගණකාධිපතිගේ නිර්දේශය** | **ව්‍යාපෘතිය මගින් ගෙන ඇති වැලැක්වීමේ ක්‍රියාමාර්ග** | **වර්ථමාන තත්වය** |
|---|---|---|---|---|
| (අ) | මහවැලි ජල සුරක්ෂිතතා ණය ආයෝජන වැඩසටහනේ ණය ගිවිසුම - 02 අධියර 2018 දී | ගිවිසුමට අනුව ඉදිකිරීම් ක්‍රියාත්මක කිරීමට කටයුතු කළ | 2020 දෙසැම්බර් මාසයේදී මෙම කොන්ත්‍රාත්තුව ප්‍රදානය සහ | NWPCP-ICB-1 කොන්ත්‍රාත්තුවේ UECP-ICB- |

| | | | | |
|---|---|---|---|---|
| | අත්සන් කර තිබුණද, සමාලෝචිත වර්ෂය අවසන් වන විට NWPC-ICB-01 සහ UECP-ICN-02A ගිවිසුම් පැකේජය ප්‍රදානය කර නොතිබුණි. තවද, කොන්ත්‍රාත් පැකේජවල කිසිදු ප්‍රගතියක් ලබා නොගෙන කැපවීම් ගාස්තු රු. මිලියන 81ක් ණය දෙන නියෝජිතායතනය විසින් අයකරගෙන තිබුණි. | යුතුය. | කිරීමට කටයුතු කර ඇත. | 2A කොන්ත්‍රාත්තුවේ වැඩ පිලිවෙලින් 2021 මාර්තු 31 දින සහ 2021මාර්තු 10 ආරම්භ කර තිබුණි. |
| (ආ) | ආසියානු සංවර්ධන බැංකුවේ මධ්‍ය කාලීන සමාලෝචන ධූත මණ්ඩල වාර්තාවේ සහායක මතක සටහන් වලට අනුව, ව්‍යාපෘති පිරිවැය අඩුකිරීම සඳහා UECP - ICB - 5 සහ NWPC - ICB - 3 කොන්ත්‍රාත්තු අධියර -01 වෙතින් ඉවත් කිරීමට සහ අධියර -02 වෙත ඇතුළත් කිරීමට යෝජනා කරන ලදී. කෙසේ වෙතත්, අධියර 01 - සිට අධියර -02 වෙත එසේ මාරු කිරීම නිසා සිදුවන බලපෑම වැඩසටහන මගින් ඇගයීමට ලක් කර නොතිබුණි. | සියලුම කොන්ත්‍රාත් පැකේජ අනුමත පිරිවැය ඇස්තමේන්තුව තුළ ක්‍රියාත්මක කිරීමට කටයුතු කළ යුතුය. | අතිරේක මූල්‍ය පහසුකම් ලබා ගැනීම සඳහා 2022 ජනවාරි 04 වන දින අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලබා ගැනීමට කටයුතු කර තිබුණි. | වැඩසටහනේ කාලසීමාව සංශෝධනය කිරීමට සහ අතිරේක මූල්‍ය පහසුකම් සඳහා පහසුකම් සැලසීමට අනුමැතිය ලබාගෙන තිබුණි. |
| (ඇ) | කළු ගඟ සහ මොරගහකන්ද මාරු ඇළ ඉදිකිරීමේ ප්‍රගතියෙන් සියයට 89ක් අපේක්ෂා කළද, 2020 | ඉදිකිරීම් කටයුතු ක්‍රියාත්මක කිරීමේදී අනපේක්ෂිත ප්‍රමාදයන් අවම කිරීමට කටයුතු | 2021 දෙසැම්බර් 31 වන විට සියයට 70 ක ප්‍රගතියක් ළඟා කර ගැනීමට කටයුතු කර | 2022 ජනවාරි 31 වන විට සියයට 71 ක ප්‍රගතියක් ලබා |

| | | | | |
|---|---|---|---|---|
| | දෙසැම්බර් 31 වන විට ප්‍රගතිය ලබාගෙන තිබුණේ සියයට 52ක් පමණි. | කළ යුතුය. | ඇත. | ඇත. |
| (ඈ) | අධියර -3 2018 සිට 2024 දක්වා ක්‍රියාත්මක කිරීමට අපේක්‍ෂා කළද, ඒ සඳහා 2020 දෙසැම්බර් 31 දක්වා අනුමැතිය ලබාගෙන නොතිබුණි. එබැවින්, අධියර-3 යටතේ වූ කොන්ත්‍රාත් පැකේජ 08ක් මේ දක්වා ප්‍රදානය කර නොතිබුණි. | ඉදිකිරීම් කටයුතු ක්‍රියාත්මක කිරීමේදී අනපේක්ෂිත ප්‍රමාදයන් අවම කිරීමට කටයුතු කළ යුතුය. | 2022 ජනවාරි 04 වැනි දින අධියර -03 ගිවිසුමට එළඹීමට අනුමැතිය ලබාගෙන ඇති අතර ඉතිරි කොන්ත්‍රාත් පැකේජ 09, 2022 අයවැය ප්‍රතිපාදන තුළ 01, 02 අධියර ඉතිරි කර ප්‍රදානය කිරීමට අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කර තිබුණි. | අධියර -03 සඳහා ගිවිසුමට එළැඹීමට අමාත්‍ය මණ්ඩලයෙන් අනුමැතිය ලබාගෙන තිබුණි. |
| (ඉ) | 2019 - 2020 දී ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර ඇති ඒකාබද්ධ ජල සම්පත් කළමනාකරණය ශක්තිමත් කිරීමේ (SIWRM) උපදේශන සේවාව 2020 දෙසැම්බර් 31 වන විටත් ක්‍රියාත්මක කර නොතිබුණි. | ප්‍රමාදයකින් තොරව අදාළ කාල සීමාවට අනුව උපදේශන සේවාව ක්‍රියාත්මක කිරීමට කටයුතු කළ යුතුය. | යොමුගත කිරීමේ කොන්දේසි සකස් කර ප්‍රධාන පාර්ශ්ව සමඟ යොමුගත කිරීමේ කොන්දේසි සමාලෝචනය කිරීම සඳහා උපදේශන සමාගමක් තෝරා ගෙන ඇත. | 2022 පෙබරවාරි වන විට එය ක්‍රියාත්මක කර නොතිබුණි. |
| (ඊ) | 2020 නොවැම්බර්/දෙසැම්බර් මාසවල පැවති අධියර 2 හි මධ්‍ය කාලීන සමාලෝචන ධූත මණ්ඩලයේ සහ 1 වන වාරිකයේ සමාලෝචන ධූත | වැඩසටහන මඟින් ණය ගිවිසුමේ අනුමත ණය මුදල තුළ කොන්ත්‍රාත්තු ප්‍රදානය කළ යුතුය. අනුමත ණය මුදලෙහි | 2022 ජනවාරි 04 වැනි දින අම්ප/21/2142/317/049-1 මගින් වාරික-03 සඳහා ගිවිසුමට | වැඩසටහනේ කාලසීමාව සංශෝධනය කිරීමට සහ රජය විසින් අතිරේක |

| | | | |
|---|---|---|---|
| මණ්ඩලයේ ආසියානු සංවර්ධන බැංකුවේ සහායක මතකයට අනුව, ආයෝජන වැඩසටහන සම්පූර්ණ කිරීම සඳහා අතිරේක අරමුදල් ඩොලර් මිලියන 400 ක් පමණ අවශ්‍ය වනු ඇතැයි දැනට ඇස්තමේන්තු කර ඇත. කෙසේ වෙතත්, 2020 දෙසැම්බර් 31 දිනට ආසියානු සංවර්ධන බැංකුව සමඟ සාකච්ඡා කරන ලද අතිරේක අරමුදල් අවශ්‍යතා සඳහා අවසාන එකඟතාව ලබා ගැනීමට වැඩසටහන අසමත් වී තිබුණි. තවද, අතිරේක අරමුදල්වල අවසාන එකඟතාවයකින් තොරව අනුමත ණය මුදල ඉක්මවා කොන්ත්‍රාත්තු ප්‍රදානය කර ඇත. එබැවින්, 2020 දෙසැම්බර් 31 දිනට ඇමෙරිකානු ඩොලර් මිලියන 114ක් සඳහා සම-මූල්‍ය පහසුකම් සපයන්නා සොයාගැනීමට අපොහොසත් වීම හේතුවෙන් අනාගතයේදී අරමුදල් හිඟයක් ඇති විය හැක. | කොන්ත්‍රාත් වටිනාකම ඉක්මවන්නේ නම්, වැඩසටහන මඟින් අමතර අරමුදලක් සකස් කළ යුතුය හෝ වැඩසටහන් පිරිවැය අවම කළ යුතුය. | එළඹීමට අනුමැතිය ලබාගෙන තිබුණි. | මූල්‍ය පහසුකම් සැපයීමට අනුමැතිය ලබාගෙන තිබුණි. |

වගුව 01

| අනු අංකය | ණය නියෝජිතායතයයේ නම | ව්‍යාපෘති ගණන | ණය ශේෂය | | |
|---|---|---|---|---|---|
| | | | 2020 | 2019 | 2018 |
| 01 | ආසියානු සංවර්ධන බැංකුව (ආ. සං. බැ.) | 53 | 132,655,294,995 | 33,529,668,541 | 63,464,380,565 |
| 02 | ආසියානු යටිතල පහසුකම් ආයෝජන බැංකුව | 2 | 1,638,886,494 | - | - |
| 03 | එක්සත් රාජධාන් ආනයන අපනයන බැංකුව | 1 | - | 1,506,090,427 | 136,179,117 |
| 04 | බොරෙන්ලීන් බැංකුව | 3 | 10,580,714,427 | 282,543,637 | 811,796,799 |
| 05 | එච්. එස්. බී. සී. බැංකුව | 2 | 7,393,088,080 | - | 501,367,168 |
| 06 | එච්එස්බීසී (ඩෙන්මාර්ක් ඊකේඑෆ් සහතිකලත්) | 1 | 155,405,190 | 413,429,364 | 1,414,599,082 |
| 07 | එච්එස්බීසී ලිමිටඩ් (හොංකොං) | 1 | 12,076,984,244 | - | 2,273,572,328 |
| 08 | ජාත්‍යන්තර සංවර්ධන සංගමය | 18 | 60,462,418,395 | 7,825,262,326 | 22,432,097,289 |
| 09 | ප්‍රතිසංස්කරණ සහ සංවර්ධනය උදෙසා වන ජාත්‍යන්තර බැංකුව | 6 | 22,953,551,711 | 1,737,866,894 | 4,390,834,327 |
| 10 | කෘෂිකාර්මික සංවර්ධනය සඳහා වන ජාත්‍යන්තර අරමුදල | 3 | 7,654,612,531 | 907,849,835 | 687,871,760 |
| 11 | පිංලන්ත නෝඩියා බැංකුව | 1 | 3,116,644,721 | - | - |
| 12 | ඛණිජ තෙල් අපනයනය කරන රටවල සංවිධානය | 5 | 3,934,259,469 | 3,139,057,695 | 3,502,525,180 |
| 13 | රාෆ්පිසීන් සෙන්ට්‍රල් බැංකුව | 3 | 1,449,381,056 | 962,798,432 | 1,922,010,924 |
| 14 | ඕස්ට්‍රේලියානු යුනික්‍රෙඩිට් බැංකුව | 3 | 1,640,455,036 | 657,325,543 | 845,197,072 |
| 15 | කැලියන් ක්‍රෙඩිට් ඇග්‍රිකෝල් සීඅයිබී | 2 | 21,476,611,620 | 9,256,861,170 | 4,247,856,180 |
| 16 | සීඕ- ඕසී සෙන්ට්‍රල් බොරෙන්ලීන් බැංකුව | 4 | 3,121,906,541 | 3,782,478,286 | 2,346,118,941 |
| 17 | චීන සංවර්ධන බැංකුව | 3 | 3,548,449,320 | 4,413,467,830 | 6,483,317,842 |
| 18 | ප්‍රංශ රජය | 5 | 5,504,908,614 | 758,529,380 | 813,423,879 |
| 19 | ජර්මන් රජය | 1 | 702,112,079 | - | 409,519,917 |
| 20 | ඉන්දියානු රජය | 4 | 8,610,599,407 | 3,700,164,440 | 6,834,154,828 |
| 21 | කුවේට් රජය | 5 | 3,079,637,462 | 1,040,319,174 | 2,421,573,021 |
| 22 | අරාබි ආර්ථික සංවර්ධන සෞදි අරමුදල | 6 | 2,702,471,056 | 2,494,826,112 | 3,228,232,169 |
| 23 | ජපන් රජය | 14 | 64,274,890,880 | 15,730,991,212 | 17,400,529,849 |
| 24 | බැන්කොබිලිබාඕ වීස්කෙයා ආජන්ට්‍රියා | 1 | - | - | 282,894,641 |
| 25 | කොරියානු ජනරජය | 4 | 4,770,550,945 | 2,388,476,681 | 1,485,422,631 |
| 26 | අපනයන මූල්‍ය සහ රක්ෂණ සංස්ථාව | 1 | - | - | 185,732,518 |
| 27 | චීන ආනයන අපනයන බැංකුව | 11 | 106,689,956,880 | 54,578,537,111 | 55,534,237,260 |
| 28 | හංගේරියානු ආනයන අපනයන බැංකැව | 1 | - | 7,068,025 | 384,534,097 |
| 29 | ඩොයිෂ් බැංකුව ඒජී | 3 | 9,226,333,713 | 238,582,868 | 4,569,818,118 |
| 30 | බෙල්ජියමේ කේබීසී බැංකුව | 1 | - | 46,097,160 | - |
| 31 | ඉන්දියානු ආනයන අපනයන බැංකුව | 1 | 4,842,265,567 | 2,915,539,639 | - |
| 32 | ස්පාඤ්ඤ රාජධානිය | 1 | 437,888,476 | 275,596,841 | 879,566,674 |
| 33 | ස්ටෑන්ඩර්ඩ් චාර්ටඩ් බැංකුව (එක්සත් රාජධානිය) | 1 | 934,596,367 | - | - |
| 34 | පකිස්තානු රජය | 1 | 18,829,096 | 115,195,952 | - |
| 35 | ඊස්ටර් බැංකුව - ඔස්ට්‍රියාව | 1 | 1,734,737,991 | - | - |
| **එකතුව** | | **173** | **507,388,442,363** | **152,704,624,575** | **209,889,364,176** |